# JESUS AND THE BUDDHA

A Study of Their Commonalities and Contrasts

# ජේසුස්වහන්සේ සහ බුදුන්වහන්සේ

උන්වහන්සේලා ගේ පොදු ලක්ෂණ සහ අසමානතා



සම්පාදක | පරිවර්තක
පූජ්‍ය ශ්‍රාවස්ති ධම්මික හිමි | මන්ජරී පීරිස්

# ජේසුස්වහන්සේ සහ බුදුපියාණන් වහන්සේ

උන්වහන්සේලා ගේ පොදු ලක්ෂණ සහ අසමානතා

**සම්පාදක:**

**පූජ්‍ය ශ්‍රාවස්ති ධම්මික හිමි**

**පරිවර්තක:**

මන්ජරී පීරිස්

# ජේසුස්වහන්සේ සහ බුදුපියාණන් වහන්සේ

උන්වහන්සේලා ගේ පොදු ලක්ෂණ සහ අසමානතා

**සම්පාදක:**

**පූජ්‍ය ශ්‍රාවස්ති ධම්මික හිමි**

**පරිවර්තක:**

මන්ජරී පීරිස්

ISBN:

ප්‍රකාශනය:

බෞද්ධ සංස්කෘතික මණ්ඩලය

# හැඳින්වීම

*සැලැකිය යුතුයි: ඉංග්‍රීසි බසින් රචිත මෙම ග්‍රන්ථයෙහි මුල් පිටපත විදේශීය කියවන්නන් වෙනුවෙන් ලියැවී ඇති අතර, එහි ඇතැම් වචන සහ අදහස්වල සාම්ප්‍රදායික ගෞරවපූර්වක භාවය යම් තරමකින් අඩු ලෙසක් පෙනී යා හැකි ය. ලාංකීය පාඨක ඔබ මැදහත් සිතින් මෙය කියවනු ඇතැයි සලකමි. - පරිවර්තක*

ගෞතම බුදුපියාණන් වහන්සේ සහ නසරෙත්වල ජේසුස්වහන්සේ ඉතිහාසයේ ඉතාමත් වැදගත් පුද්ගලයෝ වෙති. උන්වහන්සේලා ගේ සංකල්පවලින් සිය ගණනක් ශිෂ්ටාචාර සහ ගණන් කළ නොහැකි තරම් විශාල ප්‍රමාණයක ජීවිත හැඩගස්වනු ලැබ ඇත. මෑතක් වනතුරු ම බුදුදහම සහ ක්‍රිස්තියානි ධර්මය එකිනෙකට හමුවීම සතුටුදායක එකක් නොවීය. ක්‍රිස්තියානි ධර්මය විවිධ සම්ප්‍රදායික බෞද්ධ රටවල් වලට පැමිණියේ යටත් විජිත හමුදාවන් ඒ රටවල්වලට පැමිණීමත් සමඟ ය. නමුත් ක්‍රිස්තියානි ධර්මයට අයත් අයට තිබුණේ තමන්ගේ ආගම අනෙක් සියලු ආගම්වලට වඩා ඉහළ ය යන උච්චතා මානයයි. හිස් පිළිම වන්දනා කරන ආගමක් ලෙස බුදුදහම සාමාන්‍යයෙන් බැහැර කරනු ලැබීය. 19 වන ශතවර්ෂයේ දෙවන භාගයේ සහ 20 වන ශතවර්ෂයේ මුල් භාගයේ දී බුදුදහම වඩා හොඳින් අවබෝධ කරගත් බටහිර ජාතීන් නිසා මෙම ආකල්පය තව දුරටත් පවත්වා ගෙන යාම දුෂ්කර විය.[1] බුදුපියාණන් වහන්සේ උතුම් ගුරුවරයකු වශයෙන් ගෞරවයට පත් වූ අතර, උන්වහන්සේගේ ආචාර ධර්ම, ක්‍රිස්තියානි ධර්මය මෙන් ම ඉහළ මට්ටමින් යුක්ත බව අඩු තරමින් වඩා විවෘත මනසින් යුක්ත බටහිර පුද්ගලයෝ පිළිගත්හ. කෙසේ නමුත් බුදුදහම පිළිබඳ සමස්ත තක්සේරුව එසේම පැවතුණි. එනම් බුදුදහම ක්‍රිස්තියානි ධර්මයට වඩා හීන බවයි. වර්තමානයේ ප්‍රධාන පෙළ සහ නිදහස් මතධාරී ක්‍රිස්තියානි පල්ලිවල බුදුදහම සමඟ විවෘත සහ ගෞරවනීය ආකාරයෙන් ද, සමපිළිගැනීමෙන් යුතුව ද කටයුතු කිරීමට කැමැත්තක් ඇත. මෙම නව විවෘත බව බුදුපියාණන් වහන්සේගේ සහ ජේසුස්වහන්සේගේ ජීවිත සහ

ඉගැන්වීම් සසඳමින් අධ්‍යයනය කිරීමට කැමැත්තක් ඇතිවීමට හේතු තිබේ. කෙසේ නමුත් බුදුපියාණන් වහන්සේ සහ ජේසුස්වහන්සේ අතර විස්තරාත්මක සැසඳීමක් සිදුකිරීම අභියෝගාත්මක දෙයක් බවට පත් කරන බාධා කීපයක් ඇත. එමනිසා ඒ පිළිබඳ ව මෙතෙක් සිදුකර ඇති උත්සාහයන් බොහෝ වටී.

පළමු වන ගැටලුව නම් බුදුපියාණන් වහන්සේ ජීවත් වූයේ ජේසුස්වහන්සේට වඩා අඩුම ගණනේ වසර 500කට පෙර, ඉන්දියාවේ ලේඛන කලාව ආරම්භ වීමටත් පෙර වීමයි. උන්වහන්සේ පිළිබඳව හෝ වෙනත් කිසිවකු පිළිබඳව හෝ උන්වහන්සේට සම්බන්ධ කිසිම සිද්ධියක් පිළිබඳව හෝ සමකාලීන ලිඛිත සටහනක් නැත. බුද්ධ පරිනිර්වාණයෙන් වසර 276 කට පමණ පසු, ක්‍රි.පූ. 268 - අශෝක අධිරාජයාගේ යුගයේ පටන් බුදුරජාණන් වහන්සේ පිළිබඳ ලිඛිත සාධක හමු වේ. ආදිකාලීන සිදුවීම්, ලිපි, ශිලාලේඛන වැනි ජේසුස්වහන්සේගේ කාලයට අයත් ලේඛන රාශියක් තිබෙන නමුත්, ඒ කිසිවක ජේසුස්වහන්සේ පිළිබඳව සටහනක් නැත. ජේසුස්වහන්සේ ඉතා හොඳින් ප්‍රසිද්ධ බවට බයිබලයේ සඳහන්ව තිබියදී එසේ නොවීම කුතුහලයට හේතුවකි. කෙසේ නමුත්, දැනට ඇති ලේඛන තුළ ජේසුස්වහන්සේගේ ජීවිත පසුබිමට අදාළ කරුණු රාශියක් ඇතුළත් වන අතර, සමහර විට උන්වහන්සේගේ ජීවිතය හා සම්බන්ධ පුද්ගලයන් හා සිද්ධි පිළිබඳව ද දැක්වේ.

මීලඟට පුරාවිද්‍යාව පිළිබඳව ගැටලුව ඇත. ක්‍රිස්තියානි ප්‍රයත්නයක් ලෙස මෙම විද්‍යාව සැබැවින් ම ආරම්භ වූයේ 1830 ගණන්වල දී නැගෙනහිර මධ්‍යධරණී ප්‍රදේශයේ ලෙවැන්නයේ (Levant) බයිබලයට සාක්ෂි සොයා ගැනීමට එඩ්වඩ් රොබින්සන් දැරූ ප්‍රයත්න සමගය. එතැන් සිට බයිබලයට අදාළ පුරාවිද්‍යාව, ප්‍රධාන සහ නොකඩවා ඉදිරියට ගිය ව්‍යාපෘතියක් බවට පත් විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, විශාල වශයෙන් කෞතුක භාණ්ඩ, ශිලාලේඛන සහ පැරණි අතිරේක අත්පිටපත් සොයා ගැනීම සිදු වූ අතර, සමහර අවස්ථාවලදී ජේසුස්වහන්සේ ගේ සමාජ පරිසරය පිළිබඳව

සැඟවුණු ඇත්ත දැකීමේ හැකියාවක් ලබා ගැනීම සඳහා බයිබලයේ තොරතුරු පිරික්සීමට අවස්ථාව අනාවරණය විය.

19 වන සියවසේ දෙවන භාගයේදී ඇලෙක්සැන්ඩර් කනිංහැම්, සී. එල්. කාලිල්, වින්සන් ස්මිත් වැනි බ්‍රිතාන්‍ය පුරාවිද්‍යාඥයින් සහ වෙනත් අය, බෞද්ධ ග්‍රන්ථවල සඳහන් ස්ථාන හඳුනාගෙන කැණීම් සිදු කළ අතර, එතැන් සිට බොහෝ වැදගත් සොයාගැනීම් සිදුකර ඇත. කෙසේ නමුත් එබඳු ස්ථාන බොහෝ දුරට ඉතා ස්වල්ප වන අතර, සමහර ස්ථාන නිසියාකාරව පරීක්ෂණයට ලක් කොට හෝ ලේඛනගත කොට නැත. මෙයට විශේෂයෙන්ම අවාසනාවන්ත උදාහරණයක් වන්නේ, බුදුපියාණන් වහන්සේගේ උපන් ගමවන කපිලවස්තු පුරයේ කේ. එම්. ශ්‍රිවාස්ත විසින් සිදුකළ කැණීමයි.

ජේසුස්වහන්සේ සහ බුදුපියාණන් වහන්සේ අතර සමතුලිත සහ සවිස්තරාත්මක සැසඳීමක් සිදු කිරීමට ඇති තවත් අවහිරයක් වනුයේ බුදුපියාණන් වහන්සේගේ සහ ජේසුස්වහන්සේගේ වචන ඇතුළත් ග්‍රන්ථ පිළිබඳ කාරණය යි. නව තෙස්තමේන්තුව සාපේක්ෂව කුඩාය, කියවීම පහසු වන අතර ඕනෑ ම පොත් වෙළඳ සැලක හෝ පුස්තකාලයක, ඕනෑ භාෂාවකින්ම පාහේ ලබා ගැනීමට හැකිය. බෞද්ධ ග්‍රන්ථ මීට අසමාන ලෙස ඉතා විශාලය, ඒවායේ හැඩය සහ ශෛලිය ග්‍රන්ථ පරිහරණය කරන බටහිර ජාතිකයන්ට අපහසුවක් සහ නුහුරු බවක් ඇති කරයි.

මීට අමතරව, අනෙක් අතට ජේසුස්වහන්සේගේ ලේඛන බොහෝ විට අතරින් පතර නතර කරමින් උපමාකථා සහ උපමාලංකාරය හසුරුවමින් කෙටි හාස්‍යකාව්‍යය භාවිත කරමින් කථා කළ ද, බුදුපියාණන් වහන්සේගේ කථා සහ සංවාද බොහෝ දුරට දීර්ඝ - දාර්ශනික - ග්‍රන්ථ ස්වරූපය ගත්තේය. එහි ප්‍රතිඵලයක් වශයෙන් මෙම උතුම් ගුරුවරුන් දෙදෙනා අතර සැසඳීම් ලියන බොහෝ දෙනකුට විශේෂයෙන්ම, නව ගිවිසුම පිළිබඳ පුළුල් දැනීමක් තිබුණ ද ඔවුහු බුදුදහම පිළිබඳ ද්වීතියික ග්‍රන්ථ මත වඩාත්

විශ්වාසය රඳවති. මේවා බුදුදහම පිළිබඳ ඇතුළාන්තය දන්නා අයට වඩා විද්වතුන් විසින් ලියන ලද ද්වීතියික මූලාශ්‍රය මත පදනම් වූ ඒවා ය.

මෙම අවසාන ගැටලුවට අදාළව කථා කරනවා නම්, බුදුදහම සහ ක්‍රිස්තියානි ධර්මය හෝ ඔවුන්ගේ ආරම්භකයන් පිළිබඳව සංසන්දනාත්මක අධ්‍යයන ලියන බොහෝ කතුවරුන්ට, තමන් භාවිත කරන බෞද්ධ ග්‍රන්ථවල ගුරුකුල සහ යුග පිළිබඳව හුරුපුරුද්දක් නැත. බුදුදහම වසර 2500ක ඉතිහාසයක් තුළ ක්‍රමයෙන් ඇතිවීම පිළිබඳව පැහැදිලි නොකරමින් දිව්‍යාවදාන (ක්‍රි.පූ. 3වන ශතවර්ෂය) චර්යාපද (12වන ශතවර්ෂය) ජපන් ජාතික සෙන් ගුරුවරුන් සහ ටිබෙටයේ වර්තමාන දලයි ලාමා තුමාගේ මත පළ කිරීම් සඳහන් කරමින්, ක්‍රි.පූ. 6-4 සියවස කාලයේ පාලි ග්‍රන්ථවල බුදුදහම සහ විශේෂයෙන් බෞද්ධ සිද්ධාන්ත පිළිබඳව අදහස් දක්වා ඇත. මෙය ක්‍රිස්තියානි ධර්මය පිළිබඳ වාර්තාවක් ලිවීමට බයිබලය, තෝමස්ගේ ශුභාරංචිය (the Gospel of Thomas), ජනප්‍රවාද ශුද්ධස්ථානය (the Legenda sanctorum), දෙවියන්ගේ ප්‍රහසනය (the Divine Comedy), නැතිවූ ස්වර්ගය (Paradise Lost), බහුවිවාහ ක්‍රමය අනුමත කරන ජේසුස් ක්‍රිස්තු න්‍යායික සාමාජිකයාගේ ග්‍රන්ථය (the Book of Mormon) සහ එක්සත් දේවස්ථානයේ දිව්‍යමය ප්‍රතිපත්තීන් යන කෘතිය (Divine Principles of the Unification Church) යන ග්‍රන්ථ, ප්‍රධාන ක්‍රිස්තියානි ධර්මයේ සම්මත නියෝජිතයන් ලෙස ඉදිරිපත් කිරීමට සමාන වේ.

සමාජමය සහ සංස්කෘතික යන අංශ දෙක තවත් ගැටලුවකි. බටහිර රටවල බුදුදහම පිළිබඳව වඩා නිවැරදි සහ සම්පූර්ණ දැනුම තිබියදීත් බුදුදහම තවදුරටත් අඩු වටිනාකමක් ඇති දෙයක් ලෙස සාමාන්‍යයෙන් අවඥාවට ලක් කරන ලදී. බුදුපියාණන් වහන්සේ ''උතුම් සහ ගුණයහපත් මිනිසකු සතු ගුණාංග ඇත්තකු ලෙස ගෞරව කළ හැකි වනු ඇති බව" කතෝලික විශ්වකෝෂය 1921දී පිළිගත් නමුත්, බුදුදහමේ මූලික ඇදහිලි බරපතල අඩුපාඩු සහිත බව පැහැදිලි කළ අතර, ප්‍රබුද්ධ මනුෂ්‍යත්වයෙන් යුතු ආගමක් බවට පත්වීමට ප්‍රමාණවත් නොවේ යයි සලකා ඇත. එසේම

ජේසුස්වහන්සේ ධර්මයට වඩා පහත් කරමින් කැපීපෙනෙන සහනයක් ලබා ගෙන ඇත.”

බටහිර සමාජයේ ආගම් කෙරෙහි සාමාන්‍යයෙන් තිබූ මෙම පාරම්පරික පොදු අදහස් බැහැර කොට, වර්තමානයේ නව සහ සම්පූර්ණයෙන්ම ගෞරවනීය අයුරින් සියලු ආගම් හා එක්ව කටයුතු කරන තත්ත්වයකට වෙනස් වී ඇත. ‘‘උපකාර නොකරන” හෝ ‘‘නොඉවසන” ඇතැම් කරුණු සම්බන්ධයෙන් වුව ද දැන් විවිධ ආගම් විසින් කරන සුහද යෝජනාවලට ‘‘එකිනෙකා අතර බෙදා ගන්නා සහ අගය කරන” ‘‘පොදු හේතු” ලෙස අවධාරණයට ගැනීමට හැකි තත්ත්වයකට පත් වී ඇත.

බුද්ධාගම සහ ක්‍රිස්තියානි ධර්මය යන දෙකම එකම සත්‍යය යැයි අවධාරණය කරන්නා වූ ග්‍රන්ථ සැලකීමට භාජනය කරනු වටී. මේවා ජනප්‍රිය මාතෘකා යටතේ විහිදී - පැතිරී ඇත. ජීවමාන බුදුපියාණන් වහන්සේ - ජීවමාන ජේසුස්වහන්සේ (Living Buddha - Living Christ), යහපත් හදවතක්: ජේසුස්වහන්සේගේ ඉගැන්වීම් පිළිබඳව බෞද්ධ අදහසක් (A Good Heart: A Buddhist Perspective on the Teachings of Jesus), ගුරුවරු දෙදෙනයි, එක පණිවුඩයයි (Two Masters, One Message) යනාදී ජනප්‍රිය මාතෘකා යටතේ මෙම ග්‍රන්ථ බිහිවී ඇත. වඩාත් ශාස්ත්‍රීය ග්‍රන්ථ වශයෙන් කරුණාව සහ භාවනාව (Compassion and Meditation), බුදුදහම සහ ක්‍රිස්තියානි දහම අතර ආධ්‍යාත්මික උනන්දුව (the Spiritual Dynamic between Buddhism and Christianity), ජේසුස්වහන්සේ සහ බුදුපියාණන් වහන්සේ: සංවාදයේ යෙදෙන මිතුරෝ (Jesus and Buddha: Friends in Conversation), බෞද්ධයකු සහ ක්‍රිස්තියානුවකු? ද්විත්ව අයිතිය පිළිබඳ ගවේෂණයක් (Buddhist and Christian? An Exploration of Duel Belonging) යන මෙම ග්‍රන්ථ ද බිහිවී ඇත.

බුද්ධාගම සහ ක්‍රිස්තියානි ධර්මය යන දෙක ම එකම සත්‍යය යැයි කියන එවැනි කෘති සැලකීමට වටී, මනා වැදගත්කමක් ඇත. නමුත් බොහෝ විට උත්සාහ කර ඇත්තේ හුදෙක් සමානකම් දකින්නටත්, වෙනස්කම් අඩුවෙන්

තක්සේරු කිරීමටත් ය. එහි ප්‍රතිඵලය වන්නේ සත්‍යය වසන් වීමයි. එවැනි අසතුටුදායක උත්සාහ පිළිබඳ උදාහරණයක් ලෙස ජේසුස්වහන්සේ සහ බුදුපියාණන් වහන්සේ - සමාන්තර කියමන් (Jesus & Buddha - The Parallel Sayings) දැක්විය හැකිය. මේවා බයිබල් ගිවිසුමේ නව ප්‍රඥප්තිය පිළිබඳ උගතකු වන දේවධර්මධර මාකස් බෝග් විසින් සංස්කරණය කර 1997 සිට බොහෝ වාරයක් ප්‍රකාශනයට පත් කර ඇත. බෝග් නව ප්‍රඥප්තියෙන් විශාල ප්‍රමාණයක ඡේද වලින් ද, බෞද්ධ ග්‍රන්ථ පෙළකින් ද උපුටනයන් ඉදිරිපත් කර ඇති අතර, මේ දෙකම සමාන ලෙස ඔහු දැක්කේය.

මෙම කියමන්වලින් ස්වල්පයක් නිසැකවම එක සමාන නමුත්, බොහෝ ප්‍රමාණයක් එසේ නොවේ. සමහර අවස්ථාවල 'උපමාව' එකම විදහා දැක්වීම වන අතර, එම උපමාවල අර්ථය සහ උපමාව භාවිත කිරීමේ අරමුණ නොසලකා හැර තිබේ. ඒ අනුව ජේසුස්වහන්සේ ජලය මත ඇවිදින විස්තරය ඔහුගේ දේවත්වය ඔප්පු කිරීමට යොදාගෙන ඇති අතර, ඉතා දිගු ඡේදයකින් බුදුපියාණන් වහන්සේ බෞද්ධයකුට හෝ අබෞද්ධයකුට ජලය මත ඇවිදීම ඇතුළුව භාවනාවේ ප්‍රතිඵලයක් ලෙස දියුණු කරගත හැකි සමහර ඍද්ධිබල පිළිබඳව කළ විස්තරය යුගල වශයෙන් කෙටි උපුටා දැක්වීමක් දක්වා ඇත. ජලය මත ඇවිදීම හැර මෙම ඡේදයන් දෙකේ කිසිම පොදු දෙයක් නැත.

නැවතත්, බෝග්, ක්‍රිස්තියානි ධර්මයට අදාළ උදාහරණ ඉදිරිපත් කිරීම සඳහා නව ගිවිසුම භාවිත කරන අතරතුර සමහර විට ඒවාට කිසිසේත් සමාන කළ නොහැකි සම්ප්‍රදායන් සහ යුගවලට අයත් බෞද්ධ ග්‍රන්ථ සමඟ සමාන කර ඇත. ඒ අනුව දස වාරයකට වඩා[2] ක්‍රිස්තියානි ධර්මයේ පැදි හා සියවස් ගණනාවකට පසු රචනා කරන ලද බෞද්ධ ග්‍රන්ථ සමඟින් සමීපව තබා ගෙන උපුටා දක්වා ඇත. පිටු අංක 36 සඳහන් විස්තරය විමලකීර්ති නමැති ගිහියකු විසින් කරන ලද්දක් මිස බුදුපියාණන් වහන්සේ විසින් කරන ලද්දක් නොවේ.

පිටු අංක **45** සහ **49**යේ ඔහු උපුටා දක්වා ඇත්තේ බුදුපියාණන් වහන්සේ ගේ පරිනිර්වාණයෙන් වසර 1000කට වඩා කාලයකට පසුව කරන ලද ජාතකමාලා නමැති සාහිත්‍යයම නිර්මාණයකින් ය. එකිනෙකට කිසිසේත් සම්බන්ධයක් නොමැති වෙනත් ග්‍රන්ථ හෝ එකිනෙකට පරස්පර ග්‍රන්ථ භාවිත කිරීම ඉතාමත් පුදුමයට කරුණකි. පිටු අංක **56**යේ වංචාකාර අනාගතය හෙළිකරන්නන්ට විරුද්ධව කරන ලද අනතුරු ඇඟවීමක් (මැතිව් 7,15), බුදුපියාණන් වහන්සේ විසින් අභ්‍යන්තර වෙනස්වීම වෙනුවට දැඩි තපස හෙළා දැකීම හා සමාන කර ඇත. පිටු අංක **101** තවත් උදාහරණයකින්, ජේසුස්වහන්සේ තමන්ගේ මරණයෙන් පසුවත්, තමන් සැබැවින්ම ජීවත්වන නිසා තමන්ගේ ශ්‍රාවකයන්ට තමා දකින්නට හැකි බව කියා ඇත.[3] බුදුදහමට අදාළ ඡේදයේ මෙයට සමාන යැයි සිතන පරිදිම, සම්පූර්ණයෙන්ම නිශ්චිතවම මෙහි විරුද්ධ අර්ථය කියයි. ඒ තවදුරටත් ළඟාවිය නොහැකි නමුත්, උන්වහන්සේගේ ශ්‍රාවකයන්ට උන්වහන්සේගේ ධර්මයෙන් මඟ පෙන්වීම සහ ප්‍රබෝධය ලබාගත හැකි බවය.

බෝග් බුදුපියාණන් වහන්සේගේ සහ ජේසුස්වහන්සේගේ ජීවිතවල සමානකම් සාකච්ඡා කරනවිට අපට එම ගැටළුව ම ඇති වේ. උන්වහන්සේලා දෙදෙනාගේම ජීවිතයේ පරිවර්තනයට ලක් කරන අත්දැකීම් සිදු වූයේ වයස 30දී බව ඔහු කියයි. ජේසුස්වහන්සේ බව්තීස්මය ලබන විට සමහර විට වයස 29ක් හෝ 30ක් වූ අතර, බුදුපියාණන් වහන්සේ බුද්ධත්වය ලැබුවේ වයස 35දීය. එම නිසා මෙම සැසඳීම "සිත් බඳනා සුළු" එකක් ලෙස හැඳින්වීම සුදුසු නොවේ. බෝග් පවසන ආකාරයට "රදළ පැළැන්තියේ පාලනයේ" හිරිහැරවලට බුදුපියාණන් වහන්සේ මුහුණ දුන්නේ ද? කිසිම ආගමක් පිළිබඳව උනන්දුවක් නොතිබූ වංසයේ උදේන හැර, එකල සිටි ඉතාමත් බලසම්පන්න අධිරාජයන් සතර දෙනා සමඟ ම උන්වහන්සේ යහපත් මිත්‍රත්වයක් ගොඩනඟා තිබූ සේක. සමහර බ්‍රාහ්මණයන් උන්වහන්සේට එදිරි වූ අතර, සෙසු අය තුළ උන්වහන්සේ කෙරෙහි සැහෙන ගෞරවයක් තිබුණි. සැහෙන සංඛ්‍යාවක් උන්වහන්සේගේ ශ්‍රාවකයන් ද විය. මීට ප්‍රතිවිරුද්ධව, ජේසුස්වහන්සේ ආගමික සහ

දේශපාලනමය බලධරයන්ගේ ප්‍රබල ප්‍රතික්‍රියා ප්‍රකෝපකාරි බවට පත් කිරීමේ හේතුවෙන් ඔවුහු එතුමන් මරණයට පත් කළහ. බුදුපියාණන් වහන්සේ එකම එක වරක් අම්බපාලි නමැති ගණිකාව සහ මිනීමරු අංගුලිමාල හමුවීම බෝග් ගේ මතයට අනුව, ජේසුස්වහන්සේ පව්කාරයන් සහ බදු එකතුකරන්නන් සමග නිතර තිබූ ආශ්‍රය හා සමාන විය. වෙනත් ඕනෑම පුද්ගලයකුගෙන් ලබන දානයක් මෙන් අම්බපාලි විසින් පිරිනැමූ දානය ද බුදුපියාණන් වහන්සේ පිළිගත්හ. ජේසුස්වහන්සේ පව්කාරයන් ආශ්‍රය කළේ ඔවුන්ට ගැලවීම ඉතාම අවශ්‍ය බව එතුමා විශ්වාස කළ නිසාය. ජේසුස්වහන්සේ සහ බුදුපියාණන් වහන්සේ අතර තිබුණා යැයි බෝග් ඉදිරිපත් කළ සෑම සමානකමක්ම අල්ප හෝ හැකිතාක් ඉහළ මට්ටමින් නොවැදගත් ඒවා විය.

බුදුදහම සහ ක්‍රිස්තියානි ධර්මය වැදගත් ලක්ෂණ බෙදා ගන්නවා ය යන අදහසට බෝග් බැඳුණ නිසා, මෙම පූර්ව මතයට නොගැළපෙන සියලු සාක්ෂි ඔහුට නොසලකා සිටින්නට සිදුවී ඇත. නොගැළපීම් සෙවීමේ කාර්යයට ඔහු යොමුවූයේ නම් ඔහුට මෙම ග්‍රන්ථය සකස් කිරීමට රැස්කළ කරුණුවලට වඩා බොහෝ ප්‍රමාණයක බොහෝ විශ්වසනීය උදාහරණ සොයා ගැනීමට ඉඩ ප්‍රස්ථාව තිබුණි. 1960 ගණන්වලදී සුප්‍රකට දේවධර්මාචාර්ය කාල් රානර් විස්මය දනවන කියමනක් අවධානයට යොමුකරමින්, "සැබැවින්ම ක්‍රිස්තියානි වූ, එහෙත් ඒ බව නොදත් බෞද්ධයන් සිටි බව" පැවසුවේය. ඔහු ඔවුන් හැඳින්වූයේ "නිර්නාමික ක්‍රිස්තියානීන්" වශයෙනි. දැන් සමහර පුද්ගලයන් "බෞද්ධ ක්‍රිස්තියානීන්" හෝ "ක්‍රිස්තියානි බෞද්ධයන්", බවට තමන් සම්පූර්ණ අවබෝධයෙන් යුතු බවත්, සාධාරණ ලෙස අනුමාන කරන පරිදි තමන් ජීවත්වෙමින් සහ කිසිම ගැටීමකින් තොරව මේ දෙකේම දහම ඥානාන්විතව පිළිගන්නා බව අදහස් වේ. උදාහරණ වශයෙන්, බෞද්ධ ක්‍රිස්තියානි ධර්මයඃ දැඩි උද්‍යෝගිමත් විවෘත බවක් (Buddhist Christianity: A Passionate Openness), යන ග්‍රන්ථය ලියන ලද රොස් කොම්ප්සන් තමන් බෞද්ධ ක්‍රිස්තියානුවකු ලෙස හඳුන්වයි. පුදුමයට හේතුව නම්, ඔහුගේ අනෙක් ග්‍රන්ථවලින් පැහැදිලි

වන්නේ ඔහු බොහෝ දුරට ක්‍රිස්තියානි අයකු බවයි. නමුත් ඔහු විවෘත සහ නිදහස් මතධාරී පුද්ගලයෙක් වේ. ඔහු එංගලන්ත සභාවට අයත් පූජකවරයකු වූයේ සහ තවදුරටත් එසේ සිටින්නේ ඇයි ද යන විමතිය කෙනකුට ඇතිවිය හැකිය. කතෝලික දේවධර්මාචාර්ය, රයිමන් පනික්කාර් මෙසේ ලියා ඇතඃ "මම යුරෝපයේ සිට ඉන්දියාවට ක්‍රිස්තියානි පුද්ගලයකු ලෙස පිටත්වූයෙමි. මම මා හින්දු භක්තිකයකු බව හඳුනා ගත්තෙමි. මම කිසිදිනක ක්‍රිස්තියානි ධර්මය අතනොහැර, බෞද්ධයකු වශයෙන් නැවත පැමිණියෙමි". කෙසේ නමුත්, පණික්කාර් ඔහුගේ "බුදුදහම" පැහැදිලි කරන ආකාරය කියැවූ විට, වසර 42ක් බෞද්ධ භික්ෂුවක වූ මට ඔහු කී දෙයින් බොහොමයක් නුහුරු බව දැනුණි. මෙම මත සහ කියමන් තමන්ගේ තර්කානුකූල අවසාන නිගමනයන් සඳහා සැලකිල්ලට ගනිමින් ලින් ඩි සිල්වා - බුදුදහමේ සහ ක්‍රිස්තියානි ධර්මයේ ආත්මය පිළිබඳ ගැටළුව (The Problem of Self in Buddhism and Christianity), ජෝන් කොබ් - සංවාදයෙන් ඔබ්බට, ක්‍රිස්තියානි ධර්මය සහ බුදුදහමේ අන්‍යෝන්‍ය වෙනස්වීම (Beyond Dialogue, Towards Mutual Transformation of Christianity and Buddhism) සහ හැන්ස් වොල්ඩ්න්ෆෙල්ස් - සම්පූර්ණ හිස්බව, ක්‍රිස්තියානි බෞද්ධ සංවාදයේ අත්තිවාරම (Absolute Nothingness, Foundations of Christian Buddhist Dialogue) යන කෘතිවලින් උක්ත දේවධර්මචාර්යයන් සිතන පරිදි ආගම් දෙකේ ම අන්‍යෝන්‍ය වැඩිදියුණුව සඳහා සම්මිශ්‍රණ ස්වභාවයෙන් පක්ෂව කථාකර ඇත. මගේ ග්‍රන්ථය වෙනස් ස්වරූපයක් ගනී. බුදුදහමේ සැබැවින්ම ක්‍රිස්තියානි ධර්මය සමඟ, විශේෂයෙන් ම ආචාරධර්ම අංශයෙන්, යම් අවධානය ගන්නාසුළු සමානකම් තිබෙන බවට පිළිගැනීමක් ඇත - එය බුදුදහම ජෛන ආගම, සමහර හින්දු ගුරුකුල, ප්‍රඥාව වැනි ආචාරධර්ම - සහ ෂොපෙන්හවර්, ෆෙරොඩ්, මැස්ලෝ වැනි බොහෝ දෙනා ලියන ලද දේ ආදිය සමඟ ඇති ඇතැම් සමානකම් මෙනි. සැබැවින් ම කෙනකුට ඕනෑම සිතීමේ ක්‍රමයක් තවත් එකක් හා සසඳමින් එකඟවීමට කරුණු සොයාගත හැකිය. කෙසේ නමුත්, මෙසේ කිරීම වෙනුවෙන් මූලික වෙනස්කම් සැඟවීම හෝ මඟහැරීම, මානව ආධ්‍යාත්මිකතාවන්ගේ

විවිධත්වයන්ට සහ සම්පත්වලට ඇති ඔවුන්ගේ දායකත්වය හා අනන්‍යසාධාරණ අංග සොරකම් කිරීමකි. එය කුදර්ථවත්ය, එපරිද්දෙන්ම නොමඟයවන සුළුය.

මෙසේ නොකරන එක් ග්‍රන්ථයක් නම්, කීත් යැන්ඩෙල් (Keith Yandell) සහ හැරල්ඩ් නෙට්ලන්ඩ් (Harold Netland) විසින් රචිත - ක්‍රිස්තියානි අදහසින් බුදුදහම දෙස ගෞරවනීය සහ සාමාන්‍යයෙන් හොඳ දැනුමකින් පිරික්සූ, 'බුදුදහමඃ ක්‍රිස්තියානි ගවේශණයක් සහ ඇගයීමක්' (Buddhism: A Christian Exploration and Appraisal) යන ග්‍රන්ථයයි. මෙම කතුවරයන් තුළ බුදුදහමේ ඇතැම් කරුණු පිළිබඳව බරපතල අනවබෝධයක් තිබෙන නමුත්, මම ඔවුන්ගේ සාමාන්‍යය ප්‍රවේශය සහ අදහස් සමඟ එකඟ වෙමි. "...ක්‍රිස්තියානි ධර්මය සහ බුදුදහම සතුව සමහර සමානකම් ඇත. එසේම ක්‍රිස්තියානින්ට සහ බෞද්ධයන්ට ප්‍රවේශමින් එකිනෙකාට සවන් දෙමින් තවත් බොහෝ දේ ලබාගත හැකිය. කැබලිවලට කැඩීගිය ලෝකයක සියල්ලන් විසින් ම බොහෝවිට අසාධාරණයට සහ ප්‍රචණ්ඩත්වයට දඬුවම් පැමිණවීමට ආගම භාවිත කෙරෙයි. වෙනස්කම් යාකර සාමය සඳහා කටයුතු කිරීමට ක්‍රම යෙදීම වැදගත් වේ. ස්ථිරවම, ජේසුස්වහන්සේ සහ බුදුපියාණන් වහන්සේ තමන්ගේ අනුගාමිකයන්ගෙන් නොඅඩුව එය බලාපොරොත්තු වූහ. ඒ අනුව දෙපාර්ශ්වය ම පොදුවේ පිළිගත් අංශ සහ ගෞරවනීය සහයෝගයක අවශ්‍යතාව අප පිළිගත්තත් සත්‍යයේ දර්ශන දෙක අතර මූලික වෙනස්කම් සමඟ අප ජීවත් වියයුතු ආකාරය හඳුනාගත යුතු බව අවංකත්වය අපට අවධාරණය කරයි.

ක්‍රිස්තියානි ධර්මය සදාකාලික සර්වබලධාරී නිර්මාපකයකු පිළිබඳ යථාර්ථයක් තරයේ කියා සිටියි. බුදුදහම මෙය බැහැර කරයි. නසරෙත්වල ජේසුස්වහන්සේ තුළ දෙවියන්ගේ මිනිස් ආරෝපිතයක් ගෙන සිටින බව ක්‍රිස්තියානි ධර්මය තරයේ දරා සිටියි. එම නිසා ජේසුස් ක්‍රිස්තු සම්පූර්ණ දෙවියෙක් වන අතරම සම්පූර්ණ මිනිසෙකි. මෙවැනි දෙයක් බුදුදහමේ නැත. ක්‍රිස්තියානි අධ්‍යාත්ම විද්‍යාවට අයත් වන්නේ පුද්ගල අධ්‍යාත්ම සහ

ආත්ම යථාර්ථයයි. පාරම්පරිකව බුදුදහම මෙය බැහැර කරයි. දුකට හේතුව සහ අපගේ ලෝකයේ ප්‍රශ්නවලට හේතුව ආශාව සහ මෝහය බව බුදුදහමින් පෙන්වා දෙයි. ක්‍රිස්තියානි විශ්වාසයට අනුව, අපගේ සියලු ප්‍රශ්නවලට මුල මෝහය නොව, පූජනීය සහ යහපත් දෙවියන්ට විරුද්ධවීමේ පාපය බව පෙන්වා දෙයි.[4] ඒ හා සමාන වූ "...අවංකව මගේ අභිප්‍රාය සමානකම්, වෙනස්කම් මෙන්ම පරස්පරකම් ද සොයා බැලීමයි. එසේම මම ජේසුස්වහන්සේට සහ බුදුපියාණන් වහන්සේට ඔවුන් වෙනුවෙන්ම හැකිතාක් ඔවුන්ගේ වචන අදාළ පූජනීය ග්‍රන්ථවලින් ඉදිරිපත්කර ඇති ආකාරයට කථා කිරීමට අවස්ථාව ලබා දෙමින් ඔවුන්ට ගෞරව කරමි. අවසාන වශයෙන්, ඒ වචන, පාප්තුමාගේ හෝ දලයිලාමාගේ, මැතිව් ෆොක්ස්ගේ හෝ ස්ටීවන් බැච්ලර්ගේ වචන වලට වඩා, යථෝක්ත ආගම් දෙකේ අත්තිවාරම සහ ඉවත නොදැමිය හැකි කොටස වේ, නොඑසේ නම් එසේ යැයි සැලකේ. මම ක්‍රිස්තියානි ආගම ගැන කථාකිරීම සඳහා බයිබල් සංගමය සහ කතෝලික බිෂොප් සම්මන්ත්‍රණය - ශ්‍රී ලංකා 1981, විසින් අනුමත පොදු පරිවර්තනය - සිංහල බයිබලය සහ බුදුදහම සඳහා පාලි ග්‍රන්ථ ප්‍රකාශන සමිතියේ පාලි ත්‍රිපිටකය බොහෝ විට මගේ පරිවර්තනය සඳහා භාවිත කරමි. පාලි දේශනා තුළ බොහෝ විට නැවත - නැවත සඳහන් වී තිබෙන සමහර ඡේදයන් කෙටියෙන් සඳහන් කළෙමි. මෙම ග්‍රන්ථය පුරාම මම ජේසුස්වහන්සේ එතුමන්ගේ නිල නාමය වූ ක්‍රිස්තු වෙනුවට එතුමන්ට දී ඇති නාමය වූ 'ජේසු' යනුවෙන් සඳහන් කිරීමට පෙළැඹුණෙමි. බුදුරජාණන් වහන්සේගේ ගෝත්‍ර නාමය වූ 'ගෝතම' හෙවත් 'ගෞතම' හෝ පදවිනාමය වූ 'බුද්ධ' යන නමින් හැඳින්වීමි. ජේසුස්වහන්සේ ''දෙවියන් වහන්සේගේ රාජධානිය" ''මනුෂ්‍ය පුත්‍ර" සහ ''දෙවියන් වහන්සේගේ පුත්‍රයා" යනුවෙන් අදහස් කළේ කුමක්ද? යන්න පිළිබඳව උගතුන් සහ ක්‍රිස්තියානීන් අතර ද සැහෙන මතභේද ඇති නිසා මම එම විෂයයන් සම්බන්ධයෙන් මත ප්‍රකාශ කිරීමෙන් වැළකුණෙමි. එම හේතුව නිසාම ජේසුතුමා සැබැවින්ම තමන් ගැළවුම්කරුවා ලෙස සිතුවා ද සහ එසේ සිතුවා නම් ඔහු දිව්‍යමය ද

නොවේ ද යන්නත් තීරණය කිරීමට අනිත් අයට ඉඩ හරිමි. මීට අමතරව, සංසන්දනය කිරීමට සහ පිරික්සීමට තව බොහෝ වෙනත් අදහස් සහ ඇදහිලි ඇත. ජේසුස්වහන්සේට වඩා බුදුපියාණන් වහන්සේ පිළිබඳව සැහෙන තොරතුරු ලබාදී ඇති බව මේ ග්‍රන්ථය කියවන්නන්ට වැටහෙනු ඇත. මෙයින් අදහස් වන්නේ හුදෙක් මුල් පුද්ගලයා පිළිබඳව අවසාන පුද්ගලයාට වඩා තොරතුරු අඩුවීම නොවේ. බුදුපියාණන් වහන්සේ පිළිබඳව අඩුම තරමින් පැරණිතම විස්තර ඉතා අඩුවෙන් දැනගැනීමට ඇති හේතුව නිසාම මම බුදුපියාණන් වහන්සේගේ ඉගැන්වීම් පැහැදිලි කිරීමට වඩා ඉඩ ප්‍රමාණයක් ඒ වෙනුවෙන් වෙන් කළෙමි. මෙම ග්‍රන්ථය පුරාම මම "ත්‍රිපිටකය," "මූල ග්‍රන්ථ" සහ "බෞද්ධ ලේඛන" යනුවෙන් අදහස් කරන පාලි ත්‍රිපිටකය මූලාශ්‍රය වශයෙන් යොදාගෙන ඇත්තෙමි.

# පරිවර්තකගේ සටහන

මෙම ග්‍රන්ථයේ කර්තෘ පූජ්‍ය ශ්‍රාවස්ති ධම්මික ස්වාමීන් වහන්සේ මෙම නිබන්ධය තුළින් වැදගත් තොරතුරු සහ සැඟවුණු ඇත්ත දැකීමේ හැකියාව ඇති කරන ආකාරයට එය ඉදිරිපත් කර ඇත. ඊට අමතරව, ආගමිකත්වය නිහතමානිකම, මිනිස්කම සහ අන්‍යෝන්‍ය ගෞරවය සමඟ එකට ගළපන්නේ කෙසේ ද යන්න ඉතා හොඳින් ධනාත්මක පණිවුඩයක් සමඟින් සමාජයට ලබා දී ඇත.

උන්වහන්සේ එක් ආගමක් උත්පත්තියෙන් උරුමකර ගෙන ඇති අතර අනෙක් ආගම පසුව තෝරා ගැනීමෙන් ආගම් දෙකම පිළිබඳව හොඳින් දන්නා ලේඛකයකු වීමේ විශේෂත්වය හිමිකර ගෙන ඇත. උන්වහන්සේ ආගම් දෙකම පිළිබඳව දැඩි අවධානයෙන් අධ්‍යයනය කර ඇති බවට මෙම කෘතිය සාක්ෂියකි. එහි අඩංගු බොහෝ ආවේණික ගුණාංග අතර, ඉතාමත් සිත් බඳනාසුළු දෙය වන්නේ උන්වහන්සේ තමන්ගේ විෂය පිළිබඳව සාධාරණ සහ විෂය නිඃශ්‍රිත අයුරෙන් කරුණු දක්වා  ඇති ආකාරයයි.

මෙම ග්‍රන්ථය සැමවිටම තමන්ගේ ආගම අධ්‍යයනය කිරීම හුදෙක් සාන්දෘෂ්ටික අවශ්‍යතාවන්ට පමණක් සීමා නොකරන විද්වතුන්ට පමණක් නොව, ක්‍රිස්තියානින් සහ බෞද්ධයන් ඇතුළු පුළුල් පාඨක සංඛ්‍යාවකට වැදගත් වේ.

පළමුව මෙම ග්‍රන්ථය සිංහලට පරිවර්තනය කිරීමට අවසර දුන් උන්වහන්සේට මම මගේ ප්‍රණාමය පුද කරමි.

දෙවනුව මෙම ග්‍රන්ථය ප්‍රකාශ කිරීමට අනුග්‍රහය දැක්වූ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයේ අධිපති, පූජ්‍ය කිරම විමලජෝති නායක ස්වාමීන් වහන්සේට සහ සහාය දුන් පූජ්‍ය මිද්දෙනියේ ධම්මික ස්වාමීන් වහන්සේටත් ප්‍රණාමය පුද කරමි.

තෙවනුව, ග්‍රන්ථය සංස්කරණය කළ ජර්මනියේ හැම්බර්ග් විශ්වවිද්‍යාලයයේ කථිකාචාර්ය, මහරගම සිරි වජිරඤාණ ධර්මායතනයේ උපප්‍රධානාචාර්ය, ශාස්ත්‍රපති රාජකීය පණ්ඩිත ත්‍රිපිටකාචාර්ය, තල්පාවිල කුසලඤාණ ස්වාමීන් වහන්සේටත්, උපදෙස් ලබා දුන්, මහරගම සිරි වජිරඤාණ ධර්මායතනවාසී ශාස්ත්‍රපති පණ්ඩිත ගබ්බෙල වජිරඤාණ ස්වාමීන් වහන්සේට සහ

වජිරාරාමවාසී ශාස්ත්‍රපති පණ්ඩිත වේරදුවේ මහින්ද ස්වාමීන් වහන්සේටත් ප්‍රණාමය පුද කරමි.

එසේම, මෙම ග්‍රන්ථයේ සෝදුපත් බලා දුන් අරුණ තලගල, විවිධ ආකාරයෙන් උපකාර කළ සුජීව දිලංගනට සහ ජීවක මෛත්‍රීටත්, උපාලි සල්ගාදු යන මහතුන්ටත් කෘතඥ වෙමි. ඔවුන් සියලු දෙනාගේම මෙලොව සහ පරලොව සුවයට ද, සංසාර විමුක්තියට ද මෙම පුණ්‍යකර්මය හේතුවක්ම වේවා!

මගේ දෙමව්පියන්ගේ සහ පවුලේ සියලු දෙනාගේත් සංසාර විමුක්තියට මෙම උත්සාහය උපකාර වේවා!

සැමට තෙරුවන් සරණයි!

මන්ජරී පීරිස්
86, දහම් මාවත
මහරගම

# ජේසුස්වහන්සේ සහ බුදුපියාණන් වහන්සේ

## උන්වහන්සේලා ගේ පොදු ලක්ෂණ සහ අසමානතා

''වැරදි කිරීමෙන් වළකින්න, යහපත් දේ කිරීමට ඉගෙන ගන්න, මනස පිරිසිදු කර ගන්න'' - ධම්මපදය 183

''ආදරයට අවංක වන්න, අයහපතට අකැමැති වන්න, යහපත තදින් අල්ලා ගන්න'' - රෝමානු 12,9


**පෙරවදන**

**හැඳින්වීම**

**1. මූලාශ්‍රය**

පැරණිතම ග්‍රන්ථ

**2. උන්වහන්සේලාගේ ජීවිත**

සැබෑ මිනිසුන්

උන්වහන්සේලාගේ සමාජමය පසුතලය

උන්වහන්සේලාගේ පෙළපත්

උන්වහන්සේලාගේ උත්පත්ති

උන්වහන්සේලාගේ පවුල් සහ දෙමාපියන්

උන්වහන්සේලාගේ සහෝදර සහෝදරියන්

උන්වහන්සේලාගේ නම්

උන්වහන්සේලාගේ ළමා කාලය

උන්වහන්සේලාගේ කායික පෙනුම

උන්වහන්සේලාගේ භාෂා

උන්වහන්සේලාගේ දූත මෙහෙය

පොළඹවනු ලැබීම

උන්වහන්සේලාගේ ශාස්තෘවර ජීවිත

උන්වහන්සේලාගේ සංචාර

උන්වහන්සේලාගේ ශ්‍රාවකයන්

ජුදාස් සහ දේවදත්ත

දෙව්වරුන්ගේ පැමිණීම

උන්වහන්සේලාගේ මෙහෙවරවල අදාළ පසුබිම

වෙනත් අය උන්වහන්සේලා දුටු අයුරු

උන්වහන්සේලාගේ අවසාන දින

උන්වහන්සේලාගේ අවසාන වචන

## 3. බුද්ධ ධර්මය හා සුභාරංචිය

උන්වහන්සේලා තමන්ගේ ඉගැන්වීම් නම් කළේ කෙසේ ද?

උන්වහන්සේලාගේ ඉගැන්වීමේ ශෛලීන්

ප්‍රාතිහාර්ය

මරණින් මතු ජීවිතය සහ ආත්මය

අත්හැරීම

ආදරය

විශ්වාසය

ලෝකයේ අවසානය

විමුක්තිය සහ බුද්ධත්වය

ධනසම්පත්

සමාජයේ සියලු කොටස් ඇතුළත් කිරීමේ ගුණාංගය සහ පොදු නොවන බව

දෙවියන්වහන්සේ

යාඥාව සහ භාවනාව

## 4. අවසානය

පදමාලාව

ආගමික ග්‍රන්ථ සහ කෙටි යෙදුම්

සටහන්

සූචිය

# මූලාශ්‍රය

## පැරණිතම දත්ත

බුදුපියාණන් වහන්සේගේ පරිනිර්වාණයෙන් අඩුම තරමින් වසර 150ක් ගතවන තුරුත් ඉන්දියාවේ ලේඛන කලාව භාවිතය පුළුල්ව ව්‍යාප්ත නොවීය. දැනුම - විශේෂයෙන්ම ආගමික දැනුම ආරක්ෂා වූයේත්, පතුරුවා හැරියේත් වාචිකවය. පාලි වචන අධ්‍යයනය හෝ කටපාඩම් කිරීම 'ඇසීමෙන්' හෙවත් 'සුත' වශයෙන් සිදුවූයේ ඒ නිසාය. භික්ෂුවක් ආගමික සභාවකට එක්වීමෙන්, දේශනාවලට සවන් දීමෙන්, ක්‍රමයෙන් ඒවා කටපාඩම්කර ගත්තේය. බ්‍රාහ්මණ ආගමේ පාරම්පරික බ්‍රාහ්මණයන්ට පරිපූර්ණ ස්මරණ උපායන් තිබුණි. ඒවා උපයෝගී කරගනිමින් වේද දේවගීතිකා ගායනය අසාමාන්‍ය නිරවද්‍යතාවයෙන් යුතුව සිදුවිය. තොරතුරු ලිවීමෙන්, මතකයේ තබා ගැනීමට වඩා වැඩි විශ්වාසවන්ත බවකින් පතුරුවා හැරිය හැකියයි සාමාන්‍යයෙන් උපකල්පනය කරනු ලැබේ. නමුත් මෙය සැමවිටම සත්‍යය නොවේ. මුද්‍රණය ආරම්භයට පෙර පොත් නිර්මාණය, අතින් පිටපත් කිරීමෙන් සිදුවිය. බොහෝ විට ලියන්නන්ට ලියනවිට වැරදීම් සිදුවිය. කාලයත් සමඟ එක් පොතක් තවත් එකකින් පිටපත් කරන විට වැරදීම් කොතරම් එකතුවුණා ද කිවහොත්, සමහර විට මුල් පිටපතේ කුමන කොටස ද කියාවත් තෝරා ගැනීමට දුෂ්කර විය. වඩාත් බරපතළ ලෙස ලියන්නකුට තමන් පිටපත් කරන පොතෙන් ඡේද මකාදැමීමට හෝ එකතු කිරීමට සිදුවිය හැකිය. එවිට එය ඊළඟ පිටපතේ ඇතුළත් විය හැකිවන අතර, මෙයින් අත්පිටපත්වල වෙනස්කම් නොමැති ද යන්න සසඳන විට ව්‍යාකුලත්වයට පැමිණිය හැකිය. මෙවැනි බොහෝ උදාහරණ බයිබලයේ ඇතුළත් වේ. හොඳින් දන්නා කතාවක් නම් ස්ත්‍රියක් අනාචාරයේ හැසිරීම පිළිබඳව සඳහන් දීර්ඝ ඡේදයයි (මාක් 16, 9 සිට 20 දක්වා පැදි) මේ කිසිවක් පැරණිතම සහ ඉතා විශ්වසනීය අත්පිටපත්වල නැත. යම් කිසිවකු පසුකලෙක ඒවා එකතු කර ඇත.

අනෙක් අතට, මිනිස් මතකය, විශේෂයෙන්ම කුඩාකල සිට පුහුණු කර ඇත්නම් සහ අප පෙළන සියලු අවුල් වියවුල්වලින් තොර ලෝකයක සිටීනම් ඉතාමත් ඉහළ තත්ත්වයෙන් නිවැරදි වේ. බ්‍රාහ්මණයන් නිශ්චිතවම සිදුකළේ මෙයයි. එක් බ්‍රාහ්මණ තරුණයෙක් ඔහුගේ මතකයේ කාවදින තුරුම නැවත නැවත වේද ගීතිකා ගායනා කරන්නට පුහුණු වූයේය. විවිධ උත්සවවලදී, බ්‍රාහ්මණයන්ගේ ආගමික සභාවලදී එකට ගීතිකා ගායනා කළ අතර, එක් අයකුට කොටසක් අමතක වුවහොත් හෝ වැරැද්දක් සිදුවුවහොත්, ඔහුගේ මතකය අනෙක් අය විසින් අවුස්සනවා ඇත. එසේ නැත්නම් වැරැද්ද නිවැරදි කරනු ඇත. එක් පුද්ගලයකුට යම් දෙයක් එකතු කිරීම හෝ මකා දැමීම කොහෙත්ම කළ නොහැකිය. බුදුපියාණන් වහන්සේගේ ශ්‍රාවකයන්ගෙන් සැලකිය යුතු ප්‍රමාණයක් බ්‍රාහ්මණ කුලයේ අය වන අතර ඔවුහු මෙම නිපුණත්වය තමන්ගේ ආගමට ගෙන ආවෝය.[1] බුදුපියාණන් වහන්සේගේ දේශනා රැක ගැනීමට උපකාර කිරීම සඳහා, තවත් ඔවුන්ගේ මතකයට නතුවන ආකාරයට ඒවා සංස්කරණය කරන ලදී. ඒවා පුනරුක්තවලින් සම්පූර්ණ විය. අංක සඳහන් ලැයිස්තු, විධිමත් ඡේදයන්, සම්මතයකට අනුකූල නාමාවලියක්, එළිසමය සහිත පැදි ආදිය ඇතැම්විට වර්තමානයේ බෞද්ධයන්ට කියවීමට වඩාත් වෙහෙසක් ඇතිකරන හේතු වේ. යථෝක්ත ක්‍රමානුකූල ආරක්ෂණ ක්‍රම නිසා පාලි ත්‍රිපිටකය බුදුපියාණන් වහන්සේ ඉගැන්වූ නිවැරදි ලේඛන ඉදිරිපත් කරයි. එසේම කරුණු සහිතව සනාථ කරනු ලබන බොහෝ විද්වත්හු ඒ බවට එකඟ වෙති.[2]

පළමු වරට ත්‍රිපිටකය ලිවීම ආරම්භවූයේ, ක්‍රි. පූ. පළමුවෙනි ශතවර්ෂයේ ශ්‍රී ලංකාවේ අළුවිහාරේදී බව නිතරම සඳහන් වේ. මෙම තොරතුර එන්නේ, ශ්‍රී ලංකාවේ පැරණිතම වංශකථාවක් වූ දීපවංසයේය. කෙසේ නමුත් දීපවංසය සැබැවින්ම සඳහන් කරන්නේ, ත්‍රිපිටකය පළමුවරට ලිව්වේ ශ්‍රී ලංකාවේදී බව පමණි. එය බොහෝ විට මීට පෙර ඉන්දියාවේ ද ලියන්නට යෙදී ඇත (සාධක නොමැත), සමහර විට අශෝක අධිරාජයාගේ පාලන කාලයේදී (ක්‍රි. පූ. 268-232) විය හැකිය. මෙම රජු භක්තිමත් බෞද්ධයකු වූ අතර, බුදුපියාණන් වහන්සේගේ ඉගැන්වීම් ආරක්ෂා කිරීම සහ ව්‍යාප්ත කිරීම පිළිබඳව ඔහුට ඉතා ඕනෑකමක් තිබුණි. ඊටත් වඩා වැදගත් ලෙස, ඔහු ඔහුගේ පොදු ප්‍රතිපත්තියේ අංශයක් වශයෙන් ලේඛන කලාව ඉතා පුළුල් ලෙස භාවිත කළේය. අප අශෝක අධිරාජයා පිළිබඳව දන්නා කරුණු අපට යෝජනා කරන්නේ, ඔහු ත්‍රිපිටකය ලියවීමට සැළැසුවේ නම් එය ඔහු කළ වැදගත්ම දෙය වනු ඇති බවයි. මෙය නිවැරදි නම් එයින් අදහස් වන්නේ, බුදුපියාණන් වහන්සේගේ පරිනිර්වාණයෙන් අවුරුදු 200කට පසු ත්‍රිපිටකය ලිවීමේ කාල පරාසය බවයි. කෙසේ නමුත් තවත් පැරණි ග්‍රන්ථයක් වූ මංජුශ්‍රී මූලකල්පයේ සඳහන් වන්නේ, ත්‍රිපිටකය සැබැවින්ම ලියන ලද්දේ බුදුපියාණන් වහන්සේගේ සමකාලීනයකු වූ අජාසත්ත රජුගේ පුත්‍රයා වූ

උදායිභද්ද රජුගේ රාජ්‍ය කාලයේදී බවයි. මෙය නිවැරදි නම්, ත්‍රිපිටකය පළමුව ලියා ඇත්තේ බුදුපියාණන් වහන්සේගේ පරිනිර්වාණයෙන් වසර 30ක් පමණ කාලයකට පසුව ය. ඒ උන්වහන්සේ හමුවූ මිනිසුන් ඒ වනවිටත් ජීවත් වූ කාලයකයි. සිද්ධිය කුමක් වුවත්, ත්‍රිපිටකය පුළුල් ලෙස ලිඛිතව තිබී ශතවර්ෂ ගණනාවකට පසුවත්, කටපාඩමින් මතකයේ තබා ගැනීමේ සම්ප්‍රදාය අඛණ්ඩව පැවතුණි, ඒ එය වඩාත් විශ්වාසවන්ත ලෙස සැලකීම නිසාය.

පූජනීය බෞද්ධධර්ම ග්‍රන්ථ හඳුන්වන්නේ ත්‍රිපිටකය වශයෙනි, එනම් 'කූඩ තුනක්' යනුවෙනි. 'ත්‍රි' යනු ධර්ම ග්‍රන්ථවල තුන් ආකාර විභජනයකි. පිටක යනු 'කූඩ' වන අතර, (මා අදහස් කරන පරිදි) එසේ භාවිත වූයේ පැරණි ඉන්දියාවේ කම්කරුවන් පස්, වැලි හෝ ගොඩනැගිලි ඉදිකිරීමේ ද්‍රව්‍ය එහා මෙහා ගෙන ගියේ මාරුවෙන් මාරුවට විශාල, වටකුරු, නොගැඹුරු කූඩවල වීම නිසයි. සෑම කම්කරුවකුම පුරවන ලද කූඩා තමන්ගේ හිස මත තබාගෙන, ඊළඟ කම්කරුවා වෙත ඇවිද ගෙන ගොස් එය ඔහු අතට දෙයි. දෙවන පුද්ගලයා එම ක්‍රියාවලියම නැවත සිදු කරයි. ඒ අනුව පැරණි බෞද්ධයන්ගේ මනසේ, භාණ්ඩ කූඩාවල පුරවා හිස මතින් ගෙන ඊළඟ පුද්ගලයාට යැවීම, ධර්ම ග්‍රන්ථ මතකයෙන් එක් පුද්ගලයකුගෙන් තවත් පුද්ගලයකු වෙත යැවීමට සමාන විය.

ත්‍රිපිටකයේ කූඩා තුන, සුත්ත පිටකය, විනය පිටකය සහ අභිධම්ම පිටකය යි. මෙයින් පළමුවෙනි සහ ඉතා වැදගත් සූත්‍ර පිටකයේ, බුදුපියාණන් වහන්සේගේ කථා, දේශනා, සංවාද සහ උන්වහන්සේගේ ශ්‍රාවක - ශ්‍රාවිකාවන් සුළු පිරිසකගේ දේශනා ද ඇතුළත් වේ. දෙවන කොටස වූ විනය පිටකයේ භික්ෂු-භික්ෂුණීන්හට සහ පැවිදි ප්‍රජාවට සිදුකළ පැණවීම් ද ඇතුළත් වේ. තුන්වන කොටස වූ අභිධම්ම පිටකයේ, සුත්ත පිටකයේ ඇතුළත් ප්‍රධාන ධර්මය පිළිබඳ තේමාවල ප්‍රකරණ හෙවත් මාතෘකානුකූල විවරණ අඩංගු වේ. එය බුදුපියාණන් වහන්සේගේ පරිනිර්වාණයෙන් මාස කිහිපයකට පසු පැවැත්වූ පළමුවෙනි ධර්ම සංගායනාවේදී සජ්ඣායනා කළේ නැත. එසේම එම ග්‍රන්ථයේ බුදුපියාණන් වහන්සේට ආරෝපණය කර නැත, නමුත් පසුකාලීන සම්ප්‍රදාය එසේ කර ඇත. ත්‍රිපිටකයේ කාලනිර්ණය අපහසු කරුණකි. නමුත් සුත්ත පිටකයේ සාරය හෙවත් මූල කරුණු බොහෝ විට බුදුපියාණන් වහන්සේගේ කාලයේ සිට, උන්වහන්සේ පරිනිර්වාණයට පත් වී අවුරුදු 50ක් හෝ 100ක් යන තුරු පැමිණ තිබේ. ඇතැම් පසුකාලීන කොටස්, බුදුපියාණන් වහන්සේගේම වචන නොවූවත්, සාමාන්‍යයෙන් උන්වහන්සේගේ අර්ථය පිළිබිඹු කරයි.

ජේසුස්වහන්සේගේ ඉගැන්වීම් නව තෙස්තමේන්තුවේ දෙවන සහ වඩාත් මෑත කොටස වූ බයිබලයේ අන්තර්ගත වේ. බයිබලය යන නාමය පැමිණ ඇත්තේ, පැරණි ග්‍රීක 'ටා බිබ්ලියා' (ta biblia) නම් වචනයෙනි. හුදෙක්

'පොත්' යන අර්ථය එහි අන්තර්ගත වේ. නව තෙස්තමේන්තුව කොටස් හතරකින් යුක්තයඃ සුවිශේෂ දේවවාක්‍ය හතර, අපොස්තල්ගේ ක්‍රියා, සන්දේශය සහ අලුත් තෙස්තමේන්තුවේ අවසාන පොත යනුවෙනි. ජේසුතුමාට විශේෂ වූ ඔහුගේ ජීවිතය සහ මෙහෙවර හා සබැඳි සම්පූර්ණ සහ සියලු දේ මෙම සුවිශේෂ දේවවාක්‍ය හතරේ අඩංගු වේ. පාරම්පරිකව ජේසුස්වහන්සේගේ ඍජු ශ්‍රාවකයන් වූ මැතිව්, මාක්, ලූක් සහ ජෝන්ට ඒ ඒ සුවිශේෂ දේවවාක්‍ය පවරා ඇත. නමුත් ඒ අය සුවිශේෂ දේවවාක්‍ය නිර්මාතෘවරුන් ලෙස සඳහන් වී නැත. එසේම කිසිම විද්වතෙක් ඔවුන් නිර්මාතෘවරුන් ලෙස පිළිගන්නේ නැත. පැරණි පලස්තීනයේ ලිවීම බහුලව සිදුවූ අතර, ජේසුස්වහන්සේට සමහර විට අකුරු නොදත් බව හෝ උපරිමව, යාන්තමට කියවීමට හැකියාවක් තිබෙන්නට ඇත. එසේම එතුමන්ගේ ඍජු ශ්‍රාවකයන්ගෙන් එක් අයකු හැර අනිත් අය කොහෙත්ම අකුරු නොදත්, එකල සිටි සියලු සාමාන්‍ය මිනිසුන් හා සමාන විය. ජේසුස්වහන්සේ පෞද්ගලික හෝ අවිධිමත් රැස්වීම්වල තමන්ගේ ධර්මය දේශනා කළ අතර ඒ කිසිවක්, කිසිදිනක ඍජුව ලියා තැබුවේ නැත. පවතින පැරණිතම ලේඛනවල ජේසුස්වහන්සේට තිබුණේ, පෝල් ගේ බහුශ්‍රැත බව යැයි සඳහන් වුවත්, පෝල් කිසිදිනක ජේසුතුමා හමුවී නැත. නමුත් ජේසුස්වහන්සේ පිළිබඳව තමාට සිහිනයක් තිබූ බව ඔහු කියා තිබේ. පෝල්ගේ ලිපිවලින් මුල්ම ඒවා වූ තෙසාලෝනියන්ස්, ජේසුස්වහන්සේගෙන් පසු වසර 20ක පමණ සිට අදාළ වේ. නමුත් පුදුමයට කරුණ නම් එතුමන්ගෙන් එකද උපුටා ගැනීමක් එහි ඇතුළත් නොවීමය. පෝල්ගේ ලිපි 13න්ම ජේසුස්වහන්සේගේ නිශ්චිත වචන උපුටා දක්වා ඇත්තේ දෙවරක් පමණක් වීම අසාමාන්‍ය ලෙස පෙනෙන්ට පුළුවන. ඒ 1 කොරින්තන්ස් - 11,24-5 සහ 11 කොරින්තන්ස් 12,9 වන අතර, මේ උපුටා දැක්වීම් සුවිශේෂී දේවවාක්‍යවල අඩංගු නොවේ. මෙයින් නිගමනය කළ හැකි එකම දේ නම්, ජේසුස්වහන්සේගේ වචන ඒ වන විටත් ලියා නොමැති බව, හෝ ඒවා ලියා ඇත්නම් පෝල් ඒ පිළිබඳව නොදත් බවයි. එසේ තිබියදීත් පෝල්ගේ ලිපි නව තෙස්තමේන්තුවෙන් 25%ට ආසන්නව තිබේ. ජේසුස්වහන්සේගේ වචන ඇතුළත් මුල්ම ලේඛනය මාක්ගේ සුවිශේෂී දේවවාක්‍යයයි. විද්වතුන් ගණනය කරන්නේ, එය ලියා ඇත්තේ ක්‍රිස්තුන් වහන්සේගෙන් පසු වසර 65 - 75 අතර කාලයක විය යුතු බවයි. අඩුම තරමින් ජේසුස්වහන්සේගේ මරණයෙන් අවුරුදු 30කට පසුයි. සුවිශේෂී දේවවාක්‍ය මැතිව් ක්‍රි. පූ. 80 සහ 90 අතරත්, ලූක් 85 සහ 100 අතරත් සහ ජෝන් 100 සහ 110 අතරත් ලියන්නට ඇත.

## පසුකාලීන ග්‍රන්ථ

ආගම් නිශ්චල නොවේ, ඒවා ජීවත්වන වස්තූන්ය. ඒවා වැඩෙයි, වර්ධනය වෙයි, පරිණත වෙයි සහ සමහර විට නැතිවී යයි. බුදුදහම නිශ්චිතවම ආරම්භ වූයේ බුදුපියාණන් වහන්සේගේ බුද්ධත්වය ලැබීමේ අත්දැකීමත්

(බෝධි) සහ උන්වහන්සේගෙන් ඊට පසු සිදුවූ වසර 45ක මෙහෙවරත් සමගයි. උන්වහන්සේ ඉගැන්වූයේ මතකයෙන් සහ පසුකාලීන පරම්පරාවන්ට පතුරුවා හැරීමෙනුත්ය. එසේම එය වඩාත් ගැඹුරෙන් ගවේෂණය කළ නිසා, ඒ පිළිබඳව සිතූ නිසා සහ ඒ පිළිබඳව විස්තර කළ නිසා, ධර්මය අවබෝධ කළ යුත්තේ කෙසේ ද යන්න සම්බන්ධයෙන් එකඟ නොවීම් අනිවාර්යයෙන්ම මතුවිය. එහි ප්‍රතිඵලයක් වශයෙන් වඩාත් දේශනා, (පාලියෙන් සුත්ත, සංස්කෘතෙන් සූත්‍ර) ඉදිරිපත් වෙමින් නව අර්ථනිරූපණ නිර්මාණය විය. එසේම බොහෝ විට ඒවාට උන්වහන්සේගේ අනුමැතිය ලබා ගැනීම පිණිස ඒවා බුදුපියාණන් වහන්සේට ඉදිරිපත් කරනලදී. නව දේශනා නිර්මාණය කිරීමේ මෙම ක්‍රියාවලිය ශතවර්ෂ ගණනාවක් පැවතුණි. ප්‍රධාන වශයෙන්ම සංස්කෘත භාෂාවෙන් ලියන ලද මහායාන දේශනා මේවාට නිදසුන් වේ. ක්‍රි. පූ. 1වන ශතවර්ෂයේදී පමණ, පසුව කොටස් එකතු කළ සද්ධර්මපුණ්ඩරීක සූත්‍රය නිර්මාණය බොහෝ විට එවැනි මුල්ම ක්‍රියාවක් සේ සඳහන් කළ හැකිය. මෙය ඇතුළුව මහායාන ග්‍රන්ථ බොහොමයක් බුදුපියාණන් වහන්සේ දේශනා කරමින්, බොහෝ අදහස් ඉදිරිපත් කරමින් ඉගැන්වූ බවට සඳහන් වන අතර, ඒවායේ ධර්මය පිළිබඳ බොහෝ නවීකරණයන් ඇතුළත් වේ. කාලයත් සමග මෙවැනි නවීකරණයන් වඩාත් ගරුසරු නැති මෙන්ම මුල්කාලීන ඉගැන්වීම්වලින් වඩාත් දුරස්තර විය. බුදුපියාණන් වහන්සේගේ චරිතාපදානය ද තව තවත් සිද්ධීන් එකතු කරමින් වර්ධනය විය. මුල්කාලීන උදාහරණයක් ලෙස ලලිත විස්තර සඳහන් කළ හැකිය. (ක්‍රි. පූ. 150 සිට 100) මෙහි බුදුපියාණන් වහන්සේ අර්ධ දිව්‍යමය ස්වරූපයෙන් එකින් එක පුදුමාකාර ප්‍රාතිහාර්යයන් ක්‍රියාත්මක කරන අයුරු නිරූපණය කරයි.

බුදුපියාණන් වහන්සේගේ ඉගැන්වීම් ශතවර්ෂ ගණනාවකදී වර්ධනය වන සහ අතිශය දියුණු වන ආකාරයටම, ජේසුස්වහන්සේගේද එසේම සිදු විය. වර්තමානයේ සම්මත බයිබලයට අනුව කිතුදහමට කොටස් හතරක් තිබේ, එය පෙර තිබූ බොහෝ කොටස්වලින් තෝරාගත් කුඩා කොටසක් පමණි. ක්‍රිස්තුන් වහන්සේගෙන් පසු 85 සහ 100 අතරදී ලූක් තමන්ගේ සුවිශේෂ දේවවාක්‍යයට ආරම්භය ලියමින්: "බොහෝ පුද්ගලයන් අප අතර සිදුවූ දේ පිළිබඳව වාර්තාවක් ඉතා හොඳින් ලියා ඇත. එම නිසා මම මේ සියලු කරුණු ආරම්භයේ සිට අධ්‍යයනය කර ඔබ සඳහා විධිමත් විස්තරයක් ලිවීම හොඳයයි සිතුවෙමි".[3] ලූක් දැනසිටි වෙනත් බොහෝ විස්තරවලට කුමක් සිදුවූයේ ද කියා අපි නොදනිමු. එසේම ඔහුට පසුව රචනා කළ බොහෝ දේට ඒවා රචනා කළ අය ජීවත්ව සිටියදීම කුමක් සිදුවූවා ද කියා නොදනී. පීටර්ගේ සුවිශේෂී දේවවාක්‍යය (The Gospel of Peter), මේරිගේ සුවිශේෂී දේවවාක්‍යය (The Gospel of Mary), මාසියන්ගේ සුවිශේෂී දේවවාක්‍ය (The Gospel of Marcion), ගැලවුම්කරුවාගේ සංවාදය (Dialogue of the Saviour), ක්‍රිස්තුස්තුමාගේ සුවිශේෂී දේවවාක්‍යය (The Gospel of the

Nazarene), ෆිලිප්ගේ සුවිශේෂී දේවවාක්‍යය (The Gospel of Philip), අපෝස්තල් පෝල්ගේ යාච්ඤාව (Prayer of the Apostle Paul) සහ බාර්තොලොමව්ගේ (බාර්තොලොමිව්ගේ) සුවිශේෂී දේවවාක්‍යය (The Gospel of Bartholomew) යන අයත් ජේසුස්වහන්සේගේ ජීවිතය සහ ඉගැන්වීම් පිළිබඳව තොරතුරු රැස්කළ වෙනත් අයයි. ජේසුස්වහන්සේ ඉගැන්වූ තොරතුරු ඉහත සඳහන් කෘතිවල අඩංගු වේ. නමුත් ජේසුස්වහන්සේට ආරෝපිත බයිබලයෙහි ඇතුළත් තොරතුරුවලට වඩා සමහර විට විප්ලවකාරී අයුරින් වෙනස් අදහස් ඔව්හු ඉදිරිපත් කරති. මේවා සහ වෙනත් සුවිශේෂී දේවවාක්‍ය ශතවර්ෂ ගණනාවක් ජනප්‍රිය සහ බලවත් වූ නමුත් ක්‍රමයෙන් ඒවායේ සිත්ගන්නා සුලු බව නැති වීමක් හෝ පල්ලිය විසින් මැඩපැවැත්වීමක් සිදු විය.

බුදුපියාණන් වහන්සේගේ මෙන්ම ජේසුස්වහන්සේගේ චරිත කථාවට ද ශතවර්ෂ ගණනාවක් තුළ එකතු කිරීම් සිදුවිය. මැතිව්ගේ සුවිශේෂ දේවවාක්‍යයට අනුව ජේසුස්වහන්සේ  උපන්විට එතුමාගේ දෙමව්පියන් එතුමන් ඊජිප්තුවට ගෙන ගිය බව සඳහන් වෙයි. නමුත් එහිදී එතුමන් කළේ කුමක්ද හෝ එතුමන්ට සිදුවූයේ කුමක්ද යන්න පිළිබඳව විස්තර සඳහන් වී නැත.[4] කෙසේ නමුත් ජේසුස්වහන්සේගේ මරණයෙන් වසර 100ක් තුළ පළමු ඊනියා ළදරු මට්ටමේ පැවති සුභාරංචිය, එතුමන්ගේ ඊජිප්තුවේ තාවකාලික නවාතැන පිළිබඳ විස්තර සැපයීමට ඉදිරිපත් විය. ජේසුස්වහන්සේ සිදුකළ හෝ ඔවුන් ඉදිරියේ සිදුවූ ප්‍රාතිහාර්යයන් ඉතා පුදුමාකාර සහ වැදගැම්මකට නැති ඒවා බව ඔවුහු කියා සිටියහ. ඒවා බුදුපියාණන් වහන්සේ කළා යයි ලලිත විස්තර සහ මහායාන ග්‍රන්ථවල සඳහන් ඒවා හා සමානය. තවත් ජේම්ස්ගේ මුල් අවස්ථා සුභාරංචිය (Infancy Gospel of Jame), මේරිගේ සුභාරංචිය (the Gospel of Mary), තෝමස්ගේ මුල් අවස්ථා සුභාරංචිය (the Infancy Gospel of Thomas), වඩුකාර්මික ජෝසප්ගේ ඉතිහාසය (the History of Joseph the Carpenter) සහ සිරියානු මුල් අවස්ථා සුභාරංචිය (the Syrian Infancy Gospel) ඇතුළුව බොහෝ මුල් අවස්ථා සුභාරංචි ද තිබුණි. ජේසුතුමාගේ මව මේරි පිළිබඳව හා බර්නබාස්ගේ ක්‍රියා (Acts of Barnabas), පීටර්ගේ  සහ ඇන්ඩෲගේ ක්‍රියා (Acts of Peter and Andrew), තිමතිගේ ක්‍රියා (Acts of Timothy)  සහ මාටයාර්ස්ගේ ක්‍රියා (Acts of Martyrs) යනාදිය පිළිබඳව තොරතුරු ද ඇත. ජේසුස්වහන්සේ උපන් අවස්ථාවේ දී ඔහු දැකීමට ගිය බුද්ධිමත් මිනිසුන් තිදෙනා මැගීගේ දේවවාක්‍යය ඇදහීම පිළිබඳව ද තොරතුරු ඇත. වර්තමාන බොහෝ ක්‍රිස්තියානීන් මෙම පූජනීය ග්‍රන්ථ පිළිබඳව කිසිදිනක අසා නැත. නමුත් බොහෝ පැරණි ක්‍රිස්තියානීහු සහ බහුලව පොත්පත් ඇසුරු කළ පුද්ගලයෝ මෙම තොරතුරු විශ්වාස කරති.

මෙම පසුකාලීන සියලු බෞද්ධ සහ ක්‍රිස්තියානි ග්‍රන්ථවල විශ්වසනීයත්වය පිළිබඳ ප්‍රශ්නය උගතුන් සහ ඉතිහාසඥයන්ට පැවරීම හොඳම දෙයයි. කුමන ප්‍රශ්නයක් තිබුණත් සියලුම ක්‍රිස්තියානීහු වර්තමානයේ දී බයිබලයේ සඳහන් සුභාරංචි හතරම ජේසුස්වහන්සේගේ ජීවිතය සහ ඉගැන්වීම් නියෝජනය කරන සැබෑ විස්තරයක් බවට පිළිගනිති. එසේම සියලු බෞද්ධයෝ බුදුපියාණන් වහන්සේගේ ජීවිතය සහ ඉගැන්වීම් සඳහන් සැබෑ තොරතුරු පාලි ත්‍රිපිටකයේ සඳහන් බවට සලකති. ඒ නිසාවෙන් ජේසුස්වහන්සේගේ ජීවිතය සහ ඉගැන්වීම් නව තෙස්තමේන්තුවේ සඳහන් තොරතුරුවලටත්, බුදුපියාණන් වහන්සේගේ ජීවිතය සහ ඉගැන්වීම් පාලි ත්‍රිපිටකයේ සඳහන් තොරතුරුවලටත් මෙම ග්‍රන්ථය සීමා කරනු ඇත.

## උන්වහන්සේලාගේ ජීවිත

ක්‍රිස්තියානි උගතකු වන ජී. ඩබ්ලිව්. හවුස්ටන් (G. W. Houston) මෙසේ ලියා ඇතः "ඓතිහාසික බුදුපියාණන් වහන්සේ බුදුදහම සමග වැදගත් නොවේ. වැදගත් වන්නේ දුක මැඩපැවැත්වීමට ක්‍රමයක් තිබීමයි. බුදුපියාණන් වහන්සේ අනාවරණය නොකළේ නම්, යම්කිසි යෝගියකු එය සොයාගන්නට ඉඩ තිබුණි. ප්‍රධාන නාභිය බුදුපියාණන් වහන්සේ නොවේ, බුදුපියාණන් වහන්සේ ඉගැන්වූ දෙයයි. ක්‍රිස්තියානි ධර්මය සම්බන්ධයෙන් සැබෑවටම වැදගත් වන්නේ ජේසුස්වහන්සේ ඉගැන්වූ දෙය නොව, ඔහු කළ දෙයයි. (අඩු තරමින් ක්‍රිස්තියානි ධර්මය අනුගමනය කරන්නන්ට), ඒ මියගොස් සියලු මිනිසුන් වෙනුවෙන් මළවුන්ගෙන් නැගිටීමයි. ක්‍රිස්තියානි ධර්මය ගැළවුම්කරුවකුට යොමුවෙයි. මෙය ආගම් දෙක අතර ඒවායේ වඩාත් ප්‍රබෝධමත් කරන සහ සංක්ෂිප්ත කරන ස්වරූපයෙන් තිබෙන සැබෑ වෙනසයි."[1] ඉහත උපුටා දැක්වූ යැන්ඩල් සහ නෙට්ලන්ඩ් (Yandell and Netland) ප්‍රකාශන මෙන්ම මෙය එක් දෙයක් හැර, ආගම් දෙක අතර ඇති පැහැදිලිවම අවබෝධවන හරය වෙතට යයි. ජේසුස්වහන්සේ ක්‍රිස්තියානි ධර්මයේ සිදුකළ දෙයම බුදුපියාණන් වහන්සේ බුදුදහමේ නොකළත්, හෝ වැදගත් නොවූවත්, කෙසේ නමුත් බුදුපියාණන් වහන්සේ ඉතා වැදගත් දෙයක් ඉටුකර ඇත. උන්වහන්සේ ඉගැන්වූ දෙයෙහි සත්‍යවාදී භාවය උන්වහන්සේගෙනුත් නොබැඳිය. ඒ ගුරුත්ව බලය පිළිබඳ න්‍යාය නිව්ටන්ටත් නොබැඳිවූවා මෙන්ම, සාපේක්ෂතාව පිළිබඳ න්‍යාය ඓන්ස්ටයින්ගෙනුත් ස්වාධීන වේ. සෑම මිනිසෙක් ම එක් විශේෂ ප්‍රපඤ්චයක් සොයාගෙන, සකස්කර, පැහැදිලි කර සහ ලෝකයට ඉදිරිපත් කර ඇත. බුදුපියාණන් වහන්සේ මෙසේ සඳහන් කර ඇතः "තථාගතයන් වහන්සේලා මේ ලෝකයට පහළ වූවත් නැතත්, මෙම ශාසනය පවතියි, ඇලෙන සුලු ස්වභාවයෙන් යුක්ත ප්‍රපඤ්චය, මෙම අඛණ්ඩ රටාව සහ ඒවායේ සාමාන්‍ය තත්ත්වාරෝපිත ස්වභාවය - මෙය තථාගතයන්

වහන්සේලා සොයා ගනිති, අවබෝධ කර ගනිති, සහ එසේ කර, එය පෙන්වා දෙති, උගන්වති, කරුණු දක්වති, විශ්ලේෂණය කරති, පැහැදිලි කරති, සහ මෙසේ කියති: "ඔබම සොයා බලන්න."[2] කෙසේ නමුත් බුදුපියාණන් වහන්සේගේ ජීවිතය සහ නිදර්ශනය බෞද්ධයන්ට අනුගමනය කිරීමට සහ පිබිදීමක් ඇතිකර ගැනීමට වැදගත් ලෙස මග පෙන්වන දිනුම් කණුවක් වෙයි. බුදුපියාණන් වහන්සේ විසින් අනාවරණය කරන ලද සත්‍යයන්ට ඒවා මානව මිණුමක් එකතුකර ධර්මයේ පරිණාමය සම්බන්ධ බලපෑම් පැහැදිලි කරයි. පුද්ගලයකු තිසරණය සරණ යෑමට පොරොන්දු වෙමින් ආර්ය අෂ්ටාංගික මාර්ගයේ යෑම ආරම්භ කරන්නේ මේ නිසාය; " මම බුදුන් සරණ යමි (බුද්ධං සරණං ගච්ඡාමි)", මෙසේ කරමින් පුද්ගලයෙක් අර්හත් ඵලයට පැමිණීමට මිනිසකුට ඇති හැකියාව පිළිගනියි. ඒ අතරම ඓතිහාසික බුදුපියාණන් වහන්සේගේ ජයග්‍රහණයෙන් සහ නිදර්ශනයෙන් ප්‍රබෝධයට පත්ව ඒවායෙන් තමන් තුළ ආකෘතියක් තනන්නට බලාපොරොත්තු වෙයි. යම් පුද්ගලයකු ධර්ම තුළින් වෙනස් වන්නට පටන් ගන්නා විට, බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ: "ඔහු මා සමීපයේ ඇත - මා ඔහු සමීපයේ ඇත. ඒ ඇයි? ඒ ඔහු ධර්මය දකී, ධර්මය දැකීම තුළින් ඔහු මා දකී".3

## සැබෑ මිනිසුන්

බුදුපියාණන් වහන්සේ සහ ජේසුස්වහන්සේ යන දෙදෙනාම සැබෑ මිනිසුන් බව විද්වතුන් අතර පුළුල් එකඟතාවක් තිබුණත්, දෙදෙනාගෙන් එක් අයකුගේ හෝ පැවැත්ම පිළිබඳව සම්පූර්ණයෙන්ම ඍජු සාක්ෂියක් නැත. බුදුපියාණන් වහන්සේ සම්බන්ධයෙන් මෙය පුදුමයට හේතුවක් නොවේ. පෙර කී ලෙස, ජේසුස්වහන්සේට පෙර සහස්‍ර වර්ෂ භාගයකට ටිකක් අඩුවෙන් උන්වහන්සේ අඩුම තරමින් තවත් ශතවර්ෂයක් එනතුරුත් ලිවීම නොපැවති ප්‍රදේශයක ජීවත් වූ සේක. ජේසුස්වහන්සේ සම්බන්ධයෙන් එය ඉතා පුදුමයට කරුණක් වන්නේ, උන්වහන්සේගේ කාලයේ ලතින් සහ ග්‍රීක, යුදෙව් සහ ඇරමික් භාෂාවලින් රචිත බොහෝ ලේඛන තිබීමය. ඒ කාලයේ සිටි, ඇතැම් අඩුවෙන් වැදගත් මිනිසුන්ගේ සාක්ෂි බොහෝ විට සතුටුදායක විය. උදාහරණ වශයෙන් ජේසුස්වහන්සේ විනිශ්චය කළ රෝම ජාතික පොන්ටියස් පිළිබඳව කරනලද සඳහනක් 1961දී ඊශ්‍රාලයේදී, ලතින් ශිලාලේඛනයකින් හමුවී ඇත. ජේසුස්වහන්සේ දැනගෙන සිටි යුදෙව් ජාතික පූජක කයිෆස්, ජේසුස්වහන්සේ අත්අඩංගුවට ගත් පසු උන්වහන්සේ පිළිබඳව සඳහන් කළ ශිලා ලේඛනයක් 2011දී සොයාගෙන ඇත. නමුත් ජේසුස්වහන්සේ ඉතා ප්‍රකට බව බයිබලයේ සඳහන් වුවත්, තත්කාලීන වාර්තාවල ඒ පිළිබඳව සඳහනක් නැත. ජේසුස්වහන්සේගේ මරණයෙන් වසර 60කට පමණ පසු ඉතිහාසඥ ජෝසප්, ජේසුස්වහන්සේ පිළිබඳව

සඳහන් කරයි. නමුත් මේවායෙන් දෙවන සහ දීර්ඝතම ඒවා, පසුකාලීනව එකතු කළ හෝ පසුකාලීනව ක්‍රිස්තියානීන් ජේසුස්වහන්සේගේ පැවැත්ම සඳහා සාක්ෂි 'නිර්මාණය' කිරීමට උත්සාහ කරමින් කොටස් ප්‍රකාශය සඳහා සංස්කරණය කරන්නට ඇතැයි බොහෝ විද්වත්හු සලකති. ජේසුස්වහන්සේ පිළිබඳ පැරණිතම දොස් පැවරිය නොහැකි සහ ස්වාධීන සාක්ෂි වන්නේ ජේසුස්වහන්සේගෙන් පසු වසර 112 සහ 115 සිට (ජේසුස්වහන්සේගේ මරණයෙන් වසර 85කට පමණ පසු) රෝමානු ජාතික ප්ලිනී (Pliny) සහ ඉතිහාසඥ ටැසිටස් (Tacitus) විසින් මුල්කාලයේ රචිත කෙටි සඳහනයි.

බුදුපියාණන් වහන්සේ පිළිබඳ මුල්කාලීන ඍජු සාක්ෂි තිබුණේ, ක්‍රි. පූ. 249වන වසරේ සිටයි. ඒ උන්වහන්සේගේ පරිනිර්වාණයෙන් වසර 160කට පමණ පසුවයි. එම වර්ෂයේදී අශෝක අධිරාජයා ලුම්බිනි ගම්මානයේ විශාල ගල් කුළුණක් ඉදි කළේය. මෙම ගම්මානය වර්තමානයේ ඉන්දියාව හරහා තිබෙන මායිමේ කිලෝ මීටර් සුලු ප්‍රමාණයක් ඇතින් නේපාලයේ පිහිටා ඇත. කුළුණ මත තිබෙන ශිලා ලේඛනයේ මෙසේ සඳහන් වේ: " තමන්ගේ මෞලි මංගල්‍යයෙන් වසර 20කට පසු දෙවිවරුන්ට ප්‍රිය ඇති පියදසී රජ (අශෝක) මෙම ස්ථානයට ගොස් වැඳ නමස්කාර කළේය, ඒ ශාක්‍යයන්ගේ මහා ප්‍රාඥයාවූ බුදුපියාණන් වහන්සේගේ උත්පත්තිය සිදුවූයේ මෙතැන නිසාය. ඔහු ගල් රූපයක් සහ කුළුණක් ඉදිකළේ, බුදුපියාණන් වහන්සේ මෙතැන උත්පත්තිය ලැබූ නිසාය. ලුම්බිනිය බදුගෙවීමෙන් නිදහස්වන ගමක් බවට පත් කළ අතර, බදුගෙවිය යුතු වන්නේ, නිෂ්පාදනයකින් අටෙන් එකකට පමණක් විය."

### උන්වහන්සේලාගේ සමාජ පසුතලය

බුදුපියාණන් වහන්සේ සහ ජේසුස්වහන්සේ ජීවත්වූ කාලය සහ දුර අවකාශය ඉතාම දූරස්ථ විය. නිශ්චිත දිනය ස්ථිර නොවූවත්, බුදුපියාණන් වහන්සේ උත්පත්තිය ලැබුවේ ක්‍රි. පූ. 563දී පමණය. මේ වර්ෂයට දශක ගණනාවකට පෙර උන්වහන්සේ උපත ලැබූ බවට සම්ප්‍රදාය විශ්වාසය පළ කරන අතර, මෑත කාලයේ සිදුකළ පර්යේෂණයකින් හැඟවෙන්නේ, උන්වහන්සේ දශක ගණනාවකට පසුව උපත ලබන්නට ඇති බවයි. කෙසේ නමුත්, උන්වහන්සේ උපත ලැබූ ස්ථානය පිළිබඳව මතභේදයක් නැත. එය සිදුවූයේ කපිලවත්පු සහ දේවදහ නගරය අතර ලුම්බිනී නමැති උද්‍යානයේ බව ත්‍රිපිටකයේ සඳහන් වේ. අශෝක රජතුමාගේ ලුම්බිනී ශිලාලේඛනයේ විශ්වාසදායී පුරාවිද්‍යා සාක්ෂියෙන් එය තහවුරු කර ඇත.

එකල මධ්‍යම දේශය (මජ්ඣිම දේස) යනුවෙන් හැඳින්වූ ලුම්බිනිය උතුරු මායිමේ නූතන බිහාර් සහ උත්තර් ප්‍රදේශයේ ඉන්දියානු රාජ්‍යයට අන්‍යෝන්‍ය සම්බන්ධයක් ඇති ගංගා නම් ගඟ සහ යමුනා නදියේ විශාල

නොගැඹුරු මිටියාවතේ පිහිටා ඇත. ඉන්දියාවේ අලුතින් මතුවන ශිෂ්ටාචාරයේ හරිමැද මධ්‍යම දේශයයි. පළමු නගර දියුණු වූයේ මැතදීය, මහාද්වීපයේ වෙළඳාම් ආරම්භ වූ අතර, එයින් වැදගත් සමාජ වෙනස්වීමකට කාලය උදාවිය. මධ්‍යම දේශයට රටවල් දොළොසක් පමණ අයත් විය. ඒ කෝසල, මගධ සහ චම්පා වැනි විශාල සහ වැදගත් අධිරාජ්‍යයන් සහ විවිධ කුඩා කුමාරයන්ගේ පාලනයට අයිති ප්‍රධාන පාලන ප්‍රදේශ වූ මල්ල රජදරුවන්ගේ කුසිනාරා, පිප්ඵලීවන, වේඨදීපක, බුලීන්ගේ අල්ලකප්ප, සහ කෝලියාස්වල දේවදහ යන පත්කරගත් කවුන්සල මගින් පාලනය වූ ඒවාය. බුදුපියාණන් වහන්සේගේ පරිනිර්වාණයෙන් වසර 100ක් ඇතුළත, මගධය මෙම රටවල් බොහොමයක් අවශෝෂණය කරගත් අතර, සම්පූර්ණයෙන් සහ මුළුමනින්ම ඉන්දියාවේ ආධිපත්‍යය ලබා ගනු ලැබීය.

බයිබලය පුරාම ජේසුස්වහන්සේ "නාසරෙත්වල ජේසුස්වහන්සේ" යනුවෙන් සඳහන් කර ඇත. නාසරෙත් නගරයක් වන අතර, එය දැන් උතුරු ඊශ්‍රායලය නම් වේ. ජේසුස්වහන්සේගේ කාලයේදී එය ගැලිලිය ප්‍රදේශයේ පිහිටි අප්‍රකට ගමකි. එය කෙතරම් වැදගත් බවින් අඩුද කිවහොත්, ජේසුස්වහන්සේගෙන් පසු 3වන ශතවර්ෂය වනතුරු යුදෙව් මූලාශ්‍රයවල ඒ පිළිබඳව සඳහන් වී නොතිබුණි. නාසරෙත්වල ජේසුස්වහන්සේගේ පාරම්පරික නිවෙස පිහිටා තිබුණි. ඔහුගේ මව සහ පියා එහි ජීවත් වූ අතර, ඔහු වැඩිහිටියකු වනතුරු එහි ජීවත් වූවේය.[4] කෙසේ නමුත් බයිබලයේ සඳහන් වන්නේ ඔහු උපන්නේ එහි නොවන බවයි. මැතිව් සඳහන් කරන පරිදි, හෙරඩ් රජතුමා නාසරෙත්වල උපන් දරුවකු යුදෙව්වරුන්ගේ රජවන බවට අනාවැකියක් අසා එම කාලයේ එම ගමේ උපන් සියලු පිරිමි දරුවන් මරන ලෙස හේවායන්ට නියෝග කළේය. ඒ එම දරුවා වැඩුණු පසුව තමන් බලයෙන් පහ කරනු ඇත කියා හෝ තමාගේ උරුමය ලබා ගනී යැයි යන බිය නිසාය. දේවදූතයකු මේ පිළිබඳව අනතුරු ඇඟවීමක් ලබාදීමෙන් පසු ජේසුස්වහන්සේගේ දෙමාපියන් ඊජිප්තුවට පලා ගිය අතර, අතරමගදී ජේසුස්වහන්සේ බෙහෙත්ලෙහෙම් නමැති කුඩා නගරයේ තිබූ නවාතැන් පොළක පසුපස පිහිටි අස්හලකදී උපත ලැබුවේය. මේ කථාන්තරය මැතිව් විස්තර කළත්,[5] අනෙක් සුභාරංචිවල එය සඳහන් වන්නේ නැත. එසේම එකල තිබූ ඓතිහාසික මූලාශ්‍රයවල හෙරඩ්ගේ සමූල ඝාතනය පිළිබඳව ද සඳහන්වී නැත. බයිබලය පිළිබඳ විද්වත්හු සියල්ලෝම පාහේ මෙම කථාව ජනප්‍රවාදයක් ලෙස සලකති.

ජේසුස්වහන්සේගේ උපත සිදුවීමට ශතවර්ෂ ගණනාවකට පෙරදී යුදෙව් ග්‍රන්ථ (පරණ තෙස්තමේන්තුව), බෙත්ලෙහෙමේ මිසයියා නමින් ඔවුන් හඳුන්වන උතුම් ගැලවුම්කරුවකු උපත ලබන බව පුරෝකථනය කරන ලදී. එම ගැලවුම්කරුවා ජේසුස්වහන්සේ බව විශ්වාස කළ අතර, සමහර විට ඔහු එම පුරෝකථනයට ගැළපෙන අයුරින් ජේසුස්වහන්සේ බෙත්ලෙහමේදී

ඉපදීමේ කථාව ප්‍රබන්ධ කරන්නට ඇත. ජේසුස්වහන්සේ නාසරෙත්වල උපදින්නට ඇති බව සිතීමට බොහෝදුරට ඉඩ ඇත.

ජේසුස්වහන්සේ දැනසිටි භූමි පථය - යුදෙව්වන් පූජනීය ලෙස සැලකූ දේශය, ජේසුස්වහන්සේගේ ඉපදීමට දශක ගණනාවකට පෙරදී රෝමන් ආධිපත්‍යයේ ඍජු පාලනයෙන් හෝ පැවරුණු බලයෙන් යටත් විය. ඉතාමත් වැදගත්, දේශපාලන වශයෙන් වූ බෙදීම් සිදුවූයේ ගැලිලි, සමාරියා, ජුඩෙයා සහ සිරියාවේය. යුදෙව් ජාතීන් අප්‍රසාදය පළකළ නව නීති, බදු සහ පුරුදු, රෝමන් ජාතීහු හඳුන්වා දුන්හ. එසේම වඩාත් වැදගත් දෙයක් නම් යුදෙව් ජාතීන් ඉතා දැඩි ලෙස වෛර කළ අලුත් දෙවිවරුන් හඳුන්වා දුන්හ. මුළු දේශයම සමාජීය, දේශපාලනමය සහ ආගමික ආතතියෙන් උණුසුම් විය. එසේම බොහෝ විට කැරැලි ගැසීම්වලට ක්‍රමයෙන් ඇදෙමින් තිබුණි. මෙම ගැටළු පිළිබඳව බයිබලයේ බොහෝ සඳහන් තිබේ. ජේසුස්වහන්සේගේ මරණයෙන් වසර 36කට පසු, රෝමන්වරුන්ට එරෙහි වූ ප්‍රබල කැරැලි ගැසීමක් අවසාන වූයේ, යුදෙව් ජාතිකයන්ට පරාජය අත්කරමින් සහ ඔවුන්ගේ පූජනීය නගරය වූ ජෙරුසලම වැනසීමට ලක්කරමින් සහ දෙවියන් වෙනුවෙන් තිබූ අගනා දේවස්ථානයත් සම්පූර්ණයෙන්ම විනාශ කිරීමත් සිදු කරමින් ය.

## උන්වහන්සේලාගේ පෙළපත්

ජේසුස්වහන්සේගේ දෙමව්පියන් නිහතමානී, සාමාන්‍ය මිනිසුන් වුවත්, බයිබලයෙහි සඳහන් වන්නේ, බලවත් යුදෙව් වීරයකු වූ ඩේවිඩ් රජුගේ පෙළපතින් පැවත එන්නකු වශයෙන් ජේසුස්වහන්සේට රාජකීය ලේ උරුමකම් තිබූ බවයි. මෙම රජු ජේසුස්වහන්සේ ඉපදීමට වසර 600කට ටිකක් අඩු කාලයකට පෙර ජීවත් වූ නිසා පවුලේ ලේඛන එතරම් දීර්ඝ කාලයක් තිබීම බොහෝ සෙයින් සිදුවිය නොහැකි දෙයක්ය. ජේසුස්වහන්සේ ඔහුගේ පෙළපත දැන සිටියා විය හැකිය. මැතිව්ගේ සහ ලූක්ගේ සුභාරංචිවල ජේසුස්වහන්සේගේ පෙළපත පිළිබඳව විස්තර තිබේ. නමුත් ඒ දෙකේම සම්පූර්ණයෙන්ම පොදුවේ ගතයුතු දෙයක් නැත. ඒවා බොහෝවිට හිතුමතයකි.[6]

බුදුපියාණන් වහන්සේ උපත ලැබුවේ ශාක්‍ය රටේ ය. එහි ජීවත් වූ මිනිසුන් ශාක්‍යයන් වූ නිසා ඒ කුඩා රටට එම නාමය ලැබුණි. එය මධ්‍යම දේශයේ උතුරු මායිමේ විශාල රාජධානියක් වූ කෝසල සහ වජ්ජි රාජ්‍ය සන්ධානය අතර පිහිටා ඇත. මෙය වර්තමාන උතුරු ඉන්දියානු දේශය වන උත්තර ප්‍රදේශයේ උතුරු - නැගෙනහිර මායිමේ සහ නේපාලයේ මායිම හරහා පහත්බිම් ප්‍රදේශයට අනුරූපී වේ. තමන්ගේ දෙවන රැජිනගේ කුමන්ත්‍රණයකින් රටින් නෙරපනලද අඩක් ජනපුරාණ ඔක්කාක රජුගේ

පුත්‍රයන්ගෙන් පැවත එන්නන් ලෙස ශාක්‍යයන් හඳුන්වනු ලැබේ. සාක ගස් තිබෙන වනාන්තරයක පදිංචිවීම නිසා ඔවුන් ශාක්‍යයන් වශයෙන් හඳුන්වනු ලැබූහ.[7] සාක යනු ඉන්දියානු තේක්ක හෙවත් ටෙක්ටෝනා ග්‍රැන්ඩි (Tectona Grandi) වන අතර, එහි කල්පවත්නා ස්වභාවය සහ එම දැව වර්ගයේ මනා පෙනුම නිසා එහි වටිනාකම වැඩිය. එසේම ශාක්‍යයන්, වේදයේ සඳහන් සූර්ය දිව්‍ය පෙළපත වන 'ආදිත්‍ය' පෙළපතින පැවත එන්නන් බව ද කියැවේ.

## උන්වහන්සේලාගේ පවුල් සහ දෙමාපියන්

නාමමාත්‍රව ස්වාධීන වුවත්, ශාක්‍යයන් ඔවුන්ගේ වඩා බලවත් අසල්වැසියා වූ කෝසලයේ බලපෑම්වලට ලක් වූ අතර, කෝසලය පැති දෙකකින්ම ශාක්‍යයන් වටකර තිබුණි. ත්‍රිපිටකයේ මෙසේ සඳහන් වේ: "ශාක්‍යයන් කෝසලයේ රජුගේ පක්ෂපාතීන් ය. ඔව්හු රජුට යටහත් සේවයක් ලබා දෙන අතර, ඔහුට නමස්කාර ද කරති.[8] ඔහුගේ අණ ඉෂ්ට කරති, ඔහුට ප්‍රණාමය පුදති". තමන්වහන්සේගේ මව්බිම කෝසල රජුට[9] හිමි බව වරක් බුදුපියාණන් වහන්සේ පැහැදිලි කළේ මේ නිසාය. බුදුපියාණන් වහන්සේ බැහැදැකීම සඳහා රජතුමා තමන්ගේ නිල රථයෙන් ශාක්‍යයන්ගේ ප්‍රාන්තය වූ මේදලුම්පා නගරයට ගිය බව එක් ග්‍රන්ථයක සඳහන් වේ.[10] ශාක්‍යයන් කෝසලය යටතේ පවතින සහ බදු ගෙවන රජයක් නිසාම, ඔහු එසේ කරන්නට ඇති බව සහතිකය. පෙරදී කෝසලයට පවරාගෙන තිබූ ශාක්‍යයන්ගේ ඉඩම් පිළිබඳ අස්ථිර නිදහස බුදුපියාණන් වහන්සේගේ ජීවිතයේ අවසාන කාලයේ දී හෝ සමහර විට දශක ස්වල්පයකට පසුව අවසානයට පත් විය.

ශාක්‍යයන්හට අභිමානය සහ ආවේගීබව පිළිබඳව ප්‍රසිද්ධියක් තිබූ අතර, ඔවුන්ගේ අසල්වැසියෝ ඔවුන් ගැමියන් ලෙස සැලකූහ.[11] ශාක්‍යයන් කණ්ඩායමක් තමන් පිළිබඳව මෙසේ පැවසූ බව සඳහන්ය: "ශාක්‍යයන් වූ අපි අභිමානවත් මිනිස්සු වෙමු".[12] එසේම, ශාක්‍යයකු වූ උපාලි පසුකාලයේදී බුදුපියාණන් වහන්සේගේ ශ්‍රාවකයකු බවට පත්විය. ඔහු තමන්ගේ පිරිස, "ප්‍රචණ්ඩ පුද්ගලයන්" ලෙස හැඳින්වූයේය.[13] වඩාත් ධනාත්මක ආකල්පයක් ගනිමින්, බුදුපියාණන් වහන්සේ තමන්වහන්සේගේ ඥාතීන් "සම්පත් සහ වීර්යය උරුම කරගත්'[14] අය බව පැවසූහ. උද්ධච්ච, තරුණ බ්‍රාහ්මණයකු වූ අම්බට්ඨ කපිලවත්ථුවේදී බුදුපියාණන් වහන්සේ හමුවූ එක් අවස්ථාවකදී ශාක්‍යයන් තමන්ට දියයුතු ගෞරවය නොදුන් බවට පැමිණිලි කළ විට, උන්වහන්සේ තමන්වහන්සේගේ ඥාතීන් ආරක්ෂා කළහ: "නමුත් අම්බට්ඨ, වටුකුරුල්ලකු වැනි කුඩා සත්ත්වයකු වුවත්, තමන්ගේම කූඩුවේදී තමන්ට කැමැති ආකාරයට කථා කළ හැකිය."[15]

"බුදුපියාණන් වහන්සේ හින්දු බැතිමතකු වශයෙන් ඉපිද, හැදී වැඩී මියගිය බවට" එස්. රාධක්‍රිෂ්ණන් කළ[16] ඔප්පු නොකළ ප්‍රකාශය පසෙකින් තබමු. ශාක්‍යයන් අතර තිබුණේ, කිනම් ආගමක් ද කියා අපි නොදනිමු. ඒ නිසා තරුණ සිද්ධාර්ථයන්ට බලපෑමක් තිබෙන්නට ඇත. කපිලවත්ථුවට ගිය එකම බ්‍රාහ්මණයා එහි තරුණ සමාජ කණ්ඩායම විසින් උසුළු විසුළුවලට ලක් කරන ලදී. පසුගිය වසර 200 තුළදී සෙමෙන් නැගෙනහිර සිට මධ්‍යම දේශයට ඉවත් වෙමින් තිබූ බ්‍රාහ්මණ ආගම ශාක්‍යයන් අතර ස්ථාපිත වෙන්නට තවත් කාලය ඉතිරිව තිබුණි. ශාක්‍යයන්ගේ ආගමික ජීවිතය පිළිබඳව දැනගැනීමට අපට ඇති එකම ඉඟිය නම් බුදුපියාණන් වහන්සේගේ ජෛන ආගම ඇදහූ මාමා කෙනකු වූ වප්ප පිළිබඳව කරන ලද කෙටි සඳහනක් පමණි. ඒ අඩුම තරමින් සමහර ඉහළ පැලැන්තියේ ශාක්‍යයන්, අබ්‍රාහ්මණික නව්‍ය නිකායයන් කෙරෙහි ආකර්ෂණය වූ බවයි. බොහෝවිට බහුතරයක් ශාක්‍යයන්, වර්තමානයේ 'Animists' යනුවෙන් හඳුන්වන, තමන්ගේම ප්‍රාදේශීය දෙවිවරුන් සහ ආත්ම වන්දනා කරන්නන් වන්නට ඇත. සජීව සහ අජීව හැම දෙයෙහිම ආත්මයක් ඇති ලෙස අදහන්නන් හෝ තමන්ට ඵලදායී ස්ථානීය භූතයන්ට වඳින්නන් ලෙසයි.

බුදුපියාණන් වහන්සේගේ (ගෝතම බෝසතාණන් වහන්සේගේ) පියා - 'පිරිසුදු බත' යන අර්ථය හිමි ශුද්ධෝදන, උන්වහන්සේගේ මව වූ මහාමායා සහ මහාප්‍රජාපතී ගෝතමී යන දෙදෙනා හා විවාහ විය. ජන සම්මතයට අනුව, ශුද්ධෝදන ශාක්‍යයන්ගේ රජ වූ නමුත්, මෙය පැරණිතම වාර්තාවල එකඑල්ලේ ම සඳහන් වී නැත. බෝසතාණන් වහන්සේ කුමාරයෙක් (රාජකුමාර) ලෙස ඒවායේ හඳුන්වා නැත. එහෙත් එක් ස්ථානයක එතුමන්ගේ පියා 'රාජ' යනුවෙන් හඳුන්වා ඇත. රාජ යන වචනය සාමාන්‍යයෙන් 'රජු' යනුවෙන් පරිවර්තනය වී ඇත. නමුත් ක්‍රි.පූ. 5 වන ශතවර්ෂයේදී 'රාජ' යන වචනය තවදුරටත් එහි පැරණි අර්ථය වූ 'පාලකයා' හෝ 'ප්‍රධානියා' යන්න කිසිම 'රාජකීය ඇඟවීමක්' නොමැතිව රඳවාගෙන තිබේ. බුදුපියාණන් වහන්සේ තමන්වහන්සේගේ පියා රජ යනුවෙන් හැඳින්වීමට තිබුණු බොහෝ ස්ථානවලදී එසේ නොකළහ. උදාහරණ වශයෙන් බිම්බිසාර රජු උන්වහන්සේගෙන් පවුල සහ උත්පත්තිය පිළිබඳව විමසූ විට හුදෙක් උන්වහන්සේ පිළිතුරු දුන්නේ, තමන්වහන්සේ ශාක්‍ය පවුලකින් පැවත එන බවයි.[17] ශාක්‍යයන්ට 'රාජ කත්තාරෝ' - 'රජුන් තනන්නන්' නමින් මිනිස් කණ්ඩායමක් තිබූ බව ප්‍රසිද්ධය. මෙම සමූහය බොහෝදුරට තමන්ගේ නායකයා, නියමකරගත් කාලයකට හෝ මෙම සමූහයට ඔහු පිළිබඳව විශ්වාසය ඇතිතාක් තෝරා පත්කර ගනිති.[18] වරක් කපිලවත්ථුවේ නව සභා ශාලාවක් (සන්ථාගාරයක්) ආරම්භ කිරීමේ උත්සවයකට බුදුපියාණන් වහන්සේට ආරාධනය කළවිට එම ස්ථානයට එම කටයුත්ත මෙහෙයවන්නට එහි රැස් වූ 'නායකයන් තනන්නන්' අතර ප්‍රධානියා, රැස්වීමේ මූලාසනයට 'ජ්‍යෙෂ්ඨයා'[19] ලෙස සහභාගි විය. එම

නිසා බුදුපියාණන් වහන්සේ වංශාධිපති හෝ පාලන පංතියේ පවුලකින් පැවත ආ  බව අපට පැවසිය හැකිය. ශුද්ධෝදන පිළිබඳව ත්‍රිපිටකයේ ඇත්තේ කෙටි සටහන් තුනක් පමණක් බවත් සඳහන් කිරීමත් වැදගත් වේ.[20] උන්වහන්සේගේ තරුණ විය පිළිබඳව ජීවිතයේ පසුකාලයේදී සිහිපත් කරනවිට, උන්වහන්සේ මෙසේ පැවසූහ: "සුමුදු ලෙස ඇතිදැඩි විය, ඉතාම සුමුදු ලෙස ඇතිදැඩි විය, අසාමාන්‍ය අයුරින් සුමුදු ලෙස ඇතිදැඩි විය." උන්වහන්සේ ඉස්තරම් සිල්ක් රෙදි ඇඳ-පැළැඳ සුවඳ විලවුන් ගැල්වූහ. උන්වහන්සේ සතුටු කිරීමට කාන්තා සංගීත කණ්ඩායමක් තිබුණි. පිටත යනවිට උන්වහන්සේ කැටුව යැමට කුඩයක් ඔසවාගත් පුද්ගලයෙක් සිටියේය. එසේම උන්වහන්සේට ප්‍රණීත ආහාර-පාන ලැබුණේය. ග්‍රීෂ්ම, ශීත සහ වර්ෂාකාලය යන සෑම ඍතුවකටම එක බැගින්, මාළිගා තුනක් උන්වහන්සේට තිබූ බව පවසා ඇත.[48] බෝසතාණන් වහන්සේගේ පවුල ධනවත්ය යන හැඟීම මෙයින් ස්ථිර කරයි.

බෝසතාණන් වහන්සේගේ මව වූ මහාමායා මාතාව උන් වහන්සේගේ උත්පත්තියෙන් දින හතකින් මියගිය අතර, ඇය පිළිබඳව ත්‍රිපිටකයේ සඳහනක් නැත. කෙසේ නමුත් උන්වහන්සේගේ සුළුමව වූ මහාප්‍රජාපතී ගෝතමී පිළිබඳව ඊට වඩා සුළු සඳහනක් ඇත. ඒ ඇය "උන්වහන්සේ ගේ මවගේ සොහොයුරිය, උන්වහන්සේගේ සාත්තුසේවිකාව, උන්වහන්සේගේ සුළුමව සහ උන්වහන්සේට මව්කිරි සැපයූ තැනැත්තිය" ආදී වශයෙනි.[21] ශුද්ධෝදන පියාණන් මියගිය විට බුදුපියාණන් වහන්සේ කපිලවත්ථුවට වැඩිය අතර, මහාප්‍රජාපතී සුළුමව තමන්ට භික්ෂුණියක වීමට අවසර ඉල්ලුවාය. නමුත් උන්වහන්සේ එය ප්‍රතික්ෂේප කළහ. ඊට ටික කාලයකට පසු උන්වහන්සේ වේසාලියට වැඩම කළවිට ද මහාප්‍රජාපතී සහ භික්ෂුණීන් වීමට අවශ්‍ය වූ බොහෝ කාන්තාවන්ට ද උන්වහන්සේ අනුගමනය කරන්නට අවශ්‍ය විය. ඔවුන් පැමිණි විට, මහාප්‍රජාපතී ගෝතමියගේ "කකුල් ඉදිමී, අවයව දූවිල්ලෙන් වැසී සහ මුහුණ කඳුළුවලින් දුර්වර්ණ වී" තිබෙනු දැක, ආනන්ද හිමියෝ කාන්තාවන් වෙනුවෙන් බුදුපියාණන් වහන්සේට කථා කිරීමට තීරණය කළහ. අවසානයේ ආනන්ද හිමියෝ "පුරුෂයන් මෙන් කාන්තාවන්ට ද රහත් ඵලය ලබා ගැනීමට නොහැකි ද" කියා බුදුපියාණන් වහන්සේගෙන් විමසූහ. බුදුපියාණන් වහන්සේ මෙසේ පිළිතුරු දුන්හ: " අභිනිෂ්ක්‍රමණය කර කාන්තාවන්ට ද රහත් ඵලය ලබාගත හැකිය." අවසානයේ අනුකම්පාවෙන්, භික්ෂුණී ශාසනය ස්ථාපිත කිරීමට බුදුපියාණන් වහන්සේගේ අවසරය ලැබුණි.[22] බුදුපියාණන් වහන්සේ එසේ කළේ තරමක අකමැත්තකින් ය යන අදහස යම් අයකුට ඇතිවිය හැකිය. නමුත් තමන්ගේ එම ගමන යාමට අධිෂ්ඨානයක් සහිත ශක්තියක් මහාප්‍රජාපතියට තිබූ බවට හැඟීමක් උන්වහන්සේට තිබුණි.

ශාක්‍යයන් පිළිබඳව වඩා හොඳින් පැහැදිලි කරන සහ ඒ අනුව බුදුපියාණන් වහන්සේ සහ උන්වහන්සේගේ පවුල පිළිබඳව සටහන් වන්නේ,

ශාක්‍යයන්ගේ ප්‍රධාන ජනගහණ මධ්‍යස්ථානය වූ කපිලවත්ථුව ගැන ත්‍රිපිටකයේ සඳහන් වන අවස්ථා දෙකක පමණි. එක් ස්ථානයක දී කපිලවත්ථුව ගමක් ලෙසත්, අනෙක් ස්ථානයේදී එහි පදිංචිකරුවන් " පොහොසත්, සශ්‍රීක, මිනිසුන්ගෙන් පිරී ඉතිරී ගිය, විශාල පිරිසක් සහ සංකීර්ණ ලෙස ජනගහනය සපිරි"[23] බව විස්තර කිරීම, හුදෙක් ගමකට වඩා විශාල ලෙස පෙනෙන්නට තිබේ. මෙම විස්තර දෙක අතර පෙනෙන්ට තිබෙන වෙනස විසඳන්නට පුරාවිද්‍යාවේ සොයා ගැනීම්වලට හැකිය. 1980 ගණන්වලදී ක්‍රි.පූ. 7සිට 3වන ශතවර්ෂ කාලයේදී උත්තරා ප්‍රදේශයේ කැන්පූර් දිස්ත්‍රික්කයේ පැරණි ජනාවාස ඉඩම් සම්බන්ධයෙන් පුළුල් සමීක්ෂණයක් පුරාවිද්‍යාඥයෝ සිදු කළහ. ඉඩම් 99කින් 41ක් හෙක්ටයාර් එකකට අඩු ප්‍රදේශයක් ආවරණය වූ අතර, ඉඩම් 40ක් හෙක්ටයාර් එකක් සහ දෙකක් අතර වූ බව ඔවුන්ට දැනගන්නට ලැබුණි. ඒ අනුව ජනාවාස 81කට වඩා වැඩි ප්‍රමාණයකට හෙක්ටයාර් දෙකකට අඩු ප්‍රමාණයක් ලැබුණි. මෙය ගණනය කළ විට මිනිසුන් 500කට වඩා වැඩි නොවිය යුතු විය. ජනාවාස 14කට හෙක්ටයාර් දෙක සහ හතර යන ප්‍රමාණයක් තිබූ අතර, එහි සිටිය යුතු ජනගහනය 500ක් සහ 1000ක් අතර ප්‍රමාණයක් ය. ජනාවාස හතරක හෙක්ටයාර් හතරකට වඩා තිබූ අතර, සිටිය යුතු ජනගහනය 1200ක සහ 1300ක ප්‍රමාණයයි.[24] මෙම සියලු ජනගහන මධ්‍යස්ථාන එකල ප්‍රධාන නගරවලට වඩා ඉතා කුඩා වූ අතර, ඒවා වර්තමානයේ විශාල නගර වශයෙන් වෙනස් විය. කපිලවත්ථුවේ 1300ක ජනගහනයක් සිටිය අතර, විශේෂයෙන්ම එය වෙළෙඳාමේ සහ රජයේ මූලස්ථානයක්ද වූයේ නම්, එය කාර්යබහුල සහ තදබදය ඇතිකරන ස්ථානයක් ලෙස විස්තර කළ හැකිය.

1970 මුල්කාලයේදී කපිලවත්ථුවේ සිදුකරන ලද කැණීම්වලින් බැසගත් නිගමනය වූයේ, එකල ප්‍රමිතිය අනුව පවා එම ප්‍රදේශය මධ්‍යස්ථ එකක් බවයි. කැණීම්වලට ලක් කළ ප්‍රදේශය කුඩා බවත්, මුළු ප්‍රදේශයම ගවේෂණය කළ නොහැකි වූයේ වැඩි ප්‍රදේශයක කෘෂිකර්මයේ යෙදීම නිසා බවත් ඔව්හු අනාවරණය කළහ. සියලු ගෘහයන් මැටි බිත්තිවලින් යුක්ත විය. ගඩොලින් ඉදිකිරීම ආරම්භ වූයේ බුදුපියාණන් වහන්සේගේ කාලයෙන් පසුවය.[25] පසුකාලීනව බෞද්ධ පුරාවෘත්තවල විස්තරවන අන්දමට ශුද්ධෝදනගේ උත්කෘෂ්ට රාජකීය අගනුවරට මෙහි කිසි සම්බන්ධතාවක් නැත.

බුදුපියාණන් වහන්සේගේ පියා මෙන් නොව, ජේසුස්වහන්සේගේ පියා වූ ජෝසප්ට බයිබලයේ ලැබී ඇත්තේ මඳ සඳහනකි. මැතිව්ගේ, ලූක්ගේ සහ ජෝන්ගේ සුභාරංචිවල ඉතා කෙටි සඳහනක් ඇත ද, මාක්ගේ සුභාරංචියේ කිසිම සඳහනක් නැත. ඉතාම පැරණි දේවවාක්‍යය වූ පෝල්ගේ සන්දේශයේ හෙවත් ක්‍රිස්තියානි ධර්මයේ පැරණිතම සටහනේ, එක් ස්ථානයක ජේසුස්වහන්සේ 'ටෙකන්ගේ පුතා' (the tekon's son) යනුවෙන් සඳහන්

වේ. මෙයින් ජෝසප්ගේ වෘත්තිය අපට හෙළි වෙයි. ග්‍රීක භාෂාවෙන් tekon යනු 'වඩුවා' ය. නමුත් සැබැවින්ම එහි අදහස 'සවිකරන්නා' හෝ 'අත්වැඩ කාරයා' ය. එකල පුරුද්දට අනුව, ජෝසප් සමහර විට ඔහුගේ පියාගේ වෘත්තිය අනුගමනය කරන්නට ඇත.

පසුකාලීන ක්‍රිස්තියානි දේවධර්මයට ඇතුළත් කිරීමට ජේසුස්වහන්සේගේ මව වන මේරි කෙතරම් වැදගත් ද යන්න සැලකිල්ලට ගත්විට, බයිබලයේ ඇයට දී ඇති ස්වල්ප අවධානය පුදුමයට කරුණකි. ජෝන්ගේ සුවිශේෂ ධර්මයේ ඇය පිළිබඳව සඳහන් වී ඇත්තේ දෙවතාවකි. එය ද ඇගේ නම සඳහන් නොකරමින් ය.[26] පැරණිතම සුභාරංචි ලියන ලද මාක් ඇය පිළිබඳව දෙවතාවක් සඳහන් කර ඇති අතර, එක් වතාවක පමණක් ඇයගේ නම සඳහන් කර ඇත.[27] මැතිව් සහ ලූක් ස්වල්ප වාරයක් ඇය පිළිබඳව සඳහන් කරයි. ඒ ප්‍රධාන වශයෙන් ජේසුස්වහන්සේගේ උපත පිළිබඳවයි. මේරි පිළිබඳව එකම වැදගත් විස්තරය ලබා දී ඇත්තේ ලූක් විසිනි. ඔහු පවසා ඇත්තේ ඇයගේ විවාහයේදීම ඇය දරුවා පිළිසිඳ ගෙන සිටි බවයි. ජෝසප් මේ පිළිබඳව දැනගත් විට, නිහඬව ඇය දික්කසාද කිරීමට තීරණය කළ විට, ''දෙවියන් වහන්සේ විසින් තමා ගැබ්ගන්වා ඇති බව'' ඇය පවසා ඇත.[28]

## උන්වහන්සේලාගේ සහෝදර - සහෝදරියන්

ජේසුස්වහන්සේ එකල සම්පූර්ණයෙන් ම අපේක්ෂිත දෙයක් වන විශාල පවුලක පළමුවෙනි දරුවා බව බයිබලය සඳහන් කරයි. මාක්ට අනුව ජේසුස්වහන්සේගේ පවුලේ සහෝදරයන් වූයේ ජේම්ස්, ජෝස්, ජූඩ් සහ සයිමන් ය. එසේම ඔහුට ප්‍රමාණය නොදන්නා තරම් සහෝදරියන් සිටි නමුත්, ඒ කිසිවකුගේ නම් සඳහන් වී නැත.[29] ජේසුස්වහන්සේ වයස අවුරුදු 20 ගණන්වල අවසානයේදී අවිවාහකව සිටීම ඉතා අසාමාන්‍ය දෙයකි. විශේෂයෙන්ම පෝල් සඳහන් කරන ආකාරයට ඔහුගේ බාල සොහොයුරෝ විවාහ වී සිටියහ.[30] (1 COR. 9.5) මීට අමතරව ජේසුස්වහන්සේගේ සහෝදර සහෝදරියන් පිළිබඳව තවත් අසම්පූර්ණ තොරතුරු තුනක් පමණක් බයිබලයේ සඳහන් වී ඇත. ජේසුස්වහන්සේ ගැලිලියේ ඉගැන්වීම් කළ අතර, ඔහුගේ සහෝදරයෝ ජුඩේවලට යාමට ඔහු උනන්දු කළහ. පෙනෙන ආකාරයට ඔවුන්ට ඔහු ලජ්ජාවට හේතුවක් වන්නට ඇත. එසේම ඔව්හු ජේසුස්වහන්සේ ඉගැන්වූ දේ හෝ ඔහු කියා සිටින දේ පිළිබඳව විශ්වාස නොකළහ.[31] තවත් අවස්ථාවක ඔහු විශාල පිරිසකට අමතන විට උමතුවෙන් හෝ අසිහියෙන් සිටි බව (exeste. Jn. 71-5¦ Mk.3.20) පවසමින් ඔහු වෙන ස්ථානයකට ගෙනයාමට උත්සාහ කළහ.[32] ජේසුස්වහන්සේ මියයන අවස්ථාවේ අඩුම ගණනේ එක් සොහොයුරෙක්, ජේම්ස් සහ සමහර විට ජූඩ් ද ජේසුස්වහන්සේ පිළිබඳව තිබූ ඔවුන්ගේ

අදහස් වෙනස්කර ගෙන තිබුණි. එයට හේතුව ජේම්ස් මුල්ම පල්ලියේ නායකයකු ලෙස සිටීමයි.[33]

මුල්කාලීන විශ්වාසවලට අනුව, ගෝතමට (සිදුහතුන්ට) පොදු සහෝදරයෙක් සහ බොහෝ ඥාති සහෝදරයෝ ද සිටියහ. ඔවුන්ගෙන් තුන් දෙනකු පිළිබඳව ත්‍රිපිටකයේ සඳහන් වේ, දේවදත්ත, ආනන්ද සහ නන්ද යන අයයි. ගෝතමට සමාන උස සහ මුහුණේ රුව නන්දට තිබූ නිසා, ඔවුන් එකම පරම්පරාවට අයත් ය යන මතය තහවුරු කරයි.[34]

## උන්වහන්සේලාගේ උත්පත්ති

මැතිව් සහ ලූක් සඳහන් කර තිබුණේ, ජේසුස්වහන්සේගේ පිළිසිඳ ගැනීම සිදුවූයේ ප්‍රාතිහාර්යයකින් බවයි. එනම්, දෙවියන් වහන්සේ ඔහුගේ මව ගැබ්ගැන්වීමෙන් බවයි.[35] පුදුමයට කරුණ නම් මුල්කාලීන ක්‍රිස්තියානි ලේඛන, පෝල්ගේ සන්දේශයෙහි සහ මාක්ගේ සුභාරංචිවල සඳහන්, ඉතා වැදගත් සේ පෙනෙන්නට තිබෙන මෙම විස්තරය සඳහන් කිරීමට අපොහොසත් වීමයි.

ජේසුස්වහන්සේගේ උපත වටකරගත් වෙනස් තොරතුරු දෙකක් ඇත. හෙරඩ් රජු අපේක්ෂා කළ සමූලඝාතනය මඟහැරීමට ජෝසප් සහ මේරි නාසරෙත්වලින් පිටවූයේ නැතැයි ලූක් කියයි. නමුත් රෝමන්වරුන් සංගණනයක් කිරීමට නියමිත වූ නිසා, සියලුදෙනා තමන්ගේ උපන් ප්‍රදේශයට පැමිණීම අත්‍යවශ්‍ය විය. බෙත්ලෙහෙම ජෝසප්ගේ පාරම්පරික නිවසයි. යුවළ එහි ගිය අතර, ජේසුස්වහන්සේ උත්පත්තිය ලැබුවේ එම ප්‍රදේශයේ දීය. දරුවාට වන්දනා කළේ, තරුවක මඟපෙන්වීම ලැබූ මැගී හෙවත් බුද්ධිමත් මිනිසුන් තිදෙනා නොව, උපත පිළිබඳව සුරදූතයන් විසින් සුපරීක්ෂාකාරී කරවනු ලැබූ ගොපල්ලන් කණ්ඩායමකි. කිසිම රෝමානු පරිපාලන වාර්තාවක් ජේසුස්වහන්සේගේ උපත සිදුවූ කාලයේ සංගණනයක් සිදුවූ බව සඳහන් නොකරයි. එසේම ලක්ෂ ගණන් මිනිසුන්ට තමන්ගේ උපන් ගමට නැවත ඒමට සංගණනයකින් උපදෙස් දී නැත.

මැතිව්ගේ සුභාරංචියට අනුව, මේරි ගැබ්ගත්තේ විවාහ උත්සවය කාලයේදීය. එසේම කරුණාවන්ත ජෝසප් ඇය විවාහකර ගත්තේය. ඒ සමාජ අවලාදයෙන් ඇය ආරක්ෂාකර ගැනීමටය. ඊජිප්තුවට පලායාමේදී නවාතැන් පොළක පිටුපස ගවමඩුවක ජේසුස්වහන්සේගේ දෙමාපියන් එදින රාත්‍රිය නැවතී සිටින විට, උන්වහන්සේ උත්පත්තිය ලැබූහ. තරුවක මඟ පෙන්වීමෙන් එම නවාතැන් පොළට පැමිණි මැගී හෙවත් ඊනියා බුද්ධිමත් මිනිසුන් තිදෙනා, දරුවාට නමස්කාර කර වටිනා පරිත්‍යාග කළහ. එම කෙටි ගමනින් පසු ඔව්හු වහා නැගෙනහිරට පැමිණියහ.

බුද්ධිමත් මිනිසුන් තිදෙනා හෙවත් මැගීට මඟ පෙන්වූ තරුව පිළිබඳව බොහෝ කල්පිත ඇත. ක්‍රි. පූ. 12දී දිස් වූ (Hayleyzs Comet) හේලීගේ වල්ගාතරුව (ඉතා කෙටි කාලයකට දිස්වන තරුවක්) සහ ක්‍රි. පූ. 5දී නිරීක්ෂණය කරන ලද සුපර්නෝවා තාරකාව (දීප්තිය ඉතා වැඩිවන) පිළිබඳව ද අනුමාන සිදුකර ඇත. සැතපුම් දහස් ගණනක් දුරින් දකින්නට ලැබෙන වස්තුවකට - තරුවක්, හෝ වල්ගා තරුවක් හෝ සුපර්නෝවාවකට, නිවසක්, නගරයක්, දිස්ත්‍රික්කයක් හෝ විශේෂ ස්ථානයක් හෝ රටක් වේවා ඊට මඟපෙන්වීමක් කළ නොහැකිය. මීට අමතරව 'Aster' තරුව මැගී ඉදිරිපිටින් ගමන්කළ බව සහ අවසානයේ ජේසුස්වහන්සේ සහ දෙමාපියන් නවාතැන් ගෙන සිටි නවාතැනට උඩින් කරකැවෙමින් රැඳී සිට නැවැත්වූ බව මැතිව් විශේෂයෙන් සඳහන් කරයි.[36] එසේ නම් එය කුමක් වුවත්, විද්‍යාව හා සම්බන්ධ, තාරකා විද්‍යාත්මක වස්තුවක් විය නොහැකිය.

ගෝතම බෝසතාණන් වහන්සේගේ උත්පත්තිය සම්බන්ධයෙන්, උන්වහන්සේගේ මව දරුවා පිළිසිඳ ගන්නා අවස්ථාවේදී සුදු ඇතකු සිහිනෙන් දුටු බව පසුකාලීන ජනප්‍රවාද දරා සිටියි. බෝසතාණන් වහන්සේගේ උත්පත්තිය සිදුවන අවස්ථාවේදී සිදුවූ යැයි කියනු ලබන විස්මය දනවන සිදුවීම් කිහිපයක් පසුකාලීන ලේඛනයක සඳහන් වී ඇත. මෙම කතන්දර ත්‍රිපිටකයේ සඳහන් නොවේ. අච්ඡරියබ්භුත සූත්‍රයේ වත් නැත.

මෙම සූත්‍රයේ සඳහන් කරන එක් විස්මය දනවන සිදුවීමකට සම්බන්ධ වන්නේ තරුවක් නොව, ආලෝකයකි. එසේම විශේෂයෙන්ම ස්ථානයක් හඳුනාගන්නා ආලෝකයක් නොව, පිටත දර්ශනයක් ආලෝකවත් කරන්නකි.

"බෝධිසත්වයන් වහන්සේ උන්වහන්සේගේ මවගේ ගැබට බැසගන්නා විට දෙවිවරුන්ගේ ආලෝකයට වඩා වැඩි එක් විශාල, මිණිය නොහැකි ආලෝකයකින් ලෝකය බැබළෙන්නට විය. එසේ ම, බලවත් සහ මහේශාක්‍ය වූ හිරු සහ සඳුගේ ආලෝකයට පවා ප්‍රවේශවිය නොහැකි, ලෝක දෙකක් අතර පවතින අඳුරු අවකාශය පවා එම ආලෝකය විසින් බබුළුවනු ලැබී ය. එසේම, එම අඳුරේ සිටි සත්ත්වයෝ එම ආලෝකය නිසා එකිනෙකා හඳුනා ගත්හ. ඔව්හු මෙසේ සිතූහ: "සැබැවින්ම මෙහි වෙනත් සත්ත්වයන් ඇත".[37] බුදුපියාණන් වහන්සේ උත්පත්තිය ලබන මෙම අවස්ථාවේදී සැබෑ එළියක් මතුවූවා යැයි මෙම කථාවෙන් අදහස් කරන්නේ නැත යන්න පෙනී යයි. ඊට වඩා එය සාහිත්‍යමය යෙදුමකි, උපහරණයකි කියා අපට සිතිය හැකි ය. "බුදුපියාණන් වහන්සේ ගේ සම්ප්‍රාප්තිය - ළඟාවීම තුළින්, සත්ත්වයන්ට එකිනෙකා පිළිබඳව හඳුනා ගැනීමට, ඔවුනොවුන් අතර සංවේදනයක් සහ අවබෝධයක් ඇතිකිරීමට වඩාත් හැකියාවක් ඇති වේ යැයි යන්න පවසන ආකාරයකි".

## උන්වහන්සේලාගේ නම්

බුද්ධ යන පදය 'බුජ්කධති' යන ක්‍රියා පදයේ අතීත කෘදන්තයයි. මෙයින් අදහස් කරන්නේ 'අවබෝධ කරගත්' හෝ 'පුබුදු වූ' යන්නයි. එසේම පුද්ගලයකු පිළිබඳව සඳහන් කරමින් එම වචන භාවිත කළවිට, එයින් අදහස් කරන්නේ යමකු යමක් අවබෝධ කළ බව හෝ පුබුදු වූ බවයි. බොහෝ විට ත්‍රිපිටකයේ උන්වහන්සේ 'බුද්ධ' යනුවෙන් හඳුන්වා ඇත. නමුත් එම පදයෙන් කිසිදිනක උන්වහන්සේ තමන්වහන්සේව ආමන්ත්‍රණය කර නැත. උන්වහන්සේව උන්වහන්සේගේ ගෝත්‍ර නාමය වූ 'ගෝතම', 'යහපත් ගෞතම' හෝ 'ශ්‍රමණ ගෞතම' යනුවෙන් හඳුන්වනු ලැබ ඇත. 'ගෝතම' ('ගවයන් ඇති උතුම් කෙනා') යන ගෝත්‍ර නාමයෙන් පිළිබිඹු වන්නේ පැරණි කාලයේ ඉන්දියාවේ පශු වර්ගයේ සතුන් බොහෝ ඇති බව වස්තුව සහ වැදගත් බව මැනීමේ ප්‍රභවයක්ව තිබීමයි. වඩාත් විධිමත්ව බුදුපියාණන් වහන්සේ, භාග්‍යවතුන් වහන්සේ (භගවා), ඉඳහිට - ශාක්‍යයන්ගේ හිරු පෙළපතට යොමුවක් වූ හිරුගේ ඥාතියා (ආදිච්චබන්ධු),[38] සහ වරක් ශාක්‍යයන්ගේ මුනි (ශාක්‍යමුනි) වශයෙන් හඳුන්වා ඇත. උන්වහන්සේ බොහෝ විට තමන්වහන්සේ හැඳින්වූයේ තථාගත යන නමින්ය. එම පදවි නාමයේ අප්‍රකට මුල් අර්ථය වන්නේ, " මෙසේ පැමිණෙන කෙනෙක් සහ මෙසේ ගිය කෙනෙක්" යන දෙකමය. කිසිම දිනක, කිසිම විටෙක බුදුපියාණන් වහන්සේ, තමන් සිද්ධාර්ථ ගෞතම වශයෙන් නොහැඳින්වීම අවධානයට ගතයුතු කරුණකි. සැබැවින්ම, ඉතා පසුකාලීනව ත්‍රිපිටකයට ඇතුළත් කළ අපදානයේ හැර ත්‍රිපිටකයේ කිසිම තැනක සිද්ධාර්ථ යන නම සඳහන් වී නැත. උන්වහන්සේට ලැබුණ නාමය එය විය හැකිය. නමුත්, එය මුල්මකාලීන වාර්තාවල නැත.

ජේසුස්වහන්සේගේ පියා වූ ජෝසප්ට, තමන්ට උපදින්නට සිටින පුත්‍රයාට ජේසු යන නම තබන ලෙස දේවදූතයකු සිහිනෙන් පැවසූ බව බයිබලයේ සඳහන් වේ.[39] මෙම නම පැවත එන්නේ හීබ්‍රෑ 'යෙහොෂුආ' (Yehoshua) යන්නෙහි ග්‍රීක යෙදුම වන 'ලෙසස්' (Lesous) යන්නෙනි. එය ඉංග්‍රීසි බසින් 'ජොෂුආ' (Joshua) යනුවෙන් සහ සිංහල බසින් 'ජේසුස්' යනුවෙන් යෙදේ. ජේසුස්වහන්සේ දන්නා ගම්වාසීන් විසින් සහ අසල්වැසියන් විසින් උන්වහන්සේ, "මොහු වඩුවා නොවේද? මරියාගේ පුතා නොවේද? ජාකොබ්, ජෝසෙප්, ජුදාස් සහ සීමොන් යන අයගේ සහෝදරයා නොවේද?[40] මොහුගේ සහෝදරියනුත් අප අතර සිටිනවා නොවේද?" කියා ඔවුහු උන්වහන්සේ ප්‍රතික්ෂේප කළහ (Mk 6,3). එසේම, උන්වහන්සේ, " මොහු වඩුවාගේ පුතා නොවේද? මොහුගේ මවගේ නම මරියා නොවේද? මොහුගේ සහෝදරයෝ ජාකොබ්, ජෝසෙප්, සීමොන් සහ ජුදාස් නොවෙත්ද?"[41] (Matt 13, 55) යනුවෙන් හැඳින්වුණහ. සමහර විට

ජේසුස්වහන්සේ ග්‍රීසියේ ක්‍රිස්තු යනුවෙන් ආමන්ත්‍රණය කරනු ලැබූහ. එහි අදහස 'ආලේප කරන්නා' වන අතර එහි අර්ථය 'දෙවියන් වහන්සේ විසින් තමන්ගේ කටයුතු කිරීමට තෝරාපත් කරගත් පුද්ගලයා' යන්නයි. එසේම ඔහු රබී (rabbi) - හේබ්‍රෑ බසින් ගුරුවරයා, ස්වාමියා (epistates) සහ සාමිවරයා (kurio) යනුවෙන් ද ආමන්ත්‍රණය විය. මෙම අවසාන පදවිනාම 'මහත්මයා' හෝ 'සර්' යනුවෙන් ද අදහස් කළ හැකිය. භාර්යාවන්ට තමන්ගේ ස්වාමිපුරුෂයන් කුරොස් යනුවෙන් ආමන්ත්‍රණය කළ හැකිය. දෙවිවරුන්ගේ පිළිම ද කුරොස් යන නමින් හැඳින්විණ. කලාතුරකින් ජේසුස්වහන්සේ ඩේවිඩ්ගේ පුත්‍රයා[42] යනුවෙන්ද හඳුන්වනු ලැබූහ. ඒ සිතන පරිදි ඩේවිඩ් රජු හා සම්බන්ධ හැඳින්වීමකි.

## උන්වහන්සේලාගේ ළමාකාලය

ජේසුස්වහන්සේගේ උත්පත්තියෙන් දින අටකට පසු, යුදෙව් පූජනීය නීතියට අනුව, ඔහුගේ චර්මඡේදනය සිදු කරනු ලැබුණි.[43] කාන්තාවකගේ දරු ප්‍රසූතියෙන් දින 40ක් යනතුරු ඇය අපිරිසුදු බව බයිබලය නියමකර ඇත. මේ කාලය ඉකුත් වූ පසු ජේසුස්වහන්සේගේ දෙමව්පියෝ ජෙරුසලමේ පිහිටි වැදගත් පල්ලියට දරුවා රැගෙන ගියහ. එහිදී ඔවුන්ට සයිමන් නැමැති පූජනීය මිනිසකු අහම්බෙන් හමුවිය. ඔහුට ගැළැවුම්කරුවා හමුවන තුරු ඔහු මිය නොයන බව දෙවියන්වහන්සේ පවසා ඇත. දෙවියන්වහන්සේ විසින් යුදෙව් මිනිසුන් බේරාගැනීමට ද රජුට පොරොන්දු වී ඇත. සයිමන් ජේසුතුමා දුටුවිට, මේ පොරොන්දුව සහ බොහෝ ආශාකළ ගැළැවුම්කරුවා බව ඒත්තු ගියේය. එසේම ඔහු ජේසුස්වහන්සේට ආශීර්වාද කළේය.[44]

ජේසුස්වහන්සේට අහම්බෙන් සයිමන් හමුවීමට යම්තරමක් සමාන සිද්ධියක් ගෝතම බෝසතාණන් වහන්සේගේ ළමාකාලයේ ද සිදුවී ඇත. ශාක්‍යයන්ගේ රටේ එක් වනාන්තරයක අසිත නමැති තවුසෙක් ජීවත් විය. එක්දිනක ඔහුට දෙවිවරුන්ගේ ප්‍රීතිමත් ස්වභාවයක් දකින්නට ලැබුණි. එයට හේතුව ඔවුන්ගෙන් විමසූවිට මෙසේ පිළිතුරු දුන්හ: "එක් බෝධිසත්ත්වයෙක්, විශිෂ්ට සහ අසමසම වැදගත් පුද්ගලයෙක් ලෝක සත්ත්වයන්ගේ ශුභසිද්ධිය සහ සතුට පිණිස ලුම්බිනී ශාක්‍ය නගරයේ උපත ලබා ඇත. අප සතුටට පත් වී ඇත්තේ ඒ නිසාය". මෙම දරුවා දැකීමට තද ආශාවක් ඇති වූ අසිත කපිලවත්ථුවට ගියේය. ශුද්ධෝදන ඔහු පිළිගෙන දරුවා වඩා ගැනීම සඳහා දුන්නේය. 'සලකුණු සහ මන්ත්‍ර' පිළිබඳව නිපුණ වූ ඔහු, දරුවා පරීක්ෂාකර උන්වහන්සේ බුද්ධත්වයට (සම්බෝධි) පත්වන බවත්, 'අත්‍යන්ත පිරිසුදු දර්ශනය' (පරම විසුද්ධිදස්සන), සහ සත්‍යය 'බොහෝදෙනා කෙරෙහි අනුකම්පාවෙන්' (බහුජන හිතානුකම්පාය) අනාවරණය කරන බව ඔහු ප්‍රකාශ කළේය. ඊට පසු ඔහුගේ ඇස්වලට කඳුළු

ගලා ආවේය. මෙය දැක එයින් බියට පත් ශුද්ධෝදන අසිතගෙන් දරුවාගේ අනාගතයේ යම් අයහපතක් සිදුවන්නට තිබේ දැයි විමසුවේය. තමන් දුකට පත්වූයේ මේ සියල්ල සිදුවීමට ප්‍රථම තමා මියයන නිසා බව ඔහු පිළිතුරු දුන්නේය.[45] පසුව අසිතගේ කථාවට තවත් විස්තරත්, ඊට අමතරව මුල් ඒවාට වඩා විස්තරත් එකතු විය. දරුවා විශ්වයට අධිරාජයා (චක්කවත්ති) හෝ සම්පූර්ණයෙන්ම ප්‍රබුද්ධ වූ මුනිවරයෙක් (බුද්ධ) වන බව අසිත පැවසූ බව නිතර සඳහන් වේ. මෙම අනාවැකි දෙකෙන් එකක් හෝ ත්‍රිපිටකයේ නැත.

ජේසුස්වහන්සේගේ දෙමාපියෝ යුදෙව් පූජනීය දිනය වන යුදෙව් වසන්ත උත්සවය සැමරීම සඳහා සැම වර්ෂයකම පල්ලියට යති. ජේසුස්වහන්සේට වයස 12 දී ඔව්හු යළිත් එහි ගොස් ආපසු එන්නට සූදානම් වනවිට ජේසුතුමා ඔවුන් සමග නොසිටි හෙයින් ඔහු සෙවීම සඳහා නගරයට ගියහ. දින තුනක් නොඉවසිලිවන්තව ඔහු සොයමින් සිටින විට, පූජකවරයාට සවන්දෙමින් සහ ඔවුන්ගෙන් ප්‍රශ්න අසමින් ඔහු පල්ලිය තුළ සිටිනු දැක ඇත. මෙතරම් තරුණ පුද්ගලයකු එතරම් විශ්වාසයෙන් හා බුද්ධිමත් ලෙස කථා කරන්නේ කෙසේ ද යන්න, බලාසිටි අයට - පෙනෙන ආකාරයට - පුදුමයක් විය. ඔහු මුණ ගැසුණු විට ඔහුගේ අතුරුදන්වීම පිළිබඳව, මේරි ඔහුට චෝදනා කළාය. නමුත් ඔහු මෙසේ පිළිතුරු දුන්නේයː "ස්වාමීන් වහන්සේගේ ආත්මය මා කෙරෙහි ඇත. කුමක් නිසාදː දිළිඳුන්හට සුබ ආරංචිය දේශනා කරනු වස්, උන් වහන්සේ මා ආලේප කළ සේක. වහලුන්ට මිදීම ද, අන්ධයන්ට පෙනීම ද ලැබෙන බව දන්වන්ටත්, පීඩිත වූවන් මුදන්ටත්, ස්වාමීන් වහන්සේගේ ප්‍රසාදය ලත් වසර ප්‍රකාශ කරන්ටත් මා එවා වදාළ සේක."[46] මෙවැනි සුන්බුන් ස්වල්ප වශයෙන් අඩංගු තොරතුරු පෙන්නුම් කරන්නේ, ඉතා කුඩා අවධියේ සිටම ජේසුස්වහන්සේට ආගම පිළිබඳව උනන්දුවක් තිබූ බවයි. නැවත නාසරෙත්වලට පැමිණෙන විට, ජේසුස්වහන්සේ තමන්ගේ දේවගැති ධුරයට සම්බන්ධ කාලයේ ස්ථානීය දහම්සලට ගොස් පැරණි තෙස්තමේන්තුවෙන් ඡේදයක් කියැවූ බව පසුව අපට දැනගන්නට ලැබුණි.[47] සිදුවන්නට හැකිවූවත්, ඔහුගේ පංතියේ සහ සම්භාවිතාවේ පුද්ගලයකු දැනඋගත්වීම එවැනි කාලයක ඉතාමත් අසාමාන්‍යයි. බොහෝ විට ධර්ම ග්‍රන්ථවලින් බොහෝ ඡේදයන් කටපාඩම්කර ඉගෙනගෙන හුදෙක් මතකයෙන් උපුටා දක්වන්නට ඉඩ ඇත. කුමන ආකාරයට සිදු වුවත්, පරණ තෙස්තමේන්තුව පිළිබඳව ඔහුට හොඳ දැනීමක් තිබූ බව එයින් පෙනීයයි.

බෝසතාණන් වහන්සේගේ ළමාකාලය හා තරුණකාලය සම්බන්ධයෙන් අපට ඇත්තේ කෙටි තොරතුරු දෙකක් පමණි. උන්වහන්සේගේ තරුණ විය පිළිබඳව ජීවිතයේ පසුකාලයේදී සිහිපත් කරනවිට, උන්වහන්සේ මෙසේ පැවසූහː "සුමුදු ලෙස ඇතිදැඩි විය, ඉතාම සුමුදු ලෙස ඇතිදැඩි විය, අසාමාන්‍ය අයුරින් සුමුදු ලෙස ඇතිදැඩි විය." උන්වහන්සේ ඉස්තරම් සිල්ක්

රෙදි ඇඳ-පැළැඳ සුවඳ විලවුන් ගැල්වූහ. උන්වහන්සේ සතුටු කිරීමට කාන්තා සංගීත කණ්ඩායමක් තිබුණි. පිටත යනවිට උන්වහන්සේ කැටුව යෑමට කුඩයක් ඔසවාගත් පුද්ගලයෙක් සිටියේය. එසේම උන්වහන්සේට ප්‍රණීත ආහාර-පාන ලැබුණේය. ග්‍රීෂ්ම, ශීත සහ වර්ෂාකාලය යන සෑම ඍතුවකටම එක බැගින්, මාළිගා තුනක් උන්වහන්සේට තිබූ බව පවසා ඇත.[48] ගෝතම බෝසතාණන් වහන්සේගේ පවුල ධනවත් ය යන හැඟීම මෙයින් ස්ථිර කරයි. නැවතත්, උන්වහන්සේම සඳහන් කර ඇති අනෙක් තොරතුර වඩාත් වැදගත් එකක් වේ. එක් දිනක, තමන්වහන්සේගේ පියා වැඩෙහි යෙදී සිටින අයුරු බලමින් ගසක සෙවණේ ඉඳගෙන සිටිනා විට, පුදුමාකාර අත්දැකීමක් ලෙස හඳුන්වන දෙයක් සිදුවී ඇත. පැහැදිලිව පෙනෙන ආකාරයට, මුළුමනින්ම උන්වහන්සේ භාවනානුයෝගී තත්ත්වයකට පත් වී ඇත,[49] උන්වහන්සේගේ දේශනයක එය ධ්‍යාන ලෙස හඳුන්වා ඇත.

බෝසතාණන් වහන්සේගේ තරුණ කාලයේ සිදුවූවා යැයි පවසන ඥාති සහෝදර දේවදත්ත මරන්නට තැත් කළ පාත්තයකු බේරා ගැනීම, මලල ක්‍රීඩා සහ සටන්කාමී ක්‍රීඩා තරග, විවාහය පතා ඇසුර සහ ඊට පසුව යසෝධරා සමඟ විවාහය, සතර පෙරනිමිති අහඹුලෙස හමුවීම ආදී කිසිවක් ත්‍රිපිටකයේ සඳහන් වී නැත.

## උන්වහන්සේලාගේ කායික පෙනුම

ජේසුස්වහන්සේගේ පෙනුම පිළිබඳව කිසිම තොරතුරක් නැත. චිත්‍රවල සෑමවිටම ඔහුගේ රුව සිතුවම් කර ඇත්තේ නිසැකවම බටහිර, යටිරැවුල සමඟ දිගු කෙස් ඇති පුද්ගලයකු ලෙසයි. සැබැවින්ම ඔහු 'සෙමිටික්' ජනවර්ගයෙන් පැවත එන්නෙකි. එමනිසා ඔහුට අඳුරු පැහැති වර්ණයක් සහ කලුකෙස් තිබෙන්නට ඇත. ශාන්ත පාවුළු කියන පරිදි, "පුරුෂයකුට දික් වූ හිසකෙස් තිබීම ඔහුට අගෞරවයක් බව ස්වභාව ධර්මය ඔබට උගන්වා නැද්ද?."[51] ජේසුස්වහන්සේට සම්පූර්ණයෙන්ම හා නිසැකවම තිබුණේ කෙටි කෙස් වන අතර, මුල්ම කාලයේ සියලු නිරූපණවලින් පෙන්වූයේ රැවුල නැති සහ කෙටි කෙස් ඇති පුද්ගලයකු ලෙසයි. වරක් ජේසුස්වහන්සේ නිහඬව මාරුවීම සඳහා පිරිසක් අතරට මුසුවූ විට, කිසිවකුට එය දැනගත නොහැකිවිය, මෙයින් ඇඟවෙන්නේ ඔහුගේ පෙනුම පිළිබඳව ප්‍රකටවී ඇත්තේ හෝ ආකර්ෂණය වී ඇත්තේ ඉතා සුළු වශයෙන් බවයි.[52] ඔහු 'පව් උසුලන්නා' වශයෙන් හඳුන්වනු ලැබූ අතර, 'සන්තාපයේ මිනිසා' (virdolorum) සමඟ සමානකර ඇත. එය පරණ තෙස්තමේන්තුවේ 'දුකෙන් පිරි මිනිසා'[53] යනුවෙන් සඳහන් වී ඇත. මෙම හේතුව නිසා පැරණි ධර්මයට අයත් නොවන ක්‍රිස්තියානි මූලාශ්‍රයවල, ජේසුස්වහන්සේ කිසිදිනක සිනහ නොවූ බව සඳහන් වෙයි.

ජේසුස්වහන්සේගේ කායික පෙනුම සිත් ඇදගන්නා එකක් නොවන බව මුල්කාලීන ක්‍රිස්තියානි ලේඛකයෝ ඒකමතිකව ප්‍රකාශ කළහ. (2වන ශතවර්ෂයේ මුල් කාලයේදී) ඉරාන ජාතිකයෙක් ජේසුස්වහන්සේ "දුර්වල සහ අප්‍රකට මිනිසකු" ලෙස හැඳින්වූයේය. ජේසුස්වහන්සේ අවලක්ෂණ පුද්ගලයකු බවට සාක්ෂි දරමින් ක්‍රිස්තියානි උගතෙක් (184-253) පරණ තෙස්තමේන්තුවෙන් ජේසුස්වහන්සේ පිළිබඳව අනාවැකියක් මෙසේ උපුටා දක්වයි: "ඔහු කෙතරම් අවලස්සන ද කිවහොත්, ඔහු මිනිසකු ලෙස දකින්නට දුෂ්කරය. අපට ඔහු කෙරෙහි සැලකිල්ලක් දක්වන්නට තරම් තේජසක් හෝ රූපශ්‍රීයක් ඔහුට තිබුණේ නැත. අපට ඔහු වෙත යොමුවීමට කිසිම ආකර්ෂණයක් නොවීය. කිසිම කෙනකු ඔහු දෙස බලන්නේවත් නැත". පීටර්ගේ ක්‍රියාකාරකම් (The Acts of Peter) (2වන ශතවර්ෂයේ දෙවන භාගය) "අප අතර ඔහු නිහතමානී සහ පිහිටක් නොමැති පුද්ගලයෙක් ලෙස පෙනී සිටියේය." සමහර විට ක්‍රිස්තියානි මූලාශ්‍රයවල මෙහෙයවීමෙන්, යුදෙව් ඉතිහාසඥයකු වූ ජෝසප් (1වන ශතවර්ෂය) ජේසුස්වහන්සේ මෙසේ හඳුන්වා දුන්නේය: "දුඹුරු වර්ණ, කුඩා පෙනුම, අඩි 3ක් උස, කුදු සහ බුම්මාගත්, දිගු නාසය සහ එකිනෙකට ගැටෙන ඇහිබැම, පෙනුමෙන් සහ ලිහිල් කෙස් සහ නොවැඩුණු යටිරැවුල දකින මිනිසුන් බියට පත්විය හැකිය". ඒවා සත්‍ය නොවේ නම් මේ සියල්ල පැවසීමට හොඳ හේතුවක් නොමැති විය හැකිය. පුද්ගලයකුගේ සදාචාරය සහ ආධ්‍යාත්මික ගුණාංගවලට ඔවුන්ගේ කායික පෙනුම බලපාන්නේ නැති බව මතක තබාගත යුතුය.

ක්‍රිස්තු වර්ෂ 2 සිට 5 දක්වා ගන්ධාර මූර්තිය හැරුණු විට, බුදුපියාණන් වහන්සේගේ රුව නිරූපණය කර ඇත්තේ සාමාන්‍යයෙන් තාත්වික ආකෘතියට වඩා ශෛලීගත ආකෘතියෙන්ය. අදටත් උන්වහන්සේගේ පරිනිර්වාණය ඇතැම්විට නිරූපණය කර ඇත්තේ, උපරිම වයස 25ක් හෝ 30ක් පෙනෙන අයුරින්ය. නමුත් උන්වහන්සේ පරිනිර්වාණයට පත්වූයේ වයස 80දී පමණ බව අපි දනිමු. නමුත් විශ්වාස හැර, බුදුපියාණන් වහන්සේගේ කායික පෙනුම පිළිබඳ බොහෝ සිත්බඳනා තොරතුරු රාශියක් ත්‍රිපිටකය අපට ලබා දී ඇත. කඩවසම්, සහෝදර නන්දට වඩා සෙන්ටි මීටර් 8ක් බුදුපියාණන් වහන්සේ උසින් වැඩි බව අපි දන්නෙමු. බොහෝ විට නන්ද ඈතින් දකින විට බුදුපියාණන් වහන්සේ යැයි වරදවා හඳුනා ගැනීම් සිදුවිය.[53] බුදුපියාණන් වහන්සේගේ සඳහන් කිරීමකටම අනුව, උන්වහන්සේ තරුණ කාලයේදී, උන්වහන්සේගේ අභිනිෂ්ක්‍රමණයට ප්‍රථමව, තමන්වහන්සේට කළු සහ සමහර විට දිගු යටිරැවුලක් තිබූ බව සඳහන්ය.[54] සැමවිටම බුදුපියාණන් වහන්සේගේ පිළිම දිගු කෙස් සමගින් පෙන්වා තිබුණත්, මෙය චිත්‍රරූප චාරිත්‍රයක් මිස, ඓතිහාසික වශයෙන් නිවැරදි නොවේ. අභිනිෂ්ක්‍රමයෙන් පසු අනෙක් සියලු භික්ෂූන් මෙන්ම උන්වහන්සේ "තමන්වහන්සේගේ කෙස් සහ රැවුල් කපන්නට ඇති" අතර උන්වහන්සේ

තමන්වහන්සේගේ හිස සහ මුහුණ අනෙක් භික්ෂූන් මෙන්ම අඛණ්ඩව මුඩු කළ බවට සැක කිරීමට හේතුවක් නැත.

බුදුපියාණන් වහන්සේ විශේෂයෙන්ම කඩවසම් බවට සියලු මූලාශ්‍ර එකඟ වේ. සෝණදණ්ඩ මෙසේ විස්තරකර ඇතː "කඩවසම්, මනා පෙනුම, පැහැපත් සමේ වර්ණය සහ ප්‍රසන්න රූපය සහ මුහුණේ පෙනුම දකින්නට ප්‍රියයි."[55] තවත් ඇසින් දුටුවකු වූ දෝණ, මෙසේ පැවසුවේයː "කඩවසම්, ප්‍රබෝධකරවන, ආත්ම විශ්වාසයෙන් යුතු, සන්සුන්, සම්පූර්ණයෙන්ම මෙල්ල කරන ලද ඇතකුගේ අභිමානය සහ පෙනුමෙන් නිර්මාණය වී තිබුණි".[56] මෙම ස්වභාවික පියකරු පෙනුම උන්වහන්සේගේ ගැඹුරු ආභ්‍යන්තරික නිසල බවින් වැඩිදියුණුවී තිබුණි. තවත් ඇසින් දුටුවෙක් මෙසේ පැවසුවේයː "චමත්කාරජනකයි, සැබැවින්ම විස්මය දනවයි, යහපත් ගෝතමගේ පෙනුම කෙතරම් ශාන්ත ද, කෙතරම් පැහැදිලි ද, ප්‍රභාවත් ද? සරත් ඍතුවේ රන්වන් ජුජුබේ පලතුරක් මෙන් පැහැදිලිය, දීප්තිමත්ය, යහපත් ගෝතමගේ සමේ පැහැයත් එසේමයි".[57] කෙසේ නමුත්, අනෙක් සියලු දෙනෙක් මෙන්ම, බුදුපියාණන් වහන්සේගේ පෙනුමත්, වයස සමඟ දුර්වල විය. උන්වහන්සේගේ වියපත් බව පිළිබඳව ආනන්ද ස්වාමීන් වහන්සේ මෙසේ පැවසූහː "බුදුපියාණන් වහන්සේගේ සමේ වර්ණය තවදුරටත් පැහැපත් සහ ප්‍රභාවත් නැත, උන්වහන්සේගේ අවයව දුබලය, රැළි වැටී ඇත. ශරීරය පහතට නැමී ඇත. ඉන්ද්‍රියයන් වෙනස් වී ඇත".[58] ජීවිතයේ අවසාන මාසවලදී බුදුපියාණන් වහන්සේ තමන්වහන්සේ පිළිබඳවම පැවසූ සේකː "මම දැන් වියපත්මි, මහලු වයසින් යුක්තයි, වැහැරී ඇත්තෙමි, ජීවිත ගමන ගොස් ඇත්තෙමි. අවුරුදු 80 පසුවී මම මගේ ජීවිතයේ අවසානයට ප්‍රවේශ වෙමි. පරණ කරත්තයක් තබාගත හැක්කේ පිරියම් කරමින්ය. එසේම මගේ ශරීරය තවදුරටත් ගෙන යා හැක්කේ පිරියම් කරමින් ය."[59]

## උන්වහන්සේලාගේ භාෂාවන්

බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ පළමු දශකයේ ජීවත් වූ පාලන ප්‍රදේශය, එනම් උතුරු - නැගෙනහිර කෝසලයේ මායිම් ප්‍රදේශයේ භාවිත වූ ප්‍රාදේශීය භාෂාවන් තිබෙන්නට ඇති නමුත්, බුදුපියාණන් වහන්සේ කථා කළේ කුමන භාෂාවෙන් ද කියා දැනගන්නට නැත. බුද්ධත්වය ලැබූ පසු, සෑහෙන දුර ප්‍රමාණයක් සංචාරය කරමින් ධර්මය ඉගැන්වූ නිසා, උන්වහන්සේ බොහෝ භාෂා පිළිබඳ නිපුණත්වයක් ලබා සිටින්නට ඇත. එසේම එම තත්ත්වය තිබූ බවට සාක්ෂි ඇත. විවිධ පාලන ප්‍රදේශවල භාජනයක් හඳුන්වා දීමට විවිධ වචන තිබෙන බව උන්වහන්සේ අවධාරණයට ගත් බව එක් දේශනාවක සඳහන් විය, උන්වහන්සේ එයින් අටක් නම් කළහ.[60] මෙයින් හැඟෙන්නේ, එකල උතුරු ඉන්දියාවේ භාවිත කළ භාෂා සහ ප්‍රාදේශීය භාෂා පිළිබඳව අඩුම තරමෙන් යම්කිසි

නිපුණත්වයක් උන්වහන්සේට තිබුණු බවයි. කෙසේ නමුත් මෙම භාෂාවලින් අප දන්නේ ස්වල්පයක් පමණි, එම නිසා බුදුපියාණන් වහන්සේගේ මව් භාෂාව කුමක් ද කියා අපට කළ හැක්කේ අනුමාන කිරීම පමණි.

තත්ත්වය කුමක් වුවත්, මුල්කාලයේ යම් දිනයක, සමහර විට අශෝක රජු විසින් කැඳවන ලද තුන්වන සංගායනාවේදී, බුදුපියාණන් වහන්සේ විසින් වදාරන ලද සියලු දේ විවිධ භාෂා සහ ප්‍රාදේශීය උපභාෂාවලින් මතක තබාගනිමින් සාමාන්‍යයෙන් අද කාලයේ හඳුන්වන පාලි භාෂාවට හෙවත් මගධ භාෂාවට පරිවර්තනය කර ඇත. එය එකල පුළුල් ලෙස භාවිත කළ භාෂාව ලෙස පෙනෙන්ට තිබේ. මීට ටික කාලයකට පසු පළමුවෙනි ඉන්දියානු ධර්මදූත ස්වාමීන්වහන්සේලා, උන්වහන්සේලාගේ මතකයේ තිබූ හෝ ලේඛනගත කළ ත්‍රිපිටකය ශ්‍රී ලංකාවට ආගමනය කරවූහ. එතැන් සිට එය තවමත් පාලි භාෂාවෙන් ආරක්ෂා වී ඇත. ඉන්දියාවේම, බුදුපියාණන් වහන්සේගේ දේශනා පසුකාලීනව සංස්කෘත භාෂාවට පරිවර්තනය කර, පසුව චීනයට ගෙනගොස් චීන භාෂාවට පරිවර්තනය කරන ලදී. චීන බසට පරිවර්තනය කරන ලද මෙම ග්‍රන්ථ සම්පූර්ණ නොවූවත්, පාලි භාෂාවෙන් තිබෙන ඒවාට සැලකිය යුතු ප්‍රමාණයකින් සමාන වේ. සමහර විට පාලි ග්‍රන්ථවල මතුවන දුෂ්කරතා චීන පරිවර්තනවලට යොමුවෙමින් විසඳා ගත හැකිය.

ජේසුස්වහන්සේ සහ උන්වහන්සේගේ සමීපතම ශ්‍රාවකයෝ පලස්තීනයේ සාමාන්‍ය මිනිසුන්ගේ භාෂාව වූ 'Aramaic' හෙවත් සිරියාවේ භාවිත වූ සෙමිටික් භාෂා අතුරින් එකක්වූ ඇරමෙයික් භාෂාවෙන් කථා කළහ. පලස්තීනය ඇතුළුව, රෝම අධිරාජ්‍යය පුරාම පරිපාලන කටයුතු සහ ඉගැන්වීම් සිදුකළේ ග්‍රීක සහ ලතින් භාෂාවලින් ය. සුභාරංචි හතරේ ම ජේසුස්වහන්සේගේ වචන සියල්ලක්ම පාහේ සටහන් වී ඇත්තේ ග්‍රීක භාෂාවෙන් ය. මෙයින් අදහස් වන්නේ, ඒවා පදනම් වී ඇත්තේ මුල්කාලීන ඇරමෙයික් සටහන් මත බවයි.

බයිබලයේ ඇරමෙයික් වචන සහ වැකිකඩ හතරක් තිබේ. එහි ජේසුස්වහන්සේගේ ම වචන උන්වහන්සේ ගේ මව් භාෂාවෙන් ආරක්ෂා වී තිබේ. දරුවකු සුවපත් කළ විට උන්වහන්සේ, "ටලිතාකුම්" යි ඇට වදාළ සේක. එහි අර්ථයඃ 'දැරිය මම ඔබට කියමි, නැගිටින්න' යනුය. ඉන්පසු ස්වර්ගය දෙස බලා, සුසුම් ලා, "එප්පාතා"යි ඔහුට වදාළ සේක. එහි අර්ථය, 'ඇරේවා' යනු යි. "අබ්බා, පියාණෙනි, ඔබට සියල්ලක් ම හැකි ය; මේ කුසලාන මා කෙරෙන් ඉවත් කළ මැනව; එහෙත් මාගේ කැමැත්ත නොව, ඔබේ කැමැත්ත වේවා"යි වදාළ සේක. පෙරටුවෙන් හා පිටුපසින් ගිය අය " හෝසන්නා! සමිඳුන් නමින් වඩනා මෙතුමාණන්හට ආසිරි වේවා"[61] යි කීහ.

## උන්වහන්සේලාගේ දූත මෙහෙය

ජේසුස්වහන්සේගේ ඉගැන්වීමේ වෘත්තීය ප්‍රගමනයට පෙර, ඔහුගේ ජීවිතයේ ප්‍රභාත්මක පළපුරුද්ද බවට පත්වූයේ ඔහුට බැප්ටිස්ට් නිකායට අයත් ජෝන් හමුවීමයි. ජෝන් සංක්‍රාමී ශ්‍රමණ දේශකයෙකි. ඔහු ඔටුවකුගේ ලොම්වලින් නිම කළ ඇඳුම් ඇඳ, ඉණට පදම්කළ සමෙන් නිමැවූ බඳපටියක් පැළැඳුවේය. එසේම ඔහුගේ ආහාරය වූයේ පළඟැටියන් සහ කැළෑබද මීපැණිය. ඔහු යුදෙව් පූජකවරයන් ගැන ඉතා තියුණු විවේචකයකු වූ අතර, දෙවියන් වහන්සේ නිවාදැමිය නොහැකි ගින්නක ඔවුන් පුළුස්සා දමන බව මිනිසුන්ට පැවසුවේය.[62] එකල සිටි බොහෝ අය මෙන්ම, මානවවර්ගයා වෙත දඬුවම් දීමේ බිහිසුණු තීන්දුව ඉතා ඉක්මනින් දෙවියන් වහන්සේගෙන් බලාපොරොත්තු විය. එසේම ඔහු බව්තීස්මය ලබමින් ඒ සඳහා සූදානම් වියයුතු බව මිනිසුන්ට දේශනා කළේය. එසේ කිරීමට ඔවුන් තමන්ගේ පව්වලින් චාරිත්‍රානුකූලව පිරිසුදු වීමට බව්තීස්මය ලැබිය යුතු බව ඔහු දේශනා කළේය.[63] තමන්ට වඩා ඉහළ පුද්ගලයකු එහි පැමිණ මෙම සිද්ධියට ප්‍රථමව, පවිත්‍ර පැන් (පරක්ලෙටස්) (parakletos)[64] වලින් මිනිසුන් බව්තීස්ම කරනු ලබයි. ජේසුස්වහන්සේ බැප්ටිස්ට් ජෝන්ගේ ශ්‍රාවකයකු, නොඑසේ නම් අඩු තරමින් අගයන්නකු බවට පත් වී ලෝක විනාශය ආසන්න බවට කර ඇති දෙවියන් වහන්සේගේ අනාවැකිය පිළිගෙන තිබෙන බව පෙනී යයි. ජෝන් විසින් සිදු කළ බව්තීස්මය ලැබීම සමහර විට ජේසුස්වහන්සේට ඔහුගේ ජීවිතයේ තීරණාත්මක වෙනසක් වන්නට ඇත. එසේ ම ඔහුගේ දේවගැති ධුරයේ ආරම්භය වන්නට ද ඇත.

ගෝතම බෝසතාණන් වහන්සේ යම් දිනයක අභිනිෂ්ක්‍රමණය කර බලවත් පාලකයකු හෝ උතුම් ආධ්‍යාත්මික ගුරුවරයකු වේ යැයි බිය උන්වහන්සේ ගේ පියාට තිබූ බව ජනප්‍රවාදයේ සඳහන් වේ. දෙවනුව සඳහන් තත්ත්වයට පත්වීමට වඩා, පළමුව සඳහන් තත්ත්වයට පත්වීම සාක්ෂාත් කරගැනීම සඳහා, ශුද්ධෝදන පියාණන් පරිකල්පනය කළහැකි සියලු සැපවිහරණ සහිත අලංකාර මාළිගාවක සිදුහත් කුමරුන් රඳවා තැබුවේය. කෙසේ නමුත්

එක් දිනක තමන්ගේ රථාචාර්යයාගේ උපකාරය ඇතිව, ගෝතම බෝසතුන් තමන්ගේ මාළිගාවෙන් පිටතට පැමිණ, කපිලවස්තුවේ මාර්ග ඔස්සේ ඉදිරියට ගියේය.

මෙම ගමනේදී ඔහුට අහම්බෙන් වියපත් බවින් කුදු බවට පත් මිනිසකු, රෝගී මිනිසකු, ආදාහනය සඳහා ගෙනයන මළමිනියක් සහ ඔබමොබ යන තවුසකු ද හමුවිය. මේ කිසිවක් ඔහු මීට පෙර දැක තිබුණේ නැත. ජීවිතයේ මුහුණ පෑමට සිදුවන සැබෑ තත්ත්වය පළමු වරට ඔහුට දැනගැනීමට මෙම සතර පෙරනිමිති හේතුවිය. එම තත්ත්වයන් අභිබවා යාමට මාර්ගයක් සොයා ගැනීමට කැමැත්තක් ඔහු තුළ ඇතිවිය. ගෝතම මාළිගාවකට සීමාවීම සහ සතර පෙරනිමිති පිළිබඳ කථාව බුදුපියාණන් වහන්සේගේ සෑම චරිතාපදානයක ම පාහේ විස්තර කර ඇතත්, ඒවා ඍජුව ත්‍රිපිටකයෙහි සඳහන් නොවේ. කෙසේ නමුත්, මෙම ප්‍රබන්ධය විකාසනය වන්නට ඇත්තේ කෙසේ ද කියා දැක ගන්නට පහසු වේ.

වරක් බුදුපියාණන් වහන්සේ අතීතය ආවර්ජනය කරන විට උන්වහන්සේ මෙසේ පැවසූහ: "මා බුද්ධත්වය ලබන්නට පෙර, බුද්ධත්වයට පත් නොවූ බෝධිසත්ත්වයකු ව සිටින විට, මමත් ඉපදීම, වියපත් වීම, ලෙඩරෝග සෑදීම, මරණය, දුකට සහ කෙලෙස්වලට යටත් වී සිටින විට, එවැනි දේ ඇති වන්නට හේතු සෙව්වෙමි. නමුත් ඊට පසු මම මෙසේ සිතුවෙමි, 'මා මෙසේ කරන්නේ කුමක් සඳහා ද? ඉපදීමට, වියපත් වීමට, ලෙඩරෝග සෑදීමට, දුකට පත්වීමට, කෙලෙස්වලට යටත්වී සිටියදී සහ ඒවායේ ඇති භයානකත්වය දකිමින් මා සෙවිය යුත්තේ වියපත් නොවීම, ලෙඩරෝග නොසෑදීම, නොමියන, දුකෙන් තොර සහ කෙලෙස්වලින් තොර, බැඳීම්වලින් තොර, උත්තරීතර ආරක්ෂාව වූ නිර්වාණයයි.' එයින් පසුව, තරුණ වියේ කලු කෙස් ඇතිව, තරුණ වියේ ආශීර්වාද උරුමකර ගනිමින් සිටියදී ම, ජීවිතයේ උච්චතම අවස්ථාවේ, මගේ දෙමාපියන්ගේ වැළපීම් සහ විලාප නොසලකමින් මම මගේ හිස සහ රැවුල් මුඬුකර, කසා සිවුරු ඇඳ ගෘහජීවිතයෙන් නිවෙස් අහිමි ස්ථානයකට නික්ම ගියෙමි.[65] පැහැදිලිවම පසු

කාලයකදී වියපත් වීමේ කාරණය වියපත් මිනිසකු ලෙසට, ලෙඩරෝග සෑදීමේ කාරණය රෝගියකු ලෙසට, මරණයට පත් වීමේ කාරණය මළමිනියක් ලෙස, ආදී වශයෙන් වෙනස් වන්නට ඇත. වැදගත් කාරණය නම්, ගෝතම බෝසතුන් සාමාන්‍ය පැවැත්මේ විවිධාකර වෙහෙසකර තත්ත්වයන්ට යම් කාලයකට සංවේදී වූ බවත්, උන්වහන්සේගේ අභිනිෂ්ක්‍රමණය එක් තනි සිද්ධියකින් හේතුකාරක වූ ආවේගයක් නිසා සිදු නොවූ බවත් ය.

## පොළඹවනු ලැබීම

බැප්ටිස්ට් ජෝන්ගෙන් බව්තීස්මය ලැබුණු පසු, ජේසුස්වහන්සේ ජුඩේන් කාන්තාරයට දින 40ක හුදෙකලාවක් ගත කිරීම පිණිස ගියේය. මෙම කාලය තුළ දේවදූතයන් විසින් ඔහුට සේවා සැපයූ අතර, සාමාන්‍යයෙන් එයින් අදහස් වන්නේ දේවදූතයන් ඔහුට ආහාර සහ ජලය ලබාදුන් බවයි. මෙම කාලය තුළ ම යක්ෂයා ඔහු ඉදිරියට පැමිණ ඔහු පොළඹවා ගන්නට උත්සාහ කළේය. පළමුව, යක්ෂයා ප්‍රාතිහාර්යයක් සිදුකරන ලෙස ඔහුට අභියෝග කළේය. ඒ ගල්, පාන්වලට පරිවර්තනය කරන ලෙසයි. ඊටපසු විශාල උස් ස්ථානයකින් පැන ඔහුගේ වැටීම වළක්වා දේවදූතයන්ගේ විශ්වාසය ලබා ගන්නා ලෙස ඉල්ලා සිටියේය. අවසානයේ ජේසුස්වහන්සේ යක්ෂයාට වැඳ නමස්කාර කරන්නේ නම්, මුළු ලෝකයේම ස්වෛරීභාවය ඔහුට ලබාදෙන බව පැවසුවේය.[66] මෙම පෙළඹවීම් තුන සාමාන්‍යයෙන් අර්ථ දක්වන්නේ ජේසුස්වහන්සේගේ අභිමානයට අවධානය කැඳවීම, ඔහුගේ ආගමික විශ්වාසය පරීක්ෂා කිරීම සහ ඔහු තුළ ලෞකික බලය සඳහා ආශාවක් උත්තේජනය කිරීම පිණිස ගත් උත්සාහයක් බවයි. එම සැම අවස්ථාවේදී ම ජේසුතුමා යක්ෂයාගේ ඉල්ලීම් සන්සුන්ව ප්‍රතික්ෂේප කළේය.

බුදුපියාණන් වහන්සේගේ ජීවිතයේ සිදුවීම් පෙළක් ම ජේසුස්වහන්සේගේ පෙළඹවීම් හා යම් ආකාරයකින් සමාන වේ. නිර්වාණය සොයාගෙන යාමේදී දෙවන සහ අවසාන අදියරේදී ගෝතම බෝසතාණන් වහන්සේ ස්වයං-අත්තකිලමථය පුරුදුකළ අතර, එය ක්‍රමයෙන් වඩ වඩාත් අන්තයට පත්විය. මේ අතරට බොහෝ වේලාවක් අපහසු ඉරියව් ගතකිරීම, උපවාස දික්ගැස්සීම් සහ අපවිත්‍ර දේ ආහාරයට ගැනීම ආදිය ඇතුළත් විය.[67] වැයවීමෙන් සහ කුසගින්නෙන් උන්වහන්සේ මියයතැයි පෙනීගොස්, දෙවිවරු  උන්වහන්සේගේ උපවාසය ප්‍රායෝගිකව නොකැඩෙන අයුරින්, උන්වහන්සේගේ සමේ කුප හරහා දිව්‍ය ඕජස් සැපයීමට කැමැත්ත පළ කළහ. බෝසතාණන් වහන්සේ මෙම පිළිගැන්වීම ප්‍රතික්ෂේප කළහ.[68] අවසානයේ උන්වහන්සේගේ ශරීරය තවදුරටත් ඉදිරියට ගෙනයාමට අපහසුවී උන්වහන්සේ ඇද වැටුණි. එවැනි ස්වයං-අත්තකිලමථය අසාර්ථක බව අවබෝධ වී සාමාන්‍ය ආකාරයට නැවත ආහාර ගැනීමට උන්වහන්සේ තීරණය කර, වෙනත් ප්‍රවේශයක් වෙත නැඹුරුවීමට ප්‍රථමව විවේක ගෙන තම ශරීර ශක්තිය නැවත ලබා ගැනීමට ද තීරණය කළහ.[69] උන්වහන්සේ බෝගස යට ඉඳගන්නා විට මාරයා පෙනී සිටියේය. පළමුව, මාරයා බෝසතාණන් වහන්සේගේ උත්සාහය අත්හැර නැවත සාමාන්‍ය ජීවිතයක් ගතකරමින් හුදෙක් "කුසල් වඩමින්" යහපත් පුද්ගලයකු කරවීමට උත්සාහ ගත්තේය. මෙය සාර්ථක නොවූ විට, ඔහු තමාගේ "සේනාව" බෝසතාණන් වහන්සේ වටා රැස්කර උන්වහන්සේට පහර දුන්හ. උන්වහන්සේ සතුව තිබූ සැඟවුණු ඇත්ත දැකීමේ හැකියාව සහ ඍජු අධිෂ්ඨානයෙන් මෙම පහරදීම් මැඩපවත්වා ගත් බව බුදුපියාණන් වහන්සේ පැවසූහ. [70]

බයිබලයේ කතෘවරුන් යක්ෂයා සැබෑ පුද්ගලයකු ලෙස සැලකුවා ද යන්න පිළිබඳව සුළු සැකයක් ඇත. සහස්‍ර වර්ෂ ගණනක් තිස්සේ ක්‍රිස්තියානුවෝ එසේ සිතති. බුදුපියාණන් වහන්සේට ඇතිවූ පෙළඹවීම් සම්බන්ධයෙන් ත්‍රිපිටකයේ ඇතුළත් තොරතුරුවල සඳහන් මාරයා නිර්වාණයේ ඉදිරි ගමන අවුරන බාධකවල කායික සහ මානසික පුද්ගලාරෝපණයකි,[71] මෙය මාරයාගේ "සේනාවට" අඩංගු කරුණුවලින් පැහැදිලි වේ; ඒ ඉඳුරන්

තෘප්තිමත් කිරීම, නොසතුට, කුසගින්න සහ පිපාසය, දැඩි සේ ආශාකිරීම, අලසකම සහ උනන්දුවක් නැති බව, බිය, සැකය, ආත්මවංචාව සහ මුරණ්ඩුබව, ලාභය, කීර්තිය සහ යසස, ප්‍රසිද්ධිය සඳහා ඇති ආශාව සහ අනෙක් අය හෙළාදකිමින් තමන් උසස් ලෙස සිතීම ආදියයි.[72] වෙනත් බොහෝ දේශනාවලද මාරයාගේ දූවරුන් පිළිබඳව සඳහන් වේ, නැවතත් ඔවුන්ගේ නම් ලෙස සඳහන් වන්නේ ඍණ මානසික තත්ත්වයන්ගේ පුද්ගලාරෝපණ වන අතර, ඒ සැබෑ ප්‍රාණීන් නොවේ. දියණියන් ලෙස නම්කර ඇත්තේ, තණ්හාව (තණ්හා), කුසලයෙහි නොඇලීම (අරති) සහ ආශාව (රාග) යනුවෙනි.[73]

## උන්වහන්සේලාගේ ඉගැන්වීමේ ප්‍රගමනය

ජේසුස්වහන්සේ කෙතරම් කාලයක් ජීවත්වූවා ද හෝ එතුමාගේ පූජක ධුරය කෙතරම් කාලයක් තිබුණා ද යන්න නිශ්චිත නැත. එතුමා මරණයට පමුණුවනු ලබන විට වයස අවුරුදු 29ක් හෝ ඊට වඩා අවුරුදු කිහිපයක් වැඩිවන්නට ඇති බව බයිබලය පිළිබඳ විද්වතුන්ගේ සාමාන්‍ය එකඟතාවක් ඇතිවී තිබේ. උන්වහන්සේ කළ සැම දෙයක් ම පළමු සුවිශේෂ දේවවාක්‍ය තුනේ සටහන් වී ඇති ආකාරයට පහසුවෙන් එක් අවුරුද්දකට ගළපා තිබේ. නමුත් අවසානයට ලියන ලද ජෝන්ගේ සුවිශේෂ දේවවාක්‍යයට අනුව, ජේසුස්වහන්සේ පූජක ධුරය තුළදී ඔහු යුදෙව් වසන්ත උත්සව තුනක් පවත්වා තිබේ.

තමන් වහන්සේ ඔබමොබ යන භික්ෂුවක වීමට අභිනිෂ්ක්‍රමණය කළේ වයස අවුරුදු 29දී බව බුදුපියාණන් වහන්සේ පැවසූහ.[74] උන්වහන්සේ බුද්ධත්වයට පත්වූයේ අවුරුදු 35දී බව ගණනය කළ හැකිය. මෙය ඍජුව ත්‍රිපිටකයේ සඳහන් වී නැත. උන්වහන්සේගේ පරිනිර්වාණයට ආසන්නව තිබියදී උන්වහන්සේ වදාළේ තමන්වහන්සේ "වසර 50කට වඩා වැඩි කාලයක්" භික්ෂුවක ලෙස වැඩසිටි බවයි. එසේම උන්වහන්සේට එවිට "වයස 80ක් පමණ"[75] වූ අතර, එය කාලයට අනුව සුවිශේෂ දිගු ආයුෂයකි. මේ අනුව

බුදුපියාණන් වහන්සේ ගේ මෙහෙවර අඩුම තරමින් අවුරුදු 45ක් වත් පවතින්නට ඇති බව ගණනය කළ හැකිය.

## උන්වහන්සේලාගේ සංචාර

ජේසුස්වහන්සේ තමන්ගේ දේවදූත සේවය තුළදී සම්පූර්ණයෙන්ම නිරන්තරව සංචාරයේ යෙදුණ බව පෙනී යයි. ක්‍රි. පූ. 1වන ශතවර්ෂයේ දී රෝමන් ජාතිකයන් පලස්තීනය පුරාම මාර්ග ජාලයක් ඉදිකළ නිසා ජේසුස්වහන්සේගේ සංචාර සාපේක්ෂව පහසුවන්නට ඇත. රෝම නීතිය ද ඉහළ මට්ටමකින් ආරක්ෂාව දියුණු කළ අතර, දුර-ගමන් සංචාරය බොහෝ දුරට ආරක්ෂා සහිත විය, නමුත් එය සැම තැනම සහ සැම විටම එසේ නොවීය. ජේසුස්වහන්සේගේ ජනප්‍රිය උපමා කථාවකට අනුව, කොල්ලකෑමට ලක්වූ, පහර දීමට ලක්වූ, මරණයට ලක්වූ මිනිසාට උපකාර කළ යහපත් මිනිසා, ජෙරුසලමේ සිට ජෙරිචෝ දක්වා තිබූ මාර්ගයේ ගමන් කර ඇත. අනුමාන කරන පරිදි ජේසුස්වහන්සේ උන්වහන්සේගේ උපමා කථාවේ මෙම විස්තර ඇතුළත් කළේ සමහර විට එවැනි සිද්ධීන් කෙටි සහ හොඳ තත්ත්වයේ පවතින මාර්ගවල ද සිදුවී ඇති නිසාය. ජේසුස්වහන්සේගේ සංචාරවලින් උතුරු ප්‍රදේශයේ දීර්ඝතම ගමන සිදුවූයේ සිඩොන්වලට වන අතර, දකුණු ප්‍රදේශයේ දීර්ඝතම ගමන සිදුවූයේ ජෙරුසලමටයි. අහම්බෙන් පමණක් ජෝර්දාන් ගඟෙන් සහ ගැලීලි මුහුදෙන් නැගෙනහිරට නුදුරු ප්‍රදේශයකටද ජේසුතුමා සංචාරය කළේය. ඒ අනුව ජේසුතුමාගේ දූතමෙහෙය වර්ග කිලෝමීටර් 7600ක් පමණ ආවරණය වන්නට ඇත.

බුදුපියාණන් වහන්සේ ජීවත් වූ ප්‍රදේශය වූ මධ්‍යමදේශය, වර්තමාන උතුරු ඉන්දියානු ප්‍රාන්ත රාජ්‍ය වූ උත්තර ප්‍රදේශය සහ බිහාරයට දළ වශයෙන් සමානවන අතර, උතුරේ හිමාලය කන්දෙන් සීමා වේ. බුදුපියාණන් වහන්සේ මෙහි වැඩම කළ බවට ඇත්තේ එක් සඳහනක් පමණි. එක් ඡේදයකින් උන්වහන්සේ ''හිමාල ප්‍රදේශයේ කැළෑබද ගෙපැලකට තාවකාලිකව වැඩමකර සිට ඇත.''[76] යනුවෙන් සඳහන්ය. උත්තර ප්‍රදේශයේ

සහ බිහාරයේ දකුණු මායිමේ මිසාර්පුර් සහ රාජ්මහල් කඳු සහ වින්ධ්‍යාචල් අන්තරය විසින් ඉදිරියට යයි. එමනිසා බුදුපියාණන් වහන්සේ මෙම කඳුවලින් ඔබ්බට හෝ ඒ තුළට කිසිම දිනක වැඩම කිරීමක් සිදුවිය නොහැකිය. උන්වහන්සේ නැගෙනහිර දෙසට වැඩමකළ උපරිම දුර කජංගල ලෙස තවමත් හඳුනාගත හැකිවන අතර, දැන් එය රජ්මහල් අසල පිහිටි කනක්ජොල් වේ, එසේම බටහිර දෙසට වැඩිම දුර, මථුරා නම් වේ, දිල්ලියෙන් දකුණට කිලෝ මීටර් 180ක් පමණ වේ. මෙම ස්ථාන දෙක එකිනෙකා අතර කිලෝ මීටර් 1000ක් පමණ දුරින් පිහිටා ඇත.

බුදුපියාණන් වහන්සේ ගමනින් කෙතරම් දුරට ආවරණය කළා ද යන්න පැවසීම අපහසු ය. නමුත් අවුරුදු 50ක් පාගමනින් වඩින විට උන්වහන්සේ පහසුවෙන්ම ඒ ප්‍රදේශයේ බොහෝ දුරක් ආවරණය කරන්නට ඇත. උන්වහන්සේ ස්ථාන 500කට වඩා වැඩමකළ හෝ පසුකළ බව ත්‍රිපිටකයේ සඳහන් වේ. පුරවර, නගර, ගම්, කඳුබෑවුම්, ගුහා, ගංගා සහ වනාන්තර ආදී වශයෙනි. ඒ අනුව උන්වහන්සේ අඩුම තරමින් වර්ග කිලෝමීටර් 290,000ක් හොඳින් ආවරණය කරන්නට ඇත.

බුදුපියාණන් වහන්සේගේ කාලයේදී ඔබමොබ යන ශ්‍රමණයන් අතර තිබුණේ මෝසම් ඍතුවේ මාස තුනක් එක් ස්ථානයක රැඳී ඉතිරි මාස නමයේදී පාගමනින් වැඩීමේ පුරුද්දය. බුදුපියාණන් වහන්සේ අඩුම තරමින් උන්වහන්සේගේ අවසාන වර්ෂ 20වත්, කෝසලයේ අගනගරය වූ ශ්‍රාවස්තියේ සහ ඒ අවට බොහෝ කාලයක් ගතකරමින් මෙම සම්ප්‍රදාය පිළිපැදීමට පුරුදුවූ සේක. ත්‍රිපිටකයේ බුදුපියාණන් වහන්සේගේ ඇතැම් සැරිසැරුම් විස්තර සටහන් සඳහන්කර ඇත. උදාහරණ වශයෙන්, උන්වහන්සේගේ බුද්ධත්වයෙන් පසු මාස 12 උරුවෙල සිට වාරානසිවලට සමීප ඉසිපතනයට, ආපසු උරුවෙලට සහ එතැන් සිට ගයා සහ ලට්ඨිවන හරහා රජගහට, කිලෝ මීටර් 315ක් පමණ වැඩියහ. ඉතාම දීර්ඝ ගමනක් ලෙස ත්‍රිපිටකයේ සඳහන් වන්නේ රජගහ සිට වේසාලිය හරහා සාවත්ථියටත්, ආපසු කීටාගිරි සහ ආළවි හරහා විකල්ප මාර්ගයෙන්

රජගහට ආපසු වැඩම කිරීමත්ය. මෙම ගමන අඩුම තරමින් කිලෝමීටර් 920ක් වත් වෙයි. උන්වහන්සේගේ අවසාන සංචාරයෙන් උන්වහන්සේ රජගහ සිට නාලන්දාව හරහා පාටලීගම (නූතන පැට්නා) දක්වාත්, පසුව වේසාලිය වෙතත් ගෙන ගියේය. එහිදී උන්වහන්සේ වස්සාන සමයේ මාස තුන එහි වැඩම කළ අතර, අවසානයේ කුසිනාරාව වෙත වැඩම කළහ. අවුරුදු 80ක් වූ[77] බුදුපියාණන් වහන්සේට, කිලෝමීටර් 275ක් පාගමනින් වැඩම කිරීම ඉතා දුෂ්කර සහ පීඩාකාරී දෙයක් විය යුතුය. මෙම ගමන සහ උන්වහන්සේගේ අනෙක් සංචාරවලට කෙතරම් කාලයක් ගතවූවා ද කියා ගණනය කිරීම දුෂ්කරය.

එක් ස්ථානයකින් තවත් ස්ථානයකට වැඩම කිරීමට වැදගත් ප්‍රායෝගික හේතු තිබුණි. අද ලෝකයේ මෙන් අප දන්නා හඳුනන සන්නිවේදන ක්‍රම නොතිබූ ලෝකයක බුදුපියාණන් වහන්සේගේ ඉගැන්වීම් බොහෝ දුරක් සහ පුළුල් ලෙස ප්‍රචාරය වූයේ උන්වහන්සේ තැනින් තැන වැඩමකළ නිසාය. විශේෂයෙන්ම, අලුතින් පැවිදි වූ භික්ෂු භික්ෂුණීන්ට තමන්වහන්සේ සමග පෞද්ගලික හමුවීම වැදගත් බව බුදුපියාණන් වහන්සේ දැන සිටි අතර, උන්වහන්සේ වැඩමකළ දිස්ත්‍රික්ක සහ, කොපමණ කාලයකට ද යන්න තීරණය කිරීමට මේ හේතුව සාධකයක් වූ බව, සිතිය හැකිය.[78] උන්වහන්සේ ඔබමොබ වඩිනවිට, එක් දිස්ත්‍රික්කයකට වැඩමකර, උගන්වා, ශ්‍රාවකයන් බිහිකර, භික්ෂු භික්ෂුණීන් පැවිදිකර, ඊටපසු සමහර විට වසර ගණනාවකට එහි නැවත නොවැඩියහ. එවැනි දිස්ත්‍රික්කයකින් භික්ෂුවකට නැවත උන්වහන්සේ බැහැ දකින්නට අවශ්‍ය වූයේනම්, ඒ අවස්ථාවේ උන්වහන්සේ වැඩමකර සිටින ඕනෑම ස්ථානයකට හුදෙක්ම පිටත්ව යන්නට හැකිවිය.

සෝණ කුටිකණ්ණ පැවිදි වූයේ මහා කච්චාන ස්වාමීන්වහන්සේ යටතේය. වර්ෂයකට පසු උන්වහන්සේට තමන් පේවුණු ධර්මය ඉගැන්වූ ශාස්තෘවරයාණන් හමුවීමට කැමැත්තක් ඇතිවිය. උන්වහන්සේ තමන්ගේ ගුරුවරයාට මෙසේ පැවසූහ: ''මට තවමත් බුදුපියාණන් වහන්සේ හමුවී නැත. මම උන්වහන්සේ කෙබඳු පුද්ගලයෙක් ද යන්න පමණක් අසා

ඇත්තෙමි. ඔබ වහන්සේ මට අවසර දෙන්නේ නම්, මම බුදුපියාණන් වහන්සේ හමුවීමට යන්නෙමි.[79]" ගෘහස්ථ බැඳීම් සහිත ගිහි ශ්‍රාවකයන්ට බුදුපියාණන් වහන්සේ හමුවීම සඳහා දීර්ඝ ගමන් යාමට බොහෝ දුෂ්කරවූ අතර, එම හේතුව නිසා ඔවුන්ට උන්වහන්සේ හමුවීමට සමහර විට වසර ගණනාවක් බලා සිටින්නට සිදුවිය. එක් දුරින් පිහිටි දිස්ත්‍රික්කයක ජීවත්වන පිරිසක් උන්වහන්සේ එම ප්‍රදේශයට වැඩම කළ බවට පුවතක් දැනගත් විට, ඔවුන්ගේ සිත්තුළ ඇතිවන ප්‍රබෝධය සහ උන්වහන්සේගේ ක්‍රමානුකූල සමීපවීම පිළිබඳ පුවත ඔවුන් වෙත ළඟාවූ විට බලාපොරොත්තු වැඩිවූයේ කෙසේද යන්න පිළිබඳවත් සංයුත්ත නිකායේ සෝතාපත්ති සංයුත්තයේ ථපති සූත්‍රයේ යම් අදහසක් ලබා දී ඇත.[80] බුදුපියාණන් වහන්සේ පිළිබඳව සහ උන්වහන්සේ ඉගැන්වූ දේ පිළිබඳව සංචාරය කරන භික්ෂුවකගෙන් ලැබෙන තොරතුරු ඇසූවිට මිනිසුන් තුළ ඇතිවෙන තද ආශාව පිළිබඳව වෙනත් තැනක අපි කියවා ඇත්තෙමු.

වරක් බුදුපියාණන් වහන්සේ චාතුමාවල වැඩසිටින එක් අවස්ථාවකදී දහස් ගණන් භික්ෂූන් වහන්සේලා උන්වහන්සේ බැහැදකින්නට පැමිණ ඇත.[81] කෙසේ නමුත්, බොහෝ සෙයින් සංචාරය කළ උන්වහන්සේ ඒ ඒ අවස්ථාවල වැඩසිටින්නේ කුමන ස්ථානයේ ද කියා සැමවිටම සොයා ගැනීම පහසු නොවීය. බාවරී නම් භික්ෂුවගේ ශ්‍රාවකයන් 16දෙනා ගෝදාවරී, සමහර විට මහාරාෂ්ට්‍ර හරහා උතුරු ඉන්දියාවට ගලායන ස්ථානයේ සිට බුදුපියාණන් වහන්සේ හමුවීම සඳහා පිටත්වීමේ සිත් පිණවන පුවත පාරායන වග්ගයේ අපි කියවා ඇත්තෙමු. පළමුව බුදුපියාණන් වහන්සේ සාවත්ථියේ වැඩසිටින බව අසා ඔව්හු එහි ගියහ. ඔවුන් කෝසම්බි සහ සාකෙත හරහා ශ්‍රාවස්තියට පැමිණෙන විට, බුදුපියාණන් වහන්සේ එතැනින් නික්ම තිබිණ. "පිපාසයෙන් පෙළෙනා මිනිසකු සීතල ජලය ලබා ගැනීමට යන්නාක් මෙන්" ඔවුහු සේතව්‍ය, කපිලවත්ථු, කුසිනාරා, පාවා සහ වේසාලි හරහා උන්වහන්සේ වැඩමකළ මාර්ගය හරහා පාසාණක සිද්ධස්ථානයට (උතුරු ගයාවේ බරබර් කන්දට) පැමිණ වහ වහා එම කන්ද නැග්ගහ[82].

බොහෝ විට බුදුපියාණන් වහන්සේ භික්ෂූන් 500ක් සමග සංචාරය කළ බවට සඳහන් වේ. මෙය සම්ප්‍රදායානුකූල අංකයකි. එහි අදහස 'බොහෝ හෝ හුදෙක් - විශාල භික්ෂු කණ්ඩායමක්' යන්නය. වෙනත් අවස්ථාවල තමන්වහන්සේ සමග කැටුව යන්නන්ට හෝ සහකරුවන්ට නොදන්වමින්, තරමක් වේලාවකට උන්වහන්සේ හුදෙකලාවේ ඔබමොබ වැඩියහ.[83] උන්වහන්සේ සැමතැනම පාගමනින් වැඩිය බවත් පයාග (නූතන අලහබාද්) වැනි විශාල ගංගා හරහා වඩින්නට සිදුවෙන අවස්ථාවලදී පමණක් පාරුවකින් වැඩිය බවත් සඳහන් වේ. සංචාරය කරන විට උන්වහන්සේ සැතපුණේ පාර අද්දර තානායමක, කමතක, මැටිවළං කරුවකුගේ මඩුවක හෝ කිසිම තැනක් නොතිබුණොත් එළිමහනේ ''කොළ අතු විසුරුවන ලද පොළොවේ"[84] යනාදී වශයෙනි. වරක් උන්වහන්සේ කුරු රටේදී කුඩා මඩුවක වැඩ සිටියහ. එහි පොළොවේ අතුරා තිබුණේ තණ කොළයි.[85] උන්වහන්සේ වරක් තමන්වහන්සේගේ උපන්ගමවූ කපිලවත්ථුවට ආපසු වඩිනවිට උන්වහන්සේට නවාතැන් ගන්නට තැනක් නැතිවූ විට, භරණ්ඩු භික්ෂුවගේ සරල අසපුවේ නවාතැන් ගන්නට සිදුවිය.[86]

වරක් බුදුපියාණන් වහන්සේ භික්ෂූන් අමතා මෙසේ පැවසූහː" මහණෙනි, බොහෝ දෙනාගේ යහපත පිණිස, බොහෝ දෙනාගේ සතුට වෙනුවෙන්, ලෝකය කෙරෙහි අනුකම්පාවෙන්, දෙවිවරුන්ගේ සහ මිනිසුන්ගේ ශුභසිද්ධිය පිණිස, යහපත සහ සතුට වෙනුවෙන් ඉදිරියට යන්න. ආරම්භයේ යහපත් වූ, මැද යහපත් වූ සහ අවසානයේ යහපත් වූ ධර්මය උගන්වන්න. පරිපූර්ණ ජීවිතයේ අර්ථය පදගතාර්ථයෙන් සහ ආකල්පමය වශයෙන් කෙසේ ද යන්න පැහැදිලි කරන්න. ඔබ ලබාගත් දේ නිර්ලෝභීව අනෙක් අය සමග බෙදාගන්න."[87] මෙසේ වදාරමින් බුදුපියාණන් වහන්සේ, තමන්වහන්සේ දීර්ඝ සහ වෙහෙසකර චාරිකා සිදුකළේ කුමන හේතුවක් නිසා ද කියා පැහැදිලි කළහ. ඒ ලෝකයා වෙත උන්වහන්සේ තුළ තිබූ කරුණාවයි. උන්වහන්සේට අවශ්‍ය වූයේ හැකිතාක් ජනයාට උන්වහන්සේගේ ධර්මයට සවන්දීමට අවස්ථාව සැලසීමයි.

## උන්වහන්සේලාගේ ශ්‍රාවකයන්

බුදුපියාණන් වහන්සේ සහ ජේසුස්වහන්සේ යන දෙදෙනාම වටා ශ්‍රාවක පිරිසක් එක්රැස් වූහ. ජේසුතුමාට උදව්කරුවෝ 70ක් සිටියහ, ඒ සමීප භක්තිකයන් ගණනක් - ඒ අයගෙන් වැඩිදෙනෙක් කාන්තාවන්ය,[88] සාමාන්‍යයෙන් අපෝස්තල් නමින් හඳුන්වන ශ්‍රාවකයන් 12කින් යුක්ත සමාන අදහස් ඇති කණ්ඩායම් සිටියහ. මෙම සංඛ්‍යාව තෝරාපත් කරගත්තේ ලෝක විනාශයෙන් පසු ඊශ්‍රායලයේ ගෝත්‍ර 12න් එකක් පාලනය කරන්නට ජේසුස්වහන්සේ පොරොන්දු වී ඇති නිසාය.[89] මෙම අපෝස්තල්වරුන් ඵලසහිත වේදැයි සැක සහිත විය, ඇත්තටම ප්‍රභාව බොහෝ සෙයින් අඩු බවත් බයිබලය පෙන්වා දෙයි. පීටර් සහ ජෝන් නූගත් අය වූහ, සයිමන්, පීටර්, ජේම්ස් සහ ජෝන් මාළු මරන්නන් වූ අතර, ඔවුන් ද නූගත් අය විය යුතුය.[90] මැතිව් බදු එකතු කරන්නකු වූ අතර, ඔහුට ලේඛන සටහන් කරන්නකුගේ මට්ටමෙන් අකුරු කියවන්නට සහ ලියන්නට හැකියාවක් තිබෙන්නට ඇත. ඔහු හුදෙක් බලය ක්‍රියාත්මක කරන්නකු වූයේ නම්, ඔහු ද නූගතකු වීමට බොහෝ ඉඩකඩ තිබුණි. දෙකෙන් කුමක් වුවත්, බදු එකතු කිරීම සම්බන්ධ පුද්ගලයන් පහත් කොට සැලකිය යුතු කණ්ඩායමක් යැයි කීමට හොඳ හේතුවකි. ලූක් වෛද්‍යවරයකු යයි සඳහන් වන නමුත්, ඔහුට වෙදකමට පුහුණුව ලැබුණේ ද නැතිනම් හුදෙක් දේශීය ප්‍රජාව සුවපත් කරන්නකු ද යන්න නිශ්චිත නැත. එක් අවස්ථාවකදී අපෝස්තල්වරුන් තමන් අතරින් ශ්‍රේෂ්ඨතම තැනැත්තා කවුදැයි එකිනෙකා සමඟ දබරකරන බව ජේසුස්වහන්සේ දුටුවේය. සමහර විට ස්වර්ගරාජ්‍යය පිහිටුවීමෙන් පසු ඔවුන්ගේ තත්ත්වය සම්බන්ධයෙන් විය හැකිය. ජේසුතුමා පැවසූ දේ වටහා ගැනීමට අපෝස්තල්වරුන්ට නොහැකි විය. ඒ නිසා ජේසුස්වහන්සේ "ඇදහිල්ල මඳකමක හැටි! බිය වන්නේ මන්ද"[91] කියා නැඟිට, මාරුතයට හා මුහුදට නිශ්චල වන්ට අණ කළ සේක. එවිට මහත් නිසංසලයක් විය. එසේම තීරණාත්මක මොහොතකදී ඔවුන් විශ්වසනීයත්වයෙන් තොර බව ඔප්පුකර ඇත. ජෙරුසලමේ ඓතිහාසික

ස්ථානයක් වූ ජෙත්සමනේ හි ජේසුතුමා යාඥා කරන විට ඔවුන්ට බලා සිටින්නට කීවත්, ඔව්හු නින්දට වැටුණහ. ජ්‍යෙෂ්ඨ ශ්‍රාවක පීටර් අත්අඩංගුවට පත්වූ විට, තමා කිසිදිනක ජේසුස්වහන්සේ නොදත් බවට අසත්‍ය ප්‍රකාශ කළේය. එසේම ජුදාස් මුදල් සොරකම් කළ අතර, අවසානයේ ඔහුගේ ස්වාමියා බලධරයන්ට පාවාදුන්නේය.

ජේසුස්වහන්සේ මෙකී දොළොස් දෙනා යවමින් ඔවුන්ට මෙසේ අණ දුන් සේක: ''විජාතීන්ගේ මාවතකට පා නොතබන්න; සමාරියයන්ගේ නුවරකට ඇතුල් නොවන්න; ඊශ්‍රායල් වංශයේ නැතිවූ බැටළුවන් වෙතට යන්න. එසේ ගොස්, ස්වර්ග රාජ්‍යයට ළංවී ඇතැ'' යි දේශනා කරන්න. රෝගීන් සුවකරන්න, මළවුන් නැඟිටුවන්න, ලාදුරු රෝගීන් පවිත්‍ර කරන්න, යකුන් දුරු කරන්න. ඔබ නොමිලයේ ලැබුවහුය, නොමිලයේ දෙන්න. ඔබේ පසුම්බිවල රන් හෝ රිදී හෝ තඹ කාසි හෝ ගෙන නොයන්න. ගමන් මල්ලක්වත්, කමිස දෙකක්වත්, පාවහන් සඟලක්වත්, සැරයටියක්වත්, සපයා නොගන්න. මන්ද, සේවකයාට අවශ්‍ය දේ ඔහුට ලැබිය යුතු ය. ඔබ කවර නුවරකට හෝ ගමකට හෝ ඇතුල් වූ කල ඔබ පිළිගන්නට සතුටු කෙනකු සොයාගෙන, ඉන් නික්ම යන තුරු, එහිම නැවතී ඉන්න. ගෙදරකට ඇතුල් වන විට එයට සුබ පතන්න. ගෙයි වැසියෝ සුදුසු අය නම්, ඔබේ ඒ සුබ පැතුම ඔවුන් පිට පැමිණේවා. එහෙත් නුසුදුසු නම්, ඔබගේ ඒ සුබ පැතුම, යළි ඔබ වෙත පැමිණේවා. කවරකු වුව ද ඔබ පිළිගන්නේවත්, ඔබගේ වචන අසන්නේවත් නැත් නම්, ඒ ගෙදරින් හෝ ඒ නුවරින් හෝ නික්ම යන කල ඔබේ පාදවල දූවිලි ගසා දමන්න. සැබැවින් ම මම ඔබට කියමි: දේව විනිශ්චය දවසේ දී ඒ නුවරට වඩා සොදොම් සහ ගොමොරා රටට සහනය ලැබෙන්නේ ය.”[92]

ජේසුස්වහන්සේ තමන්ගේ අපෝස්තල්වරුන්ට දුන් පැවරුම් සහ වෙනත් බොහෝ දේ බුදුපියාණන් වහන්සේ තමන්වහන්සේගේ ශ්‍රාවකයන්ට දුන් නියෝග සමඟ අවධානයට යොමුවන්නාවූ සමානකම් ඇත. ධර්මය හැකිතාක් පුළුල්ව පැතිරවීම සඳහා උන්වහන්සේලාට තනිව යාමට සිදුවූ

අතර, ජේසුස්වහන්සේට අවශ්‍ය වූයේ අපෝස්තල්වරුන් දෙදෙනා බැගින් යනු ලැබීමට ය.[93] බුදුපියාණන් වහන්සේ ධර්මය ''බොහෝ දෙනාට අනුකම්පාවෙන්" ඉගැන්වූ අතර, ජේසුස්වහන්සේට අවශ්‍ය වූයේ තමන්ගේ සමකාලීන යුදෙව්වන්ගේ යහපත සඳහා පමණක් ධර්මය ඉගැන්වීමය. යුදෙව් නොවන සහ සමාරියානු ජාතීන් නොසලකා හරින ලදී. සුවිශේෂ දේවවාක්‍ය මූලිකවම යුදෙව්වන්ට සහ වෙනත් අයට නොවේ ය යන අදහස එකල යුදෙව් ජාතීන්ට තිබූ සුවිශේෂත්වය රඳවා ගැනීම පිණිස විය හැකිය. එසේම එය තවත් සිද්ධියක කොටස්වලින් ස්ථිරකර සුවිශේෂ දේවවාක්‍යවල (පරිච්ඡේද 3.111 සටහන බලන්න.) සටහන්කර ඇත. එක් කානානීය ස්ත්‍රියක් ඒ පෙදෙස්වල සිට අවුත්, ''දාවිත්ගේ පුත්‍ර වූ ස්වාමීනී, මට අනුකම්පා කළ මැනව; මාගේ දුව බලවත් සේ යක්ෂාවේෂ ව සිටින්නී ය" යි කීවා ය. එහෙත් උන් වහන්සේ ඇයට වචනයකින්වත් පිළිතුරු නුදුන් සේක. උන් වහන්සේගේ ශ්‍රාවකයෝ අවුත්, මේ ස්ත්‍රිය මොරගසමින් අප පස්සේ එන බැවින් ඇයට යන්ට කිව මැනැවැ" යි උන් වහන්සේගෙන් ඉල්ලූහ. උන් වහන්සේ කතා කරමින්, 'මා එවන ලද්දේ ඊශ්‍රායල් වංශයේ නැති වූ බැටළුවන් වෙත පමණකැ'යි වදාළ සේක. එහෙත් ඈ අවුත් උන් වහන්සේට පසඟ පිහිටුවා වැඳ ''ස්වාමීනී මට පිහිටවුව මැනැවැ" කීවා ය. උන් වහන්සේ උත්තර දෙමින්, ''දරුවන්ගේ කෑම ගෙන බල්ලන්ට දැමීම යුතු නැතැ"යි වදාළ සේක. එහෙත් ඈ කතා කොට, ''එසේය, ස්වාමීනී, බල්ලන් පවා තම ස්වාමිවරුන්ගේ මේසයෙන් වැටෙන කැබලි අවුලා කති" යි කීවා ය. එවිට ජේසුස්වහන්සේ උත්තර දෙමින්, ''ස්ත්‍රිය, ඔබේ භක්තිය මහත් ය. ඔබේ කැමැත්ත ලෙස ම ඔබට වේවා" යි වදාළ සේක. ඒ මොහොතේ පටන් ඇගේ දුව සුවපත් වූවා ය.[94] ජේසුතුමා අසරණ කාන්තාවගේ විශ්වාසය හුදෙක් මැන බැලුවා ද නැතහොත් ඇයට උපකාර කිරීමට අදහසක් නොතිබී, පසුව ඔහුගේ අදහස වෙනස් කළා ද යන්න පැහැදිලි නැත. මහාප්‍රජාපතී ගෝතමියගේ ඉල්ලීමට බුදුපියාණන් වහන්සේගේ ප්‍රතිචාරය අපට මතක් කර දෙයි. එහෙත් කාන්තාවකට භික්ෂුණියක වීමට

අවසරදීම ප්‍රතික්ෂේප කිරීම සහ ජේසුතුමා රෝගී දරුවකු සමඟ දුකට පත් මවකට උපකාර කිරීම අතර සැලකිය යුතු තරම් වෙනසක් ඇත.

බුදුපියාණන් වහන්සේගේ ශ්‍රාවකයන් ඉගැන්වීමට නියමිත වූ ධර්මය වූයේ ''දුක සහ දුක නැතිකිරීම" ය. ජේසුස්වහන්සේගේ ශ්‍රාවකයන් කළයුතු වූයේ ලෝක විනාශය වේගයෙන් එළඹෙන බවට අනතුරු ඇඟවීම ය. ඔවුන්ට තිබුණේ සුවිශේෂ දේවවාක්‍ය අනාවරණය කිරීම සහ විශේෂයෙන් ම මළවුන් නැගිටවීම, රෝගීන් සුවකිරීම සහ භූතාත්ම පලවා හැරීම වැනි විවිධ ප්‍රාතිහාර්යයන් සිදුකිරීම ය. බුදුපියාණන් වහන්සේ සහ ජේසුස්වහන්සේ යන දෙදෙනා වහන්සේලා ම තමන් වහන්සේලාගේ ශ්‍රාවකයන් ජීවිතයට අවමය ඔවුන් සමඟින් තබා ගැනීම අපේක්ෂා කළහ; භික්ෂූන් සඳහා අට ආකාර මූලික අවශ්‍ය දේ (අට පිරිකර) සහ අපෝස්තල්වරුන්ට ඊටත් අඩු සහ මේ දෙපාර්ශ්වයම මූල්‍යමය ලාභයක් බලාපොරොත්තු නොවිය යුතු විය. බුදුපියාණන් වහන්සේ භික්ෂූන්ට මෙසේ වදාළහ: ''යමකු ධර්මය ව්‍යාපාරයකට යොදවා නොගත යුතුය."[95] සැබැවින්ම භික්ෂූන් වහන්සේලාට මුදල්, එනම් රන් හා රිදී පිළි නොගන්නා ලෙස බුදුන්වහන්සේ වදාළහ. අපෝස්තල්වරුන්ට ජේසුස්වහන්සේ දුන් උපදෙස් බුදුපියාණන් වහන්සේ දුන් උපදෙස් තරම් අවධානය නොකැඳවයි. ඔහු පැවසුවේ ඕනෑම නගරයක - ඕනෑම පුද්ගලයකු එම පණිවුඩය මඟහැරියොත්, එයින් අදහස් වන්නේ ඔවුන් එම පණිවුඩය විශ්වාස කිරීම ප්‍රතික්ෂේප කරන බවට ප්‍රකාශ කරන බවත්, එවිට සෝඩම් සහ ගොමොරා යන නගරවලට දෙවියන් වහන්සේ ගෙන්දගම් සහ ගින්දරවලින් පුළුස්සා දුන් දඬුවමට වඩා දරුණු ඉරණමක් විනිශ්චය දිනයේ ලැබෙනු ඇති බවත්ය.[96]

වරක්, බොහෝ විට තමන්වහන්සේගේ බුද්ධ කෘත්‍යයේ මුල් කාලයේදී, බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ: ''මගේ ශාසනයේ සිටියේ සිය ගණනක්". පසු කාලයේ ගණනය කරන විට උන්වහන්සේගේ ශ්‍රාවක ප්‍රමාණය දහස් ගණනින් සිටියහ; භික්ෂූන් සහ භික්ෂුණීන්, උපාසක සහ

උපාසිකාවන්, ඔවුන්ගෙන් බොහෝ ප්‍රමාණයක් නිර්වාණයට තබන පියවර හතරෙන් හෝ දෙකකටවත් පැමිණ තිබුණි.[97] තමන්වහන්සේ ඔවුන්ගේ මඟපෙන්වන්නා සහ ප්‍රබෝධක ආවේගය ලෙස පිරික්සා බලන ලෙස ඉල්ලමින් තවදුරටත් බුදුපියාණන් වහන්සේ වදාළේ සියලු පැවිදි සහ නොපැවිදි (පුරුෂයන් සහ කාන්තාවන්) පිරිසගෙන් ''නිපුණ සහ හොඳින් පුහුණු, උගත් සහ බහුශ්‍රැත, ධර්මය දන්නා අය, ධර්මය සමග ජීවත්වන්නන් සහ ධර්ම මාර්ගයේ ගමන් කරන්නන් බලාපොරොත්තු වූයේ තමන් ගුරුවරයාගෙන් උගත් ධර්මය අනක් අය අතට පත් කරන්න, උගන්වන්න සහ ප්‍රසිද්ධ කරන්න, ස්ථාපනය කරන්න සහ පැහැදිලි කරන්න, ප්‍රවර්ධනය කරන්න සහ ගුණය ප්‍රකාශ කරන්න, එසේ කරමින් වැරදි ඉගැන්වීම් ප්‍රතික්ෂේප කරන්න, එසේ කරමින් මෙම ශ්‍රේෂ්ඨ ධර්මය උගන්වන්න" යනුවෙනි.[98]

බුදුපියාණන් වහන්සේගේ අග්‍රශ්‍රාවකයන් වහන්සේලා වූයේ සාරිපුත්ත සහ මොග්ගල්ලාන මහරහතන් වහන්සේලා වන අතර, දෙදෙනා වහන්සේ ම බ්‍රාහ්මණ කුලයට අයත් විය. සාරිපුත්ත මහරහතන් වහන්සේ උන්වහන්සේගේ ප්‍රඥාව සම්බන්ධයෙන් විශේෂ වූ අතර, මුගලන් මහරහතන් වහන්සේ උන්වහන්සේගේ ආධ්‍යාත්මික හැකියාවන් සම්බන්ධයෙන් විශේෂ වූහ. සැරියුත් මහරහතන් වහන්සේගේ ප්‍රඥාව කෙතරම් ද කිවහොත්, සමහර විට බුදුපියාණන් වහන්සේ උන්වහන්සේ වෙනුවට ධර්මදේශනා සිදුකිරීමට සාරිපුත්ත මහරහතන් වහන්සේට අනුදැන වදාළහ. මෙම අග්‍රශ්‍රාවකයන්ගෙන් එක් අයකු හෝ දෙදෙනා වහන්සේම පැවිදි ශාසනය බුද්ධ පරිනිර්වාණයෙන් පසු ඉදිරියට ගෙන යනවා ඇතැයි සැලකුවත් එය එසේ නොවීය. එම දෙදෙනා වහන්සේම බුදුපියාණන් වහන්සේට පළමුව පරිනිර්වාණයට පත්වූහ. තවත් විශිෂ්ට ශ්‍රාවකයකු වූ මහා කාශ්‍යප මහරහතන් වහන්සේ එම කාර්යභාරය භාරගත් සේක. බුදුපියාණන් වහන්සේගේ පරිනිර්වාණයෙන් මාස තුනකට පසු මහාකාශ්‍යප මහරහතන් වහන්සේ පළමුවෙනි ධර්මසංගායනාව කැඳවා එහි

මූලිකත්වය ගෙන කටයුතු කළහ. සාරිපුත්ත සහ මුගලන් මහරහතන් වහන්සේලාගේ පරිනිර්වාණය බුදුපියාණන් වහන්සේට උන්වහන්සේලාගේ නැතිවීම පිළිබඳ හැඟීමක් ඇති කරන ලද්දේ යැයි උන්වහන්සේගේ මෙම ප්‍රකාශනයෙන් පෙනීයයි. : ''මුගලන් සහ සාරිපුත්තගේ පරිනිර්වාණයෙන් මෙම සභාවේ හිස් බවක් මට පෙනෙන්ට තිබේ.''[99]

ජේසුස්වහන්සේට විශේෂ වූ සමීප සබඳතාවක් එක් ශ්‍රාවකයකු සමඟ තිබුණි. මෙම පුද්ගලයාගේ නමක් කිසිවිටක සඳහන් නොවූ අතර, සැමදාම ඔහු හැඳින්වූයේ ''ජේසුස්වහන්සේ ආදරය කළ ශ්‍රාවකයා'' යනුවෙනි. අවසාන රාත්‍රී භෝජන සංග්‍රහයේදී ජේසුස්වහන්සේගේ උකුල මත තම හිස තබා ගත්තේ මෙම ශ්‍රාවකයා විසිනි. ජේසුස්වහන්සේ හිරභාරයට පත්වූ රාත්‍රියේදී ඔහු සමඟ සිටි ලිනන් රෙදි කැබැල්ලක් පමණක් ඇඳ සිටි තරුණයා මොහු විය හැකිය.[100] ජේසුස්වහන්සේට මෙතරම් විශේෂ වූ පුද්ගලයකු නිර්නාමික වූයේ සහ බොහෝදුරට නිර්වස්ත්‍ර පුද්ගලයකු ජේසුස්වහන්සේ සමඟ අඳුරේ රැඳී සිටියේ ඇයි ද යන්න නිශ්චිතව කිසිදා පැහැදිලි කර නැත.

බුදුපියාණන් වහන්සේට ද ඉතා සමීප සබඳතාවක් තිබූ ශ්‍රාවකයෙක් සිටියේය, ඒ උන්වහන්සේගේ ඥාති සහෝදර - ආනන්ද ස්වාමීන් වහන්සේය. බුදුපියාණන් වහන්සේගේ අවසාන අවුරුදු 25 තුළ දී ආනන්ද ස්වාමීන් වහන්සේ බුදුපියාණන් වහන්සේගේ ප්‍රධාන අනුගාමිකයා සහ සහායක වශයෙන් කටයුතු කළ අතර, උන්වහන්සේට ආනන්ද ස්වාමීන් වහන්සේ කෙරෙහි නිසැක විශ්වාසක් තිබුණි. සාරිපුත්ත රහතන් වහන්සේ තුළ ප්‍රඥාව ඇතුළත්ව තිබුණේ නම්, මුගලන් මහරහතන් වහන්සේ තුළ ආධ්‍යාත්මික බල ඇතුළත් ව තිබුණේ නම්, ඊළඟට ආනන්ද මහරහතන් වහන්සේ තුළ නිත්‍ය වශයෙන් ම කරුණාව, මෘදුබව, උදෙ‍්‍යාගි බව සහ ආදරය ආදර්ශයෙන් තහවුරු විය. බුදුපියාණන් වහන්සේ ආනන්ද ස්වාමීන් වහන්සේගේ 'කයෙන් සිදුකරන ලද සෙනෙහෙබර ක්‍රියා, සෙනෙහබර වචන

සහ මනසින් සිතන ලද සෙනෙහෙබර සිතුවිලි (මෙත්තේන කාය කම්මේන, මෙත්තේන වචී කම්මේන, මෙත්තේන මනෝ කම්මේන), උන්වහන්සේ සැමවිටම උපකාරය සඳහා අතදීමට ඉදිරිපත් වීම, මිනිසුන්ට කරුණාවෙන් කථා කිරීම සහ අනෙක් පුද්ගලයන්ගේ ගුණ සිහිකිරීම' ආදිය අදහස් කරමින්,101 බුදුපියාණන් වහන්සේ ආනන්ද හිමියන් අගයකළ සේක. තමන්වහන්සේගේ බොහෝ ගතිගුණ ආනන්ද හිමියන්ට ද තිබුණු බව බුදුපියාණන් වහන්සේ වදාළහ. උන්වහන්සේ බැහැ දැකීමට මිනිසුන් අතිශයෙන් සතුටු වූ බවත්, උන්වහන්සේ ධර්මය උගන්වන විටත් මිනිසුන් අතිශයෙන් සතුටු වූ බවත්, උන්වහන්සේ කථා කිරීම අවසන් වූ විට ඔවුන් කණස්සල්ලට පත් වූ බවත් බුදුපියාණන් වහන්සේ වදාළහ.102 බුදුපියාණන් වහන්සේ පරිනිර්වාණයට පත් වනදා රාත්‍රියේදී උන්වහන්සේගේ අවසානය ළඟාවෙමින් තිබෙන බව සිතමින් ආනන්ද හිමියෝ දොර කණුවට අත තබාගෙන ඉකිබිඳිමින් හැඬුහ. "

## ජුදාස් සහ දේවදත්ත

ජේසුස්වහන්සේගේ අපෝස්තල්වරුන්ගෙන් වඩාත් අපකීර්තිමත් පුද්ගලයා වූයේ ජුදාස් ඉස්කැරියට්ය. අනෙක් අපෝස්තල්වරුන් මෙන්ම ඔහුටත්, භූතාත්ම පලවා හැරීමේ සහ ප්‍රාතිහාර්යයෙන් ලෙඩ සුවකිරීමේ බලය තිබුණි,103 නමුත් පැහැදිලි නොකරන ලද හේතූන් නිසා ඔහු ක්‍රමයෙන් නරක තත්ත්වයට පත් වූයේය. ජුදාස්ට තිබූ එක් රාජකාරියක් නම්, ජේසුස්වහන්සේ සහ අනෙක් අපෝස්තල්වරුන් ඔවුන්ගේ අවශ්‍යතාවයන්ට සහ දුප්පතුන් අතර බෙදා දීමට තිබූ මුදල් රැකබලා ගැනීමයි. නමුත් ඔහු කළේ ඒවා ඔහු සඳහා පරිහරණය කිරීමය. වරක් එක් බැතිමත් කාන්තාවක් වටිනා සුවඳවිලවුන් ජේසුස්වහන්සේ වෙත වත්කළ විට, ජුදාස් නොසතුට පළ කළේය: "මෙම සුවඳවිලවුන් රිදී කාසි 300කට විකුණා දුප්පතුන්ට නොදුන්නේ ඇයි?" ඔහු සැබැවින්ම දුප්පතුන් පිළිබඳව නොතකන, නමුත් එම මුදල සොරකම් කිරීමට උවමනා වූ බව අනෙක් අපෝස්තල්වරු සැක කළහ.104 තමන්ගේ එක් අපෝස්තල්වරයෙක් අවසානයේ තමන්ගේ

විශ්වාසය කඩ කරන බව ජේසුස්වහන්සේ දැනගත් අතර, ඒ ජුදාස් බවද හැඟීමක් ඇතිවිය. එය එසේම විය. ජේසුස්වහන්සේගේ මරණයෙන් පසු ජුදාස් ද මිය ගියේය. මෙය සිදුවූයේ කෙසේද කියා දෙආකාර තොරතුරු ඇත; ඔහු එල්ලී මරණයට පත්වූ බව, හෝ ඔහු ඇදවැටී ඔහුගේ සිරුර ඉරී, විවෘත වී ඔහුගේ බඩවැල් පිටාරගිය බවය.105

''ජේසුස්වහන්සේ ආදරය කළ ශ්‍රාවකයා'' ට සමාන පුද්ගලයකු බුදුපියාණන් වහන්සේට සිටි ආකාරයටම, ජුදාස්ට සමාන පුද්ගලයෙක් බුදුපියාණන් වහන්සේට ද සිටියේය; ඒ උන්වහන්සේගේ මවගේ සහෝදරයා වූ සුප්පබුද්ධගේ පුතා වූ දේවදත්ත ය.

බුදුපියාණන් වහන්සේ බුද්ධත්වයට පත්වී මුල්වරට කපිලවත්ථුවට වැඩම කළවිට, දේවදත්ත ඇතුළුව ශාක්‍ය තරුණයන් පිරිසක් තමන්ටත් පැවිදි වීමට අවශ්‍ය බව පැවසූහ.106 දේවදත්ත වසර ගණනාවක් අවංක සහ උද්‍යෝගිමත් භික්ෂුවක බව ඔප්පු කළ අතර, ඒ බවට ග්‍රන්ථ රාශියක ඔහු පිළිබඳව ඇගයීම් ද ඇත.107 බුදුපියාණන් වහන්සේ තවත් බොහෝ අය ඇතුළුව දේවදත්ත ආදර්ශවත් ශ්‍රාවකයකු ලෙස නම් කළහ.108 නමුත් සියලු දේ වෙනස් විය. පසුව ඔහු පිළිබඳව බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ: ''වරක් දේවදත්තගේ චරිතය එක් දෙසකට යොමු විය, දැන් එය මුළුමනින් වෙනත් දෙසකට යොමුවී ඇත.''109 උද්‍යෝගිමත් ලෙස භාවනාවේ යෙදීමේ ප්‍රතිඵලයක් ලෙස ඍද්ධිබල ප්‍රකට කිරීම ආරම්භයෙන් පසු දේවදත්තගේ මෙම වෙනස ඇතිවිය. ක්‍රමයෙන් ඔහු ආක්‍රමණශීලී සහ උඩඟු බවට පත්විය. බුදුපියාණන් වහන්සේ පාරම්පරික ශ්‍රමණ ජීවිත රටාවෙන් බොහෝ දුරට සෙමෙන් චලනය වන බවක් දේවදත්තට දැනෙන්ට වූ අතර, තවත් භික්ෂූන් තමන්ගේ අදහසට එකඟ කර ගැනීමට ද ඔහුට හැකිවිය. මේ සම්බන්ධයෙන් බුදුපියාණන් වහන්සේට විරෝධය පාමින්, සියලු භික්ෂූන්ට ශ්‍රමණ ප්‍රතිපත්ති රාශියක් අනිවාර්ය කරන ලෙස ඉල්ලා සිටියේය. ඒ ඔවුන් වනගතව සිටිය යුතු බව, කිසිවිටක දානය සඳහා බැතිමතුන්ගෙන් ඔවුන්ගේ නිවෙස්වලට යාමට ඇරයුම් භාරනොගත යුතු බව, නමුත්

පිණ්ඩපාතයෙන් පමණක් යැපිය යුතු බව, පරණ සිවුරු පමණක් ඇඳිය යුතු බව, ජීවත්විය යුත්තේ ආරාමවල නොව, එළිමහනේ පමණක් බව සහ ඒ අය නිර්මාංශ විය යුතු බව ය. භික්ෂූන් වහන්සේලා කැමති නම් පමණක් මෙම ප්‍රතිපත්ති අනුගමනය කළ හැකි බවත්, නමුත් උන්වහන්සේ එය අනිවාර්ය නොකරන බවත් බුදුපියාණන් වහන්සේ පවසා සිටියේ සමහර විට ගැටුමක් ඇතිවීම වැළැක්වීමට විය හැකිය. එමනිසා දේවදත්ත සහ ඔහුගේ කණ්ඩායම බිඳී කණ්ඩායමක් පිහිටුවා ගත්හ. බුදුපියාණන් වහන්සේගේ අවුරුදු 45ක ලෝක සාසනික සේවාවේ මුහුණ දුන් විශාලම දුෂ්කර අවස්ථාව මෙයයි. දේවදත්ත අවස්ථා දෙකකදී බුදුපියාණන් වහන්සේ මරණයට පත් කිරීමට උත්සාහ කළ බව විනය පිටකයේ සඳහන් වේ. මෙය ඔහු හැකිතාක් නරක පුද්ගලයකු බව පෙන්වීමට මුල් කාලයේ ගත් උත්සාහයක් විය හැකිය.[110] දේවදත්තගේ අවසාන ඉරණම කුමක් ද යන්න පිළිබඳව තොරතුරු ත්‍රිපිටකයේ නැත. නමුත් ඔහුගේ උදව්කරුවන් අවසානයේ ඔහු අතහැර දමා බුදුපියාණන් වහන්සේ වෙත නැවත ගිය බව සහ ඔහු අවමනට ලක්වී තනිව මියගිය බව ද විශ්වාසවලට අනුව සඳහන්ය.

## දිව්‍යමය නිල ගමන්

ජේසුස්වහන්සේ සහ බුදුපියාණන් වහන්සේ යන දෙදෙනා වෙත ම දිව්‍යමය ජීවීන්ගේ පැමිණීම ඉදහිට සිද්ධ වූ බව අවධානයට යොමුවී ඇත. වරක් ජේසුස්වහන්සේ තමන්ගේ ශ්‍රාවකයන් කඳු මුදුනකට කැඳවාගෙන ගිය අවස්ථාවක, ඔවුන් සෝදිසියෙන් බලන විට, ජේසුස්වහන්සේගේ දසුන දීප්තිමත් සුදු වර්ණයකට ක්‍රමයෙන් වෙනස් විය. ඊට පසු පැරණි ශාස්තෘවරයකු වූ එලිජා සහ මෝසස් ජේසුස්වහන්සේ සමඟ මතු විය. ශ්‍රාවකයෝ ගොළු වූහ. පසුව ඔවුන් දුටු දේ තමන් මියයන තුරු කිසිවකුට නොකියන ලෙස ජේසුස්වහන්සේ ඔවුන්ට උපදෙස් දුන්නේය.[111]

බුදුපියාණන් වහන්සේ බුද්ධත්වයට පත්වීමෙන් සතියකට පසු එවැනිම දෙයක් බුදුපියාණන් වහන්සේට සිදුවී ඇත. තමන්වහන්සේ සොයාගත් සත්‍ය ''ගැඹුරු, දකින්නට සහ අවබෝධකර ගැනීමට දුෂ්කරය... සියුම්ව

තේරුම්ගත හැක්කේ ප්‍රධාන වශයෙන් ඥානවන්තයන්ට පමණය" සහ ලෝකය ''සතුටට පත්වන්නේ ඉඳුරන් පිනවීමෙන් පමණක්" ය යන හේතු මත, උන්වහන්සේ තමන් අවබෝධ කරගත් දේ අනෙක් අයට උගන්වන්නේ නැතැයි තීරණය කළහ. ඔවුන් හුදෙක් උන්වහන්සේ සමඟ වාද කළහොත්, එය උන්වහන්සේට "වෙහෙස දෙන්නක් සහ හිරිහැරයක්" පමණක් වේ. බ්‍රහ්ම ලෝකයේ ඉහළම දෙවියකු වන සහම්පති බ්‍රහ්මයා බුදුපියාණන් වහන්සේගේ තීරණය පිළිබඳව අධෛර්යයට පත්වී උන්වහන්සේ ඉදිරියේ පෙනී සිට, ආචාර කර, උන්වහන්සේගේ තීරණය නැවත සලකා බලන ලෙස අයැද සිටියේ යඃ ''ඔබවහන්සේට පෙර, මගධයේ තිබුණේ අපිරිසුදු මනසින් සැලසුම් කළ අපිරිසුදු ධර්මයයි. ඉතින් ඒ අමරණීය දොරටුව විවෘත කරන්න, සවන් දීමට හැකි සියලු දෙනාට ම නොකැළැල් ඔබවහන්සේට ප්‍රතිචාර දැක්විය හැකිය.'' ස්වල්ප දෙනකුට ධර්මය අවබෝධ වනු ඇතැයි සිතූ නමුත්, ''(කෙලෙස්) දූවිලි ස්වල්ප ප්‍රමාණයක් ඇති මිනිසුන්ගේ" යහපත වෙනුවෙන් ධර්මය ඉගැන්වීමට උන්වහන්සේ තීරණය කළහ.[112] ඊට පසු දශකවල විවිධ දෙවිවරු සාමාන්‍යයෙන් උන්වහන්සේගෙන් ආධ්‍යාත්මික කරුණු පිළිබඳව ප්‍රශ්න ඇසීමට බොහෝ විට බුදුපියාණන් වහන්සේ බැහැදැකීමට පැමිණියහ.

බුදුපියාණන් වහන්සේගේ සමහර ශ්‍රාවකයන්ට දෙවියන් සමඟ එවැනි අහඹු හමුවීම් සිදුවී ඇත. පැහැදිලිව පෙනෙන ආකාරයට සමහර විට දෙවිවරු බුදුපියාණන් වහන්සේගේ ඉතා දියුණු තත්ත්වයට පත්ව සිටි ගිහි ශ්‍රාවකයකු වූ 'උග්ග' ඉදිරිපිට පහළ වී ඔහු සමග සාකච්ඡා කරති. දෙවිවරුන්ගේ එවැනි පහළවීම් විශේෂ අනුග්‍රහයක් හෝ විශාල ආශීර්වාදයක් ලෙස යම් කෙනකු සලකන්නට හැකි නමුත්, උග්ගට එයින් විශේෂ හැඟීමක් ඇති නොවීය, සසල නොවීය. වැදගත් යමක් ඔහුට දෙවිවරු කිව්වේ නම්, ඒ සියල්ල දැනටමත් ඔහු බුදුපියාණන් වහන්සේගෙන් අසා ඉගෙන ගෙන ඇත.[113]

## උන්වහන්සේලාගේ මෙහෙවරවල අදාළ පසුබිම

ජේසුස්වහන්සේගේ උත්පත්තියට ශතවර්ෂ ගණනකට ප්‍රථමව, යුදෙව් ජාතිහු යහවේ නමැති එක් කේවල දෙවිකෙනකු අදහමින් සිටියහ. මෙම දෙවියා ජීවත්වීමට නීති කියා දෙමින්, ඔවුන්ගේ කැපකිරීම් ලබමින් සහ ඔවුන්ගේ සතුරන්ගෙන් ඔවුන් ආරක්ෂා කරමින් මේ මිනිසුන් සමඟ විශේෂ සබඳතාවක් පවත්වා ගෙන යමින් සිටියේය. වෙනත් දෙවිවරුන්ට වඳින අසල්වැසි රාජධානි විසින් ඔවුන් ආක්‍රමණය සහ බලයෙන් අල්ලා ගත්තොත් සහ අල්ලා ගත් අවස්ථාවල, යහවේ මෙම බලයෙන් අල්ලාගත් අය පලවා හැරීමට සහ තමන් නිදහස් කරගැනීමට රජ කෙනකු එවනු ඇතැයි යුදෙව් ජාතිකයෝ විශ්වාස කළහ. එවැනි පුද්ගලයකු යුදෙව්වන්ගේ ගැළැවුම්කරුවා වශයෙන් හැඳින්වේ. මෙහි අදහස මෙම කාර්යය සඳහා දෙවියන් වහන්සේ විසින් කැපකළ සහ පත්කළ පුද්ගලයා යන්නය. ජේසුස්වහන්සේට ක්‍රිස්තුස් යනුවෙන් දෙන ලද නාමය ‘හෙබ්‍රෑ’ යන ග්‍රීක පරිවර්තනයෙන්ය. ඕනෑම පුද්ගලයකුට ගැළැවුම්කරුවකුගේ තත්ත්වයට පත්වීමට සුදුසුකම් ලබාගත හැකි බව පෙනේ. ජේසුතුමාට වර්ෂ 500කට පමණ පෙර තම රටෙන් පිටමං කරණ ලද යුදෙව් ජාතිකයන් නැවත මව්රටට ඒමට මිථ්‍යාදෘෂ්ටික පර්සියානු ජාතික සයිරස් නමැති රජු අවසර දුන් විට, බයිබලය ගැළැවුම්කරුවකු ලෙස ඔහුට සුබපැතුවේය.114

ජේසුස්වහන්සේගේ කාලයේදී ඍජුව හෝ වක්‍රව, දශක ගණනාවක් යුදෙව් ජාතිකයන් රෝමානු නීති පාලනයට යටත්ව සිටි අතර, ඔවුන් අකැමැති මිථ්‍යාදෘෂ්ටික වැඩි බර පැටවීම්වලින් තමන් නිදහස් කරවීමට ගැළැවුම්කරුවකු දෙවියන්වහන්සේ එවනු ඇතැයි ඔව්හු දැඩි ආශාවෙන් බලා සිටියහ. ගැළැවුම්කරුවාගේ ස්වභාවය සහ මෙහෙවර පිළිබඳ අවබෝධය ශතවර්ෂ ගණනාවක් පුරා විකාශනය වූ නමුත්, කාරණා කිහිපයක් නොවෙනස්ව පැවතුණි. එනම්, ගැළැවුම්කරුවා මිනිස් රජකෙනකු වනු ඇති බවත්, ඔහු අභිෂේක කරනු ලබන බවත්, බලගන්වනු ඇති බවත්, යුදෙව් නිජබිම සතුරන්ගෙන් මුදාගන්නා බවත් යන්නයි. බොහෝ කාලයක් බලා සිටි ගැළැවුම්කාරයා තමා බව ජේසුතුමා විශ්වාස කළේය.

අනාගතයේ යම් දිනක විශ්වයටම අධිරාජයකු, 'චක්‍රවර්ති' (චක්කවත්ති) මුළු ඉන්දියාවම, හමුදා බලයෙන් නොව, තමන්ගේ ගුණධර්මවල බලයෙන් එක්සත් කර, ධර්මිෂ්ට සමාජයක් බිහිකරනු ඇතැයි යන මතය ක්‍රි. පූ. 6වන ශතවර්ෂය සමීපයේදී, ඉන්දියාවේ ක්‍රමයෙන් ඇතිවිය. චක්‍රවර්ති මතය බුදුපියාණන් වහන්සේට සුපුරුදු විය, උන්වහන්සේ ඒ පිළිබඳව බොහෝ විට සඳහන්කර ඇත.[115] කෙසේ නමුත් උන්වහන්සේ කිසිවිටක තමන්වහන්සේ චක්‍රවර්ති අධිරාජයකු වශයෙන් නොහැඳින්වූ අතර, උන්වහන්සේගේ ශ්‍රාවකයෝ ද උන්වහන්සේ එසේ යයි නොහැඳින්වූහ.

සිතන පරිදි එකල ඇත අතීතයේ වැඩ සිටි වැඩසිටි ඔබමොබ යන බොහෝ භික්ෂූහු (ශ්‍රමණ), ඉහළ ආධ්‍යාත්මිකතා ඉෂ්ටකරගත් විශේෂ හැකියාවන්වලින් යුක්ත වූහ. එම ගුරුවරුන් හැඳින්වූයේ බුද්ධ, ජින, තථාගත, තීර්ථංකර, කේවලින්, උත්තමපුරිස හෝ මුනි යන නාමවලින් ය. ජෛනයන් උදාහරණ වශයෙන් තමන්ගේ ආගම ගොඩනැඟුවේ 'පාර්ශ්ව' බව කියා ඇත. සමහර විට ක්‍රි.පූ. 7වන ශතවර්ෂයේදී පමණ ජීවත් වූ සැබෑ මිනිසා විය හැකිය. අනෙක් අය ද සැබෑ මිනිසුන් විය හැකිය, අඩු තරමින් ඒ අයගේ නම් මතක තබාගෙන ඇත, බොහෝ අය සුදුසු ආකාරයට ප්‍රසිද්ධියක් දරන්නන් හෝ අර්ධ ප්‍රසිද්ධියක් දරන්නන් විය හැකිය.

අතීතයේ වැඩසිටි බුදුවරුන් පිළිබඳව බුදුපියාණන් වහන්සේට විශ්වාසයක් තිබූ අතර, උන්වහන්සේ 6 නමකගේ නම් සඳහන් කළහ.[116] තමන්වහන්සේ මෑතම බුදුන්වහන්සේ ලෙස සැලකූහ. බුදුවරුන් කිසිම දෙවිකෙනකු විසින් එවා නොමැත, ඔවුහු එක් විශේෂ වේලාවක නොපැමිණෙති, ඔවුහු කිසිම විශේෂ ජනවාර්ගික කණ්ඩායමක් හා සම්බන්ධ නැත, නමුත් ඕනෑම පුද්ගලයකුට ඔවුන්ට සවන් දී යහපත උදාකරගත හැකිය. අතීත බුදුවරුන් පිළිබඳව සංකල්පය පදනම් වන්නේ නිත්‍ය සත්‍ය (ධම්මෝ සනන්තනෝ) යන අදහස මතයි, ඒ මිනිසුන්ට එය තේරුම් ගැනීමට ස්වභාවිකවම හැකියාවක් තිබෙන නිසා සහ සමහර පුද්ගලයෝ එය සාක්ෂාත් කරගනිති.

ගැළැවුම්කරුවකු තුළ ඇති විශ්වාසය සම්බන්ධයෙන්, ජේසුස්වහන්සේගේ කාලයේ බොහෝ යුදෙව්වන්ටත් විනාශකාරී සිද්ධීන් පිළිබඳව බලාපොරොත්තු තිබුණි, උදාහරණ වශයෙන්, ලෝකය පිළිබඳ අදහස හෝ අඩුතරමින් ලෝකය ඉක්මනින් විනාශ වේ යැයි දැන සිටීම සඳහන් කළ හැකි ය. ඔවුන්ගේ විශ්වාසය වූයේ ලෝකය දූෂිත සහ දුෂ්ට ස්ථානයක් බවය. කෝපයට පත් දෙවියන් වහන්සේ ගෙන්දගම් සහිත විශාල ජලගැල්මකින් ලෝකය විනාශ කිරීමට යන බවත්, ධාර්මික ජීවිත ආරක්ෂාකර අළුත් සහ පරිපූර්ණ ලෝකයක් ඇතිකරන බවත්ය.

## වෙනත් අය උන්වහන්සේලා දුටු අයුරු

පොදු ජනතාව අතර බොහෝ කාලයක් වැඩසිටිමින් සහ පැවති විශ්වාසවලට අභියෝගාත්මක ලෙස සමහර අදහස් ප්‍රකාශ කරමින් ද බුදුපියාණන් වහන්සේ සැබැවින් ම විරුද්ධ පාර්ශ්වයන්ගේ, විවේචන සහ සමහරවිට නොරිස්සීම් ද ආකර්ෂණය කරගත්හ. එවැනි ප්‍රතිචාරවලට කලබල නොවූවත්, උන්වහන්සේ සාමාන්‍යයෙන් වඩා සම්පූර්ණ ලෙස පැහැදිලි කරමින් තමන්වහන්සේගේ තත්ත්වය සාධාරණීය කිරීමට උත්සාහ ගත්හ. එසේම උන්වහන්සේ තමාගේ විවේචකයන්ට පෞද්ගලික මට්ටමෙන් දෝෂාරෝපණය නොකළහ.

බුදුපියාණන් වහන්සේ බුද්ධත්වයට පත්වී වසරක කාලයක් තුළ මගධයේ සිටි ඉතාම හොඳින් දන්නා සහ උතුම් ශ්‍රමණයන් වූ (සමණ) කාශ්‍යප සොයුරන් තිදෙනා සහ ඔවුන්ගේ සියලු අනුගාමිකයන් සමඟින් උන්වහන්සේගේ ශ්‍රාවකයන් බවට පත් වූහ. ඊට ටික කාලයකට පසු, සංජය බෙල්ලට්ඨිපුත්ත නමැති තවත් ශ්‍රමණ ගුරුවරයකුගේ බොහෝ අනුගාමිකයෝ, මුළුමනින් 250ක් පමණ, බුදුපියාණන් වහන්සේගේ ශාසනයට එක්වීම සඳහා ඔහු අතහැර දැමූහ. මෙම සිද්ධීන් දෙක මගධය පුරා මහත් උනන්දුවක් ඇතිකරන්නට හේතුවූ අතර, බුදුපියාණන් වහන්සේගේ බුද්ධකෘත්‍යමය ප්‍රගමනයේ ඉතාම මුල් කාලයේදීම උන්වහන්සේ ජනප්‍රිය වූහ. ඉතා ඉක්මනින් බොහෝ තරුණයන් පැවිදිවීමට

අවසර ඉල්ලා සිටි අතර, බුදුපියාණන් වහන්සේ ඒ සියලු දෙනාම පිළිගැනීමට සතුටු වූහ. නමුත් ඒ සියලු දෙනාම පැවිදි කිරීම නිසා ප්‍රශ්න ඇතිවිය. අයෝග්‍ය අන්දමෙන් පුහුණුව ලැබූ සහ නිරීක්ෂණයට ලක් නොවූ භික්ෂූහු ලඟි ලඟියේ සැම තැනම ඔබමොබ යාමෙන් බාධා ඇති කරන්නට පටන් ගත්හ. එසේම, බොහෝ තරුණයන් සහ මිනිසුන් තමන්ගේ පවුල් අත්හැරීමට පටන් ගැනීමෙන් එයින් බලපෑම් ඇතිවූ මිනිසුන් අතර, සැනසිල්ල නැතිවිය. මෙම තත්ත්වය නිසා බුදුපියාණන් වහන්සේට විරුද්ධව නොසතුට පළවිය. මිනිස්සු මෙසේ පැවසූහ: ''අපට දරුවන් නැතිකරමින්, අප වැන්දඹු තත්ත්වයට පත්කරමින්, අපගේ පවුල් කඩාබිඳ දමමින් ශ්‍රමණ ගෝතම ඉදිරියට යයි." මේ පිළිබඳව බුදුපියාණන් වහන්සේ සැලකිලිමත් වූවත්, උන්වහන්සේ ඒ බව නොපෙන්වූ සේක. මිනිසුන් උන්වහන්සේ පිළිබඳව පවසන දේ දැනුම් දුන්විට උන්වහන්සේ මෙසේ ප්‍රකාශ කළහ: ''මෙම ඝෝෂාව බොහෝ කාලයක් නොපවතී, එය දින හතක් පැවත, ඊටපසු නවතී."[117] පැවිදි අපේක්ෂකයන් පරීක්ෂා කිරීමට සහ පැවිදි කිරීම සහ භික්ෂූන් පැවිදි කිරීම සඳහා නීති පැනවීම් ආරම්භ වූයේ මෙයින් පසුවය.

බුදුපියාණන් වහන්සේ වෛතුල්‍ය වේද නොවන සමණ සම්ප්‍රදාය තුළ ශක්තිමත් ලෙස පිහිටා සිටියත්, උන්වහන්සේ එහි බොහෝ මූලික උපකල්පන, විශේෂයෙන්ම වේදනාකාරී තපස (තප) පුහුණුවීම සහ ස්වයං-අත්තකිලමථය (අත්තකිලමථ) නොසලකා හැරියහ. මේ පිළිබඳව සමහර විට වෙනත් ශ්‍රමණයෝ උන්වහන්සේ විවේචනයට ලක් කළහ. එවැනි භික්මීම් වර්ෂ ගණනාවක් පුහුණු කිරීමෙන් පසු උන්වහන්සේ අවසානයේ ඒවා අත්හැර සේදීම් සහ ආහාර ගැනීම් නිසියාකාරව නැවතත් සිදු කළහ. උන්වහන්සේට එක්ව සිටි ශ්‍රාවකයෝ පස්දෙනා ප්‍රකෝපයට පත්වූහ. ''සශ්‍රීක ජීවිතයකට නැවත පැමිණීම" ( ආවත්තො බාහුල්ලාය) පිළිබඳව ඔව්හු උන්වහන්සේට චෝදනා කරමින් කළකිරීමෙන් ඉවත් වූහ.[118] කාශ්‍යප ස්වාමීන්වහන්සේ ඔහුට ඇසුණු චෝදනාව නැවතත් බුදුපියාණන් වහන්සේට පැවසූහ: ''ගෝතම භික්ෂුව සියලු තපස් භික්මීම් අනුමත

නොකරයි, දුෂ්කර ජීවිත ගතකරන සියලුදෙනා ඔහු විවේචනය කරයි, දෝෂාරෝපණය කරයි." බුදුපියාණන් වහන්සේ මෙය අසත්‍ය බව ප්‍රකාශ කළහ. තමන්වහන්සේ අවබෝධය සහ විමුක්තිය සඳහා කෙරෙන තපස අගය කරන බව පැවසූහ. එසේම පළමුවැන්න දෙවැන්නට අනිවාර්යයෙන්ම මඟ පෙන්වන බව අදහස් නොකරන පුද්ගලයන් විවේචනය කළහ.[119] ඉහත සඳහන් පරිදි, දේවදත්ත බුදුපියාණන් වහන්සේගෙන් වෙන්වී තමන්ගේම ශාසනයක් පිහිටුවීම සම්බන්ධයෙන් කළ සාධාරණීකරණය වූයේ බුදුපියාණන් වහන්සේ තපසේ වටිනාකම සහ ස්වයං-අත්තකිලමථය අවධාරණය ඉවත් කිරීමය.

බුදුපියාණන් වහන්සේගේ තරුණ වයසට සාපේක්ෂව උන්වහන්සේ රහත්ඵලය ලබා ඇති බව බුදුපියාණන් වහන්සේ පවසද්දී, එසේ පැවසූ අනෙක් බොහෝ දෙනා බොහෝ වයසට පත්වූ අය වීම නිසාත්, බුදුපියාණන් වහන්සේ පිළිබඳව බොහෝ මිනිසුන් තුළ වැදගත් හැඟීන ගැනීමක් ඇති කිරීමට හේතුවිය. පසේනදී රජතුමා මේ පිළිබඳව බුදුපියාණන් වහන්සේගෙන් ඇසුවේය: "ශාසනයේ සහ නිකායයන්වල ප්‍රධානීන් වන, හොඳින් දන්නා ගුරුවරු, ජනප්‍රිය සහ මහජනයා අතර හොඳින් පිළිගත් භික්ෂූන් වහන්සේලා සහ බ්‍රාහ්මණයෝ ද තමන් රහත්ඵලයට පත්වූ බවක් නොපවසති. එමනිසා ඔබවහන්සේ මෙතරම් තරුණ වියේ සිටිද්දී සහ මෑතකදී භික්ෂුවක බවට පත්වී සිටියදීත් එවැනි තත්ත්වයකට පත්වී ඇතැයි කියන්නේ කෙසේ ද?"[120] බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ: "රජකෙනෙක් තරුණ විය හැකිය, නයෙක් මෑතදී බිත්තරයෙන් පිටතට ආවා විය හැකිය, යළිදු ගින්දරක් මේ දැන් ගිනි දැල්වූවා විය හැකිය, නමුත් ඒවායෙන් බලපෑමක් ඇත, එමනිසා ඒවා පිළිබඳව ප්‍රවේසම් විය යුතුය. "[121]

බුදුපියාණන් වහන්සේගේ කාලයේ ආගමික ප්‍රශ්න පිළිබඳව ප්‍රසිද්ධ සාකච්ඡා සහ වාද-විවාද ඉන්දියානු සමාජයේ අංගයක් විය. සමහර අයට

එවැනි සිද්ධි ප්‍රචාරය වන අලුත් අදහස් ඉගෙන ගැනීමට අවස්ථාවක් වන අතර, සුළු පිරිසකට තමන් දක්ෂයන් ලෙස ප්‍රවර්ධනය කිරීමට සහ වාද-විවාදවලට සවන් දීමට ද අවස්ථාව ලැබේ. ''දක්ෂ, අනෙක් අයගේ ධර්ම පිළිබඳව හොඳින් දන්නා, සැබෑ ලෙස පරවාද මථනය කරන ඇතැම් උගත් වංශවත් අය ඇත. එවැනි පුද්ගලයෝ තමන්ගේ තියුණු බුද්ධිය භාවිත කරමින් අනෙක් අයගේ අදහස් බිඳ හෙළති. ගෞතම බුදුපියාණන් වහන්සේ යම්කිසි ගමකට හෝ නගරයකට වඩින බව දැනගත් විට මිනිස්සු 'අපි උන්වහන්සේගෙන් මෙම ප්‍රශ්නය අසමු, උන්වහන්සේ මෙසේ පිළිතුරු දුන්නොත් අපි මෙසේ කියමු, අපි උන්වහන්සේගේ ධර්මය ප්‍රතික්ෂේප කරමු' ආදි වශයෙන් සිතමින් ප්‍රශ්න සකස් කරති. නමුත් ගෝතම බුදුපියාණන් වහන්සේ වෙත ගියවිට, උන්වහන්සේ ධර්මය ගැන සාකච්ඡා කරමින් ඔවුන් සතුටු කරති, උත්තේජනය කරති, ප්‍රබෝධයට පත් කරති, ප්‍රීතියට පත් කරති, ඔවුහු එතරම් ප්‍රශ්න නොඅසති, උන්වහන්සේගේ ධර්මය ප්‍රතික්ෂේප නොකරති."[122] එවැනි විරුද්ධවාදීන් සහ තර්ක කරන්නන් සනසන්නට සහ ආකර්ෂණය කරන්නට උන්වහන්සේට තිබූ හැකියාවේ ප්‍රතිඵලයක් වශයෙන් සමහර පුද්ගලයන් සිතුවේ උන්වහන්සේ එසේ කරන්නේ ගුප්ත ක්‍රමයකින් බව ය.[123]

බුදුපියාණන් වහන්සේට විරුද්ධව සිදු කරන, වැදගත් ලෙස අද කාලයටත් පැවැත එන තවත් විවේචනයක් නම්, සත්වයකු - පුද්ගලයකු නැතැයි යන උන්වහන්සේගේ නිර්වාණය සහ ධර්මය පිළිබඳ සංකල්පයයි. මෙය උච්ඡේදවාදයේ ස්වරූපය වශයෙන් සලකනු ලබයි. මෙය ඉගැන්වීම සම්බන්ධයෙන් උන්වහන්සේ මෙසේ පිළිතුරු දුන්හ: ''සත්‍යවාදීව කථාකිරීමේ ආකාරයක් තිබේ - යමකුට කියන්නට පුළුවනි මා උගන්වන්නේ ශූන්‍යවාදය (උච්ඡේදවාය) පිළිබඳ ධර්මය බව සහ මා මගේ ශ්‍රාවකයන් ඒ පිළිබඳව පුහුණු කරන බව. මා උගන්වන්නේ ලෝභය, ද්වේෂය සහ මෝහය ශූන්‍ය කරන ආකාරයයි, මා උගන්වන්නේ විවිධාකාර දුෂ්ටකම් සහ වැරදි මානසික තත්ත්වයන් ශූන්‍යකරන ආකාරයයි".[124] ඉතා අන්තයට ගිය භික්ෂූන් ටික දෙනකු උන්වහන්සේ ජීවිතය සමග නොසැලකිලිමත් යයි

චෝදනා කර ඇත. බුදුපියාණන් වහන්සේ තණකොළ අතුරන ලද පොළොවේ සැතපෙනු දැක මාගන්දිය නමැති භික්ෂුව මෙසේ පැවසුවේය: ''වැඩීමේ ක්‍රියාවලිය විනාශ කරන ගෞතමයන් වහන්සේගේ ඇඳ අප දකින විට එය අපට කණගාටුදායක දර්ශනයකි.[125] " මෙම විවේචනයෙන් අදහස් කරන්නේ කුමක් ද කියා සම්පූර්ණයෙන්ම නිශ්චිත නැත. නමුත් ගස් සචේතනික ජීවයකි; එසේම ගස් කඩා ඉවත් කිරීම හා කැපීම ද මැරීමට සමානය; වඩා සුළු දේවල් ගැන පවා කල්පනාකාරී භික්ෂුවක් ද මේවා කිරීමෙන් වැළකෙන බවට[126] එකල තිබූ සාමාන්‍ය විශ්වාසය මාගන්දිය පිළිගත් බවක් මෙයින් හැඟේ. දැඩි සේ නිර්මාංශයට යොමු වූ ජෛන භක්තිකයෝ මස් අනුභව කිරීම සම්බන්ධයෙන් බුදුපියාණන් වහන්සේට සහ උන්වහන්සේගේ ශ්‍රාවකයන්ට අප්‍රසාදය පළ කළහ: ''ජෛන භක්තිකයන් බොහෝ පිරිසක් නගරය හරහා, ප්‍රධාන මාවත් සහ වීදි - පැති හරහා, පටු පාරවල් සහ මංතීරු හරහා ඔවුන්ගේ අත් වනමින් සහ කෑගසමින් ගියහ, 'සීහ සේනාපති ගෞතමයන් වහන්සේට ආහාර සඳහා හරියටම මෙම විශාල සතා මැරුවේය. තමන් සඳහාම මැරූ බව දැන දැනම ගෞතමයන් වහන්සේ එය ආහාරයට ගන්නට යති.' "[127] දන් දෙන්නකුගෙන් පිළිගෙන මස් සහිත ආහාරයක් ගැනීම සතුන් මැරීමක් ය යන චෝදනාවට බුදුපියාණන් වහන්සේ ප්‍රතිචාර දැක්වූයේ නැත. කෙසේ නමුත්, භික්ෂු භික්ෂුණීන්ට තමන් වෙනුවෙන්ම සතකු මැරීම දුටුවා නම්, ඇසුවා නම් හෝ සැකයක් ඇති වුණා නම්, එම ආහාරය පිළිනොගත යුතු බවට බුදුපියාණන් වහන්සේ විනය ප්‍රඥප්තියක් කළහ.[128] බුදුපියාණන් වහන්සේ නිර්මාංසභක්ෂක වීම ඉගැන්වූවා යැයි පුළුල් ලෙස විශ්වාස කරන නමුත් එය නිවැරදි නොවේ. නමුත් එම පුරුද්ද සමහර බෞද්ධයන් අතර ප්‍රචලිත වූයේ පසුකාලීන ශතවර්ෂවලදී ය.[129]

බුදුපියාණන් වහන්සේ සමඟ සංවාදයක යෙදෙන්නා සංවාදය අවසානයේ බොහෝ විට බුදුපියාණන් වහන්සේ දේශනා කළ දේ සම්බන්ධයෙන් තමන්ගේ තෘප්තිය ප්‍රකාශ කරයි, නමුත් ඒ සැමවිට ම නොවේ. බුද්ධත්වයට පත්වී සති කීපයකට පසුව උන්වහන්සේගේ ශ්‍රාවකයන් පස් දෙනාට

තමන්වහන්සේ අවබෝධ කරගත් ධර්මය දේශනා කිරීමට වැඩියහ. උරුවෙල සහ ගයා අතර මාර්ගයේ දී අහම්බෙන් උන්වහන්සේට උපක නමැති ආජීවක හමුවිය. දුර සිට ම බුදුපියාණන් වහන්සේගේ ශාන්ත හැසිරීම දුටු ඔහු පැහැදීමට පත් විය. දෙදෙනා ආසන්න වූ විට ඔහු බුදුපියාණන් වහන්සේට මෙසේ පැවසුවේය: "ඔබේ ඉඳුරන් පැහැදිලිය, ඔබේ සම පිරිසුදුය, බැබළේ. ඔබේ ගුරුවරයා කව්ද? තමන්වහන්සේට ගුරුවරයකු නොමැති බව බුදුපියාණන් වහන්සේ පැවසූහ. තමන්වහන්සේ බුද්ධත්වයට පත්වී ඇති නිසා, කිසිම කෙනකු තමන්වහන්සේට ඉගැන්වීමට සුදුසු තත්ත්වයක නොමැති බව උන්වහන්සේ පැවසූහ. මෙම පිළිතුර සත්‍ය වුවත්, උපක සිතුවේ එය ආත්ම වර්ණනාවක් ලෙසය. ඔහුගේ හිස සොලවමින් ඉවත ගියේ: ''එය එසේ විය හැකිය ගරු ස්වාමීන්වහන්ස" යනුවෙන් කියමින් ය.[130]

බුදුපියාණන් වහන්සේ භික්ෂූන්ට උක්කට්ඨා යන ප්‍රදේශයේදී දේශනාවක් කිරීමෙන් පසු, 'ඔවුන් බුදුපියාණන් වහන්සේගේ දේශනාවෙන් සතුටට පත් වී නැත.'[131] තවත් අවස්ථාවක දී කපිලවත්ථුවට වැඩම කරමින් සිටිය දී බුදුපියාණන් වහන්සේට උන්වහන්සේගේ මවගේ සහෝදරයා වූ දණ්ඩපානි හමුවී ධර්මය දේශනා කරන ලෙස ඔහු ඉල්ලුවේය. සවන්දීමෙන් පසු බුදුපියාණන් වහන්සේ අවසාන කරන්නට මත්තෙන්, කිසිම සඳහනක් නොමැතිව, මහලු මිනිසා ''ඔහුගේ හිස සොලවා, දිව වනා, ඇස්බැම් ඔසවා නළල රැළි ගන්වා, තම සැරයටියට හේත්තු වී ඔහු යන්නට විය. "[132]

වරක් බ්‍රාහ්මණයකු සමග කථාකරමින් සිටින විට, පැරණි මුනිවරයන් ඉගැන්වූ දේ ඉතා විශ්වාසයෙන් පවසමින් බ්‍රාහ්මණයන් ඒ සමගම තමන් මාර්ගඵල නොලැබූ බව ඔවුන්ම පිළිගැනීම අන්ධ මිනිසුන් බැඳි රැහැනක් වගේ යැයි බුදුපියාණන් වහන්සේ පැවසූහ. ''පළමුවැන්නා මැද සිටින්නා නොදකී, මැද සිටින්නා අවසානයට සිටින්නා නොදකී." මෙයට බ්‍රාහ්මණයා කෝපයට පත්විය. මෙම උපමාවෙන් කෝපයට සහ අසතුටට පත් වී ඔහු බුදුපියාණන් වහන්සේට පරිභව කරමින්, හෙළා දකිමින් සහ විවේචනය

කරමින් මෙසේ පැවසුවේය, 'ගෝතමයන් වහන්සේ අතනොහැරිය යුතුය.' "[133] මෙම අවස්ථාවේදී සාකච්ඡාව දිගටම කරගෙන ගිය අතර, සිතේ චංචලබව අඩුවිය, අවසානයේ බුදුපියාණන් වහන්සේ කෙරෙහි යම් ගෞරවයක් බ්‍රාහ්මණයා තුළ ගොඩ නැඟීමට පටන් ගත්තේය.

බුදුපියාණන් වහන්සේගේ සමහර ශ්‍රාවකයන් උන්වහන්සේව අතහැර දැමීම පිළිබඳව උදාහරණ ස්වල්පයක් ත්‍රිපිටකයේ සටහන්ව ඇත. යම් කාලයකට භික්ෂුවකව සිටි සුනක්ඛත්ත ධර්මය කෙරෙහි නොසතුටට පත්ව, බුදුපියාණන් වහන්සේට මෙසේ පැවසුවේය: ''ස්වාමීන් වහන්ස, මම ඔබවහන්සේ අතහැර යමි. මම තවදුරටත් ඔබවහන්සේගේ උපදෙස් නොපතමි." බුදුපියාණන් වහන්සේ සුනක්ඛත්තට ප්‍රශ්නයක් නගමින් ඔහුට පිළිතුරු දුන්සේක.

'' මා කවදා හෝ ඔබට මගේ ඉගැන්වීම් සමඟ ජීවත්වන්නට කියා තිබේද? "

'' නැත ස්වාමීනි "

'' එසේ නම් ඔබ මගේ ඉගැන්වීම් සමඟ ජීවත් වන්නට අවශ්‍යය යැයි කියා තිබේද? "

'' නැත ස්වාමීනි "

''එසේ නම්, ඔබ කව්ද සහ ඔබ අත්හරින්නේ කුමක්ද හිස් පුරුෂය? "[134]

පැහැදිලිව පෙනෙන ආකාරයට, සුනක්ඛත්තට අවශ්‍යවූයේ බුදුපියාණන් වහන්සේ ඍද්ධි වික්‍රමයක් හෝ ප්‍රාතිහාර්යයක් සිදුකරනවා දැක ගැනීමට ය. එය එසේ නොවුණ නිසා ඔහු කළකිරීමට පත්විය. ඉතා සාමාන්‍ය දෙයක් වුවත්, පැවිදි ශාසනයෙන් මඟහැරුණු පුද්ගලයෝ ධර්මය කෙරෙහි ඔවුන්ගේ කැපවීම පවත්වා ගෙන ගියහ.

'' භික්ෂුත්වයෙන් බැහැර වී නැවත ගිහිගෙයට පිවිසෙන පුද්ගලයෝ ද තවමත් බුදුපියාණන් වහන්සේ, ධර්මය සහ ශාසනය අගය කරති. ඔවුහු අනෙක් අයට නොව තමන්ට ම දෝෂාරෝපණය කරගනිති, 'අප පැවිදි

වූයේ ඉතා හොඳින් අනාවරණය කරන ලද ධර්මයක් යටතේ වුවද, අපි අවාසනාවන්ත වෙමු, අපට පින මඳය, අපට මනා සහ පිරිසුදු ආධ්‍යාත්මික ජීවිතයක් අපගේ මුළු ජීවිතයේම ගතකරන්නට නොහැකි විය. 'ආශ්‍රමයක කැපකරුවකු හෝ ගිහි ශ්‍රාවකයකු ලෙස ඔවුහු පන්සිල් ආරක්ෂා කරමින් සිටිති."[135]

බුදුපියාණන් වහන්සේගේ මුළු ලෝක ශාසනික ප්‍රගමනයේදී සිදුවූ ඉතාම කැළඹිලි සහිත සිද්ධිය වූයේ උන්වහන්සේ වේසාලියේ තාවකාලිකව වැඩ සිටිය අවස්ථාවේදීය. උන්වහන්සේ අශුභ භාවනාව මෙනෙහි කිරීම සඳහා භික්ෂූන් රැස්කර දේශනා කළහ. මෙම පුහුණුව සඳහා කායික ස්වභාවයේ අප්‍රසන්න අංගයන් පිළිබඳව මෙනෙහි කිරීමේ පුහුණුව අවශ්‍ය විය. මෙම පුහුණුවේ අරමුණ වූයේ ශරීරය කෙරෙහි නොඇලීම ධෛර්යමත් කිරීමය, ලිංගික ආවේගය සන්සුන් කිරීමට, සහ කායික ආකර්ෂණය සඳහා සාමාන්‍යයෙන් පවතින වැඩි අවධාරණය තුලනය කිරීමය. මෙම දේශනයෙන් පසු, තමන් වහන්සේට මාස භාගයකට හුදෙකලාවකට යාමට අවශ්‍ය බවත්, දානය රැගෙන එන භික්ෂුව හැර වෙනත් අයකු නොපැමිණිය යුතු බවත් බුදුපියාණන් වහන්සේ පැවසූහ. උන්වහන්සේ පිටත වැඩිය පසු භික්ෂූන් මෙනෙහි කිරීම සිදුකළ අතර, සමහර අයට උග්‍ර ප්‍රතිඵල ඇතිවිය. ඔවුන්ගේ ශරීරය පිළිබඳව ''පිළිකුලට, අරුචියට සහ ලජ්ජාවට පත්ව භික්ෂූහු 30ක් පමණ සියදිවි නසා ගත්හ, පදගත අර්ථය 'ගෙල කපාගෙන' මිය යාමයි, (සත්ථහාරක). හුදෙකලාවෙන් පසු බුදුපියාණන් වහන්සේ ආපසු වැඩිය විට, සමහර භික්ෂූන් නොමැති බව දුටුවහ, ඔවුන් පිළිබඳව විමසූ විට සිදුවී ඇති දේ පැහැදිලි කරන ලදී. එවිට බුදුපියාණන් වහන්සේ ආනාපානසති භාවනාව පිළිබඳව දේශනයක් කරමින් සන්සුන් බව සහ නොකැළඹුණ බව උපද්දන්නට එයට ඇති හැකියාව අවධාරණය කළ බව ත්‍රිපිටකය සඳහන් කරයි. නමුත් සිදුවූ ඛේදවාචකය පිළිබඳව උන්වහන්සේ යමක් පැවසුවා ද කියා සඳහන් වී නැත.[136] එසේම වෙනත් අයගේ ඒ පිළිබඳ ප්‍රකාශ ද ලියා නැත. නමුත් අද කාලයේ මෙන්ම ඒ කාලයේ ද මිනිසුන් දැඩි

සේ කම්පනයට පත් වන්නට ඇත. පුද්ගලයකුගේ මනස කියවීමට හෝ අඩු තරමින් ඔවුන්ගේ හැකියාවන් සහ නැඹුරුව අවබෝධකර ගැනීමට සහ ඔවුන්ට විශේෂයෙන් ඒ ආකාරයෙන් සිත් ඇදගන්නා අයුරින් ධර්මය ඉදිරිපත් කිරීමට බුදුපියාණන් වහන්සේට හැකියාවක් තිබූ බව බොහෝ විට සඳහන් වී ඇත. වේසාලි සිද්ධියෙහි දී භික්ෂූන් ක්‍රියා කළ ආකාරය එයට අනුගත නොවන බව පෙනේ.

ඉඳහිට සිදුකෙරෙන විවේචන සහ ඍණාත්මක තක්සේරු තිබියදීත්, බුදුපියාණන් වහන්සේගේ කාලයේ සිටි උන්වහන්සේට වඩා අවුරුදු 12ක් පමණ ජ්‍යෙෂ්ඨ ජෛන තීර්ථංකර මහාවීර සමඟ බුදුපියාණන් වහන්සේ ඉතාම ගෞරවයට පත් වූ ගුරුවරයාය. උන්වහන්සේ පැවසූ දේ හා සමානවම කළ දේ පිළිබඳවත් මිනිස්සු ආකර්ෂණයට පත්වූහ. උන්වහන්සේ අගය කළ එක් පුද්ගලයෙක් මෙසේ පැවසුවේය: ''බුදුපියාණන් වහන්සේ කියන ආකාරයටම ක්‍රියා කරති, එසේම උන්වහන්සේ ක්‍රියාකරන ආකාරයටම කථා කරති. අතීතයෙන් හෝ වර්තමානයෙන් අප සෝදිසි කළහොත්, උන්වහන්සේ හැර අවිරෝධි ගුරුවරයකු තවත් නැත.[137] උන්වහන්සේ එය පැහැදිලි කිරීමේදී යොදා ගත් තමන් වහන්සේගේ විනිවිද යන ප්‍රඥාව හා පෙළඹවීමේ හැකියාව උන්වහන්සේගේ අතිශයෙන්ම පැහැදිලිව පෙනෙන හැකියාවන් අතරෙහි ලා නොයෙක් විට සඳහන් කරනු ලැබේ.”

බ්‍රාහ්මණයන් දෙදෙනකු අතර ඇතිවූ මෙම කතිකාව ත්‍රිපිටකය සඳහන් කරයි. 'එකල කාරණපාලි බ්‍රාහ්මණයා ලිච්ඡවීන් හට ගොඩනැගිල්ලක් ඉදිකරමින් සිටියේය. ඈත සිට පැමිණෙමින් සිටි මිතුරු පිංගියානි බ්‍රාහ්මණයා දැක, ඔහු සමීපයට ගොස් මෙසේ ඇසුවේය:

'මෙතරම් උදයෙන් ඔබ කොහි සිට පැමිණෙන්නේ ද පිංගියානි?'

' මම ගෝතමයන් වහන්සේ හමුවන්නට ගියෙමි.'

‘හොඳයි, උන්වහන්සේගේ ප්‍රඥාවේ ගුණය පිළිබඳව ඔබ කුමක් සිතන්නේද? ඔහු ප්‍රඥාවන්තයෙක් යැයි ඔබ සිතනවාද? ’

‘උන්වහන්සේ හා සසඳන විට මා කව්ද? උන්වහන්සේගේ ගුණය විනිශ්චය කිරීමට මා කව්ද? ගෝතමයන් වහන්සේගේ ප්‍රඥාවේ ගුණය විනිශ්චය කිරීම කළ හැක්කේ උන්වහන්සේම වැනි පුද්ගලයකුට පමණි.’

‘ඉහළයි සැබවින්ම, ඔබ ගෝතමයන් වහන්සේට දුන් ඇගයීම’

‘නමුත් උන්වහන්සේ සමඟ සැසඳීමට මා කව්ද? ගෝතමයන් වහන්සේ ඇගයීමට මා කව්ද? සැබැවින්ම, උන්වහන්සේ ප්‍රශංසිතයන් අතර ප්‍රශංසිත ය. උන්වහන්සේ දෙවියන් සහ මිනිසුන් අතර ශ්‍රේෂ්ඨතම පුද්ගලයාය.” [138]

වස්සාන කාලයේ බුදුපියාණන් වහන්සේ සමඟ ශ්‍රාවස්තියේ ගතකළ එක් භික්ෂුවක් කපිලවත්ථුවට පැමිණියේය. ඒ භික්ෂුව පැමිණියේ කොහේ සිට ද කියා මිනිසුන් දැනගත් විට, බුදුපියාණන් වහන්සේ පිළිබඳව ප්‍රශ්න ඒ භික්ෂුවට ගලා ආවේය.[139] තවත් අවස්ථාවක කෝසලය සහ මගධයෙන් වේසාලියට පැමිණි බ්‍රාහ්මණ කණ්ඩායමකට බුදුපියාණන් වහන්සේ නගරයට ඒ මොහොතේ වැඩම කළ බව අසා උන්වහන්සේ හමුවීමට ඇති ඒ අවස්ථාව මඟ නොහැරිය යුතු බව තීරණය කළහ. පැහැදිලිව පෙනෙන ආකාරයට, බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ සහායකට දන්වා ඇත්තේ තමන්වහන්සේට බාධා නොකළ යුතු බවයි, නමුත් බ්‍රාහ්මණයෝ ජනප්‍රිය ගුරුවරයා හමුවන තුරු නොයන බවට දැඩිසේ කියා සිටියහ. මෙම අවහිරය දැක සාමණේර සීහ, බුදුපියාණන් වහන්සේ බැහැදැකීමට මිනිසුන් තිදෙනෙක් පැමිණ ඇති බවට දන්වන මෙන් උපස්ථායකයන් වහන්සේට දන්වා සිටියේය. තමන්ට එය කළ නොහැකි නමුත්, සීහට අවශ්‍ය නම් එසේ කිරීමට හැකි බව සීහට පැවසුවේය. එසේ සිදු කරන ලදි. පිටත, සෙවණක් යට පැදුරක් එලන ලෙස සීහට දන්වා බුදුපියාණන් වහන්සේ බ්‍රාහ්මණයන්ට කථා කළහ. [140]

බුදුපියාණන් වහන්සේගේ ධර්මය එවැනිය, උන්වහන්සේ එය ඉදිරිපත් කරන ආකාරයෙන්, පුද්ගලයකුගේ කායික අංගවලට වුවද සැලකිය යුතු බලපෑමක් ඇති වේ. සාරිපුත්ත මහරහතන් වහන්සේට ගෘහපති නකුලපිතා හමුවූ විට, උන්වහන්සේට ගෘහපතිතුමාගේ ශාන්ත සහ සංසුන් බවක් දකින්නට ලැබුණි.: "ගෘහපතිතුමනි, ඔබගේ ඉඳුරන් සංසුන් ය, ඔබගේ සමේ වර්ණය පැහැදිලිය සහ දීප්තිමත්ය, ඉතින් අද ඔබට බුදුපියාණන් වහන්සේ සමඟ මුහුණට මුහුණලා සාකච්ඡාවක් තිබුණේ ද? ''නකුලපිතා පිළිතුරු දුන්නේය : ''එසේ නොවන්නේ කෙසේද, ස්වාමීන් වහන්ස,? මේ දැන් මම බුදුන්වහන්සේගේ අමෘතය බඳු ධර්මයේ හිරිපොද ස්නානය කළෙමි." 141

බුදුපියාණන් වහන්සේගේ උදාර ත්‍යාගශීලි බව සහ විවෘතබව, විශේෂයෙන්ම ආගමික කරුණු සම්බන්ධයෙන් මිනිස්සු බොහෝ විට පුදුමයට පත්වූහ. වරක් බාහිර ශ්‍රමණ පිරිසකගේ රැස්වීමකදී, ඔවුන්ගේ නායකයා බුදුපියාණන් වහන්සේගෙන් ධර්මය පැහැදිලි කරදෙන මෙන් ඉල්ලුවේය. බුදුපියාණන් වහන්සේ මෙසේ පිළිතුරු දුන්හ: ''වෙනස් අදහස්, මනාප සහ නැඹුරුතා ඇතිව සහ වෙනස් ගුරුවරයකු අනුගමනය කරන ඔබට මා උගන්වන ධර්මය අවබෝධ කරගැනීම අපහසුය. එමනිසා අපි ඔබගේ ධර්මය සාකච්ඡා කරමු." ශ්‍රමණයෝ මෙයින් පුදුමයට පත්වූහ. "විස්මය ජනකයි, සැබැවින්ම විශිෂ්ටයි, ගෝතමයන් වහන්සේ ගේ බලය කෙතරම් වැදගත් ද, උන්වහන්සේ අනෙක් අයට ඔවුන්ගේ ධර්මය සාකච්ඡා කිරීමට ඇරයුම් කරති! "142

සමහර ගුරුවරයෝ තමන්ගේ ශ්‍රාවකයන්ට හෝ අගය කරන්නන්ට වෙනත් ආගම්වල අයට කිසිම උපකාරයක් නොකරන ලෙස කියති. පහත සඳහන් පරිදි, අනෙක් ධර්ම පිළිබඳව බුදුපියාණන් වහන්සේ විවේචනාත්මක විය හැකි නමුත්, උන්වහන්සේ තමන්වහන්සේ පිළිබඳව මෙසේ පවසති: "මම පළමුව කරුණු පිරික්සා බලමි. මම කොන්දේසි විරහිතව (විභජ්ජවාදො නාහං එත්ථ ඒකංසවාදො) 143 කථා නොකරමි. ''වෙනත් විශ්වාස පිළිබඳව විශාල අන්තරයකින් සාධාරණීකරණය කිරීම්වලින් උන්වහන්සේ

වළකින බව බුදුපියාණන් වහන්සේ මෙයින් අදහස් කළහ. නමුත්, ඒවා පරීක්ෂාකර, ඒවායේ යම් සත්‍යයක් ඇත්නම් ඒවා පිළිගන්නා අතර, ඒවායේ දුර්වලතා පෙන්වා දෙති. මේ ආකාරයට අනෙක් ආගම් අනුගමනය කරන්නන් අවංකවම සත්‍යය සඳහා උත්සාහ කරන බව උන්වහන්සේට පිළිගත හැකිවිය. ඒ අනුව ධෛර්යමත් කිරීමට යෝග්‍ය විය.

ජෛන ආගමිකයකු වූ උපාලි බුදුපියාණන් වහන්සේගේ ධර්මය අනුගමනය කරන්නට තීරණය කළවිට, ඒ වෙනුවට උන්වහන්සේ මෙසේ පැවසූහ: ''බොහෝ කාලයක් ඔබගේ පවුලේ අය ජෛනයන්ට උපකාර කර ඇත. එමනිසා ඔවුන් ඔබගේ නිවසට පැමිණි විට දැනුදු ඔවුන්ට දානයෙන් සංග්‍රහ කළ යුතුය.144 තවත් අවස්ථාවක යම් කෙනෙක් බුදුපියාණන් වහන්සේට මෙසේ පැවසුවහ: ''යහපත් ගෝතමයන් වහන්ස, ඔබට සහ ඔබේ ශ්‍රාවකයන්ට පමණක් දන් දිය යුතු බව සහ අනෙක් අයට සහ අනෙක් ගුරුවරුන්ගේ ශ්‍රාවකයන්ට දන් නොදිය යුතු යැයි ඔබ කියන බව මම අසා ඇත්තෙමි. ඒ අය එසේ කියන්නේ ඔබගේ අදහස් නියෝජනය කරමින් සහ වෙනස් නොකරමින් ද? ඒ අය කථා කරන්නේ ඔබගේ ඉගැන්වීම්වලට අනුවද? සැබැවින්ම, යහපත් ගෝතමයන් වහන්ස, මම ඔබ වැරදියට නොදැක්වීමට තද ආශාවෙන් සිටිමි. "බුදුපියාණන් වහන්සේ මෙසේ පිළිතුරු දුන්හ: "මේ අය කියන දේ මගේ අදහස් නොවේ. ඒ අය මා වැරදියට දක්වා අසත්‍ය ප්‍රකාශ කර ඇත. සැබැවින්ම යම් කෙනෙක් තවත් කෙනකු දන් දීමෙන් වළක්වන්නේ නම් ඔහු තුන් ආකාරයකින් බාධා කරයි. ඔහු දන්දෙන්නාට යහපත අත්කර ගැනීමට බාධා කරයි, දානය ලබන්නාට එය ලබා ගැනීමට බාධා කරයි, එසේම ඔහු දැනටමත් ඔහුගේ ලෝභකම නිසා තමන් විනාශ කරගෙන ඇත."145 අන් අයගේ විශ්වාස කෙරෙහි බුදුපියාණන් වහන්සේ දැක්වූ විවෘතභාවය සහ ගෞරවය පිළිබඳව මිනිසුන් සිතුවේ කුමක්ද යන්න ගැන සටහනක් නැත. නමුත් එකල වෙනත් බොහෝ නිකායයන් අතර තිබූ වඩාත් සාමාන්‍ය දෙයක් වූ ඊර්ෂ්‍යාවෙන්

සහ තරගකාරීත්වයෙන් වෙනස්වූ පිළිගත හැකි දෙයක් ලෙස ඔවුන් සලකන්නට ඇත.

එසේම මිනිස්සු බුදුපියාණන් වහන්සේ නිශ්ශබ්දතාවට දැක්වූ ආදරය පිළිබඳව අවධානය යොමු කළ අතර, එය ඇගයූහ. බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ: ''මෙය ජලයෙන් ඉගෙන ගන්න. කඳු කුස්තුරවල සහ දැඩි පරතර අතර, උස් හඬැති වේගයෙන් දිය ගලායන තැන - ගංගා, නමුත් විශාල ගංගා ගලන්නේ නිශ්ශබ්දවය. හිස් බඳුන් ශබ්ද නගයි, පිරුණු දේ සැමවිටම නිශ්ශබ්දය. මෝඩයෙක් අඩක් පිරුණු කලයක් මෙන්ය; ප්‍රඥාවන්තයා ගැඹුරු නිශ්චල දිය කඩිත්තක් වැනිය.''[146] විශේෂයෙන්ම අපහාස සහ අසත්‍ය චෝදනා හමුවේ තැන්පත් නිශ්ශබ්දතාව පවත්වාගෙන යාම බුදුපියාණන් වහන්සේ අගය කළහ. ''කෝපයට කෝපය දනවන වචනවලින් ප්‍රතික්‍රියා නොදැක්වීම, ජයග්‍රහණය කරන්නට අපහසු යුද්ධයක් ජයග්‍රහණය කිරීමකි. එය තමන්ගේ සහ අනුන්ගේ ශුභසිද්ධිය වෙනුවෙන් කරන ක්‍රියාවකි. නමුත් ධර්මය නොදන්නා පුද්ගලයෝ ඔබ මෝඩයෙක් යැයි සිතති.[147] බුදුපියාණන් වහන්සේගේ දේශනා සිදු කිරීම් සහ සාකච්ඡා සහ වාදවිවාද පැවැත්වීම් ආදිය පිළිබඳව බොහෝ විස්තර තිබියදීත්, උන්වහන්සේ තමන්වහන්සේගේ බොහෝ කාලවේලාවක් 'එපිට රාත්‍රියට භාවනා කිරීමට', හුදෙකලාවට යෑමට, සමහර විට මාස තුනක් වැනි දිගු කාලයකට[148] සහ නිතර හුදෙක් නිශ්ශබ්දව වැඩහිඳීම ද සිදුවිය. උන්වහන්සේ 'වනාන්තර, ලඳු කැළෑවල අභ්‍යන්තරයේ, ශබ්දය අඩු නිහඬ ස්ථානවල, ජනයාගෙන් දුරස්ථ ස්ථානවල, මිනිසුන්ගෙන් බාධාවක් නැති ස්ථානවල සහ හුදෙකලාවට හොඳින් සුදුසු ස්ථානවල තාවකාලික නවාතැන් ගැනීමට සොයා වැඩියහ.''[149] වරක් ශ්‍රමණ පිරිසක් ඉඳගෙන ශබ්ද නගමින් කථාකරමින් සහ වාදකරමින් සිටින විට, ඈතින් බුදුපියාණන් වහන්සේ වඩිනු දුටුවහ. එක් පුද්ගලයෙක් අනෙක් අයට මෙසේ පැවසූහ: ''නිශ්ශබ්ද වන්න ඇවැත්නි, ගෝතමයන් වහන්සේ වඩිමින් සිටිති, උන්වහන්සේ නිශ්ශබ්දතාවට කැමැතිය, එය අගයති. උන්වහන්සේ අපේ කණ්ඩායම නිශ්ශබ්ද බව දුටුවොත්, අප වෙත වඩිනු ඇත.''[150]

බුදුපියාණන් වහන්සේගේ ශ්‍රාවකයන් නොවන පුද්ගලයෝත් උන්වහන්සේ හමුවී, සවන් දී සමහර විට උන්වහන්සේ වෙත ඔවුන්ගේ ප්‍රසාදය පළකර ඇත. මෙයට හොඳ උදාහරණයක් වැදගත් බ්‍රාහ්මණයකු වන සෝණදණ්ඩගේ මෙම ප්‍රකාශයෙන් උපුටා දක්වා ඇත. ''ගෝතමයන් වහන්සේ පවුලේ දෙපාර්ශ්වයෙන්ම හොඳ උත්පත්තියක් ලැබූ, අඩුම තරමින් පරම්පරා හතක්වත් පිරිසුදු සහ අඛණ්ඩ පරම්පරාවකින් පැවත එති. උන්වහන්සේගේ උත්පත්තිය සම්බන්ධයෙන් නිර්දෝෂීය. උන්වහන්සේ විශාල ඥාති කණ්ඩායමක්, බොහෝ රත්රන් සහ ධාන්‍ය අත්හළහ. උන්වහන්සේගේ ගුණ සම්පූර්ණය, සදහටම පැතිරී යයි. උන්වහන්සේ හොඳින් කථා කරති, ප්‍රිය වචනයෙන් යුක්තය, විනීතය, උන්වහන්සේගේ උච්චාරණය ආකර්ෂණීයයි, පැහැදිලිය සහ අදාළයි. උන්වහන්සේ බොහෝ අයගේ ගුරුවරයාය. උන්වහන්සේ ඉඳුරන් පිනවීම සහ මාන්නය අත්හැර ඇත. උන්වහන්සේ ක්‍රියාව සහ ක්‍රියාවේ ප්‍රතිඵල උගන්වති, නිදොස් බ්‍රාහ්මණ සම්ප්‍රදායයන්වලට ගරු කරති. විශාල ධනයක් සහ වතුපිටි හිමි, ප්‍රමුඛ රණශූර කුල පවුලකින් පැවැත එන ඉහළ උත්පත්තියක් හිමි වූ උන්වහන්සේ ඔබමොබ යන ශ්‍රමණයෙකි. විදේශීය රාජධානිවලින් සහ දේශවලින් පවා මිනිස්සු උන්වහන්සේ බැහැ දැකීමට පැමිණෙති. බොහෝ දෙවිවරු සහ මිනිස්සු උන්වහන්සේට ලැදිය, උන්වහන්සේ යම් නගරයක හෝ ගමක වැඩසිටී නම් එම ස්ථානයට අනර්ථකාමී භූතයන්ගෙන් අවැඩක් නැත. උන්වහන්සේට අනුගාමික විශාල පිරිසක් ඇත. උන්වහන්සේ ගුරුවරුන්ගේත් ගුරුවරයාය. විවිධ නිකායන්හි ප්‍රධානීහු උන්වහන්සේ සමඟ කරුණු සාකච්ඡා කිරීමට පැමිණෙති. වෙනත් සමහර භික්ෂූන් සහ බ්‍රාහ්මණයන් මෙන් නොව, ගෝතමයන් වහන්සේගේ කීර්තිය පදනම් වී ඇත්තේ උන්වහන්සේ අව්‍යාජ ලෙස පැමිණ වදාළ අද්විතීය ප්‍රඥාව සහ මඟපෙන්වීම මතය. මගධයේ බිම්බිසාර රජු ද, ඔහුගේ පුත්‍රයා සහ බිරිඳ, ඔහුගේ රාජ සභිකයන් සහ ඇමැතිවරු ද උන්වහන්සේගේ ශ්‍රාවකයෝ ය. කෝසලයේ පසේනදී රජු සහ පොක්ඛරසාති ද එසේම ය. ”151 සෝණදණ්ඩගේ අත්‍යන්ත වර්ණනාව බුදුපියාණන් වහන්සේ පිළිබඳව යමක්

පවසයි. එසේම එකල බ්‍රාහ්මණ පංතියේ ඕනෑකම් සහ අවධානය සහ ඔවුන් ප්‍රශංසනීය ලෙස සැලකිල්ලට ගත් දේ පිළිබඳව ද තොරතුරු ඇත.

ජේසුස්වහන්සේ, වර්ණනා කිරීම සහ චෝදනා කිරීම යන දෙකම සමාන මිම්මෙන් ආකර්ෂණය කරගන්නා, ස්වභාවයෙන් ප්‍රතිවිරුද්ධව සිතන පුද්ගලයකු බව නව තෙස්තමේන්තුව අඟවයි. සමහර අය ජේසුතුමා සම්බන්ධයෙන් කුතුහලයට සහ උද්දීපනයකට පත් වූ අතර ඔහු බැප්ටිස්ට් ජෝන්ගේ නැවත ඉපදීමක් යැයි සිතූහ. තවත් සමහරු ඔහු එලිජා යැයි විශ්වාස කළහ. පැරණි තෙස්තමේන්තුවේ වෙනත් ශාස්තෘවරයකු යැයි විශ්වාස කළහ.[152] බොහෝ කාලයක සිට බලාපොරොත්තු වූ ගැළවුම්කාර තනතුරට ජේසුස්වහන්සේ විශ්වාස කළ[153] අය අතර ඔහුගේ ප්‍රධාන ශ්‍රාවක පීටර් ද විය. අනෙක් අයට ඇතිවූයේ අඩු බලපෑමකි: ''මනුෂ්‍ය-පුත්‍රයාණෝ කමින් බොමින් ආ සේක; බලන්න, ඔහු කෑදරයෙකි, අයකැමියන්ගේත්, පව්කාරයන්ගේත් යහළුවෙකි' යි ඔබ කියන්නහු ය"[154] පැවසූහ. ජේසුස්වහන්සේ බදු එකතු කරන්නකුගේ නිවසේ නරක වර්ගයේ කණ්ඩායමක් සමඟ ආහාර ගනිමින් සිටින අයුරු විවිධ පූජකවරු දැක ඇත. ජේසුස්වහන්සේ එවැනි පුද්ගලයන් සමඟ හවුල් වන්නේ ඇයි ද කියා ඔවුන් අසා ඇත. ජේසුස්වහන්සේ ඒ අසා, ''රෝගීන්ට මිස නිරෝගීන්ට වෙදකුගෙන් වැඩක් නැත; මා ආයේ දමිටුන් නොව අදමිටුන් කැඳවීමට ය" යි වදාළ සේක.[155] මෙම පැහැදිලි කිරීම සම්පූර්ණයෙන්ම සාධාරණය, වෙනත් අය අත්හැරිය සහ මඟහරින ලද මිනිසුන් ඇතුළුව සියලු දෙනාම බේරා ගැනීමට උවමනා වූ ආදරණීය සහ කරුණාවන්ත දෙවියන් වහන්සේ කෙරෙහි ජේසුස්වහන්සේ තැබූ විශ්වාසය ඉන් අවධාරණය වේ. කෙසේ නමුත් ඔහුගේ ක්‍රියා, සම්ප්‍රදායෙහි නොබැඳුණ අතර, ආගමික ගුරුවරයකුට නොතරම් විය. එසේම ඔහුගේ පෞද්ගලික හැසිරීම සම්බන්ධයෙන් සැක මතුවන්නට ඇත. එය වර්තමානයේ භික්ෂුවක, පූජකයකු හෝ ආගමික උපදේශකයකු නොවැදගත් සොරුන්, ගණිකාවන් හෝ කල්ලියක සාමාජිකයන් හා මුසුවීමක් හා සමානය.

සමහර විට හාරදහසක් හෝ පන්දහසක්, සමහර විට පොඩි වී මිරිකෙන තරම් බොහෝ මිනිසුන් ප්‍රමාණයක විශාල ජන සමූහයක් වුවත්, ජේසුස්වහන්සේට ආකර්ෂණය කරන්නට හැකියාවක් තිබුණි.[156] මෙම සෙනඟ අතර සමහර අය පැමිණියේ ඔහු පවසන දෙයට සවන් දීමට විය හැකිය, නමුත් බොහෝ අය පැමිණියේ ප්‍රාතිහාර්යයක් දැකීමට හෝ ප්‍රාතිහාර්යයෙන් ඔවුන්ගේ ලෙඩ සුවකර ගැනීමටය. ''උන් වහන්සේගේ කීර්ති රාවය සිරියාව පුරා පැතිරිණි. නානා රෝග පීඩාවලින් පෙළුණු සියලු රෝගීහු ද යක්ෂාවේශ වූ අය ද මීමැස්මොර රෝගීහු ද අංසබාග රෝගීහු ද උන් වහන්සේ වෙත ගෙනෙන ලද්දෝ ය. උන් වහන්සේ ඔවුන් සුවපත් කළ සේක. ගලීලයෙන් ද දෙකපොලිසයෙන් ද ජෙරුසලමෙන් ද ජුදයෙන් ද ජොර්දාන් ගඟ එගොඩින් ද මහා ජනකායක් උන් වහන්සේ පසු පස්සේ ගියහ. "[157] මේ සියලුදෙනාම ඔහුගේ සුවිශේෂී දේවවාක්‍ය පිළිගත් බවක් හෝ ඒ පිළිබඳව උනන්දුවක් තිබුණේ යැයි අදහස් නොකරන බව සාක්ෂි හඟවයි. ජේසුන් වහන්සේ ඔවුන්ට පිළිතුරු දෙමින්, "මනාලයා මඟුල් ගෙදර සිටිය දී මනාල පිරිස උපවාසයෙහි යෙදවිය හැකි ද? එහෙත්, මනාලයා ඔවුන් කෙරෙන් වෙන් කරනු ලබන දවස එයි, ඒ දවසේ දී ඔවුන් උපවාස කරනු ඇතැ''යි වදාළ සේක.[158] ඒ නිසා ඔවුන්ට ජේසුස්වහන්සේ තදින් කථා කළේය : "එසේ වුවද දේව විනිශ්චය දවසේ දී ඔබට වඩා සොදොම් රටට සහනය ලැබෙන්නේ ය."[159]. ප්‍රාතිහාර්යයෙන් මිනිසුන් සඳහා ආහාර නිපදවමින් විශාල පිරිසකට ආහාර ලබා දීමෙන් පසු ජේසුස්වහන්සේ පිටවීමෙන් අනතුරුව, ඔවුහු ඔහු පසුපස ගියහ. ඔවුන් එසේ කළේ ඔහු ඉගැන්වූ දේ හෝ ඔහු විසින් ප්‍රාතිහාර්ය පෑම නිසා නොව, ඔවුන්ට ලැබුණු ආහාර නිසාය, ජේසුස්වහන්සේ ම මේ බව අවබෝධ කරගෙන සිටියේය.[160]

කැමැති වුණත් අකැමැති වුණත්, විශ්වාස කළත් නොකළත්, ජේසුස්වහන්සේ පිළිබඳව සැකයක් නොමැති, මිනිසුන්ට ඔහු දෙස බලා නිරීක්ෂණය කළ හැකි දෙයක් තිබුණි. ඔහුගේ ප්‍රාතිහාර්ය පෑමේ හැකියාව එයින් එක් අංගයකි. ඔහු තමන් පිළිබඳව කියන ලද දේවල්, සහ ලෝක විනාශය පිළිබඳව ඔහු විසින් කරන ලද විස්මය දනවන අනාවැකි අනෙක්

අංගයයි. ඒවා ඔහු ඉගැන්වූ තවත් සමහර දේවල්ය. ජේසුස්වහන්සේගේ සුවිශේෂී දේවවාක්‍යවල කූටප්‍රාප්තිය කන්ද උඩ දේශනාව බව කීම සාමාන්‍යයෙන් යෝග්‍ය වේ. මෙම දේශනාවේ ජනප්‍රිය කොටසක් වර්ණනා කරමින් තිබෙන අතරේ, ව්‍යවහාරයට සම්පූර්ණයෙන්ම කිසි දිනක ගෙන නැත. එසේම වෙනත් කෙනකු විසින් යෝග්‍ය යැයි යෝජනා කළත් අනුමැතිය වත් අද නොලැබෙනු ඇත. උදාහරණ වශයෙන් රාගයෙන් කාන්තාවක් දෙස බැලීම සැබැවින්ම පරදාර සේවනයේ යෙදීමට සමාන ලෙස සලකා බැලිය යුතු බවට එකඟ වන්නේ සුළු පිරිසකි. එසේම යමකු මෝඩයකු ලෙස හැඳින්වීම නිරයේ දඬුවම් නියම කිරීමට සුදුසු වේ.

එක් සහකරුවකු විශ්වාසය කඩකළ විට හැර වෙනත් කිසිම හේතුවක් නිසා දික්කසාද වීමට ඇති තහනම මිලියන ගණනාවක් ප්‍රේමණීය විවාහයකට හෝ පරදාර සේවනයේ යෙදීමේ අපකීර්තියට හේතු වී තිබේ. භික්ෂුවකට අනාගතයේ තමන්ගේ ආහාර සහ ඇඳුම් ලැබෙන්නේ කොහෙන්ද යන්න සිතන්නේ නැතිව සිටීමට පුළුවන් විය හැකි නමුත්, අතිවිශාල බහුතර පිරිසකට සම්පූර්ණයෙන්ම ප්‍රායෝගික නොවේ. මෙසේ ජීවත් වන්නට උත්සාහ කළ පුද්ගලයකු වගකීමෙන් තොර අයකු ලෙස හංවඩු ගැසෙනු ඇත. ''දුෂ්ට පුද්ගලයකුට විරෝධය නොපෑම සැබැවින්ම යෝග්‍ය ද? යම් අයකු යම් නිශ්චිත මුදලකට ඔබට නඩු පවරා එය ජයග්‍රහණය කරයි නම්, ඔබ උසාවිය ඔවුන්ට ගෙවීමට ප්‍රදානය කළ මුදලට වඩා වැඩි මුදලක් ගෙවනවාද?"

පාපයක් සිදු කිරීමෙන් වැළකීම සඳහා පුද්ගලයකුට අංග ඡේදනය කරන්නට දෙනු ලබන උපදෙසක් ඕනෑම සම්මතයකට අනුව සීමාන්තිකය. නමුත් ජේසුස්වහන්සේගේ පැත්තෙන් මෙය අතිශයෝක්තියකි.[161] බුදුපියාණන් වහන්සේ ස්වයං-අංග ඡේදනය සම්බන්ධයෙන් පැවසූ දේ වැදගත් වේ. එක් අවස්ථාවක භික්ෂුවක් තමන්ගේ ලිංගික ආශාව පාලනය කරගත නොහැකිව, බලාපොරොත්තු සුන්වී තමන්ගේ ප්‍රජනන ඉන්ද්‍රියන් සැබැවින්ම කපා දැම්මේය. මේ පිළිබඳව බුදුපියාණන් වහන්සේට දැන්වූ විට,

උන්වහන්සේ මෙසේ පැවසූහ: ''මේ මෝඩ මිනිසා කපා දැමිය යුතු දේ නොකපා වෙනත් දෙයක් කපා දමා ඇත, උදාහරණ - ඒ ආශාවන් සහ සිහින ලෝකය මිස එයට ප්‍රතිචාර දැක්වූ අවයව නොවේ." ඊට පසු කිසිම හේතුවකට කෙනකු ඡේදනය කිරීම වරදක් බව බුදුපියාණන් වහන්සේ නියෝගයක් පැනවූහ.162

මෙසේ තිබියදීත්, කන්ද උඩ පැවති දේශනයේ අනෙක් කොටස් සදාකාලික සහ විශ්වයට අයත් පූජනීය බවට ඇරයුමක් බව ඕනෑම ශිෂ්ට සම්පන්න පුද්ගලයකුට එකඟ විය හැකිය. මෙම කරුණාවන්තයන්, සාමය ඇති කරන්නන්, හදවතේ පිරිසුදු බව සහ ධාර්මිකතාවට තදින් ආශා කරන්නන් ආශීර්වාද ලබන බව ජේසුස්වහන්සේ ප්‍රකාශ කළේය. තමන්ගේ ප්‍රේක්ෂකයන්ට ප්‍රතිඥා දෙනවාට වඩා ඍජුව සහ අවංකව කථාකරන ලෙස, ප්‍රතිවාදියා උසාවියට ගෙන යනවා වෙනුවට ඔහු සමග සමාදාන වෙන්නට උත්සාහ කරන්න, වෙනත් අය විවේචනය කරන හෝ පරිභවයට විරුද්ධව ප්‍රතිප්‍රහාර දීමෙන් වළකින්න, සතුරන්ට ආදරය කරන්න, ඔබට පීඩා කරන අය වෙනුවෙන් අවංකව යදින්න. තමන්ට අනෙක් අය සැලකිය යුතු ආකාරයට අනෙක් අයටත් සලකන මෙන් ජේසුස්වහන්සේ ඉල්ලා සිටියේය. ඔබගේ සැදැහැවත්කම ප්‍රදර්ශනය නොකරන්නට වගබලා ගන්න, ඔබගේ දන්දීම් ප්‍රචාරය නොකරන්න, ජේසුස්වහන්සේ අවවාද දුන්නේය. දෙවියන් වහන්සේට පිළිගැන්වීමක් කරන්නේ නම් මතක තබා ගන්න, යම් කෙනකුට ඔබට විරුද්ධව යම් දෙයක් ඇත, අල්තාරය මත ඔබගේ පූජාව තබන්න, ඒ පුද්ගලයා සමග යහළු වෙන්න, ආපසු පැමිණ ඔබගේ පූජාව තබන්න. ''ඔබට ලබාදුන් දෛනික ආහාර" සම්බන්ධයෙන් නිහතමානී කෘතඥතාවකින් දෙවියන් වහන්සේට යදින්න.

මෙයින් මිනිසුන් පැහැදීමට පත්වීම පුදුමයක් නොවේ. එහි අන්තර්ගතය පමණක් නොව, සරල, නොරවටන අවංකභාවයෙන් ජේසුස්වහන්සේ කළ අනාවරණය නිසාය. මිනිසුන් පුරුදුව සිටි ව්‍යාජ භක්තිකයන්ගේ සහ නීතිය උගන්වන ගුරුවරුන්ගේ නීරස, නීතිය දැඩි සේ පිළිපදින දේශනාවලට වඩා

එය බොහෝ විට අවධානයට ලක්වන සහ පෞද්ගලික බවින් යුක්තය. ජේසුස්වහන්සේ ඉගැන්වූ වෙනත් දේ හෝ සමහර විට ඔහු ඒවා ප්‍රකාශ කළ ආකාරය මිනිසුන්ට බාධා ඇති කළේය. මිනිස්සු ඔහුගෙන් ඈත්වූහ. එබැවින් ජේසුස්වහන්සේ ඔවුන් මෙසේ ඇමතූ සේක: ''ඒකාන්තයෙන් මම ඔබට කියමි. ඔබ මනුෂ්‍ය - පුත්‍රයාණන්ගේ මාංශය අනුභව නො කරන්නාහු නම්, ඔහුගේ රුධිරය පානය නො කරන්නාහු නම්, ඔබ තුළ ජීවනය නැත. යමෙක් මාගේ මාංශය අනුභව කරන්නේ ද, මාගේ රුධිරය පානය කරන්නේ ද, ඔහුට සදාතන ජීවනය ඇත. තවද, මම ඔහු අන්තිම දවසේ දී උත්ථාන කරන්නෙමි. මාගේ මාංශය සැබෑ භෝජනය වේ; මාගේ රුධිරය සැබෑ පානය වේ. මාගේ මාංශය අනුභව කරන, මාගේ රුධිරය පානය කරන තැනැත්තේ මා තුළ ජීවත් වන්නේ ය; මම ද ඔහු තුළ ජීවත් වන්නෙමි. ජීවමාන පියාණන් වහන්සේ මා එවා වදාළ බැවින්, මා පියාණන් වහන්සේ නිසා ජීවත් වන ලෙස ම, මා අනුභව කරන තැනැත්තේ, මා නිසා ජීවත් වෙයි.''[163] මෙය ඔහුගේ ප්‍රේක්ෂකයන්ට ඕනෑවට වඩා වැඩි විය. මේ නිසා ජේසුතුමාගේ බොහෝ අනුගාමිකයෝ ඔහු අත්හැර තවදුරටත් ඔහු වෙත නොගියහ.[164] සමහර විට මෙම විස්මය දනවන වචනවලින් ජේසුස්වහන්සේ අදහස් කළේ කුමක්ද කියා පැහැදිලි කිරීමට ඔහු කාලය වැය කළා නම් ඔහුට වෙනස් ප්‍රතිචාරයක් ලැබෙන්නට ඉඩ තිබුණි. කෙසේ නමුත්, අමු මස්, මිනීමස් අහම්බෙන් හෝ පරිභෝජනය කිරීම තහනම් වූ කාලයක, පූජනීය ආහාර පිළිබඳ නීතිවලට අනුකූල වීමට මස් අනුභව කිරීමට ප්‍රථමව මස්වලින් ලේ පවා සෝදා හැරිය යුතුය, එම නිසා මෙම දේශනය මිනිසුන්ට කම්පනයක් විය, පිළිකුලක් විය. ජේසුස්වහන්සේ නසරෙත්වල තම උපන් ගමට ආපසු පැමිණි විට, නගරයේ යුදෙව් දහම්සලේ දේශනයක් කළ අතර, පෙදෙස් වැසියෝ තමන් හඳුනන ග්‍රාමීය තරුණයා, අත්වැඩකාරයාගේ පුත්‍රයා එතරම් වාග් චාතුර්යයෙන් සහ ඉගෙනීමෙන් කථා කිරීම පිළිබඳව පුදුමයට පත්වූහ. නමුත් පැහැදුණේ නැත! ඔවුහු ජේසුස්වහන්සේ සහ ඔහු කී දේ සම්බන්ධයෙන් උදාසීන වූහ. සමහර විට ජේසුස්වහන්සේ ඔහුගේ සමාජ තත්ත්වයට ඉහළින් යන බව

ඔව්හු සිතූහ. සමහර විට ජේසුස්වහන්සේ ඔවුන්ගේ සිත් රිදවන යමක් කිව්වේය, නො එසේ නම් සමහර විට වැදගම්මක් නැති පුද්ගලයන් සමඟ එක්වීමෙන් ඔහුට ලැබී ඇති ප්‍රසිද්ධිය පිළිබඳව ඔවුහු අසා දැන ගත්හ. සිද්ධිය කුමක් වුවත්, පොදු ජනයා විසින් සිතාමතා ම නොමිතුරු බව පෙන්වීම වැඩිවීමෙන් ජේසුස්වහන්සේ කම්පනයට පත් වූ බවක් පෙනී ගියේය. නගරයේ සිටි රෝගීන් සමහරක් සුව කිරීමට ජේසුස්වහන්සේ උත්සාහ කළ නමුත්, ඔහුගේ ප්‍රාතිහාර්ය බල අසාර්ථක වූ අතර, දෙදෙනකුට හෝ තිදෙනකුට පමණක් සුවය ලැබුණි. පුදුමයි, කිසිවකුට ඔහු පිළිබඳ විශ්වාසයක් නැති විය, ඔහු නසරෙත්වලින් පිටව අවට ගමකට ගියේය.[165]

යුදෙව් මිනිසුන්ට ජීවත් වීම සඳහා දෙවියන් වහන්සේ මෝසස්ට දුන් සියලු නීති පරණ තෙස්තමේන්තුවේ අන්තර්ගත ය. පුරුදු කළ යුතු ජීවිතයේ සියලු කරුණු සහ සියලු ආගමික චාරිත්‍ර මෙහි ඇතුළත් වේ. මෙම නීතිවලින් ඉතාම වැදගත් දෙයක් නම් 'සබත්' හෙවත් සතියේ අවසාන දිනයේ විවේක ගැනීමය. මෙය අර්ථදැක්වූයේ සැබැවින්ම, කිසිම ක්‍රියාවක - ඉතාම සරල ක්‍රියාවක හෝ නිරත වීමෙන් වැළකීමය. පුද්ගලයකුගේ සැදැහැවත් බවට මිනුම් දණ්ඩ වූයේ කෙතරම් ස්ථිරව ඔවුන් මේ සියලු නීති පුරුදු කරත් ද යන්න ය.

ආදි යුදෙව් නිකායක සාමාජිකයන් කළ ආකාරයට වඩා ඉතා සමීප ලෙස මිනිසුන් පූජනීය නීති අනුගමනය කළයුතු බව[166] ජේසුස්වහන්සේ උගැන්වූ අතර උන්වහන්සේ ඇත්ත වශයෙන් ම ඒවායෙහි අඩු පීඩාකාරී භාවිතයකට බැඳී සිටියේ ය. අවම වශයෙන් ඔවුන්ගෙන් සමහරක් හෝ ඔහුගේ විවේචකයෝ මෙම පරස්පරය පෙන්වා දීමට ඉක්මන් වූහ. බැප්ටිස්ට් ජෝන්ගේ ශ්‍රාවකයන් සහ වෙනත් භක්තිමත් පොදු ජනයා කළ ආකාරයට ඔහු වේගවත් නො වූයේ ඇයි ද කියා ඔව්හු ජේසුස්වහන්සේගෙන් ඇසූහ.[167] ඔහු අසම්මත ලෙස තිරිඟු කරලක මුදුන කඩා 'සබත්' (sabath) බිඳීම සම්බන්ධයෙන් වරදකරුවෙක් විය. මෙම චෝදනාවට ඔහු අසත්‍ය යැයි ඔප්පු කිරීම හොඳ එකකි. උන් වහන්සේ ඔවුන්ට කතා කොට, ''සබත

පිහිටුවන ලද්දේ මිනිසා උදෙසා ය; මිනිසා සබත උදෙසා නොවේ."[168] නීතිය අනුගමනය කිරීමේදී සමහර ආදි යුදෙව් නිකායක සාමාජිකයන් කුහක ලෙස කෙතරම් සුළු හෝ නොවැදගත් දෙයකට පවා වැරදි සොයන පුද්ගලයන් විය හැකිය, නමුත් එය ජේසුතුමාට මඟහැරීමට තරම් හොඳ හේතුවක් නොවේ.

වරක් යුදෙව් නිකායකට අයත් සාමාජිකයන් පිරිසක් ජේසුස්වහන්සේට ආහාරයකට ආරාධනය කළහ. මෙය ඔවුන්ගේ පැත්තෙන් මිත්‍රශීලි ඉඟියක් විය හැකිය, නැත්නම් ඔහු පිළිබඳව හොඳින් දැනගැනීමට උත්සාහයක් විය හැකිය. ජේසුස්වහන්සේ ආහාර ගන්නට පටන් ගත් පසු එක් පුද්ගලයෙක් පළමුවෙන් ඔහු අත් සේදුවේ නැති බව ජේසුස්වහන්සේට පෙන්වා දුන්නේය, මෙය දෙවියන් වහන්සේට අවශ්‍ය වූ නීතියකි. මෙයින් ජේසුස්වහන්සේ කෝපයෙන් යුදෙව් සාමාජිකයන්ට විරුද්ධව අතොරක් නැතිව බැණ වදින්නට පටන් ගත්තේය. විනීත ලෙස ඔහු අමතමින් ඔව්හු ආයාචනය කළහ: "ගුරුදේවයෙනි, ඔබ මෙසේ කීමෙන් අපටත් අපහාසයක් කරන සේකැ"යි කීහ.[169] කෙසේ නමුත්, ජේසුස්වහන්සේ දරුණු ලෙස සහ නොනවත්වා සියලු යුදෙව් සාමාජිකයන්ට අසාධාරණ ලෙස බැණ වැදුණේය. කෙනකු තවත් අය විවේචනය නොකළ යුතු බව ජේසුස්වහන්සේ ඉගැන්වුවත්, පෙර කී ලෙස මෙම සිද්ධිය සහ සමාන බැණ වැදීම් නිසා සමහර පුද්ගලයන්ට නොගැළපෙන තත්ත්වයක් ඇතිවන්නට ඇත.

බුදුපියාණන් වහන්සේට බ්‍රාහ්මණ ආගමේ කරුණු සම්බන්ධයෙන් මුළුමනින්ම විවේචනාත්මක වීමට හැකියාවක් තිබුණු අතර, උන්වහන්සේ පැවසුවේ එම ආගමේ සමහර පූජකවරුන්ගේ කුහකකම් පිළිබඳවය. උන්වහන්සේ විවේචනය කළා නම් එසේ කළේ ප්‍රතිකාරකයක් වශයෙන් විය හැකිය. සුදුසු කාලයක කථා කළ යුතු අතර, සැමවිටම අනුකම්පාව පෙරදැරි කරගත්, යනාදී කරුණු පදනම් කරගෙන කථා කළයුතු බව අභයරාජකුමාර සූත්‍රයේ සදහන් වේ. කෙසේ නමුත්, අභයරාජකුමාර සූත්‍රයේ

බුදුපියාණන් වහන්සේ වදාළේ, උන්වහන්සේ විවේචනාත්මක දේශනයක් කළේ නම්, ඒ කරුණු පදනම් කරගෙන, සැම විටම කරුණාව පෙරදැරිව සුදුසු අවස්ථාවක ප්‍රතිකාරක වශයෙන් වියහැකි බවත්ය.

## උන්වහන්සේලාගේ අවසාන දවස්

ජේසුස්වහන්සේ පිළිබඳ විස්තර හතර සාමාන්‍යයෙන් එකඟවන අතරේ, විස්තරාත්මකව වෙනස් වේ. විශේෂයෙන්ම මේ තත්ත්වය ඔහුගේ නඩු විභාගයේදී දකින්නට තිබේ. සිතන පරිදි එය මහජනයාට විවෘත නොවන නිසා සමහර විට මෙය පුදුමයක් නොවේ. මැතිව්ට අනුව නඩුව ක්‍රියාත්මක වන කාලය තුළ, ජේසුස්වහන්සේ නිශ්ශබ්දව සිටියේය. ඒ අතර ජෝන් කියා සිටියේ ජේසුස්වහන්සේ ප්‍රශ්න ඇසූ බව සහ ප්‍රශ්නවලට පිළිතුරු දුන් බවය.[170] සුවිශේෂ දේවවාක්‍ය හතරම ඉදිරිපත් කරනවාට වඩා ප්‍රධාන වශයෙන් මාක්ගේ තොරතුරු මත විශ්වාසය තැබීම වඩා හොඳය.

ජේසුස්වහන්සේගේ අවසාන සංචාරය වූයේ ජෙරුසලමට යෑමය. එහිදී ඔහු වැදගත් වාර්ෂික ආගමික උත්සවයක් වූ යුදෙව් වසන්ත උයනට සහභාගි වූයේය. ඔහු නගරයට පිවිසුණේ බූරුවකු හෝ අශ්ව නාම්බකු උඩ නැගගෙනය. ඒ වනවිටත් හොඳින් දන්නා පිරිස ඔහු දැක ගැනීමට සහ පිළිගැනීමට රැස් වූහ. ඔහුට පාතැබීම සඳහා සමහර අය පාරේ ඔවුන්ගේ ලෝගු සූදානම් කළහ. අනෙක් පදිංචිකරුවෝ ඔහු පිළිබඳව මීට පෙර අසා නොමැති නිසා, අනෙක් අයගෙන් මෙසේ ඇසූහ : ''මේ කවුද?''[171] ඊළඟට සිදුවූයේ තරමක් ව්‍යාකූල දෙයකි. පළමු සුවිශේෂි දේවවාක්‍ය තුන සඳහන් කර ඇත්තේ ජේසුස්වහන්සේ විශාල දේවමැදුරට ගොස් මුදල් මාරුකරන්නන් පළවා හැරිය බවය. නමුත් ජෝන් පැවසුවේ එය සිදුවූයේ ජේසුස්වහන්සේගේ දේවගැති ධුරයේ ආරම්භයේදී බවය.

යුදෙව් වසන්ත උයනේ චාරිත්‍රවල එක් කොටසක් වශයෙන් සහභාගිවන්නන්ට එක් සත්වයකු පරිත්‍යාග කිරීමට සිදුවිය. දුරබැහැර සිට එන විට තමන් සමග සතකු ගෙන ඒමට ඔවුන්ට නොහැකි විය. එම නිසා ඔවුන්ට දේවමැදුරෙන් සත්වයකු මිලදී ගන්නට සූදානම් කර තිබුණි. ඔවුන්ට

රෝමානු කාසි දී සතකු මිලදී ගත නොහැකි වූයේ ඒ මත අගරජුගේ පිළිරුවක් තිබෙන නිසා ය. හේතුව එවැනි පූජනීය ස්ථානයකට එය අභිශාපයක් වන නිසාය. ඒ නිසා ඔවුන්ට රෝමානු කාසි, පල්ලියට විශේෂ වූ කාසිවලට මාරුකරන්නට සිදුවිය. මුදල් මාරු කරන්නන්ගේ කාර්යභාරය මෙයයි. පැහැදිලිව පෙනෙන ආකාරයට මේ සියල්ලෙන් දැඩි කෝපයට පත් ජේසුස්වහන්සේ මුදල් මාරු කරන්නන්ගේ මේස බිම ගසා පෙරළා, ඔවුන් පලවා හැරියේය. එසේම කිසිවකුට කිසිවක් දේවස්ථානයේ භූමිය හරහා ගෙන ඒම වැළැක්වී ය.[172] එවැනි විශාල ආයතනයක සාමාන්‍ය ක්‍රියාකාරකම් අවුල් කිරීම පිළිබඳව එහි පාලකයන් චකිතයට පත් වන්නට ඇත. ඊට පසු ජේසුස්වහන්සේට දේවස්ථාන පූජකවරුන් සමඟ ආතතිය ඇති කරන ගැටුමක් ඇතිවිය.[173]

පසුව, සමහර විට පසු දින, ජේසුස්වහන්සේ දේවස්ථානයේදී දේශනයක් කළ අතර, එයත් පූජකවරුන්ගේ අප්‍රසන්න දෝෂාරෝපණයට හේතු විය. උන් වහන්සේ සිය අනුශාසනාවේ දී කතා කරමින්, ''විනයධරයන්ගෙන් පරෙස්සම් වන්න. ඔවුහු දිග උතුරු සළු හැඳ සක්මන් කරන්ට ද වෙළෙඳ පොළවල දී ගෞරවාචාර ලබන්නට ද ප්‍රියවෙති; ධර්ම ශාලාවල දී මූලාසනවලටත්, මංගල භෝජනවල දී සම්භාවනීය ආසන ලබන්ටත් ප්‍රිය වෙති; වැන්දඹුවන්ගේ ගේදොර කා දමති; පෙනුමට දිගින් දිගට යාඥා කරති; මොවුහු වඩාත් බරපතල දඬුවමක් ලබති.” [174]

මේ අවස්ථාවේදී ජේසුස්වහන්සේ ඇමතුවේ සාමාන්‍ය ජනතාවටය, නමුත් පසුව ඔහු ඊටත් වඩා අප්‍රසන්න ලෙස රළු වචන භාවිත කරමින් ඍජුවම පූජකවරුන්ට පැවසුවේය: ”සර්පයෙනි, පොළොං පැටවුනි, ඔබ නිරයේ දඬුවමින් ගැළවෙන්නේ කෙසේ ද” යි වදාළ සේක. [175] පූජකයන් සමඟ මීට ප්‍රථම අහඹු හමුවීමකදී ඔහු මින් ඔබ්බට ගොස් යක්ෂයාගේ දරුවන් යයි ඇමතුවේය.[176]

එවැනි බැණ වැදීම් කල්පනාකාරි නොවූ ඒවා පමණක් නොව, ඒවා ප්‍රකෝපකාරි වූ අතර ඔහුට ඔවුන් මිත්‍රයන් නොවීම පුදුමයක් නොවේ.

පල්ලියේ දී සිදු කළ කඩාකප්පල් කිරීම නිසා රෝමන්වරුන්ට කනස්සල්ලක් ඇතිවන්නට ඇත. එසේ ම පල්ලියේ පූජකවරුන්ට එරෙහි ඔහුගේ අතොරක් නැති බැණ වැදීම හේතුකොට ගෙන ඔවුන්ට ඔහු ගැන තිබූ අනුකම්පාව නැති වන්නට ඇත. නව තෙස්තමේන්තුවේ ජේසුස්වහන්සේ විස්තර කර ඇති අන්දමට වඩා ''කරුණාවන්ත ජේසු නිහතමානී සහ ශාන්ත" නමැති ප්‍රසිද්ධ දේවස්තුති ගීතය සහ ජනප්‍රිය සංජානනයේ සමහර විට පැහැදිලි වෙනසක් ඇත. ජේසුස්වහන්සේගේ හැසිරීම රෝමන්වරුන් දැඩි ලෙස ක්‍රියාකාරකමක් අරඹන්නට ප්‍රකෝප කළා නම් එයින් සැම දෙනාටම නපුරක් සිදුවන්නට ඉඩ තිබුණ බව යුදෙව් පූජකවරු හොඳින් දැන සිටියහ. එම නිසා ඔව්හු ජේසුස්වහන්සේගෙන් ඉවත් වන්නට තීරණය කළහ. ඔවුන්ට අනපේක්ෂිත අංශයකින් උපකාර ලැබුණි, ඒ ජේසුස්වහන්සේගේම අපෝස්තල්වරයකු වූ ජුදාස්ගෙන්ය. මෙම අපෝස්තල්වරයා තමාගේ ස්වාමියාට පිටුපෑවේ ඇයි ද යන්න පැහැදිලි කිරීම අපහසු ය. නව තෙස්තමේන්තුව දරා සිටින අන්දමට ඒ මුදලට ඇති ආශාව හැර වෙනත් කිසිවක් නොවේද?[177] ජේසුස්වහන්සේ සමඟ දෙවියන් වහන්සේගේ රාජධානිය පිහිටවූ විට එහි පාලනය කරන්නට නියමිත අපෝස්තල්වරුන් 12 දෙනා අතරට ජුදාස් ද පත් කරන බව ජේසුස්වහන්සේ ඔහුට පොරොන්දු වී ඇත.[178] ජුදාස් මෙම පොරොන්දුව විශ්වාස කිරීම අත්හැර තිබේද, නොඑසේ නම් වෙනත් චේතනාවක්ද? කාරණය කුමක් වුවත්, තමන් අත්අඩංගුවට පත් වෙන්නට යන බව සහ තමන්ගේ ශ්‍රාවකයකු මෙයට සම්බන්ධ බව ජේසුස්වහන්සේට හැඟුණි. යුදෙව් වසන්ත උත්සවයේ භෝජනය එක්ව බෙදාගෙන[179] ඔහු සහ අපෝස්තල්වරු ජෙරුසලමේ තාප්පයට ඔබ්බෙන් පිහිටි ජෙත්සමේන් උද්‍යානය වෙත ගියහ. මේ අතරේ ජුදාස් මඟහැර ගියේය. තනිව සහ පෞද්ගලිකව යාඥා කරන්නට උවමනා වී ජේසුතුමා, තමා එසේ කරන විට බලා සිටින ලෙස අපෝස්තල්වරුන්ට කියා සිටියේය. ඔහු නැවත එන විට ඔව්හු නිදමින් සිටියහ. මෙය මීට පෙරත් සිදුවී ඇත, කෝපයෙන් මෙන් ඔහු ඔවුන්ට බැණ වැදුණි. ''සයිමන් ඔබ නිදිද? පැයක්වත් අවදි ව ඉන්ට ඔබට

නොහැකි වූයේ ද?"[180] ඔහු එසේ පැවසූ මොහොතේම ජුදාස් සහ ප්‍රධාන පූජක විසින් එවන ලද ආයුධ රැගත් මිනිසුන් පිරිසක් පැමිණ ජේසුස්වහන්සේ අල්ලා ගත්හ.

මේ අවස්ථාවේ කෙටි අරගලයක් ඇතිවූ අතර, පීටර් ඔහුගේ කඩුව ඇද ඉහළ පූජකවරයාගේ සේවකයාගේ කණ කපා දැමුවේය.[181] මෙම සිද්ධිය ප්‍රශ්න ස්වල්පයක් මතු කරයි. තමන් පැමිණ ඇත්තේ ''මම මිහිපිට සාමය දෙන පිණිස ආවෙමි යි නොසිතන්න; සාමය නොව කඩුවක් දෙන පිණිස ආවෙමි,"[182] ජේසුස්වහන්සේ වරක් පවසා ඇත. එසේම තමන් අත්අඩංගුවට ගැනීමට පෙර තමන්ගේ ශ්‍රාවකයන්ට උපදෙස් දී ඇත්තේ සන්නද්ධව සිටින ලෙසයි. ''එහෙත් දැන් පසුම්බියක් ඇති තැනැත්තා එය ගනීවා, එසේ ම මල්ලක් ද ගනීවා, කඩුවක් නැති තැනැත්තා තම සළුව විකුණා, කඩුවක් මිළ දී ගනීවා."[183] ඔහු කරදර බලාපොරොත්තුව සිටි බවක් පෙනෙන්ට තිබූ අතර, පැහැදිලිව පෙනෙන ආකාරයට අවශ්‍ය නම්, බලයෙන් හෝ තමන්ගේ ශ්‍රාවකයන් තමන් ආරක්ෂා කිරීමත් ඔහුට අවශ්‍ය විය. මෙය අපෝස්තල්වරුන් අවබෝධ කරගෙන සිටි බව ඉන් එක්කෙනෙක් ලේ සෙලවීමෙන්ම ඔප්පු වී ඇත. පැරණි තෙස්තමේන්තුවේ සඳහන් ඉසයියා, සිතන පරිදි ගැළැවුම්කරු පිළිබඳ අනාවැකිය ඉටු කිරීමට ජේසුස්වහන්සේට තමන්ගේ ශ්‍රාවකයන් කඩුවක් තබා ගැනීම අවශ්‍ය වූ බව ලූක් අඟවා ඇත. සැබැවින්ම මෙම අනාවැකිය ආයුධ හෝ ප්‍රචණ්ඩත්වය පිළිබඳව කිසිවක් නොකියන අතර, සම්පූර්ණ ඡේදය ජේසුස්වහන්සේ පිළිබඳව සඳහන් කිරීමක් නොවිය හැකි බව පෙනේ. එහි සඳහන් වන්නේ අසල්වැසියන්ගේ දාසභාවයට පත් වී ඇති යුදෙව් මිනිසුන් නිදහස් කරගැනීම පිණිස දෙවියන් වහන්සේ විසින් යවන ලද පණිවිඩයක් පිළිබඳවය. තවදුරටත් එහි මෙසේ සඳහන්ය: ''ඔහු පිළිබඳව ආකර්ෂණය වීමට කිසිවක් නැත, අපට ඔහුගෙන් කිසිම ආකර්ෂණයක් නැත, දුෂ්ටයන් සමඟ සොහොනක තබා තිබුණි. ඔහු පොහොසතුන් සමඟ භූමදාන කර තිබුණි. ඔහු තමන්ගේ පැවත එන්නන්

දකියි, ඔහු බොහෝ කාලයක් ජීවත් වෙයි."[184] මේ කිසිවක් ජේසුස්වහන්සේට අදාළ නැත, හෝ සිදුවී නැත.

කුමන හේතුවකට හෝ කුමන පුද්ගලයකු හෝ ප්‍රචණ්ඩත්වය, බලහත්කාරකම් කිරීම හෝ බලපෑම් කිරීම, දැඩි වචන භාවිතය, බුදුපියාණන් වහන්සේගේ ආචාර ධර්මවල මූලික ප්‍රතිපත්තීන්ට සම්පූර්ණයෙන්ම එකඟ නොවේ. පුද්ගලයකු ''දඬු සහ කඩුව පසෙක තබා සියලු සත්ත්වයන් වෙත දැඩි සැළකිල්ලෙන්, සංවේදීව සහ කරුණාවෙන් යුක්ත අනුකම්පාව"[185] තිබිය යුතු බව බුදුපියාණන් වහන්සේ බොහෝ වාරයක් දේශනා කළ සේක. උන්වහන්සේ මෙසේ ද පැවසූ සේක : ''එහා මෙහා වන හෝ නොසෙල්වෙමින් පවතින ලොව සිටින සියලුම සත්ත්වයන් වෙතින් ආයුධ පැත්තකට ගනිමින්, සියලු දෙනාම සතුන් නොමැරිය යුතුය, වෙනත් අය ලවා නොමැරවිය යුතුය, හෝ මැරීමට අනුබල නොදිය යුතුය."[186] විනයක් සහ හික්මීමක් නොමැති මිනිසුන් පවා පුහුණු කිරීමට බුදුපියාණන් වහන්සේට තිබූ හැකියාව පිළිබඳව පසේනදි රජතුමා පුදුමය පළ කළේය.[187] ප්‍රචණ්ඩාත්මක භාෂාව ''දිව නමැති ආයුධයෙන් අනෙක් අයට පහර දීමක්"[188] යැයි බුදුපියාණන් වහන්සේ සඳහන් කළේය. එසේම තමන්වහන්සේගේ අනුගාමිකයන් එවැනි කථාවෙන් වැළකී සිටිය යුතු බව උන්වහන්සේ වදාළහ. සත්‍ය හෝ උපහැරණයක් වුවද, ආයුධ භාවිතයෙන් සම්පූර්ණයෙන් වැළකී වුවද, හුදෙක් ඒවා නිපදවීම හෝ අලෙවිය උන්වහන්සේගේ ධර්මයේ සම්මා ආජීව හෙවත් ආර්ය අෂ්ටාංගික මාර්ගයේ පස්වන පියවරට විරුද්ධ බව බුදුපියාණන් වහන්සේ වදාළහ. [189]

ජේසුස්වහන්සේ අත්අඩංගුවට ගැනීමෙන් පසු, යුදෙව් පූජකවරුන්ගේ සහ වැඩිහිටියන්ගේ කවුන්සලය වෙත ගෙනයන ලදී. ඔහුට විරුද්ධව ගෙන ආ කිසිම චෝදනාවකට පිළිතුරු දීම ඔහු ප්‍රතික්ෂේප කළේය. එසේම සාක්ෂිකරුගේ ප්‍රකාශ පරස්පර විය. අවසානයේ ඔහු ගැළැවුම්කරුවාද කියා ඉහළ පූජකවරයා ඔහුගෙන් ඇසූවිට, උන්වහන්සේ මෙසේ පිළිතුරු දුන්හ: ''ස්වර්ග රාජ්‍යය පිළිබඳ අබිරහස ඔබට දන්වා දී ඇත. එහෙත්,

ඔවුන්ට එසේ දී නැත. යමකුට ඇත්තේ ද ඔහුට දෙනු ලැබේ; පමණටත් වඩා ඔහුට ලැබේ. යමකුට නැත්තේ ද ඔහුට ඇති දෙයත් ඔහුගෙන් ගනු ලැබේ. එහෙයින් ඔවුන් දැක දැකත් නොදක්නා නිසා ද, අස අසාත් නොඅසන නිසා ද, වටහා නොගන්නා නිසා ද ඔවුන්ට උපමා මඟින් කතා කරමි. මෙසේ, යෙසායාගේ දිවැස් කීම ඔවුන් කෙරේ ඉෂ්ට වනු ඇත. එනම්: 'ඔබ අස අසාත් තේරුම් නොගන්නාහුය; දැක දැකත් නොදක්නාහුය. ''ජේසුස්වහන්සේ මිනිසුන් අමතමින් ඔවුන් විනිශ්චය දෙන දිනයේදී එහි සිටිනු ඇතැයි කීවේ පළමුවෙනි වරට නොවේ. කෙසේ නමුත් ඔහුගේ ඉරණම නියම කිරීමට හේතුවූයේ මෙම කියමන නොවේ,[190] නමුත් තමන් ගැළවුම්කරුවා වෙන බවට ඔහුම විශ්වාස කළ බව පිළිගැනීමය. මේ සම්බන්ධයෙන් ආගමික දේ අවමානට ලක් කිරීම යටතේ ඔහු වරදකරු වූ අතර, කවුන්සලය ඔහුට මරණ දණ්ඩනය ලබා දීමට ඡන්දය දුන්හ. පසු දින උදෑසන ඔහු දම්වැලෙන් බැඳ පොන්ටියස් පිලේට් නමැති රෝමානු ආණ්ඩුකාරවරයා වෙත ගෙන එන ලදී. මරණ දණ්ඩනයක් නියම කිරීමට අවසර ඇත්තේ ඔහුට පමණි. ජේසුස්වහන්සේට විරුද්ධව පූජකවරුන්ගෙන් තිබූ චෝදනා අසා, පිලේට් මෙසේ ඇසුවේය: ''ඔබ යුදෙව්වන්ගේ රජු යැයි කියා සිටිනවාද? '' ජේසුස්වහන්සේ මෙසේ පිළිතුරු දුන්නේය : ''ඔබේ අදහස එසේ ය' කීම නම්, 'එසේ ය, 'නැත' කීම නම්, ' නැත' කියා ද වේවා ඊට වැඩිමනත් යමක් ඇද්ද, එය එන්නේ නපුරාගෙන් ය.''[191] ජේසුස්වහන්සේ යුදෙව්වන්ගේ රජු යැයි පිලේට් කිව්වේ නැත, ඔහු හුදෙක් ඇසුවේ ජේසුස්වහන්සේ එසේ කියා සිටිනවා ද යන්නයි. එම නඩු විභාගයේ ඉදිරි කටයුතු වලදී ජේසුස්වහන්සේ නිශ්ශබ්දව සිටියේ ය.

යුදෙව් වසන්ත උත්සවයේදී යම් සිරකරුවකු මහජනතාවගේ ඉල්ලීම මත දඬුවමින් මිදීමේ සම්ප්‍රදායක් තිබුණි. පිලේට් ඔහුගේ මාලිගාවේ පිටත සිටි මිනිසුන්ගෙන් ඔවුන්ට නිදහස් කිරීමට අවශ්‍ය ජේසුස්වහන්සේ ද නැත්නම් තවත් සිරකරුවකු වූ බරබ්බාස් ද කියා විමසුවේය. මිනිසුන් ඉල්ලා සිටියේ බරබ්බාස් නිදහස් කර දෙන ලෙසය, ''කුරුසියෙහි ඇණ ගසන්නැ''යි ඔවුහු වැඩි වැඩියෙන් මොර ගැසූහ.[192] ඉහළ පූජකවරයා පිරිස උනන්දු කළ බව

මාක් කියා ඇත, නමුත් මෙය තේරුම් ගැනීම අපහසුය. මීට දිනකට පමණක් පෙර විශාල පිරිස් ''දෙවියන් වහන්සේගේ නාමයෙන් පැමිණෙන ඔහු ආශිර්වාදයකි" යැයි පවසමින් පොළොව මත තමන්ගේ කබායන් ජේසුස්වහන්සේ ඉදිරියේ අතුරමින් ජෙරුසලමට ආදරයෙන් පිළිගත්හ, පසුව ඔහු ඇගැයූ මිනිස්සු දේවස්ථානයේ උන්වහන්සේගේ දේශනාවලට සවන් දුන්හ. මේ දැන් අධික ප්‍රශංසාවෙන් කෲරතර දණ්ඩනයකට මිනිසුන් ඉතා පහසුවෙන් වෙනස් වූයේ කෙසේ ද යන්න පැහැදිලි නැත. තත්ත්වය කුමක් වූවත් ජේසුස්වහන්සේ කුරුසගත කරමින් මරණ දණ්ඩනයට පත් කිරීමට පිලේට් නියෝග කළේය. මෙය විශේෂයෙන්ම මරණ දණ්ඩනය දෙන අප්‍රසන්න ආකාරයකි. ඔහුව හමුදා භටයන්ට භාර දෙනලද අතර, ඔවුහු පහරදෙමින්, සරදම් කරමින් සහ අවමන් කරමින් නගරයේ තාප්පයෙන් පිටතට ගෙන ගොස් කුරුසගත කළහ.

බුදුපියාණන් වහන්සේගේ ජීවිතයේ අවසාන මාස තුන මහාපරිනිබ්බාන සූත්‍රයේ විස්තර වශයෙන් කියා තිබේ. මෙය ත්‍රිපිටකයේ දීර්ඝතම දේශනයයි. එය බුදුපියාණන් වහන්සේ රජගහ නුවරෙන් පිටත් වීමෙන් ආරම්භ වේ, උතුර සහ බටහිර තෙක් ගමනේදී සිදුවූ සිද්ධීන්, කුසිනාරාවේදී පරිනිර්වාණය සිදුවීම සහ උන්වහන්සේගේ ශ්‍රීදේහය ඉවත් කිරීම, සහ භෂ්මාවශේෂ බෙදාහැරීමෙන් අවසන් වේ. මෙහිලා අවශ්‍ය වන්නේ අවසාන දින සහ එයට අදාළ පෙර සිදුවූ දේ පමණක් අනාවරණය කිරීමය.

බුදුපියාණන් වහන්සේ උන්වහන්සේ පරිනිර්වාණයට පත්වෙන කාලය සහ ස්ථානය පිළිබඳව අනාවැකි පළ කළහ, එතැන් සිට මාස තුනකින් කුසිනාරාව නම් කුඩා නගරයේ පරිනිර්වාණය සිද්ධවන බවය.[193] පරිනිර්වාණයට පත් වන්නේ කවදා ද යන මනා දැනුම උන්වහන්සේට තිබූ අතර, එය සැබෑ වීම සමහර විට පුදුමයක් නොවේ. තමන්ගේ මරණය සිදුවන දිනය කියන්නට හැකි පුදුම හැකියාව ඇති මිනිසුන් ඉඳහිට ඇති බවට හැඟෙයි. බුදුපියාණන් වහන්සේගේ අවසාන ගමන් මාර්ගයේ සිතියම දෙස බැලූ විට උන්වහන්සේ තමන්වහන්සේගේ අවසාන ගමන උපන්

ගමවූ කපිලවත්ථුවට වැඩමකර පරිනිර්වාණයට අදහස් කළ බවට ප්‍රබල ලෙස හඟවයි. උන්වහන්සේ තදබල ලෙස රෝගාතුර වී කපිලවත්ථුවට පිවිසීමට පමා වී ඊට ප්‍රථමව කුසිනාරාවේදී පරිනිර්වාණයට පත්වූහ.

බුදුපියාණන් වහන්සේ, ආනන්ද ස්වාමීන් වහන්සේ සහ උන්වහන්සේලා කැටුව වැඩිය අනෙක් ස්වාමීන් වහන්සේලා වස්සාන ඍතුව ආරම්භයත් සමඟම වේසාලියට ප්‍රවිෂ්ට වූහ. භික්ෂූන් අතර සම්ප්‍රදායට අනුව ඉදිරි මාස තුන තුළදී වස් විසීමට ස්ථාන ලැබුණි. නගරයෙන් පිටස්තර උපනගරයක "බේලුව නමැති කුඩා ගමක" බුදුපියාණන් වහන්සේ තාවකාලිකව නවාතැන් ගත්හ. එහි වැඩ සිටින විට, උන්වහන්සේ පිරිනිවන් පෑමට ආසන්න මෙන් තදබල වේදනා සමඟින් දරුණු රෝගයකින් පෙළෙන්නට වූහ. නමුත් උන්වහන්සේ මේ සියල්ල කල්පනාකාරීව, පැහැදිලිව දැනගෙන සහ පැමිණිලි නොකරමින් ඉවසා දරා සිටියහ.194 අදටත් ඉන්දියාවේ ජලයෙන් ඇතිවෙන රෝග මෝසම් වැසි පවතින කාලයේ සාමාන්‍ය දෙයකි. වැසි කාලයෙන් පසු පිරිස නැවතත් පිටත් වෙමින්, භණ්ඩගාම, ජම්බුගාම, භෝගනගාම පසු කොට අවසානයේ පාවා වෙත පැමිණියහ. එහිදී ඔව්හු චුන්ද නමැති කම්මල්කරුවාගේ අඹ උයනේ නතර වූහ.195 චුන්ද සියලු දෙනා පිළිගෙන පසුදින දානයකට ඇරයුම් කළේය. මෙම ආහාරයට බුදුපියාණන් වහන්සේට සූකරමද්දව නමැති ආහාරයක් පිළිගැන්වූ අතර එයින් පසු ලේ අතීසාරය (ලෝහිත පක්ඛන්දිකා) සමඟ උන්වහන්සේට දරුණු වේදනාවක් සහ අසනීප තත්ත්වයක් ඇතිවිය.196

මෙම සිද්ධිය සම්බන්ධයෙන් අනුමාන කිරීම් සහ මතභේද බොහෝ ප්‍රමාණයක් ඇත. සූකරමද්දව යන වචනයේ පදගත අර්ථය වන්නේ 'වල්ඌරාගේ මෘදු භාවයයි' , නමුත් එහි ඇත්තේ කුමක්ද යන්න නොදනී. මෘදු වල්ඌරු මස් මිශ්‍රකරමින් සෑදූ ආහාරයක් විය හැකිය, නමුත් එය අනිවාර්ය නොවේ. දැන් මෙන්, සූපශාස්ත්‍ර සඳහා ඒවායේ අමුද්‍රව්‍යවලට සම්පූර්ණයෙන්ම සම්බන්ධ නැති නම් තිබිය හැකිය. බුදුපියාණන් වහන්සේ පරිනිර්වාණයට පත්වූයේ විෂ සහිත හතු ආහාරයට ගැනීමෙන්, ආහාර විෂ

වීමෙන් හෝ ඕනෑකමින්ම උන්වහන්සේට වස දී ඇතැයි ද යන සඳහනක් ද ඇත. උන්වහන්සේට තිබූ ප්‍රධානම රෝග ලක්ෂණය වූයේ වැස්සෙන අතීසාරයයි, එසේ වීමට ආමාශයික හෝ යම් ජලය ආශ්‍රිත රෝගයක් උන්වහන්සේට වැළඳුණ බව හඟවයි. කෙසේ නමුත් කියන පරිදි වේසාලියේ බුදුපියාණන් වහන්සේ වැඩ සිටින විට රෝගී වූ බවත්, උන්වහන්සේ 80 වැනි වියේ සිටි බවත්, උන්වහන්සේට නිරන්තරයෙන් පෙර තිබූ කුමන හෝ රෝගයක් උග්‍රවී පරිනිර්වාණයට එල්ලවී අවසානය දක්වා පැමිණ ඇත. තමන්වහන්සේ කායික වශයෙන් සහනයක් ලැබූ එකම වේලාව ගැඹුරු භාවනාවට පත් වූ වේලාවේදී පමණක් බව උන්වහන්සේ ගමන් ඇරඹූ මුල් අවස්ථාවේදී පවසා ඇත.197

තරමක් දුරට සුවය ලැබූ පසු බුදුපියාණන් වහන්සේ සහ භික්ෂූන් තමන්ගේ ගමන නොකඩවා පවත්වා ගෙන ගියත්, උන්වහන්සේ වඩාත් දුබල වූ නිසා ගමන නතර කරන්නට සිදුවිය. සිවුරක් හතරට නවා ගසක් යට ගිමන් නිවන්නට සූදානම් කරන ලෙස උන්වහන්සේ ආනන්ද ස්වාමීන් වහන්සේට දැනුම් දුන් සේක. ගිමන් නිවන අතරේ උන්වහන්සේලා වෙත පුක්කුස නමැති මිනිසෙක් පැමිණියේය. ඔහු බුදුපියාණන් වහන්සේගේ පැරණි ගුරුවරයකු වූ ආළාර කාලාමගේ ශ්‍රාවකයකුව සිට ඇත. පුක්කුස රන්වන් සිවුරු දෙකක් බුදුපියාණන් වහන්සේට පූජා කළේය. බුදුපියාණන් වහන්සේ එකක් රැගෙන අනෙක ආනන්ද ස්වාමීන් වහන්සේට දෙන ලෙස දැනුම් දුන්හ. පුක්කුස පිටත් වූ පසු ආනන්ද ස්වාමීන් වහන්සේ බුදුපියාණන් වහන්සේට එම සිවුර ලිහිල්ව එතුවේය. වහාම, සම්පූර්ණයෙන්ම උන්වහන්සේගේ සිරුර වෙනස් විය, ''රැස් විහිදෙමින් සහ දීප්තිමත්'' වෙන්නට පටන් ගත්තාද කිවහොත්, රන්වන් සිවුර අඳුරු පැහැයක් ගත්තේය.198 ආනන්ද ස්වාමීන් වහන්සේ මේ බව පැවසූ විට, මෙම ආශ්චර්යවත් සිදුවීම මීට පෙරත් එක් අවස්ථාවකදී උන්වහන්සේට සිදු වූ බව, එනම් උන්වහන්සේ බුද්ධත්වය ලැබූ දින රාත්‍රියේ දී බව බුදුපියාණන් වහන්සේ පවසා ඇත. බුදුපියාණන් වහන්සේගේ බුද්ධත්වයේදී නිල් සහ කහ, රතු, වර්ණයෙන් යුක්ත කිරණ සහ සුදු සහ තැඹිලි වර්ණයේ (රංසි)

ආලෝකයක් උන්වහන්සේගේ ශරීරයෙන් නිකුත් වී ඇති බව උන්වහන්සේගේ බුද්ධත්වය පිළිබඳ විස්තරයේ සඳහන් වේ.199

මෙම පිරිස කුකුත්ථා ගඟෙන් ස්නානය කළහ. ඊට පසු තමන් වහන්සේට නැවත සැතපී ගිමන් නිවීම පිණිස සිවුරක් හතරට නවා එය පොළොව මත අතුරන ලෙස බුදුපියාණන් වහන්සේ චුන්දකට පැවසූහ. චුන්දක එසේ කර උන්වහන්සේ අසල තවත් යම් දෙයක් අවශ්‍ය ද කියා දැන ගැනීම පිණිස රැඳී සිටියේය. මෙම කැපවූ ශ්‍රාවකයා මුළු රැයම නිදි නැතිව සිටියේය. ඔහු පෙරදී ද බුදුපියාණන් වහන්සේගේ අවශ්‍යතා පිළිබඳව අවධානය දෙමින් සිට ඇත. වරක් බුදුපියාණන් වහන්සේ රෝගීව සිටි අවස්ථාවකදී ඔහු බුදුපියාණන් වහන්සේ බැහැ දැක, ධර්මය පිළිබඳව සාකච්ඡා කර ඇත. චුන්දකගේ පැමිණීම නිසා බුදුපියාණන් වහන්සේගේ රෝග තත්ත්වයට සැහැල්ලුවක් ඇතිවූ බව ධර්ම ග්‍රන්ථ හඟවයි.200

පිරිස කුසිනාරාවේ මල්ලගේ ප්‍රධාන නගරයේ යාබද සල් උයනට පැමිණෙන තුරුම නොනවත්වා ගමන් කළහ. විශාල සල් ගස් දෙකක් අතර තමන් වහන්සේට යහනක් සූදානම් කරන ලෙස බුදුපියාණන් වහන්සේ ආනන්ද හිමියන්ට දැනුම් දුන්හ. උන්වහන්සේ සැතපුණු වහාම ගසේ නිරායාසයෙන්ම මල් පිපුණු අතර, මල් පෙතිවලින් කෙටි වැස්සක් උන්වහන්සේගේ දේහය මත පතිත විය. ආනන්ද ස්වාමීන් වහන්සේ පුදුමය ප්‍රකාශ කළ විට, බුදුපියාණන් වහන්සේ වැදගත් කරුණක් කියන්නට එය අවස්ථාව කරගත්හ. ''මෙම සල් ගසේ මල් පිපුණේ ඍතුවෙන් පිටදීය. තථාගතයන් වහන්සේ මින් පෙර මෙතරම් ගෞරවයට, පූජනීයත්වයට, සම්මානයට සහ පිදුමට පත්වී නැත. නමුත්, ධර්ම මාර්ගය සම්පූර්ණයෙන්ම සහ පරිපූර්ණ ලෙස සම්පූර්ණ කරමින්, ධර්මය පුහුණු කරමින් ජීවත්වන භික්ෂූන් හෝ භික්ෂුණීන්, උපාසක හෝ උපාසිකාවන් යන ශ්‍රාවකයන් තථාගතයන් වහන්සේට සැබෑ සහ ඉහළම ලෙස ගෞරව කරන, ප්‍රණාමය දක්වන සහ පුදන අය වෙති.''201 බෞද්ධ අදහසට අනුව භාස්කම්, ධර්මය අනුව ජීවත්වීම සමඟ සසඳන විට, සුළු වැදගත් කමක් ඇති දෙයක් බවට

සහ ධර්මය පැවිදි සහ ගිහි යන සියලු දෙනාටම වන බවටත්, මෙය තවත් උදාහරණයකි.

අවසානය ළඟා වෙමින් පවතින බව අවබෝධ කරගනිමින් බුදුපියාණන් වහන්සේ සමහර අවසාන අවවාද සහ උපදෙස් ලබා දුන්හ. සැම බැතිමතෙක්ම  තමන් වහන්සේ උපන්, බුද්ධත්වය ලැබූ, පළමු වරට ධර්මය දේශනා කළ ස්ථානයට සහ පරිනිර්වාණය ලැබූ ස්ථානවලට වන්දනා කරන මෙන් උනන්දු කළහ. කාන්තාවන් සමඟ අවශ්‍ය තරමට වඩා කුළුපග නොවන ලෙස බුදුපියාණන් වහන්සේ අවවාද කළහ. එසේම තමන් වහන්සේගේ ශ්‍රීදේහය සම්බන්ධ අවසන් කටයුතු සිදුකරන ආකාරය පිළිබඳව උපදෙස් දුන්හ. උන්වහන්සේ ආනන්ද ස්වාමීන් වහන්සේගේ වසර ගණනාවක පරාර්ථකාමී සේවය වෙනුවෙන්  ස්තුති කළහ, අගය කළහ, ඡන්න නමැති මුළා වූ භික්ෂුවට විනය දඬුවම් කරන මෙන් ආනන්ද ස්වාමීන් වහන්සේට උපදෙස් දුන්හ. එසේම අවශ්‍යනම්, සුළු පැවිදි නීති වෙනස් කිරීමට අවසර දුන්හ.  අවසාන ධෛර්යවත් කිරීමක් වශයෙන් උන්වහන්සේ මෙසේ පැවසූහ: ''ආනන්ද, ඔබ සිතන්නට පුළුවන්, 'දැන් ගුරු මඟපෙන්වීම අවසන් වී ඇත, දැන් අපට ගුරුවරයෙක් නැත'. නමුත්, ඔබ එය දැකිය යුත්තේ එසේ නොවේ. ධර්මය සහ පුහුණුව මම ඔබට කියා දී ඇත්තෙමි, මා ගිය පසු එයට ඔබේ ගුරුවරයා වන්නට ඉඩ සලසන්න."[202]

## උන්වහන්සේලාගේ අවසාන වචන

දැන් බුදුපියාණන් වහන්සේගේ අවසානය පැමිණ ඇත. කුසිනාරාවේ මල්ල රජදරුවන් සමගින් බුදුපියාණන් වහන්සේ සමඟ අවසාන වරට පැමිණි භික්ෂූන් සහ අනෙක් රැස්වූ අය අමතා උන්වහන්සේ  අවසාන වචන මෙසේ වදාළහ. ''මහණෙනි දැන් මම ඔබලාට මෙසේ පවසමි; සියලු සංස්කාර ධර්මයෝ  අනිත්‍යයි. අප්‍රමාදීව උත්සාහ කරන්න. (වයධම්මා සංඛාරා අප්පමාදේන සම්පාදේථ)"[203]

ජේසුස්වහන්සේගේ නඩු විභාගය, මරණ දණ්ඩනය සහ මරණය සම්බන්ධව වෙනස් විස්තර හතරක් තිබෙන නිසා, ඔහුගේ අවසාන ප්‍රකාශ පිළිබඳවද

වෙනස් මත හතරක් තිබේ. මැතිව්ට අනුවඃ ජේසුන් වහන්සේ යළිත් මහ හඬින් හඬ ගා අපවත් වී වදාළ සේක. මාක්ට අනුවඃ සවස තුනට ජේසුස් වහන්සේ, ''එලොයි, එලොයි, ලාමා සබක්තානි" කියා මහහඬින් මොර ගැසූ සේක. එහි අර්ථය, "මාගේ දෙවියනි, ඔබ මා අත් හැරියේ කුමක් නිසා ද?," යනුයි. ලූක්ගේ විස්තරය මෙසේ සඳහන් කරයිඃ ජේසුන් වහන්සේ මහ හඬින් මොරගසා, "'පියාණෙනි, ඔබ හස්තයට මාගේ ප්‍රාණය භාර දෙමි"යි වදාළ සේක. ජෝන්ට අනුවඃ ඉන්පසු ජේසුන් වහන්සේ සියල්ල නිමාවට පත් වූ බව දැන, ශුද්ධ ලියවිල්ල ඉෂ්ට වන පිණිස, ''මට පිපාස ය"යි වදාළ සේක. එහි විනාකිරි පිරූ භාජනයක් තිබුණි. එබැවින් ඔවුහු විනාකිරි පොඟවන ලද මූදුහත්තක් හිසොප් දණ්ඩක ගසා, උන් වහන්සේගේ මුඛයට ළං කළහ. ජේසුන් වහන්සේ විනාකිරි පිළිගත් පසු, "සියල්ල නිම වී ය"යි වදාරා, හිස නමා ස්වකීය ප්‍රාණය භාර දුන් සේක.204

බුදුපියාණන් වහන්සේගේ පරිනිර්වාණය දුක සහ අභිමිවීම අපිළිබඳ හැඟීමක් උපද්දයි. එය දීර්ඝ සහ ඵලදායී ජීවිතයක අවසානයේ සිදුවූ දෙයක් සහ එය සිදුවූයේ ස්වභාවික කාරණයන් හේතු කරගෙන නිසා එවැනි හැඟීම් සන්සුන් බවක් සිතේ ඇති කරයි. උන්වහන්සේගේ මරණ මංචකයේ එක්රැස්වූ පිරිස හඬා වැළපුණහ, නමුත් අනෙක් අය සාමාන්‍ය තත්ත්වාරෝපිත පැවැත්මේ ස්වභාවය තේරුම් ගනිමින්, සන්සුන්ව සිටියහ. ඔවුහු එදින රාත්‍රිය නිශ්ශබ්දව භාවනාවේ යෙදුණහ.205 මීට ප්‍රතිවිරුද්ධව ජේසුස්වහන්සේගේ මරණය ඛේදවාචකයකි. අදටත් පොලිස් ස්ථානවල සහ ලොව පුරා රහසිගත පොළොව යට පොලිස් සිරගෙවල්වල පවතින නින්දා සහ ප්‍රචණ්ඩත්ව ඔහුගේ ජීවිතයේ වැදගත් කාලයේදී ඔහුට අත්විඳින්නට සිදුවිය. ජේසුස්වහන්සේගේ මරණය මිනිසුන් පාපයෙන් නිදහස් කිරීමට අවශ්‍ය දෙවියන් වහන්සේගේ සැලසුමක කොටසක් බව බොහෝ ක්‍රිස්තියානීහු විශ්වාස කරති. පසුව සිදුවූ ඔහු මළවුන්ගෙන් නැගිටීම මරණය අභිබවා ජයග්‍රහණයකි. කෙසේ වෙතත්, ඔහුගේ අවසානය පිළිබඳ විස්තර තවමත් පුද්ගලයකු අනුකම්පාවෙන් සසල කළ හැකිය.

## ධර්මය සහ සුවිශේෂී දේවවාක්‍ය

## උන්වහන්සේලා තමන් වහන්සේලාගේ උගැන්වීම් නම් කළේ කෙසේ ද?

ජේසුස්වහන්සේ නිශ්චිතව, සම්පූර්ණයෙන්ම, කිසි දිනක තමන්ගේ ඉගැන්වීම් නම් කළේ නැත. ඔහු එය අලුත් දෙයක් ලෙස දුටුවේ නැත. නමුත් දුටුවේ යුදෙව් ආගමේ නැවත ප්‍රකාශනයක් ලෙසය. එය පැරණි යුදෙව් පූජනීය නීතියේ සාරය ලෙස ඔහු ගත් දෙයට බැප්ටිස්ට් ජෝන්ගේ ලෝක විනාශය පිළිබඳ අනාවැකි හා සම්බන්ධ දේවධර්මය ඒකාබද්ධ කිරීමකි. ජේසුස්වහන්සේ මෙසේ කියයි: ''මම ව්‍යවස්ථාවලිය හා දිවැසාවලිය අවලංගු කරන පිණිස ආවෙමි'' යි නොසිතන්න. මා ආයේ, ඒවා අවලංගු කිරීමට නොව, සම්පූර්ණ කිරීමට ය. එහෙත් ව්‍යවස්ථාවලියෙන් බින්දු මාත්‍රයක්වත් අහෝසි වී යාමට වඩා අහස හා පොළොව පහවී යාම පහසු ය."[1] දෙවියන් වහන්සේගේ නීතිය වඩා කැපවී ආදි යුදෙව් නිකායේ සාමාජිකයන්ට වඩා හොඳින් පුහුණු කරන ලෙස ඔහු

තමන්ගේ අනුගාමිකයන්ගෙන් ඉල්ලා සිටියේය.[2] සමහර විට ජේසුස්වහන්සේගේ කේවල, වඩාත් ජනප්‍රිය මතය, සහ හරයක් පමණක් දක්වන අදහසක් බොහෝ විට ඔහුටම අනන්‍යසාධාරණ ලෙස උපකල්පනය කර තිබේ, ''ඔබගේ අසල්වැසියාට ඔබට මෙන්ම ආදරය කරන්න", මෙය සැබැවින්ම එන්නේ ක්‍රිස්තුස් වහන්සේට වසර 500කට පමණ පෙර ලියන ලද පැරණි තෙස්තමේන්තුවේ ලෙවිටිකුස් (Leviticus) ග්‍රන්ථයෙනි.[3] ජේසුස්වහන්සේ ඔහුගේ ඉගැන්වීම් විස්තර කර ඇත්තේ ඉඇන්ජෙලියන් (euangelion) වශයෙනි, ග්‍රීක වචනයක් වූ එහි අර්ථය 'හොඳ ප්‍රවෘත්තියක්' යන්නයි.[4] එය ඉංග්‍රීසි භාෂාවට පැමිණ ඇත්තේ 'සුවිශේෂ දේවවාක්‍ය' වශයෙනි. මුල් කාලීන වකවානුවක සිට ජේසුස්වහන්සේගේ අනුගාමිකයන් හැඳින්වූයේ නසරේන් හෝ ක්‍රිස්තියානීන්[5] යන නමින්ය. නමුත් ජේසුස්වහන්සේ කිසි විටක මෙම පදය භාවිත කළේ නැත.

බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ ඉගැන්වීම් ධර්මය යන නමින් හැඳින්වූහ. එම වචනයේ අර්ථය සැබෑව යන්නය, දේවල්වල ස්වභාවය හෝ ඇති සැටි ය. සමහර විට උන්වහන්සේ එය ශික්ෂණය යනුවෙන් හැඳින්වූහ (සාසන). උන්වහන්සේ තමන්වහන්සේගේ ධර්මයේ ප්‍රධාන ඉගැන්වීම චතුරාර්ය සත්‍යය යනුවෙන් නම් කළහ. මේ අතරින් ප්‍රායෝගික වූ සතරවන සත්‍යය මැදුම් පිළිවෙත (මජ්ඣිම පටිපදා) යනුවෙන් උන්වහන්සේ නම් කළහ. එයට හේතුව එක් අතකින් එය ස්වයං අත්තකිලමථයේ අන්තය මගහරින අතර, අනෙක් අතට ඉඳුරන් සම්බන්ධ ආශාවන් සපුරා ගැනීම් මගහරියි.[6] උන්වහන්සේගේ පළමු ශ්‍රාවකයන් හඳුන්වනු ලැබුයේ ගෞතම බුදුපියාණන් වහන්සේගේ ශ්‍රාවකයන් වශයෙනි, හෝ ශාක්‍යයන්ගේ පුත්‍රයා (සක්‍යපුත්ත) යනුවෙන් ය.[7] බුදුදහම හින්දු ආගමේ ශාඛාවක් හෝ ප්‍රතිසංස්කරණයක් ලෙස ආරම්භ වූ බව හෝ එහි ප්‍රධාන මත සමහරක් භාවිතයට ගත් බවත්, නිරන්තරව, සමහර ශාස්ත්‍රීය ප්‍රකාශනවල පවා සඳහන් වේ. එවැනි ප්‍රකාශ කිරීම් පැහැදිලි කරගෙන ඊටපසු අභියෝග කළ යුතුය.

බුදුපියාණන් වහන්සේගේ කාලයේ බොහෝ ඉන්දියානු පුද්ගලයෝ බොහෝ විට ජීවවාදය ඇදහූ අය වෙති, බ්‍රාහ්මණ ආගමේ පූජකවරුන් සමඟ, ආගමික නීතිවලට අදාළ ධර්ම ග්‍රන්ථ, යාඥා ක්‍රමයට අයත් භාෂාවක් සහ විවිධ ලෙස සකස් කරගත් ධර්ම සහ චාරිත්‍ර ප්‍රධාන විධිමත් ආගම විය. එයට පදනම් වූයේ වේදයයි. ඔවුන්ගේ උත්තරීතර දෙවියන් වූයේ බ්‍රහ්මයා වන අතර, සමහර මත වලට අනුව ප්‍රජාපති විය. බුදුපියාණන් වහන්සේගෙන් ශතවර්ෂ ගණනාවකට පසු, බ්‍රාහ්මණ ආගම ක්‍රමයෙන් වර්තමානයේ හඳුන්වන සහ පිළිගැන්වීමක් දක්වන හින්දු ආගමට විකසනය විය. මෙම ක්‍රියාවලියේදී බොහෝ  බ්‍රාහ්මණ ධර්ම සහ පුරුදු තාවකාලිකව නැවතීම හෝ විප්ලවකාරී අන්දමින් වෙනස් වීම සිදුවිය. එම නිසා බ්‍රාහ්මණ ආගම සහ හින්දු ආගම අතර බොහෝ සමාන දේ තිබුණි. ඒවායේ පැහැදිලි වෙනස්කම් ද ඇත.  සමහර විට විද්වත්හු වේදය, හින්දු ආගම සහ පුරාණ හින්දු ආගම වශයෙන් ඒවා වෙන්කොට හඳුන්වති.  යුදෙව් ආගම සහ ක්‍රිස්තියානි ධර්මය අතර සම්බන්ධය ද සමහර ආකාරයෙන් එම තත්ත්වයට සමානය. ක්‍රිස්තියානි ධර්මය සමහර අංග රඳවා තබා ගනිමින් සහ බොහෝ අළුත් අදහස් ඇතිකර ගනිමින්  යුදෙව් ආගමෙන් මතු විය. එම නිසා ආගම් දෙක අසමාන ආගම් දෙකක් බවට පත්විය.

බුදුපියාණන් වහන්සේගේ කාලයේ ආගමික විශේෂඥයන් වූයේ බ්‍රාහ්මණයන් සහ ශ්‍රමණයන්ය. බ්‍රාහ්මණ ආගමේ පාරම්පරික පූජකයන් වූයේ බ්‍රාහ්මණයන්ය, වේදය අවසාන ආධ්‍යාත්මික අධිකාරිය ලෙස සැලකිල්ලට ගන්නා ලදී. අනෙක් අතට,  ඔබමොබ යන භික්ෂූන් වූ ශ්‍රමණයෝ  වේදය සහ බොහෝ බ්‍රාහ්මණ විශ්වාස සහ පුහුණු කිරීම් ප්‍රතික්ෂේප කළ අතර, සමාජීය සම්මතයන් සහ අපේක්ෂා නොවැදගත් සේ සැලකූහ. ඔවුහු ලබ්ධීන් සහ ශුද්ධ ලියවිලි පිළිබඳ පාලනයට වඩා පළපුරුද්දට ප්‍රමුඛත්වය දුන්හ. ඔවුහු භාවනාව, ස්වයං අත්තකිලමථය, යෝගී ස්වසනය සහ උපවාස සමඟ අත්හදා බැලීම් සිදු කළහ. එසේම ඔවුහු සාමාන්‍යයෙන්  බ්‍රහ්මචාරී, දානයෙන් පමණක් යැපෙන සහ ඔබමොබ යන අය වූහ. අපේක්ෂිත ශ්‍රමණ ස්වභාවය ''අවශ්‍ය ප්‍රමාණයට දානය පිළිගනිමින්

කුරුල්ලකු මෙන් තමන්ගේ ගමන යන, එහා මෙහා පියාඹන විට තමන්ගේ තටු හැර වෙන කිසිවක් රැගෙන නොයන"[8] ලෙස බුදුපියාණන් වහන්සේ හැඳින් වූ සේක. ශ්‍රමණයන් සමහර විට එගොඩ වීමට සලස්වන්නන් - තිත්ථංකර ලෙස ද හඳුනාගෙන ඇත. එයට හේතුව ඔවුන් තත්ත්වාරෝපිත පැවැත්ම හෝ භික්ෂුව (භික්ඛු) නමැති අතිශය දැඩි ගංගාව තරණය කිරීමට මාර්ගයක් සොයමින් ඒ සඳහා උත්සාහ කරමින් සිටීමයි. එසේම, ඔවුන් සමහර විට හඳුන්වනු ලැබුවේ දානයෙන් පමණක් යැපෙන (භික්ඛු) ලෙසයි. එයට හේතුව, ඔවුන් තමන්ගේ ආහාර පිඬුසිඟා වඩිමින්, හෝ ඉතා ප්‍රබල උත්සායක් දරමින් සහ වෙහෙස මහන්සිවී උපයා සපයා ගත් නිසායි. බුදුපියාණන් වහන්සේ ගේ කාලයේ දී අඩුම ගණනේ ශ්‍රමණ සහෝදර සංගම් දොළොසක් හෝ නිකායවල් තිබුණි. නමුත් ත්‍රිපිටකයට අනුව, වැඩිම ආකර්ෂණයක් ලැබුණේ බැඳීම්වලින් තොර පුද්ගලයන් (නිගණ්ඨයන්) ලෙසින් හැඳින්වූ ජෛන භක්තිකයන්ට සහ බුදුපියාණන් වහන්සේගේ කණ්ඩායමටයි (සංඝ).

බ්‍රාහ්මණ ආගම ඇදහූ අය, විශේෂයෙන්ම බ්‍රාහ්මණ පූජකයන්, ශ්‍රමණ, ප්‍රතිවාදීන්, මිථ්‍යා ලබ්ධිකයන් සහ සමාජයෙන් පිටමන් කරනු ලැබූවන් යන අය හා සමාන ලෙස සලකනු ලැබූහ. එයට හේතුව ඔවුන් නීති නොසලකා හැරීමයි. බුදුපියාණන් වහන්සේ හෝ උන්වහන්සේගේ භික්ෂූන්, කාලකණ්ණි ශ්‍රමණයන් සහ දාසයන් ලෙස (ඉබ්භ)[9] විවිධ බ්‍රාහ්මණයන් හැඳින්වූ බව ත්‍රිපිටකයේ බොහෝ විට සඳහන් කර ඇත. පතඤ්ජලි (Patañjali) (ක්‍රි. පූ. 150) ආගම් දෙක අතර තිබූ එදිරිවාදිකම් මතුකරමින් සමණයන් සහ බ්‍රාහ්මණයන් ''බළලා සහ මීයා, බල්ලා සහ නරියා, නයා සහ මුගටියා" වැනි යයි එහි සඳහන් කර තිබුණි. මෙහි අදහස ඔවුන්ගේ ජීවන රටාව සහ ආධ්‍යාත්මකතාවට ප්‍රවේශවීම යන දෙකටම ප්‍රතිවිරුද්ධ යන අදහසින් ලියා ඇත. ''දෙපාර්ශ්වය අතර තිබූ විරුද්ධතාව සදාකාලිකය" (යේෂාම් ච විරෝධඃ ශාස්වතිකඃ) *yeṣām ca virodhah śāśvatikah*)[10]. බුදුපියාණන් වහන්සේ ශ්‍රමණ සම්ප්‍රදාය සමඟ ඉතාමත් එකඟවූ අතර, ත්‍රිපිටකය පුරාම

උන්වහන්සේ හැඳින්වූයේ ''සමණ ගෝතම" යන නමින්ය. උන්වහන්සේ ගිහිගෙයින් පැවිදි ජීවිතයට එළඹි විට, වේදය ඉගෙන ගැනීමට බ්‍රාහ්මණ ගුරුවරයකුගේ උපකාරය පැතුවේ නැත, ඒ වෙනුවට උන්වහන්සේ ගෞරවනීය සමණ ගුරුවරයන් වූ, ආළාර කාලාම සහ උද්දක රාමපුත්ත වෙත වැඩියහ.[11]

ආගමික ජීවිතයට බ්‍රාහ්මණ ආගමේ ප්‍රවේශය බුදුපියාණන් වහන්සේ ප්‍රතික්ෂේප කළ ආකාරයටම, උන්වහන්සේ එම ධර්මයේ ඇදහිලි බොහොමයක් ප්‍රතික්ෂේප කළහ. බ්‍රාහ්මණ ආගමේ ප්‍රධාන විශේෂ ආගමික චාරිත්‍රය වූයේ ගින්දරට අධිපති දෙවියන් වන අග්නි වන්දනා කිරීම සහ අග්නි සහ වෙනත් දෙවිවරුන්ට යාග සහ පූජා පැවැත්වීමයි. වේදයේ වෙනත් කිසිම දෙවිවරයකුට වඩා අග්නි පිළිබඳව විස්තර කර ඇති අතර, සංහිතා, ගෘහ්‍ය සූත්‍ර සහ බ්‍රාහ්මණයන් පිළිබඳව ඇත්තේ සුළු විස්තරයක් පමණි. ඒ මෙම පූජා පැවැත්විය යුත්තේ කෙසේ ද, ඒවායේ අදහස සහ ගුණය පිළිබඳවය. මෙම චාරිත්‍ර සම්බන්ධයෙන්, විශේෂයෙන්ම, බිලි දීම සඳහා සතුන් ඝාතනය කිරීම, බොහෝ සෙයින්ම බුදුපියාණන් වහන්සේගේ විවේචනයට හේතුවිය. උන්වහන්සේට අනුව ''සන්සුන් මනසකින් ලැබිය හැකි දෙයකින් දහසයෙන් එකක්වත් බිලි පූජාවකින් ලැබිය නොහැකි බව "උන්වහන්සේ වදාළහ. ගින්දරට වන්දනා කිරීම අසාර්ථක දෙයක් බවත්, එය ''අසාර්ථක බව ප්‍රකාශ කිරීමේ මාර්ගයක්" (අපායමුඛානි) ලෙස බුදුපියාණන් වහන්සේ එය බැහැර කළහ. ''යම් පුද්ගලයකු පූජනීය ගින්දරට වනයේ අවුරුදු සියයක් පූජා පවත්වන්නේ නම්, සහ තවත් අයකු මනසින් දියුණු වූවකුට ගෞරව කළේ නම් හෝ, එය අවුරුදු සියයක් පූජා පැවැත්වීමට වඩා හොඳය."[12] නැවතත්: ''ගින්දරට වැඳීම, ස්වයං වන්දි විඳීම්, පූජනීය දේවගීතිකා ගායනා කිරීම, දේව පූජා පැවැත්වීම හෝ ගිනි පූජා පැවැත්වීම යනාදියෙන් අමරණීයත්වය දිනාගත නොහැකිය, හෝ සැකයෙන් ඔබ්බට නොගිය[13] පුද්ගලයකුට පාරිශුද්ධත්වය ලබාගත නොහැකිය." මනසින් හටගන්නා කෙලෙස් තුනක් වන ලෝභය, ද්වේෂය

සහ මෝහය, වශයෙන් බුදුපියාණන් වහන්සේ සඳහන් කළහ. ඒවා සමාන්තර ගින්දර වශයෙන් දැක්වූ උන්වහන්සේ, ඒවා බ්‍රාහ්මණ ආගමේ තුන් ආකාර පූජනීය ගින්දර සමග වෙනස පෙන්වා දුන්හ. බ්‍රාහ්මණ ආගමට අනුව පූජනීය ගෙවැසි ගින්දර තුන[14] යමකුගේ ජීවිතය පුරාම රැඳී තිබිය යුතු විය, ඇවිළෙමින් තිබිය යුතු විය. බුදුපියාණන් වහන්සේ ඉගැන්වූයේ රාගාදී ගින්දර තුන නිරුද්ධ කළ යුත්තේ යම් පුද්ගලයකු රහත් ඵලයට පැමිණීමෙන් බව ය. බුදුපියාණන් වහන්සේ සම්පූර්ණ නිදහස ලැබීමේ තත්ත්වයට දුන්නා වූ බොහෝ නම් අතර, ඉතාම පොදු නාමය වූයේ නිර්වාණය වන අතර එහි අර්ථය 'නිවා දැමීම' ය. හෙවත් දැවෙන මානසික කෙලෙස් නිවා දැමීම ය.

බ්‍රාහ්මණ සමාජ ක්‍රමයේ මුල්ම මුල්ගල වූ කුල ක්‍රමය බුදුපියාණන් වහන්සේ ඉතා දැඩි භාෂිතයෙන් ප්‍රතික්ෂේප කළහ. උන්වහන්සේ හඳුනාගත් එකම සමාජ බෙදීම නම් ගෘහස්ථ (ගහට්ඨ) සහ භික්ෂු ය (පබ්බජිත). ඒ භික්ෂූන් සහ භික්ෂුණීන්, සහ යමකුට එක් පුද්ගලයකුගෙන් තවත් පුද්ගලයකුට වෙනස් විය හැකිය. ''අඩුම තරමින් පරම්පරා හතක් පුරා පිරිසුදු ශිෂ්ටසම්පන්න"[15] දෙමාපියන්ට දරුවකු ව ඉපදීම යමකු බ්‍රාහ්මණයකු වීමට අවශ්‍ය සුදුසුකම බව කියන වැරදි ලෙස වටහාගත් බ්‍රාහ්මණයන්ගේ මතය බිඳිමින් බුදුපියාණන් වහන්සේ දේශනා කළේ ඕනෑම පුද්ගලයකුට සුචරිතයේ පිහිටා ඇත්නම් ඔහු බ්‍රාහ්මණයකු ලෙස සැලකිය හැකි බවය. උන්වහන්සේ මෙසේ පැවසූහ : ''හුදෙක් බ්‍රාහ්මණ මවකගේ කුසෙන් ඉපදීම හෝ මතුවීම නිසා පුද්ගලයකු බ්‍රාහ්මණයකු යැයි මම නොසලකමි. එවැනි පුද්ගලයෙක් හුදෙක් වෛදික ගීත ගායනා කරන්නෙකි.[16] කෝපයට පත් අය අතර මිත්‍රශීලීව සිටින, ප්‍රචණ්ඩ අය අතර සාමකාමීව සිටින, ඇලී සිටින්නන් අතර තෘප්තිමත්ව සිටින පුද්ගලයා, බ්‍රාහ්මණයෙක් ලෙස[17] මම හඳුන්වමි. පූජනීය ගීතිකා ගායනා කරන්නකු වුවද, ඔහු අභ්‍යන්තරයෙන් කුණු වී, අපිරිසුදු වී ඇත්නම් සහ උපයා ගන්නේ වංචාවෙන් නම් උත්පත්තියෙන් බ්‍රාහ්මණයකු වුවද, ඔහු බ්‍රාහ්මණයෙක් නොවේ. ක්ෂත්‍රිය කුලය, බ්‍රාහ්මණ කුලය, වාණිජ කුලය, සේවා කුලය, රැහෙන් පැන්නූවකු

හෝ කසළ ශෝධකයකු වුවත්, යමකු ධෛර්ය සම්පන්න නම්, අධිෂ්ඨානශීලී නම් සහ සැමවිටම උත්සාහ කරන්නේ නම් ඔහුට ඉහළම පරිශුද්ධත්වය ලැබිය හැකිය. මෙය යථාවක් බව ඔබ දැනගත යුතුය."[18] බුදුපියාණන් වහන්සේ "සියලු කුල හතරම පිරිසුදු යැයි උගන්වන" බව අසා එක් බ්‍රාහ්මණයෙක් මෙම කාරණය පිළිබඳව උන්වහන්සේ සමඟ වාදකර, එය ප්‍රතික්ෂේප කරන්නට එහි ගියේය. බ්‍රාහ්මණයන් පිරිසුදු වන්නේ ඒ අය බ්‍රහ්මයාගේ මුඛයෙන් උත්පත්තිය ලබන බව මෙම බ්‍රාහ්මණයා තදින් කියා සිටි විට, අනෙක් සැම දෙනකු මෙන්ම බ්‍රාහ්මණයන්ද තමන්ගේ මවගේ දරු ගැබෙන් උපදින බව දකින්නට පුළුවන් සත්‍යයක් බව බුදුපියාණන් වහන්සේ කියා සිටියහ.[19]

බුදුපියාණන් වහන්සේ සහ උන්වහන්සේගේ භික්ෂුහු සියලු කුලවලට අයත්, අඩු කුලවල අයගේ ද, දානය පිළිගත්හ. ඉහළ කුලවල අය ඉදිරිපිට දී පහත් කුලවල අයගෙන් ලැබුණු මෙම ආහාර අපිරිසුදු සහ විෂ පැතිරුණු ඒවා ලෙස දක්නට ලැබේ. බුදුපියාණන් වහන්සේ අග්ගිකභාරද්වාජ බ්‍රාහ්මණයාගේ නිවස වෙත දානය සඳහා ප්‍රවේශ වූ විට, ඔහු උන්වහන්සේ නොතකා හැරියේය, උන්වහන්සේට අපහාස කළේය. ''ඔතන නවතින්න පැවිද්දා, ඔබ ශ්‍රමණයා, ඔබ රැහෙන් පන්නා දැමූ පුද්ගලයෙක්!"[20] වරක් උන්වහන්සේ ථූනා නමැති බ්‍රාහ්මණ ගමට වැඩි අවස්ථාවේදී - මිනිස්සු එය දැක උන්වහන්සේට ජලය පානය කරන්නට බැරිවන සේ තමන්ගේ ළිං තණකොළ සහ වීපොතුවලින් පුරවා ජලය අපිරිසුදු කළහ. [22]

වර්තමානයේ බොහෝ මිනිසුන්ට කුලය යල් පිනූ චාරිත්‍රයක් හෝ සාධාරණය හෝ සමානතාව පිළිබඳ කරුණක් බවට පත්වී ඇත. නමුත් බ්‍රාහ්මණයන්ට එය සම්පූර්ණයෙන්ම වෙනස් දෙයකි. එය ඔවුන්ට ඔවුන් පිළිබඳ අදහස්වල අත්තිවාරමයි. සමාජයේ ඔවුන්ගේ කාර්යභාරය සහ දේවත්වයෙන් නිමවූ සමාජ ක්‍රමයක කූටප්‍රාප්තිය වූ ඔවුන් එයට මුක්කු ගැසීමකි. කුලය පිළිබඳව බුදුපියාණන් වහන්සේගේ ප්‍රතික්ෂේප කිරීම නම්‍ය නොවූ පිරිසට තිගැස්මක් ඇති කළේය.

බුදුපියාණන් වහන්සේ ප්‍රතික්ෂේප කළ බ්‍රාහ්මණ ධර්මයේ වැදගත් පුරුද්දක් නම් ඔවුන්ගේ සිරිතක් වූ දිය ස්නානය කිරීමයි. ගංගා නම් ගඟෙන් හෝ වෙනත් පූජනීය ගඟකින් හෝ ගමක ළිඳකින් දිය නෑමෙන් හෝ යම් කෙනකු විසින් කරන ලද පව්, කිසිසේත් සෝදා හැරිය නොහැකි බව[23] බුදුපියාණන් වහන්සේ තරයේ දරා සිටියහ. උන්වහන්සේ දැරූ අදහස වූයේ සැබෑ දූෂණය ඇතිවන්නේ ඍණාත්මක සිතුවිලි සහ අවකල් හැසිරීම් නිසා බවත්, එය ''පිරිසුදු'' කළ හැක්කේ පුද්ගලයකුගේ හදවත සහ ක්‍රියාවන් වෙනස් කිරීමෙන් බවත් ය. මෙය ''ඇතුළාන්තය සේදීම'' (සිනාතෝ අන්තරේන සිනානේන)[24] යනුවෙන් බුදුපියාණන් වහන්සේ හැඳින්වූහ. උන්වහන්සේට අනුව සදාචාරාත්මක හැසිරීමෙන් යුක්තව ජීවත්වීම සහ ආචාරශීලී පාරිශුද්ධියෙන් යුතුව ජීවත්වෙමින් "ජලය නොමැතිව නෑම"[25] (සිනානං අනෝදකං) කළ යුතුයි.

බ්‍රාහ්මණ ආගම දැඩි ගෘහස්ථ ආගමකි. බුදුපියාණන් වහන්සේගේ කාලයේදී මිනිස්සු ඔවුන්ට සැමවිටම තිබෙන සියලු හේතූන්ට අනුකූලව විවාහ වූ නමුත් බ්‍රාහ්මණ ආගම තුළ එහි ප්‍රධාන ආගමික සිරිත් විරිත් සිදුකිරීමට නොහැකිවීම හෝ අවිවාහක පුද්ගලයකුට සහභාගි වීමට ද නොහැකිවීම සම්බන්ධයෙන් විවාහය අත්‍යවශ්‍ය විය. පූජාවක් පවත්වන බ්‍රාහ්මණයකු විවාහකයකු වියයුතු වන අතර, පූජාවක අනුග්‍රාහකයකුගේ බිරිඳ ද එම කටයුත්ත සිදුකරන විට, එහි සිටිය යුතු විය. නොඑසේ නම් එම කටයුත්ත අසාර්ථක වේ. පුද්ගලයකු විසින් ජීවිතයේ පසුකළ යුතු පියවර හතරෙන් (චතුර් ආශ්‍රම) විවාහ වී සිටීම සහ පවුලක් හදාවඩා ගැනීමත් සැලකිල්ලට ගනු ලැබේ.

පවුල සහ පුරුෂ ප්‍රජනනය ඇති කිරීම මත කේන්ද්‍රගත වූ වැදගත් බ්‍රාහ්මණ ආගමේ මතයක් නම් තුන් ආකාර ණයයි. (ත්‍රිණ). මෙම ධර්මයට අනුව මිනිසකු උපන් විගසම ඔහු විසින් මිය යෑමට පෙර තුන් ආකාර ණයක් නැවත ගෙවීමට බැඳී සිටියි - අධ්‍යාපනය ලබාදීම සම්බන්ධයෙන් ගුරුවරුන්ට, දෙවිවරුන්ට පූජා, සහ පුතකුට ජීවය ලබා දීම. පුතෙක් ලැබීම

හුදෙක් පවුල් පරම්පරාව පවත්වාගෙන යාම පමණක් නොව, එය සදාකාලික බව තහවුරු කරයි. පුතකු විසින් තම දෙමව්පියන්ගේ දරසෑයට ගිනි තැබිය යුතුය.26 ඔහුට කළ හැක්කේ පිතෘ ලෝකයේ (පිතෘ ලෝක) ඔහුගේ මුතුන්මිත්තන් දරා සිටිය ප්‍රජාව සෑදීම පමණි. "තමන්ගේ අළුත උපන් පුත්‍රයාගේ මුහුණ දකින පියා තමන්ගේ ණය පියවා අමරණීයත්වය ලබා ගනියි. පුත්‍රයකුගේ මාර්ගයෙන් පියා බලවත් අඳුර කපා හරියි. බිරිඳක් මිතුරියෙකි, දියණියක් දුක ගෙන එයි, නමුත් පුතෙක් ඉහළම දිව්‍ය ලෝකයේ ආලෝකය වෙයි. ''ඔබගේ පුත්‍රයා නිසා ඔබ නැවත ඉපදී ඇත. මරණය, ඔබගේ සදාකාලිකයයි." "පුත්‍රයකු ලැබීමෙන් මිනිසකුට ලෝකය ලැබී ඇත, පුත්‍රයකු හරහා ඔහු අමරණීයත්වය ලබා ගනී, එසේම පුත්‍රයාගේ මුනුබුරා හරහා ඔහු හිරුගේ මුදුනට පැමිණෙයි."27 බ්‍රාහ්මණ ආගමට අනුව, බ්‍රහ්මචාරී භික්ෂුවක වීමෙන්, කිසිදිනක දරුවකු නොලැබීමෙන් මරණයෙන් පසු පැවැත්ම නවතියි, එය උච්ඡේදනයයි.

ජේසුස්වහන්සේ සහ පළමු ක්‍රිස්තියානින්ට මෙන්ම බුදුපියාණන් වහන්සේට ද ආධ්‍යාත්මික අභිලාෂයන් ඉටුකර ගැනීම සඳහා ගෘහ ජීවිතය බාධාවක් විය. මෙම කරුණ සම්බන්ධයෙන් - 1 කොරින්තන්ස් - 7-32-35 සඳහන් ශාන්ත පාවුළුගේ වචන අඩු තරමින් එක් කොටසක් බුදුපියාණන් වහන්සේ සම්බන්ධයෙන් ද කථා කළ හැකිය. ''මම කරදරවලින් නිදහස් වීමට කැමැත්තෙමි. අවිවාහක මිනිසෙක් දෙවියන් වහන්සේගේ කාර්යයන් පිළිබඳව සැලකිල්ලක් දක්වයි. එයට හේතුව දෙවියන් වහන්සේ සතුටු කිරීමට ඔහු උත්සාහ දැරීමයි. නමුත් විවාහකයෙක් ලෞකික දේ පිළිබඳව සැලකිල්ලක් දක්වයි. එයට හේතුව ඔහු උත්සාහ දරන්නේ ඔහුගේ බිරිඳ සතුටු කිරීමටයි. එම නිසා ඔහු දෙපැත්තකට තල්ලු වේ. මම මෙසේ කියන්නේ මට ඔබට උපකාර කිරීමට අවශ්‍ය නිසාය. මම ඔබ මත සීමාවන් දමන්න උත්සාහ නොකරමි. මට අවශ්‍ය ඔබ නිවැරදි සහ නිසි දේ කර කිසිම සීමාවක් නැතිව දෙවියන් වහන්සේගේ සේවයට සම්පූර්ණයෙන්ම යෙදවීමටයි. බුදුපියාණන් වහන්සේ ලෞකික ජීවිතය පිළිබඳ මෙසේ සඳහන් කළහ : "ගෘහස්ථ ජීවිතය සීමා ඇති කරයි, සිත් නොගන්නා සුළුයි, නමුත්

පැවිදි ජීවිතය මඳ පවන සේ නිදහස්ය. ගෘහස්ථ ජීවිතයක් ගත කිරීම පහසු නොවේ, එසේම සම්පූර්ණයෙන්ම පරිපූර්ණ වූ පැවිදි ජීවිතය ඔපදමන ලද හක්ගෙඩියක් මෙන් පිරිසුදු ය."[28] ''පුත්‍රයන් ඔබ ආරක්ෂා කරන්නේ නැත" සහ ''පුත්‍රයන් ලැබීමට හෝ ගවයන් ලැබීමට දැඩි ලෙස සිතේ රඳවා තබා ගන්නා පුද්ගලයා මරණයෙන් දිවිය අවසන් කරන්නේ ය."[29] බුදුපියාණන් වහන්සේ වදාළහ. පවුල් ජීවිතය පිළිබඳව බුදුපියාණන් වහන්සේට කියන්නට තිබූ අනෙක් දේවල් පහත සඳහන් පරිදි වේ.

ආගමික ජීවිතයක ඉලක්කය දෙව්ලොව යෑම හෝ බ්‍රාහ්මණ ආගමේ හඳුන්වන පියවරුන්ගේ ලෝකයට (පිතෘලෝක) යෑම යයි බුදුපියාණන් වහන්සේ ඉගැන්වූයේ නැත. අපායට වඩා දිව්‍යමය තත්ත්වයක් හොඳ බව උන්වහන්සේ සැලකූහ. නමුත් පැහැදිලිවම එය නිර්වාණයට වඩා පහත්ය. උන්වහන්සේට අනුව දිව්‍යලෝක වැනි සියලු තත්ත්වාරෝපිත තත්ත්වයන් අනිත්‍යයි. එම නිසා යම් කෙනකුගේ කාලය ඒ ස්ථානයේ අවසන් වූ විට, එම පුද්ගලයා මිනිසකු ලෙස නැවත ඉපදිය හැකිය. ඊට පසු කායික පැවැත්මේ සියලු වෙහෙසකර තත්ත්වයන්ට උරුමක්කාරයා විය හැකිය. ඒ අනුව ''ප්‍රඥාවන්තයෝ දිව්‍යලෝකයේ විභූතිය පිළිබඳව උනන්දු නොවෙති." එසේම පළමුවෙනි මාර්ග ඵලයට හෝ පැමිණීම ''දිව්‍යලෝකයට යාමට වඩා හොඳ ය."[30] පහත සඳහන් ආකාරයට, මෙයට සම්බන්ධව බුදුදහමේ එකම උත්තරීතර පුද්ගල ස්වභාවයකට හෝ තැනක් නැත.

බ්‍රාහ්මණ ආගමේ වැදගත් දෛනික චාරිත්‍රයක් වූයේ, දිශාවන්ට නමස්කාර කිරීමයි. සමහර විට ප්‍රධාන දිසා හතරට, සමහර විට ඊට අමතරව හිසට විරුද්ධ දිසාවට සහ මුදුනට, සමහර විට මේ හයට අමතරව අතරමැදි දිශාවන්ට වශයෙනි. තමාගේ මියැදෙමින් සිටි පියාගේ ඉල්ලීම මත දිසා හයකට වඳින බව සිගාල නමැති තරුණයා බුදුපියාණන් වහන්සේට පැවසුවේය. තමන් වහන්සේ ද දිසා වන්දනාව උගන්වා ඇති බව ද, නමුත් වෙනස් ආකාරයකට බව ද බුදුපියාණන් වහන්සේ වදාළහ. වන්දනා කරන්නා සෑම දිසාවකටම තමන් දන්නා පුද්ගලයකු - දෙමාපියන්, කලත්‍රයා,

මිතුරකු, ගුරුවරයකු, සේවකයකු ආදී වශයෙන් සහ ඒ අයට ගෞරවයෙන් සහ කරුණාවෙන් සලකමින් ''ඔවුන්ට වන්දනා" කරන ලෙස බුදුපියාණන් වහන්සේ අවවාද කළහ. [31]

බලාපොරොත්තු රහිත සහ පෙනෙන ආකාරයට සුළු යැයි හැඟෙන කරුණු සම්බන්ධයෙන් ද බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ ධර්මය බ්‍රාහ්මණ ආගමෙන් ඈත් කරන්නට විමසූ බවට සාක්ෂි ඇත. බ්‍රාහ්මණ ආගමේ පූජනීය භාෂාව සංස්කෘත වන අතර, එය දෙවියන්ගේ භාෂාව වශයෙන් විශ්වාස කරනු ලැබේ, ප්‍රාථමික, පවිත්‍ර සහ නිත්‍ය වශයෙනි. සංස්කෘත වේදයන්ගේ භාෂාව වූ නමුත්, ක්‍රි. පූ 6 වන ශතවර්ෂය වන විටදී එම භාෂාව ප්‍රධාන වශයෙන් භාවිත වූයේ යාග හෝමවලදී සහ වෙනත් චාරිත්‍රවලදී වෛදික ගීතිකා ගායනා කිරීමටය. එක් අවස්ථාවකදී බ්‍රාහ්මණ භික්ෂුහු දෙදෙනෙක් බුදුපියාණන් වහන්සේගේ සියලු ඉගැන්වීම් ඡන්දස් විරිත්මය සංස්කෘතවලට (ඡන්දස් යනු වෛදික අධ්‍යයනයේ කොටස් හයෙන් එක් කොටසකි.) පරිවර්තනය කරන ලෙස යෝජනා කළහ. මෙසේ පවසමින් බුදුපියාණන් වහන්සේ ඔවුන්ට තරවටු කළහ : ''හිස් පුරුෂයනි, ඔබලා එවැනි දෙයක් කියන්නේ කෙසේ ද? එය තවමත් සතුටට පත් නොවූ අයට සතුටට හේතුවක් නොවේ, හෝ සතුටින් සිටින අයගේ සතුට වැඩි නොකරයි. ඊට වඩා තවමත් සතුටට පත් නොවූ අයට, එසේම දැනටත් සතුටින් සිටින අයට අසතුටට හේතුවක් වේ." උන්වහන්සේ වැඩිදුරටත් මෙසේ පැවසූහ: ''ඔබ සැම බුදුපියාණන් වහන්සේගේ ඉගැන්වීම් ඔබගේම භාෂාවෙන් ඉගෙන ගැනීම සුදුසු යි."[32] බුදුපියාණන් වහන්සේගේ ඉගැන්වීම් බ්‍රාහ්මණ ආගමේ පූජක පංතිය නියෝජනය කරන සහ බහුතරයක් මිනිසුන්ට ලබා ගත නොහැකි අභාවිත භාෂාවක් සමඟ සම්බන්ධ කිරීමට බුදුපියාණන් වහන්සේට උවමනාවක් නොතිබූ බවට සැකයක් නැත.

පසුකාලීන ශතවර්ෂවලදී සංස්කෘත භාෂාව ඉන්දියාවේ සංස්කෘතිය සහ ඉගැන්වීමේ භාෂාව බවට පත් වූ අතර, ක්‍රි.පූ. දෙවන ශතවර්ෂයේදී යම් සිදුවීමක බලපෑමක් නිසා, භික්ෂුහු බුදුපියාණන් වහන්සේගේ දේශනා

සංස්කෘත භාෂාවට පරිවර්තනය කළ අතර, එම භාෂාවෙන් විවිධ රචනා නිර්මාණය කිරීම ද ආරම්භ කළහ. බුදුපියාණන් වහන්සේ සමහර විට බ්‍රාහ්මණ ආගමේ පාරිභාෂිතය සහ ප්‍රභේදයන් භාවිතයට ගත් බව සත්‍යයකි. නමුත් උන්වහන්සේ සැමවිටම සාමාන්‍යයෙන් සදාචාරමය අදහස් ඒවාට එක් කරමින් අළුත් බවක් ඇති කළහ. උදාහරණ වශයෙන් වේද තුන පිළිබඳ මනා දැනුමක් සහ වෙනත් පූජනීය දැනුම ලැබූ අයට තුන් වරක් - උගත් පුද්ගලයා යන පදවි නාමය (තෙවිජ්ජ) ලබා දුන් අතර, එය භාවනාව හරහා තුන් ආකාර ප්‍රඥාව, හෙවත් පුද්ගලයකු සැබෑ තුන්-ආකාර අධ්‍යයනය ලැබුවෙක් බවට පත්වීම බව බුදුපියාණන් වහන්සේ වදාළහ.[33]

ඒ අනුව බුදුපියාණන් වහන්සේ බ්‍රාහ්මණ ආගමේ අත්‍යවශ්‍ය ඉගැන්වීම් සහ පුරුදු කිරීම් සම්පූර්ණයෙන්ම සහ හැම දෙයක්ම විවේචනය, ප්‍රතික්ෂේප කිරීම, මඟහැරීම හෝ යළි අර්ථ නිරූපණය කිරීම සිදු කළහ. මේ ආකාරයට උන්වහන්සේගේ ධර්මයේ ප්‍රධාන ප්‍රතිපත්ති - චතුරාර්ය සත්‍ය, ආර්ය අෂ්ටාංගික මාර්ගය, පැවැත්මේ තුන් ආකාර ගතිලක්ෂණ, අනත්ත ධර්මය සහ පටිච්ච සමුප්පාදය - වේදයේ හෝ පසුකාලීන බ්‍රාහ්මණ ආගමේ ග්‍රන්ථවල නොමැත. වේදයේ කිසිම තැනක කර්මය හෝ පුනරුත්පත්තිය යනාදි බුදුදහමේ  මූලික සංකල්ප සඳහන් වී නැත. නමුත් පසුව හින්දු ආගමට ඒවා ඒකාබද්ධ කර ඇත. සැබැවින්ම මේවා සහ උන්වහන්සේ අවබෝධ කරගත් අනෙක් සත්‍යයන් ''මීට ප්‍රථම අසා නැති" (පුබ්බේ අනනුස්සුතේසු) බව බුදුපියාණන් වහන්සේ පැහැදිලිව  ප්‍රකාශ කර ඇත.

කියන පරිදි පවතින ආගම්වලට විකල්පයක් වශයෙන් බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ ධර්මය ඉදිරිපත් කර ඇත. බ්‍රාහ්මණ පූජකවරුන් මේ බව හොඳින් දැන සිටිය අතර, බුදුපියාණන් වහන්සේ සහ උන්වහන්සේගේ ධර්මය පිළිබඳව බ්‍රාහ්මණ එදිරිවාදිකම් ගැන බොහෝ උදාහරණ ත්‍රිපිටකයේ සඳහන් කිරීම පුදුමයක් නොවේ. ඔව්හු බෞද්ධ භික්ෂූන් රැහෙන් පැන්නූවන්ට සම කරමින්, සිතන පරිදි  බ්‍රහ්මගේ පාදයෙන් නිර්මාණය වූ,    "නෑයන්ගේ පාද සූරන හොරිකඩයන්" (ඉබ්භා කිණ්හා

බන්ධුපදාපක්කා) යැයි අවඥා කළහ. වරක් බුදුපියාණන් වහන්සේගේ ශ්‍රාවකයන් වූ යම් බ්‍රාහ්මණයන් පිරිසක් තමන්ගේ සමකාලීන බ්‍රාහ්මණයන් දැන් ''අපට නිග්‍රහ සහ හිරිහැර කරති" යැයි බුදුපියාණන් වහන්සේට පැවසූහ. ''ඒ අය ඒ පුරුදු නිග්‍රහ නතර කරන්නේ නැත"[34] යැයි පැවසූහ. තමන්ගේ ගෝත්‍රයේ සාමාජිකයෙක් බෞද්ධයකු බවට පත් වූ බව අසා අක්කෝසක බ්‍රාහ්මණයා බුදුපියාණන් වහන්සේ හමුවී "පරිභව කර, පරුෂ, දරුණු වචනවලින් උන්වහන්සේගේ අගුණ කීවේය. "[35]

විවිධාකාරයේ බෞද්ධ භාවනා ක්‍රම හින්දු ආධ්‍යාත්මිකතාවයේ වැදගත් කොටසක් වූ නමුත්, බ්‍රාහ්මණ ආගමේ එවැනි පුරුදු නොතිබුණි. එසේම බුදුදහමේ මෙම කරුණ බ්‍රාහ්මණයන්ගේ අවමානයට සහ අවඥාවට හේතු විය. ''එළිපත්තක් මත, කුණු ගොඩක් මත, නැතහොත් කාණුවක් මත සිටින බළලකු අවධානයෙන් සිටින්නා සේද, අවලෝකනය කරන්නා සේද, කල්පනා කරන්නා සේද මේ තවුසෝ භාවනා කරති. මේ තවුසෝ 'අප භාවනා කරනවා, අප භාවනා කරන්නෝ!' යැයි කියා සිටිති. ඔවුන්ගේ උරහිස් පහතට එල්ලා වැටී, ඔවුන්ගේ හිස් පහතට එල්ලා වැටී, නොණ්ඩි ගසමින් ඔවුන් භාවනා කරනවා."[36] බුදුපියාණන් වහන්සේගේ ඇතැම් ශ්‍රාවකයන් සැමවිටම එවැනි දෝෂාරෝපණ පිළිගැනීමට සූදානම් වූයේ නැත. වරක් බ්‍රාහ්මණ ශිෂ්‍ය පිරිසකට කච්චාන නමැති ජ්‍යෙෂ්ඨ භික්ෂුවක වනයේදී අහම්බෙන් හමුවුණු අතර, ඔහු හා අනෙක් භික්ෂූන්ට ගෞරව කරන්නේ නූගත් දාසයන් පමණක් බවත් කියමින් රහසින් පහර දුන්හ. (භාරතකා). <u>මෙම අපහාසය නොසැලකිය යුතු නොවන බව තීරණය කරමින් කච්චාන මහරහතන් වහන්සේ මෙසේ පිළිතුරු දුන්හ:</u> "අහංකාරකමින් ඉදිමුණු... ඉර උදාවේදී ස්නානය කරන, තුන් වේදය ගායනා කරන, මන්තර සජ්ඣායනය, නීති, බාර-භාර, ස්වයං වන්දි... කුහකකම, වංක සේවකයන් සහ සාමාන්‍යයෙන් අනුගමනය කරන සෝදා පිරිසුදුවීමේ පිළිවෙත් ක්‍රම, මේවා බ්‍රාහ්මණයන්ගේ සලකුණුයි. නමුත්

බ්‍රාහ්මණයකු වීමට අවශ්‍ය වන්නේ නාභිගත, පැහැදිලි සහ පලුදුවලින් නිදහස් මනසකින්, සියලු සත්ත්වයන් කෙරෙහි මෘදුව සිටීමයි.”37

බ්‍රාහ්මණ ආගම, හින්දු ආගම කෙරෙහි මෙන්ම, බුද්ධාගම කෙරෙහි ද තිබූ එදිරිවාදිකම් සහ විවේචන ද ශතවර්ෂ ගණනාවක් නොකඩවා පැවතුණි. මෛත්‍රී උපනිෂද් මෙසේ කියයි : ''වේදයන්ගේ සත්‍ය නොවූ තර්ක, සැසඳීම් සහ අනුවර්තිවාදවලින් යුතු වංචාව විශ්වාස කරන්නන්ගෙන් ඈත්වීමට කැමැති අය සිටිති... ආත්මයක් නැතැයි කියන (නයිරාත්මයවාද) ධර්මයෙන් ලෝකය වික්ෂිප්ත වී ඇත. මිථ්‍යා සැසඳීම් සහ සාක්ෂිවලින් වේදයන්ගේ ප්‍රඥාව සහ වෙනත් දැනුම අතර වෙනස ප්‍රත්‍යක්ෂ නොකරයි. වේදය වෙනුවට ධර්මය කෙරෙහි අවධානය යොමුකළ යුතු බව සමහර අය පවසනවා. නමුත් සත්‍යය වේදයයි. බුද්ධිමතුන් තමන්ගේ ජීවිත, වේදය මත පාදක කරගත යුතුයි. බ්‍රාහ්මණයකු වේදයේ තිබෙන දේ පමණක් අධ්‍යයනය කළ යුතුය.” මෙය නිසැකයෙන්ම බුද්ධ ධර්මයේ ආත්මයක් නැතැයි (අනත්ත) යන කියමන, වේදය පිළිබඳ විශ්වාසය ප්‍රතික්ෂේප කිරීම සහ බෞද්ධයන් තමන්ගේ අදහස්වලට පක්ෂව ඉදිරිපත් කරන සහේතුක විතර්ක පිළිබඳ විවේචනයකි. මිනිසුන් සත්‍යයෙන් වෙන් කිරීම සඳහා මුළාව සහ අවිද්‍යාව (මායාමෝහ) භාවිත කළ ගෞතමයන් කපටි, නොමඟට යවන්නකු ලෙස විෂ්ණු පුරාණ විස්තර කරයි. සංකරාචාර්ය (Sankaracariya), වේදාන්ත සූත්‍ර පිළිබඳව විවරණයක් කරමින් මෙසේ සඳහන් කළේය. ''තමන්ගේ සතුට සඳහා සැලකිල්ලක් දක්වන සියලුම දෙනා ගෞතමයන්ගේ ධර්මය සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කළ යුතුයි.” බුදුදහම පිළිබඳව විස්තරාත්මක විවේචන ලියවිල්ලක් ඇතුළත් කුමාරිල භට්ටගේ ශ්ලෝක-වාර්ත්තික, *(Śloka-vārttika)* බුදුදහම පහ කරමින් එය සුදුසු වන්නේ රැහෙන් පැන්නුවන්ට, විදේශිකයන්ට සහ ආදි ගොත්‍රිකයන්ට පමණක් බව කියමින් අවසන් කර ඇත. බුදුදහම සමඟ එකඟ නොවීම් සහ හින්දු ආගමට එය තර්ජනයක් ලෙස දැක, ප්‍රමේයමාලා මෙසේ සඳහන් කළේය:

''තුන් ආකාර වේදයේ සත්‍ය කණාදගේ අනුගාමිකයන්, බෞද්ධයන් සහ වෙනත් මිථ්‍යා ලබ්ධිකයන් විනාශ කර ඇත. පෙරදී, එය විෂ්ණු තම ත්‍රිශූලයෙන් ආරක්ෂා කරනු ලැබුණි. ''බුද්ධාගම හුදෙක් බ්‍රාහ්මණ ආගමේ හෝ පසුව හින්දු ආගමේ ශාඛාවක් හෝ ප්‍රතිසංස්කරණයක් වූවානම් මේ සියල්ල තේරුමක් නැති සහ අනවශ්‍ය වන්නට ඉඩ තිබුණි. බුදුපියාණන් වහන්සේ සැබැවින්ම බ්‍රාහ්මණ ආගමේ සමහර පාරිභාෂිතයන් පිළිගත් අතර, තමන් වහන්සේගේ ධර්මය බ්‍රාහ්මණ ආගමෙන් සහ බ්‍රාහ්මණ පූජකයන් වූ බ්‍රාහ්මණයන්ගෙන් අසමාන බව දුටුවහ.

සමහර බ්‍රාහ්මණ ධර්මයන් සහ පිළිවෙත් සහ උන්වහන්සේ වෙත එල්ල වූ බ්‍රාහ්මණ එදිරිවාදිකම් පිළිබඳව බුදුපියාණන් වහන්සේගේ විවේචන තිබියදී ඔවුනොවුන් අතර සමහර විට යහපත් සම්බන්ධතා ද තිබුණි. වඩාත් විවෘත සහ නිදහස් මතධාරී බ්‍රාහ්මණයන්, විශේෂයෙන්ම බුදුපියාණන් වහන්සේගේ ධර්මය පිළිබඳව බොහෝ විට කුතුහලය ඇති අය සහ උන්වහන්සේගේ අදහස්වලට ගරු කළ අය උන්වහන්සේ සමඟ විනීත සංවාදවලට එළඹියහ. ඉහත සඳහන් ආකාරයට, බ්‍රාහ්මණයන් සැළකිය යුතු සංඛ්‍යාවක් බුද්ධාගම වැළඳගත් අතර, ඔව්හු බෞද්ධ භික්ෂූන් බවට ද පත්වූහ.

## උන්වහන්සේලාගේ ඉගැන්වීමේ ශෛලීන්

බුදුදහම සහ සුවිශේෂී දේවවාක්‍ය ඉතා ඉක්මණින් සහ හොඳින් ස්ථාපනය වීමට සහ පැතිරීමට බෙහෙවින් හැකිවූ හේතුව නම් බුදුපියාණන් වහන්සේ සහ ජේසුස්වහන්සේ යන දෙදෙනා වහන්සේලාගේම ඉගැන්වීමේ ශෛලීන්ය. ජේසුස්වහන්සේගේ වෘත්තීය ප්‍රගමනයේ කෙටි බව, සහ ආරම්භයේදී සමහර විට ප්‍රචණ්ඩ විරුද්ධතාවලට මුහුණ දීමට සිදුවීම් ද සැලකිල්ලට ගත්විට ඔහුගේ තත්ත්වය වඩාත් විශිෂ්ටය. උන්වහන්සේලාගේ අදාළ ශ්‍රාවකයන් දෙදෙනා වහන්සේලාම අතිශයෙන්ම සාර්ථක සන්නිවේදකයන් වූ බව ප්‍රත්‍යක්ෂ වේ.

ජේසුස්වහන්සේ තමන්ගේ පණිවුඩය ප්‍රධාන වශයෙන්ම පලස්තීනයේ සරල යුදෙව් ගොවියන්ට යොමු කළේය. ඔහු

ඔවුන්ගේ සිත් ඇද ගන්නා ආකාරයෙන් කථා කළේය. ඔහුගේ ඉගැන්වීමේ ශෛලිය - ප්‍රධාන වශයෙන් ගොවි ජීවිතයේ මූලික දේ පිළිබඳව ආකර්ෂණය කරමින් සහ සාමාන්‍ය මිනිසුන්ගේ පළපුරුද්ද සහ කෙටි සිහිකටයුතු ආප්තවාක්‍ය, සිත්ගන්නා සුළු උපමා කථා යනාදියෙන් යුක්ත සතුටුදායක තත්ත්වයෙන් නිවැරදිව පිළිබිඹු කරමින් පළමු සුවිශේෂී දේවවාක්‍ය තුනෙහි මුළුමනින්ම ආරක්ෂා වී තිබිය හැකිය. බොහෝ විද්වතුන්ට අනුව ජේසුස්වහන්සේ උපමා කථා 40ක් පමණ භාවිතාකර ඇත. අපෝස්තල්වරුන් ඔහු මිනිසුන් සමඟ සන්නිවේදනය සඳහා උපමා කථා භාවිතා කරන්නේ ඇයිද කියා විමසූ විට, ඔහුගේ පිළිතුර වූයේ වඩාත් ව්‍යාකූල එකකි. උන් වහන්සේ මෙසේ උත්තර දුන් සේක: ''ස්වර්ග රාජ්‍ය පිළිබඳ අබිරහස ඔබට දන්වා දී ඇත. එහෙත්, ඔවුන්ට එසේ දී නැත. යමකුට ඇත්තේ ද ඔහුට දෙනු ලැබේ; පමණටත් වඩා ඔහුට ලැබේ. යමකුට නැත්තේ ද ඔහුට ඇති දෙයක් ඔහුගෙන් ගනු ලැබේ. එහෙයින් ඔවුන් දැක දැකත් නොදක්නා නිසා ද, අස අසාත් නොඅසන නිසා ද, වටහා නොගන්නා නිසා ද ඔවුන්ට උපමා මඟින් කතා කරමි. මෙසේ, යෙසායාගේ දිවැස් කීම ඔවුන් කෙරේ ඉෂ්ට වනු ඇත. එනම්: 'ඔබ අස අසාත් තේරුම් නොගන්නාහු ය; දැක දැකත් නොදක්නහු ය. මේ සෙනඟගේ සිත් අඳුරු ය; ඔවුන්ගේ කන් වැසී ඇත. ඔවුන්ගේ ඇස් පියවී ඇත. එසේ නොවී නම්, ඔවුන් ඇසින් බලා, කනින් අසා, සිතින් තේරුම් ගෙන හැරෙනු ඇත. මම ද ඔවුන් සුවපත් කරමි' යනු යි. එහෙත්, ඔබට ඇසින් පෙනෙන නිසා ද, කනින් ඇසෙන නිසා ද, ඔබ භාග්‍යවන්ත ය. සැබැවින් ම මම ඔබට කියමි, බොහෝ දිවැසිවරයන් ද දැහැමි අය ද ඔබ දකින දේ දැකීමට, අසන දේ ඇසීමට ආසා වූ නමුත්, ඔවුන් ඒවා දුටුවේවත්, ඇසුවේවත් නැත."[38] මෙයින් හැඟෙන්නේ උපමා කථා යෙදීමේ අරමුණ වන්නේ අපෝස්තල්වරුන්ගේ වඩා ඇතුළත කවයට පමණක් හෙළිකරන ලද යම්දෙයක් සඟවා තැබීමට බවය. නමුත් පුළුල් ලෙස උපකල්පනය වන්නේ, සහ කාරණය වශයෙන් පෙනී යන්නේ ජේසුස්වහන්සේ තමන්ගේ පණිවුඩය ගෙනගිය ප්‍රධාන මාර්ගය උපමා කථා බවය.

අනාචාරයේ හැසිරුණු බවට චෝදනා ලැබූ ගැහැනියකට ගල්ගැසීමට රැස්වූ පිරිසක් අමතා ජේසුස්වහන්සේ කියන ලද සරල වචන කිහිපය මිනිසුන් අතර ධනාත්මක වෙනස්කම් ඇතිකිරීමේ

ජේසුස්වහන්සේ තුළ තිබූ හැකියාව පිළිබඳව හේතු දැක්වීමට සුදුසු ප්‍රසිද්ධ උදාහරණයකි. මෙම වරදට (Deuteronomy 22; 22-24) දඬුවම වශයෙන් ගල්ගැසීමේ පූජනීය නීතිය පැනවූ පරණ තෙස්තමේන්තුව පිළිබඳව ජේසුස්වහන්සේ ලවා විවේචනය කරවීම සඳහා පාලනය කරන පූජකවරු උන්වහන්සේ මේ කාරණය සම්බන්ධයෙන් කුමක් කරන්නේ ද කියා ඇසූහ. ඔහු මොහොතකට නිහඬ විය. නැඹුරු විය. ඔහුගේ ඇඟිල්ලෙන් යම්කිසිවක් පොළොව මත ඇන්දේය. ඊටපසු නැගිට මෙසේ කීවේයඃ ''ඔබ අතරෙන් පවක් නැති තැනැත්තා පළමු කොට ගලක් ගසන්නැ''යි වදාළහ. එකිනෙකා බැගින් පිරිස තමා අතැති ගල් අත්හැර ඇදී ගියහ. සියලු දෙනා ගිය පසු ජේසුස්වහන්සේ එම ගැහැනියගෙන් මෙසේ ඇසුවේයඃ ''ස්ත්‍රිය, ඔවුහු කොහේ ද? කිසිවකු ඔබට වරද තැබුවේ නැද්ද? ''ස්වාමීනී නැතැ'' යි ඇ කීවා ය. ''මමත් ඔබට වරද නො තබමි, යන්න, මින්පසු තවත් පව් නොකරන්නැ''යි උන්වහන්සේ ඇයට වදාළ සේක.[39] මෙම කෙටි වාක්‍ය තුනෙහි විශාල වශයෙන් අදහස් පුරවා තිබුණි. එය එම පිරිසට එම ගැහැනියගේ අඩුපාඩුකම්වලට වඩා තමන්ගේම ඒවා පිළිබඳව සිතීමට උනන්දුවක් ඇති කළේය. ඔව්හු කරුණාව සහ සමාව දීම සමව තබාගෙන ඇයට ඇයගේ හැසිරීම වෙනස් කරගැනීමට ආයාචනය කළහ. එසේම ඒ අතර ම කුමන්ත්‍රණකාරී වීම පිළිබඳව සූක්ෂම ලෙස පූජකවරුන්ට දෝෂාරෝපණය කළහ. ගුරුවරයකු වශයෙන් ජේසුස්වහන්සේගේ බලය පෙන්නුම් කරන බොහෝ උදාහරණ අතරෙන් මෙය එක් කුතුහලය දනවන කථාවකි. බුදුපියාණන් වහන්සේ පිළිබඳව, බෞද්ධයන් විසිනුත් දරන ජනප්‍රිය මතය වන්නේ උන්වහන්සේ තමන්වහන්සේගේ ජීවිතයේ බොහෝ කාලයක් අර්ධ-හුදෙකලාවේ, ගසින් තොර එළිමහනක හෝ කඳු ලෙනක තනිව වැඩ සිටි බවය. මෙම මතයට ත්‍රිපිටකය සාක්ෂි දරන්නේ නැත. ත්‍රිපිටකය බොහෝ සෙයින් උන්වහන්සේ නාගරිකයකු ලෙස විස්තර කර ඇත. උන්වහන්සේ ප්‍රධාන වශයෙන් ජීවත් වූයේ විශාල පුරවර සහ නගරවල ඇවිදින දුර ප්‍රමාණයේ ය ඃ රජගහ, කොසඹෑ, සාකේත, ශ්‍රාවස්ථි, වේසාලි, චම්පා, මථුරා, ආදිය. උන්වහන්සේ ගම්බද ප්‍රදේශවලට හෝ වනාන්තරවල හුදෙකලාවට වැඩියත්, උන්වහන්සේ සැමවිටම පිණ්ඩපාතයේ වැඩීමට හැකිවන සේ ගමක් හෝ කුඩා ගමක්

සමීපයේ  වැඩ සිටියහ. මෙයින් අදහස් වෙන්නේ බුදුපියාණන් වහන්සේගේ ශ්‍රාවකයන් සියලු පසුතලවලින් යුක්ත බව, විශේෂයෙන්ම ඔවුන් නගරවල ජීවත්වන්නන්, බොහෝ විට ආර්ථික, ආගමික සහ දේශපාලන යන සමාජ තල : වෙළෙඳුන්, බොහෝ නිකායන්වල භික්ෂූන්, හමුදාවේ රාජකාරී කරන, ඉඳහිට රාජකීයයන් පවා උන්වහන්සේ බැහැදැකීමට පැමිණි බව ය.  සුනීධ සහ වස්සකාර යන දෙදෙනාම රජයේ ඇමතිවරු වූහ, ජීවක වෛද්‍යවරයෙකි, සීහ ජෙනරාල් වරයෙකි, අභය කුමාරයෙකි, මල්ලිකා රැජිනකි, එසේම උන්වහන්සේ කතාබහ කළ බ්‍රාහ්මණයන් ඔවුන්ගේ ගෝත්‍රවල සහ ප්‍රජාවන් අතර නායකයන් වූ අතර, ඔවුන්ගෙන් සැලකිය යුතු ප්‍රමාණයක් පැවිදි වූහ. අනාථපිණ්ඩික, ඝෝසිත සහ පාවාරික වැනි තවත් අය ධනවත් ව්‍යාපාරිකයෝ වූහ. එවැනි පුද්ගලයෝ එකල සාකච්ඡාවට බඳුන් වූ විවිධ ආගමික සහ දාර්ශනික මත සහ ගෘහස්ථ උපමා කථා, බොහෝ විට හොඳින් දැනගෙන සිටි අතර, ඒ පිළිබඳව කැමැත්තක් දැක්වූහ. තහවුරු නොකළ දේ සහ නිරය පිළිබඳව විශ්වාස නොකිරීමට හේතුව ඔවුන්ට ඒ සම්බන්ධයෙන් හැඟීමක් නොතිබීම විය හැකි ය.

බුදුපියාණන් වහන්සේ වෙත පැමිණ උන්වහන්සේට සවන් දීමට හෝ ප්‍රශ්න ඇසීමට සිටි මිනිසුන් සමඟ උන්වහන්සේ සාකච්ඡාවේ යෙදුණහ. සමහර විට කණ්ඩායමක් කැටුව එන  ප්‍රධානියා  සවන් දුන්නේය. සමහර විට මෙම හමුවීමට පැමිණෙන අමුත්තන්ගෙන් බුදුපියාණන් වහන්සේ ප්‍රශ්න කරමින් සහ ඔවුන් පිළිතුරු දීමේ හෝ අමුත්තා ප්‍රශ්න කරමින් බුදුපියාණන් වහන්සේ පිළිතුරු දීමේ ස්වරූපයක් ගත්තේය. අනිවාර්යයෙන්  එවැනි මෙසේ පෙරටත් පසුපසටත් සාකච්ඡා කිරීම අවසානයේදී බුදුපියාණන් වහන්සේ තමන් වහන්සේගේ මතය ඉදිරිපත් කළහ. මෙවැනි සමහර සාකච්ඡා සම්පූර්ණයෙන්ම දීර්ඝ ය. ඒවා උදාහරණ වශයෙන්, අම්බට්ඨ, අස්සලායන සහ චංකි සමඟ, ආදී වශයෙන්, සාමාන්‍යයෙන් විනීත අයුරින් පැවැතුණි. කලාතුරෙකින් තියුණු වූ අවස්ථා තිබුණි.40

බුදුපියාණන් වහන්සේ සමහර විට උපමාකථා උන්වහන්සේගේ ඉගැන්වීම්වලදී භාවිත කළ නමුත් උන්වහන්සේ වැඩි වශයෙන් භාවිත කළේ උපමා ය.[41] යමක් පැහැදිලි කරන විට සමහර විට උන්වහන්සේ මෙසේ පැවසූහ : ''මම ඔබට උපමාවක් ඉදිරිපත් කරමි. එයට හේතුව සමහර බුද්ධිමත් මිනිස්සු උපමාවක උපක්‍රමයෙන් වඩා හොඳට අවබෝධ කර ගනිති." [42] බුදුපියාණන් වහන්සේගේ සියලු උපමා සහ උපමා කථා කිසිම පුද්ගලයකු කවරදාකවත් ගණන් කර නැත. නමුත්, මජ්ඣිම නිකායේ 165ක් පමණ ඇත, 170ක් පමණ සංයුත්ත නිකායේ ඇත, සහ තවත් බොහෝ ඒවා ත්‍රිපිටකයේ වෙනත් ග්‍රන්ථවල ඇත. මෙම උපමාවලින් ස්වභාවික ප්‍රපඤ්චයේ සිට සංචාර, ග්‍රාමීය ජීවිත, ව්‍යාපාර, සතුන් හීලෑ කිරීම්, රාජ්‍යත්වය, ලෝහ විද්‍යාව, ගෘහස්ථ ද්‍රව්‍ය සහ යුතුකම් වශයෙන් සුළුවෙන් නම් කළ, නමුත් විවිධ පුළුල් අන්තරයක පැතිරුණු දේ පිළිබඳව අවධානය යොමු කර ඇත. ඒවායේ අනගිබව, අසමානබව සහ තාත්විකත්වය, පුළුල් පළපුරුද්දකින් යුක්ත අවධානයෙන් යුතු නිරීක්ෂකයකුගේ මනසක් ඉදිරිපත් කරයි.

මේ අතරින් වඩා ප්‍රසිද්ධියට පත් වූයේ පාරුව පිළිබඳ උපමා කථාවයි. මෙයින් ධර්මය හරියාකාරව ඉගෙන ගැනීමේ වැදගත් බව සහ අදහස්වලට ඇලී සිටීමේ භයානක බව බුදුපියාණන් වහන්සේ සාකච්ඡා කරති. එක් විශේෂ අරමුණක් ඉෂ්ට කරගැනීම පිණිස යම් දෙයක් භාවිත කර, එනම් රහත් ඵලයට පැමිණීමෙන් පසු අතිරික්තයක් වන ආකාරයටම, බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ ධර්මය ප්‍රධාන වශයෙන් අතිශය ප්‍රායෝගික කොන්දේසියකින් යුක්තව දුටුවහ. උන්වහන්සේ අදහස් කළ දේ පැහැදිලි කිරීමට එක් කථාවක් පැවසූහ, ගමනක් ගිය එක් මිනිසකු විශාල ගංගාවක් වෙත පැමිණ, රටේ ඔහු සිටි ප්‍රදේශය අනතුරුදායක වෙන්නට ඉඩ ඇති බව සහ අනෙක් පැත්ත ආරක්ෂාකාරී බවත් දැන, අනෙක් පැත්තට යන්නට තීරණය කළේය. පාරුවක් හෝ පාලමක් නොතිබූ නිසා ඔහු තණ සහ කොළ අතුවලින් පාරුවක් සාදා ඔහුගේ අත් සහ පාද භාවිත කරමින් ගං ඉවුරෙන් එතෙර වීමට හබල් ගැසුවේය. එසේ කිරීමෙන් පසු එම පාරුව කෙතරම් ප්‍රයෝජනවත් වූයේ ද යන්න සිතා ගමනේ ඉතිරිය සඳහා ද එය තබා ගැනීමට තීරණය කරමින්

තමන්ගේ හිස මතට ඔසොවා ගත්තේය. මෙම ක්‍රියාව බුද්ධිමත් එකක් දැයි බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ භික්ෂූන්ගෙන් ඇසූ සේක. ඔවුන්ගේ පිළිතුර වූයේ 'නැත' යන්න වූ අතර, බුදුපියාණන් වහන්සේ මෙසේ පවසමින් එය අවසන් කළහ: ''මහණෙනි, ධර්මය පාරුවකට සමාන බව ඔබ අවබෝධ කරගත් විට, (අවසානයේ) අයහපත් දේ කෙතරම් තිබුණත්, ඔබ යහපත් පවත්නා තත්ත්වයන් පවා මුදා හැරිය යුතුය."[43] ගඟක් තරණය කිරීමේ චිත්‍රයක් භාවිත කරගත් වෙනස් ආකාරයේ කරුණක් මතු කරන්නට බුදුපියාණන් වහන්සේගේ තවත් උපමා කථාවක් භාවිත කර ඇත. ඒ මෙයයි. විමුක්තිය ස්වයං අත්තකිලමථය තුළින් ලබා ගත හැකි බවට පවසන අය සම්බන්ධයෙන් බුදුපියාණන් වහන්සේගේ අදහස කුමක්ද යන්න වරක් මිනිසෙක් ඇසුවේය. මෙයට පිළිතුරු දෙමින් උන්වහන්සේ මෙසේ පැවසූහ, ''ගඟක් තරණය කිරීමට අවශ්‍ය වූ එක් මිනිසකු පොරොවක් රැගෙන වනයට ගොස් ලපටි, ගැට නොමැති ඍජු ගසක් කපා දැමුවා යැයි සිතමු. ඔහු ගසේ මුදුන කපා දමයි, කොළ සහ අතුපතර ගලවා ඉවත් කරයි, ගහේ කඳ පොරොවෙන් හැඩ ගස්වයි, වෑයකින් කප්පාදු කරයි, සූරනයකින් මටසිලුටු කරයි, ඊට පසු වැලිගලකින් ඔපදමයි. එසේ කර ගඟ තරණය කිරීමට පිටත්ව යයි. ඔබ කුමක් සිතන්නේද? ඔහුට ගඟ තරණය කිරීමට හැකිවේද? මිනිසා පිළිතුරු දුන්නේය: ''නැත ස්වාමීනි, ඔහුට එය කළ නොහැකිය. එයට හේතුව කොටය බාහිරෙන් හොඳින් හැඩ කර ඇති නමුත්, අභ්‍යන්තරයෙන් එය පිරිසුදු කර නැත." ඊට පසු උන්වහන්සේ පැවසුවේ යම් කෙනකු හැසිරීමට අදාළ සහ මානසික පිරිසුදුභාවය වැඩිදියුණු කරමින් "ඇතුළත පිරිසුදු" කර නොමැති නම් ඔහුට හෝ ඇයට රහත්ඵලයට පැමිණිය නොහැක. [44]

නිසැකවම බුදුපියාණන් වහන්සේගේ ඉතාමත් ජනප්‍රිය සහ පසුකාලීනව ලෝකය පුරාම ව්‍යාප්ත වූ උපමා කථාව වූයේ අන්ධ මිනිසුන් සහ ඇතා පිළිබඳව ය. එහි කරුණු සැකැසුම කෙතරම් හොඳින් කර ඇත්ද යත්, මිනිසා සහ සත්ත්වයා පිළිබඳ සිත් ඇදගන්නාසුලු සමීපත්වය, සහ එහි සන්සුන් හාස්‍ය විඳීමේ හැකියාව යනාදිය මත කථාවේ අවධානය සැකැසේ. එම උපමා කථාව භාවිත කර ඇත්තේ විවිධ අදහස් හෝ සමහර විට හුදෙක් අවධානය රඳවා තබන කථාවක් පැහැදිලි කිරීමටය, නමුත්

බුදුපියාණන් වහන්සේ එය භාවිත කළේ එක් විශේෂ කාරණයක් මතුකර දැක්වීමටය. යම් දාර්ශනික හෝ දැඩි දෘෂ්ටිමය වූ කාරණයක් සම්බන්ධයෙන් තවුසන් පිරිසක් දබර කරමින් සිටිනු භික්ෂුහු පිරිසක් දුටුවහ. පසුව ඔවුහු තමන් දුටුදේ බුදුපියාණන් වහන්සේට දැනුම් දුන්හ. බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ: ''අනෙක් නිකායන්වල තවුසන් අන්ධ ය, නොදකින අය වේ. ඔවුහු හොඳ හෝ නරක, සත්‍ය හෝ අසත්‍ය නොදනිති. එහි ප්‍රතිවිපාකයක් වශයෙන් දිව නමැති ආයුධයෙන් එකිනෙකාට පහර දෙමින් ඔවුහු සැමවිට දබර කරගනිති, වාද කරති සහ සටන් කරති." ඊට පසු උන්වහන්සේ උපමා කථාව විස්තර කළහ. එසේ කර, එහි අර්ථය සම්පිණ්ඩනය කළහ: "සමහර තවුසෝ සහ බ්‍රාහ්මණයෝ තමන්ගේ අදහස්වලට බැඳී සිටිති. ඒවා ග්‍රහණය කරගනිමින්, එක් පැත්තක දෙයක් පමණක් දකින ආකාරයෙන් ඔවුහු බහින් බස් වීම් ඇතිකර ගනිති." ඒ අනුව කථාවේ වැදගත් කරුණ වන්නේ යම් දෙයක එක් පැත්තක් පමණක් දැකීම (ඒකංග දස්සිනෝ) අසම්පූර්ණ හෝ අගතිගාමී අවබෝධයක් ලබා දෙන බවත්, එය සටනකට මඟ පෙන්වන බවත් ය. මෙහි ව්‍යංගය වන්නේ යම් කෙනකු යම් නිගමන සිදු කිරීමට ප්‍රථම සියලු කරුණු රැස්කිරීමට කාලය ගතයුතු බව ය.[45]

කලාතුරකින් අනාවරණය කරනු ලැබෙන බුදුපියාණන් වහන්සේ ඉගැන්වීමේදී ප්‍රවේශවන එක් ආකාරයක් නම් හාස්‍යයයි. උන්වහන්සේගේ දේශනා සහ සාකච්ඡාවලට හාස්‍යමය අතිශයෝක්තීන්, ව්‍යංගය සහ ඉඳහිට උපහාසය ඇතුළත් විය. අවාසනාවට මෙම හාස්‍යමය බොහෝ කොටස් නූතන පාඨකයන්ට පහසුවෙන් ප්‍රත්‍යක්ෂ නොවේ. ඤාණිස්සරෝ ස්වාමීන් වහන්සේ මෙසේ ලියති: "ධර්ම ග්‍රන්ථවල හාස්‍යයට පිළිගැනීමක් නොමැතිවීමට එක් හේතුවක් නම්, බොහෝ විට එහි වටහාගැනීමට දුෂ්කර, හැඟීම්වලින් තොරවූ සහ නිසරු ශෛලියයි. අතීත පාඨකයන්ට මෙම ශෛලියෙන් යුක්ත හාස්‍යය යෝග්‍ය වුවත්, විහිළු කලින්ම පළ කරන නූතන හැදියාවේ එය පූර්ණ සහ පැහැදිලි බවට නැඹුරු වී ඇත. තවත් හේතුවක් නම් පරිවර්තකයන් බොහෝ විට

ඡේදයේ හාස්‍යමය බව මඟහැරීමය. ඒ අයුරින් එය ඒකාන්ත, පොතේ දැනුමෙන් ඉදිරිපත් කරයි."[46]

බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ ධර්මය සන්නිවේදනය කළ තවත් ක්‍රමයක් නම් එකල පැවති අංගයක් වූ ප්‍රසිද්ධ වාද විවාද පැවැත්වීම ය. මෙම සිදුවීම් කෙතරම් ජනප්‍රිය වූවාද කිවහොත් සමහර නගරවල වාද විවාද පැවැත්වීමට ශාලා ද තිබුණි (කුතුහල සාලා).[47] මෙම විවාද පැවැත්වූයේ කෙසේ ද කියා හොඳ අදහසක් ත්‍රිපිටකය සහ වෙනත් සමකාලීන මූලාශ්‍ර ලබාදෙයි. තුන්වන වරටත් තර්කානුකූලව පිළිගත හැකි ප්‍රශ්නයක් ඇසූවිට, එයට පිළිතුරු දෙන්නට නොහැකි වූවොත්, ඔහු පරාජයට පත්වූ බවට සලකනු ලබයි.[48] පිළිගත හැකි තර්ක භාවිත කිරීමට සහ පිළිගත් ක්‍රියා පිළිවෙත් පිළිපැදීමටත් සහභාගිවන්නන්ගෙන් බලාපොරොත්තු විය. එසේම ඔවුන් එසේ කළ බව තහවුරු කර ගැනීම සඳහා විනිශ්චයකරුවෙක් ද (පඤ්හවීමංසකා) (*pañhavīmaṁsakā*) සිටියේය.[49] ප්‍රශ්නයක් මඟහැරීම සඳහා තවත් ප්‍රශ්නයක් ඇසීම, මාතෘකාව වෙනස් කිරීම හෝ ප්‍රශ්න අසන්නා පරිහාසයට පත් කිරීම අයෝග්‍ය ලෙස සලකනු ලැබීය. එසේම, විරුද්ධවාදී පුද්ගලයාට කෑගැසීම, ඔහු අදිමදි කරන විට හෝ අතිරේක කාරියකින් බාධා ඇතිවූ විට ඔහු පසු කිරීම ද පිළිගත නොහැකි දේවල් විය.[50] තමන්ම වාදයේ රඳවාගත් ගුරුවරයාට ගෞරවය, අනුග්‍රහය සහ ශ්‍රාවකයන් දිනාගත හැකි වූ අතර, පරාජයට පත් වූ අයට ලජ්ජාවෙන් හොරෙන්ම බැහැර වන්නට සිදු විය. බුදුපියාණන් වහන්සේ සමඟ වාදයකට පිවිසි පුද්ගලයකුට ප්‍රේක්ෂකයන් ''සියලු පැතිවලින් ප්‍රචණ්ඩ වාග් ධාරාවෙන් පරිභව කරමින් තදින් දොස් නගමින් උසුළු විසුළු කළ අතර...,"[51] ''නිශ්ශබ්දතාවට යටහත්වූ, හිස පහත්වූ, ඇස් පහත හෙළූ, පරාජය වූ, පිළිතුරක් සැපයීමට නොහැකි වූ ''එක් තරගකරුවකු පිළිබඳව විස්තරයක් ඇත." අපැහැදිලි දේව ධර්ම සහ ප්‍රායෝගික නොවූ ඇදහිලි ඉතා ඉක්මනින් තර්ක කිරීමට අපහසු තත්ත්වයට, තර්කානුකූලව සියුම්ව පිරික්සීමට සහ සාක්ෂි සඳහා ඉල්ලීම් කිරීමට යටත් විය. බුදුපියාණන් වහන්සේගේ ධර්මය මෙන්ම පරීක්ෂාවෙන් ජයගත් අය දියුණු වූ අතර, එසේ නොවූ අය ක්‍රමයෙන් නොපෙනී ගියහ.

වාද විවාද උණුසුම් විය හැකිය, සමහර විට දැඩි ප්‍රහාරවලින් ද අවසාන විය හැකිය. බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ බුද්ධකෘත්‍යමය ප්‍රගමනයේ මුල් කාලයේදී එවැනි කොටස් ඒකරාශි කිරීම් මඟහැරියේ සමහර විට මෙම හේතුව නිසාය. උන්වහන්සේ නිරීක්ෂණය කළහ: ''සමහර වාද විවාද පවත්වන්නේ වෛරයෙන් මුල් වී වන අතර, සමහර ඒවා සත්‍යය මුල් කරගෙනය. කුමන ආකාරයෙන් වුවත්, ඉසිවරයෝ ඒවාට සම්බන්ධ නොවෙති."[52] විපාකයක් වශයෙන්, බුදුපියාණන් වහන්සේගේ බුද්ධකෘත්‍යමය ප්‍රගමනයේ ආරම්භයේදී දැඩි විරුද්ධතා තිබියදී, නිරීක්ෂණය කිරීමේදී තමන් වහන්සේගේ අදහස් ආරක්ෂා කරගැනීමට නොහැකි වූයේ යැයි උන්වහන්සේ චෝදනා ලැබූහ.

එක් විවේචකයෙක් බුදුපියාණන් වහන්සේ පිළිබඳව මෙසේ පැවසුවේය: ''ගෞතම භික්ෂුව කථා කරන්නේ කාටද? ඔහුගේ ප්‍රඥාවේ සුබාවබෝධය ඔහු ලබාගෙන ඇත්තේ කාගෙන්ද? හුදෙකලාවේ ජීවත්වීමෙන් ඔහුගේ ප්‍රඥාව විනාශ වී ඇත. ඔහු සාකච්ඡාවට නුහුරුය, ඔහු කථාවේ හොඳ නැත, ඔහු සම්පූර්ණයෙන්ම ස්පර්ශයෙන් තොරය. අතන මෙතන වටේ යමින් මායිම් වල සැඟවී සිටින කුරංගයා මෙන්ම ගෝතම භික්ෂුව ද එසේම කරයි."[53]

බුදුපියාණන් වහන්සේ බොහෝ කාලයක් උන්වහන්සේගේ ධර්මයටම ධර්මය තහවුරු කිරීමට ඉඩ හැරීමෙන් සෑහීමට පත්වූ බව පෙනෙන්ට තිබේ. නමුත් මිනිසුන් තව තවත් ගැඹුරු පැහැදිලි කිරීම් ඉල්ලන්නට පටන් ගැනීමත්, ධර්මය පිළිබඳව විවේචනය කරන්නට පටන් ගැනීමත්, වැරදියට දැක්වීම් පවා ඇතිවීමත් නිසා, උන්වහන්සේට ප්‍රසිද්ධ වාදවිවාදවලට සහභාගී වීමට සහ සාකච්ඡා පැවැත්වීමට බලෙන්ම යොමුවන්නට සිදුවිය. උන්වහන්සේගේ දර්ශනය ඉතා පැහැදිලිව ඉගැන්වීමේ සහ විවේචනයට විරුද්ධව සාර්ථකව වළක්වා ගැනීමේ හැකියාව පිළිබඳව උන්වහන්සේ ඉතා ඉක්මනින් කීර්තියක් අත්පත් කරගත්හ. එසේම උන්වහන්සේ වෙනත් ධර්මයන් දැඩි ප්‍රශ්න කිරීම්වලට බඳුන් කිරීමට පටන් ගත්හ. ''බුදුපියාණන් වහන්සේගේ නිශ්ශබ්දතාව" නමින් හඬ කවා ඇති දේ සම්පූර්ණයෙන්ම ආප්තෝපදේශමය වී ඇති අතර, ශාස්ත්‍රීය සහ

ජනප්‍රිය ලේඛන යන දෙකම අතර පුළුල් ලෙස සාකච්ඡාවට බඳුන් වී ඇත. දුර්බෝධ නිශ්ශබ්දතාවක් පවත්වා ගනිමින් සිතන පරිදි බුදුපියාණන් වහන්සේ ගතිලක්ෂණ පෙන්වමින් ප්‍රශ්නවලට පිළිතුරු දුන්හ. මෙය උන්වහන්සේගේ ඉගැන්වීමේ ශෛලියේ වැදගත් අංගයක් විය. සැබැවින්ම බුදුපියාණන් වහන්සේ ඉඳහිට තමන් වහන්සේට නොවැදගත් හෝ අදාළ නොවන සේ විශ්වාස කළ ප්‍රශ්නවලට පිළිතුරු දීම ප්‍රතික්ෂේප කළහ. නමුත් සාමාන්‍යයෙන් උන්වහන්සේ එසේ කිරීමට හේතු දැක්වූහ. බුදුපියාණන් වහන්සේගේ විවිධ වූ දහස් ගණන් දේශනා අතරින්, උන්වහන්සේ පිළිතුරු දීම ප්‍රතික්ෂේප කළේ එකක් හෝ දෙකක් පමණි. උන්වහන්සේ හුදෙක් නිශ්ශබ්දතාව දරා සිටියහ.[54]

බුදුපියාණන් වහන්සේගේ අරමුණ වූයේ කවරදාවත් විරුද්ධවාදියකු පරාජය කිරීම වත්, විවේචකයකු නිශ්ශබ්ද කිරීම හෝ ශ්‍රාවකයන් දිනාගැනීම වත් නොවේ. මිනිසුන් අවිද්‍යාවෙන් පැහැදිලි තත්ත්වයට ගැනීම සහ අවබෝධයට මඟ පෙන්වීම ය. කවරදාකවත් නොවූ තරමට උන්වහන්සේ බොහෝ හෘදයංගමව සිදු කළ එක් අවධානය කැඳවීමකින් බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ: ''මම මෙය ඔබට කියමි. අවංක, සාධාරණ සහ ඍජු බුද්ධිමත් මිනිසකු මා වෙත පැමිණෙන්නට ඉඩ ඇත, මම ඔහුට ධර්මය උගන්වමි. ඔහුට ඉගැන්වූ ආකාරයට පුරුදු කරන්නේ නම්, දින හතක් ඇතුළත, ඔහුගේම දැනුමෙන් සහ ප්‍රායෝගික බුද්ධියෙන්, ඔහු පූජනීය ජීවිතයකට සහ අරමුණට පත්වෙයි. දැන් ඔබ සිතන්නට පුළුවන් මා මෙසේ කියන්නේ හුදෙක් ශ්‍රාවකයන් ලබා ගැනීමට හෝ ඔබේ පවත්නා තත්ත්වය අත්හැරවීමටය කියා. නමුත් එය එසේ නොවේ. ඔබේ ගුරුවරයා තබාගනිමින් ඔබගේ පවත්නා තත්ත්වය නොනවත්වා කරගෙන යන්න. මා මෙසේ කියන්නේ එවිට ඔබ ඔබේ ජීවිතය පවත්වා ගෙන යන ආකාරය නවතා, ඔබ නරක යැයි සිතන දේ අනුගමනය කර හොඳ යැයි සිතනදේ ප්‍රතික්ෂේප කරනු ඇතැයි ඔබ සිතන්නට පුළුවන්. නමුත් එය එසේ නොවේ. යෝග්‍ය යැයි ඔබට පෙනෙන ආකාරයට ජීවත් වෙන්න, ඔබ නරක යැයි සිතන දේ ප්‍රතික්ෂේප කිරීම නොනවත්වා කරගෙන යන්න, ඔබ හොඳ යැයි සලකන දේ අනුගමනය කරන්න. නමුත් කුසලතාවන් නොමැති, අපිරිසුදු වූ, නැවත ඉපදීමට මඟ පෙන්වන, බිය ඇති කරන, දැඩි ශෝකය ඇති කරන සහ උත්පත්තියක් ඇති

වීමට තුඩු දෙන, දිරාපත් වීම සහ මරණය යනාදිය පවත්නා තත්ත්වයන් ඇත. මා ධර්මය උගන්වන්නේ මෙම කරුණු ජයගැනීම සඳහා පමණි. "[55]

## ප්‍රාතිහාර්යයන්

උතුම් සදාචාරය පිළිබඳ ගුරුවරයකු වන ජේසුස්වහන්සේ ද හාස්කම්වලින් උපන් මිනිසෙකි. එතුමාගේ උපත අද්භූතජනකය. උන්වහන්සේ, ජීවත් වූ කෙටි කාලයේදී විවිධ හාස්කම් දක්වා ඇත. උන්වහන්සේ ඉදිරියේ විස්මයජනක දේ සිදුවී ඇත. උන්වහන්සේගේ භෞතික ජීවිතය අවසාන වූයේ ප්‍රාතිහාර්යයකින්ය. ඒ උන්වහන්සේ මළවුන්ගෙන් නැගිටීමෙනි. උන්වහන්සේ තමාගේ පුදුමාකාර බල පෙන්වන්නට ප්‍රතික්ෂේප කළ අවස්ථා තිබුණි. යක්ෂයන් පොළඹවන විට හෝ ෆැරිසිස්වරුන් එසේ කිරීමට ඔහුට අභියෝග කළ විට හා අනෙක් අවස්ථාවන්හිදී ඔහු සම්පූර්ණයෙන්ම අවිධිමත් ලෙස හාස්කම් ක්‍රියාත්මක කළේය. ඔහු ගසක් මැලවී මැරෙන්නට සැලැස්වූයේය. හේතුව සුදුසු ඍතුව නොවන නිසා ඒ ගසට ගෙඩි තිබුණේ නැත. ඔහු සහභාගි වූ විවාහ උත්සවයකදී වයින් අවසාන වූ විට, ජලය වීදුරු කිහිපයක් වයින්වලින් පිරවූයේය. තවත් අවස්ථාවක සමහර ධීවරයන්ගේ දැල් මාළුවලින් පිරවූයේය. මාළුවකුගේ මුඛයේ කාසියක් ප්‍රාතිහාර්යයෙන් දිස්වීමට සලස්වා ඔහුගේ සහ අපෝස්තල්වරුන්ගේ බදුගෙවන්නට සැලැස්වීමත් තුළින් ඔහුගේ අතිවිශේෂ හැකියාවන් සුළු අවස්ථාවන්ට යොදාගත් බව පෙනේ.[56]

ජේසුස්වහන්සේගේ රෝගීන් අද්භූත ලෙස සුව කිරීම වෙනස් පිළිවෙළකට සිදුවිය. පැහැදිලිව ඒවා අනුකම්පාව පෙරදැරිව සිදු විය. සමහර අවස්ථාවල ජේසුස්වහන්සේට ආශීර්වාදයක් ප්‍රකාශ කිරීමට අවශ්‍ය නොවීය, පීඩාවට පත් රෝගියා ස්පර්ශ කළ පමණින් සුවය ලැබුණි. උන්වහන්සේගේ ඇඳුම්වලින් සහ ශරීරයෙන් විස්මයජනක බලයකින් යුත් දියර නිකුත් විය. වසර ගණනාවක් රෝගීව සිටි එක් කාන්තාවක් සැකයක් නැතිව හුදෙක්ම ජේසුස්වහන්සේගේ ලෝගුව ස්පර්ශ කළ වහාම ක්ෂණිකව සුව වූවාය. තවත් වරක් ජේසුස්වහන්සේ බිමට කෙළ ගසා එම කෙළ

දූවිලි සමග මිශ්‍රකර, අන්ධ මිනිසකුගේ ඇස්වල තැවරුවේය. අන්ධයාට නැවත ඇස් පෙනෙන්නට පටන් ගත්තේය.[57]

තමන් පිළිබඳව විශ්වාසය තබන ඕනෑම පුද්ගලයකුට තමන් කරන ආකාරයට ම සැකයක් නැතිව හුදෙක් තමන්ගේ අත් රෝගියා මත තබා රෝග සුව කළ හැකි බව ජේසුස්වහන්සේ තරයේ දරා සිටියේය. නමුත් ඔවුන් සැබෑ ලෙස විශ්වාස කළේ නම් ඔවුන්ට ඊටත් වඩා කළ හැකිය; ඔවුන්ට විෂ සහිත සර්පයන් ඇඟිඳ දෂ්ට නොකරවාගෙන හෝ මාරාන්තික විෂ සහිත වස පානය කර මිය නොඇදී සිටින්නට පුළුවන් වේ.

සුවිශේෂී දේවවාක්‍යවලට අනුව, ජේසුස්වහන්සේ මිය ගිය මොහොතේම බොහෝ අද්භූත සිදුවීම් සහ සංඥා ඇතිවිය; ඒ භූමිකම්පාවක්, බලවත් පල්ලියක තිර ඉරීම සහ ඉර අඳුරු වීමය. මෙම අවසාන සිදුවීම ආලෝක ග්‍රහණයක් ලෙස අර්ථ දක්වා ඇත. ක්‍රි. පූ. 29යේ නොවැම්බර් 24දින 11.05ට සූර්ය ග්‍රහණයක් ජෙරුසලමෙන් දෘෂ්‍යමාන වූ බව තාරකා විද්‍යාඥයෝ දනිති. කෙසේ නමුත්, මාර්තු/අප්‍රේල්වල සමරන යුදෙව් වසන්ත උත්සවය ආරම්භයේදී ජේසුස්වහන්සේ මියගිය බව සුවිශේෂී දේවවාක්‍ය තුනකින්ම පැහැදිලිය. තවදුරටත්, මෙම අඳුර ඕනෑම සූර්ය ග්‍රහණයකට වඩා බොහෝ වේලාවක්, පැය තුනක් නොකඩවා පැවතුණ බව කියනු ලැබේ. එසේ නම් කුමක් සිදුවූවත්, පෘථිවිය අඳුරු වීම ස්වභාවික සංසිද්ධියක් නොවේ.[58] නමුත් ස්ථිරවම ජේසුස්වහන්සේගේ මරණයත් සමඟ ම සිදුවූ වඩාත් පුදුමයට පත් කරන ප්‍රාතිහාර්යය වූයේ සහසිද්ධිමය මළවුන්ගෙන් නැඟිටීම ය. ඊට නුදුරු කාලයේ මියගිය බොහෝ මිනිසුන් ඔවුන්ගේ සොහොන්වලින් නැඟිට ජෙරුසලම වටා ඇවිද ගිය බවත් එය ''බොහෝ මිනිසුන් දුටු බවත්'' කියනු ලැබේ.[59] ඔවුන්ගේ ආදරණීයයන් ශෝකයම නිසා කථාකර ගන්නට බැරිවන්නට ඇත. රෝමානු ආණ්ඩුකාරවරයා ඔහුගේ නිලධාරීන් සහ ඔවුන් යටතේ වැඩකළ බොහෝ හමුදා භටයන් ඒ හා සමානව ම පුදුම වන්නට ඇත. මේ පිළිබඳව වාර්තා රෝමයට යවන්නට ඇත. පුද්ගලයකුට මළවුන්ගෙන් නැඟිට අඩුම ගණනේ එක්කෙනකු හෝ දෙදෙනකු වත් ඔවුන් ලැබූ අපූර්ව අත්දැකීම ලියන්නට හෝ වෙන අයකු ලවා

ලියවන්නට ඇත. පැහැදිලි කළ නොහැකි දෙය නම් මැතිව්ගේ කිතුනු දහමේ හැර මෙම සිද්ධිය ගැන එකල වෙන කිසිම ලේඛනයක හෝ ඊට පසුව හෝ නැත; තවමත් පුදුමයි, මාක්, ලූක්, ජෝන්, පෝල් හෝ අනෙක් අපෝස්තල්වරුන් මෙම අපූර්ව සිද්ධිය සඳහන් කිරීම ප්‍රයෝජනවත් යැයි නොසිතීම පුදුමයකි. මෙම කාලය තුළදී සියලු ආකාරයේ ආශ්චර්යයන් සහ විස්මයජනක දේවල් ඇතුළුව සිදු වූ විවිධ වැදගත් සිද්ධීන් යුදෙව් ජාතික ඉතිහාසඥ ජෝසප් සටහන් කර ගත්තේය. නමුත් ඔහු මේ පිළිබඳව කිසිවක් පැවසුවේ නැත.

ජේසුස්වහන්සේගේ ප්‍රාතිහාර්ය බලය සම්බන්ධයෙන් අපූර්ව දෙයක් නම්, එය අඩුවැඩි වීම හෝ සමහර විට ක්‍රියාත්මක වීම හෝ අනෙක් අය සම්බන්ධයෙන් එසේ නොවීම ද පෙනී ගොස් ඇත. ඔහු නාසරෙත්වල රෝගී පිරිසක් සුව කිරීමට උත්සාහ කළ විට ඔහුගේ බලය ක්‍රියාත්මක වූයේ එයින් සුළු පිරිසකට පමණි. පෙනෙන ආකාරයට තරමක් දුරට ජේසුස්වහන්සේ එක්තරා තත්ත්වයකට වික්ෂිප්ත කරමිනි.[60] තවත් අවස්ථාවක ඔහු අන්ධ පුද්ගලයකු ස්පර්ශ කර ඊට පසු ඔහුට පෙනේද කියා ඇසුවේය. ඒ මිනිසා පිළිතුරු දෙමින් පැවසුවේ ඔහුට අපැහැදිලි හැඩ පමණක් හඳුනාගැනීමට හැකි බවයි. ඒ මිනිසාගේ සම්පූර්ණ පෙනීම ලබාගැනීමට ජේසුස්වහන්සේට ඔහු දෙවන වරටත් ස්පර්ශ කිරීමට සිදුවිය.[61]

ජේසුස්වහන්සේට ප්‍රාතිහාර්ය බලය පිළිබඳ හැඟීමක් තිබූ අතර, ඔහුට දෙවියන්ගේ ආශීර්වාදය තිබූ බව හෝ ඔහු වරම්ලත් පුද්ගලයකු බවට සාක්ෂි පෙනෙන්ට තිබුණි. ඔහු මෙසේ කීවේය: ''එසේ නම්, දෙවියන් වහන්සේ විසින් කැප කරනු ලැබ ලොවට එවන ලද තැනැත්තා වන මා 'මම දෙවියන් වහන්සේගේ පුත්‍රයා'යි කී නිසා, 'ඔබ දේවාපහාස කරන්නෙහි ය'යි මා ගැන කියන්නාහු ද? මම මාගේ පියාණන් වහන්සේගේ ක්‍රියා නො කරම් නම්, මා විශ්වාස නොකරන්න. එහෙත් මම ඒවා කරම් නම්, ඔබ මා විශ්වාස නො කළ ද, මාගේ කෘත්‍යයන් විශ්වාස කර පියාණන් වහන්සේ මා තුළ ද, මා පියාණන් වහන්සේ තුළ ද බව අවසාන වශයෙන් දැනගන්නැ"යි කී සේක."[62] තවත් එක් අවස්ථාවක ජේසුස්වහන්සේ කියා සිටියේ ඔහු සුවකළ එක් අන්ධ පුද්ගලයකු අන්ධයකු ලෙස

විශේෂයෙන්ම ඉපදී ඇත්තේ ජේසුස්වහන්සේට ඔහු සුවකර දෙවියන්ගේ බලය ප්‍රදර්ශනය කිරීමට බව ය.[63]

නමුත් ජේසුස්වහන්සේගේ සුවිශේෂ හිමිකම් ඔහුගේ ප්‍රාතිහාර්ය සම්බන්ධයෙන් ප්‍රශ්නයක් ඇති කළේය. ඔහුට සහ ඔහුටම පමණක් ආශීර්වාදය තිබුණා නම් හෝ ඔහු වරම්ලත් පුද්ගලයකු නම්, එයින් ඔප්පු වන්නේ ඔහු හෝ ඔහුගේ නමින් කටයුතු කරන අයට ද ප්‍රාතිහාර්ය පෑමට හැකි නම්, අනෙක් අය විසින් මිථ්‍යා දෘෂ්ටිකයන් පවා, කරන ප්‍රාතිහාර්ය, පැහැදිලි කරන්නේ කෙසේ ද යන්නයි. මෙම පෙනෙන්නට තියෙන දෙගිඩියාවට විසඳුම අනෙක් අය විසින් සිදුකරන ඕනෑම ප්‍රාතිහාර්යයක් සැබැවින්ම යක්ෂයාගේ ක්‍රියාවක් බවට ස්ථිරවම කියා සිටීමය.[64] එක් ප්‍රශ්නයක් විසඳීමේදී සිදුවූයේ මෙම පැහැදිලි කිරීම තවත් ප්‍රශ්නයක් ඇති කිරීම පමණ ය. යක්ෂයා සමහර පුද්ගලයන්ට ප්‍රාතිහාර්ය පෑමේ බලය දුන්නා නම්, ජේසුස්වහන්සේගේ බලය ද සමහර විට යක්ෂයාගෙන් ම ලැබූ බවට ෆැරීසියස් පෙන්වා දුන්නේය. ජේසුස්වහන්සේ අසත්‍ය යැයි යමෙක් චෝදනා කරන්නේ නම් එය බොහෝ දුරට දුර්වල එකකි.[65]

ක්‍රි. පූ. 1වන ශතවර්ෂයේ දී පලස්තීනයේ සහ අවට සිටි බොහෝ විස්මකුරුවන්ගෙන් ජේසුස්වහන්සේ එක් අයකු බව දැනගැනීම වටී. හනිනා බෙන් දෝස, අධිරාජයා වීමට පෙර වෙස්පාසියන්, සයිමන් මැගස් සහ තියුඩස් යන සියලු දෙනාම ප්‍රාතිහාර්ය බල තිබීම පිළිබඳව කීර්තියට පත් වූහ. තියුඩස් පිළිබඳව බයිබලය (Act.5.36-8) ඇතුළු බොහෝ මූලාශ්‍රයවල සඳහන් ය. ඊජිප්තු ජාතික තවත් විස්මකුරුවෙකි. ජෝසපස්ට අනුව ඔහු 30,000ක් පිරිස ආකර්ෂණය කර ඇත. ටියානාවල ඇපලෝනියස්ගේ හාස්කම්වල විශේෂයෙන්ම මුල්කාලීන ක්‍රිස්තියානීන්ගේ වැළඳගැනීමට යමක් තිබුණි. එයට හේතුව ඒවා ජේසුස්වහන්සේ කළ ඒවා හා සමාන වූ අතර, ඒවාට හොඳින් කැමැත්ත පළවිය. අවධානයට ගත යුතු කරුණක් නම් ඇපලෝනියස්ගේ ශ්‍රාවකයන් ජේසුස්වහන්සේ තමන්ගේ හාස්කම් සඳහා යක්ෂයාගේ බලය භාවිත කරන බවට චෝදනා කිරීමය. ඒ ආකාරයටම පළමු ක්‍රිස්තියානීහු ද ඇපලෝනියස්ගේ හාස්කම්වලට ද ඒවා රැවටිලි හෝ යක්ෂයා විසින් කරන ලද ඒවා බව තමන්ගේ වරදේ බරපතලකම අවම කරගැනීමට පැවසූහ.

සාමාන්‍යයෙන් හඳුන්වන ප්‍රාතිහාර්ය පිළිබඳව බුදුපියාණන් වහන්සේගේ ආකල්ප සෝදිසි කිරීමට පෙර, කරුණු කිහිපයක් පැහැදිලි කරගැනීම අවශ්‍ය වේ. හාස්කම් සිදුකිරීම් පිළිබඳව සාමාන්‍යයෙන් සිතන්නේ ඒවා සිදුවන්නේ හෝ සම්බන්ධ කරගන්නේ යම් ආකාරයක අද්භූත ජීවියකු හා සමඟ බවය. ක්‍රිස්තියානි ආගමේ යක්ෂයා හෝ දෙවියන් වහන්සේ සමඟ බවය. යක්ෂයා හාස්කම් සිදුකරන්නේ මිනිසුන් නොමඟ යැවීමට හෝ පෙළඹවීමට වන අතර දෙවියන් වහන්සේ එසේ කරන්නේ ඔහුගේ බලය ප්‍රදර්ශනය කිරීමට, දුෂ්ටයන්ට දඬුවම් කිරීමට හෝ යාඥාවලට පිළිතුරු වශයෙනි. කෙසේ නමුත් බුදුපියාණන් වහන්සේ 'ප්‍රාතිහාර්යය' මානසික වර්ධනයේ ප්‍රතිඵලයක් හෝ අතුරු ඵලයක් ලෙස අවබෝධ කරගත් සේක. ඒ අනුව බෞද්ධ සන්දර්භයට අනුව චෛතසික බලය ඉද්ධි (ඍද්ධි) පිළිබඳව කථා කිරීම ප්‍රාතිහාර්යයට වඩා සුදුසු වේ. තමන් වහන්සේගේ කාලයේ සිටි වෙනත් සමහර තවුසන්ට ඔවුන්ගේ ආධ්‍යාත්මික පුරුදුවල ප්‍රතිඵලයක් ලෙස ඍද්ධිබල තිබූ බව බුදුපියාණන් වහන්සේ ඍජුව පිළිගත්හ. එවැනි බලයන්ගේ වැදගත් බව ඔවුන් වැරදි ලෙස වටහා ගන්නට ඉඩ තිබේ, නැතහොත් ඒවායෙන් වැරදි නිගමනවලට එන්නට ඉඩ තිබේ. නමුත් ඔවුන්ට නරක බලවේග සමඟ සම්බන්ධකම් තිබුණේ යැයි උන්වහන්සේ කිසිවිටක චෝදනා නොකළහ.

සාමාන්‍යයෙන් බුදුපියාණන් වහන්සේට සියලු මනුෂ්‍යත්වය ඉක්මවූ හැකියාවන් කෙරෙහි පරීක්ෂාකාරී වනසුලු ආකල්පයක් තිබූ බව සත්‍ය කරුණකි. වරක් එක් පුද්ගලයෙක් බුදුපියාණන් වහන්සේට කථාකර, ''ඔබවහන්සේ එක් භික්ෂුවකට මනුෂ්‍යත්වය ඉක්මවූ හැකියාවන් ප්‍රදර්ශනය කිරීම පිණිස ඍද්ධිබල වික්‍රමයක් හෝ ප්‍රාතිහාර්යයක් (උත්තරි මනුස්ස ධම්ම ඉද්ධි පාටිහාර) පෑමට අවසර දෙන ලෙසත්, එවිට වඩා වැඩි පිරිසක් ඔබවහන්සේ කෙරෙහි විශ්වාසය ඇතිකර ගන්නවා ඇතැයි" සඳහන් කළේය. කල්පනාකාරී බවින් සහ සැකයෙන් යුතු පුද්ගලයන් තුළ එවැනි හැකියාවන් පිළිබඳව සාධාරණ සැකයක් ඇතිවිය හැකි බව උන්වහන්සේ පිළිතුරු දුන්හ. කෙසේ නමුත් සෑම දෙනා තුළම විශ්වාසය ඇතිකරන එවැනි එක බලයක් වූ ''අධිමානුෂික හැකියාව, ඍද්ධි වික්‍රම සහ අධ්‍යාපනයේ හාස්කම" (අනුසාසනි) බව සඳහන්

විය. මෙයට අනෙක් අයට අවවාද කිරීම සමඟ ධෛර්යවත් කිරීම ඇතුළත් වන බව උන්වහන්සේ වදාළහ. ''මේ ආකාරයට සැලකිල්ලට ගන්න, ඒ ආකාරයෙන් නොවේ. ඔබේ මනස මේ ආකාරයට යොමු කරන්න. ඒ ආකාරයෙන් නොවේ. එය අතහරින්න, මෙය ලබාගෙන එය නොපසුබටව කරගෙන යන්න.'' වෙනත් වචනයකින් කියනවා නම් පෙනෙන්නට තියෙන ප්‍රාතිහාර්යවලින්, ව්‍යාකූල නොවී, මිනිසුන්ට ඇතැම් ආකාරවලට සිතන්න, සලකා බලන්න සහ හැසිරෙන්න උනන්දු කිරීම වඩා හොඳ බව බුදුපියාණන් වහන්සේ සිතූහ.66

තවත් අවස්ථාවක එක් පොහොසත් වෙළෙන්දෙක් උණබම්බු රිටක් මත වටිනා සඳුන් භාජනයක් තබා නගර මධ්‍යයේ එය ස්ථාපිත කර, ඊට පසු එම රිට මතට ඍද්ධි බලයෙන් නගින්නට හැකිවන අයට එම භාජනය ලබාගත හැකි බවට නිවේදනයක් නිකුත් කළේය. මේ ගැන අසා, දැනගෙන, ධ්‍යාන බලයෙන් පාවෙන්නට හැකියාව තිබූ බවට ප්‍රකට පිණ්ඩෝල නමැති එක් භික්ෂුවක් එම අභියෝගය පිළිගෙන භාජනය ලබාගත්තේය. බුදුපියාණන් වහන්සේ මේ බව අසා දැඩි වචනයෙන් එම භික්ෂුවට තරවටු කළහ: ''ඔබ කාලකණ්ණි කාසියක් ලබාගැනීම පිණිස වස්ත්‍රය උස්සන ගණිකාවක වගෙයි.''67

ඊට පසු උන්වහන්සේ භික්ෂූන්ට සහ භික්ෂුණීන්ට තමන් දියුණු කළ කිසිම ඍද්ධි හැකියාවක් ප්‍රදර්ශනය කිරීම වරදක් ලෙස නීතියක් පැනවූහ. පිණ්ඩෝල භික්ෂුවගේ ප්‍රදර්ශනයට පසුව, බුදුපියාණන් වහන්සේගේ එයට ඇති ප්‍රතිචාරය පැහැදිලි කිරීම පහසු වේ: ''ඝෝෂාකාරී, ප්‍රකෝපකාරී පිරිස් පිණ්ඩෝල වටා එක්රොක් වන්නට වූහ.'' නිසැක වශයෙන්ම මිනිසුන් බුදුපියාණන් වහන්සේ සහ උන්වහන්සේගේ ශ්‍රාවකයන්ට, ගෞරව කිරීම උන්වහන්සේ බලාපොරොත්තු වූයේ ඔවුන්ගේ සුචරිතය සහ ප්‍රඥාව සඳහා මිස විස්මය හෝ ප්‍රාතිහාර්යවලින් වශීවීමක් සඳහා නොවේ. ප්‍රාතිහාර්ය බලය ආධ්‍යාත්මික හෝ සුචරිතය හා බැඳුණු නිපුණත්වවලට සාක්ෂි ලෙස පිළිනොගත යුතු බව බුද්ධ ධර්මයෙන් බොහෝ කාලයක් පුරා පෙන්වා දී තිබේ. දේවදත්තට එවැනි බල තිබූ අතර, ඔහු බුදුපියාණන් වහන්සේට සැලකිය යුතු තරම් ප්‍රමාණවත් ප්‍රශ්න ඇති කළේය. ජුදාස්ට පාපිෂ්ඨ භූතයන් එළවා දැමීමේ හැකියාව තිබුණු

අතර, ප්‍රාතිහාර්යයෙන් ලෙඩ සුව කිරීමට ද හැකියාව තිබුණි. ඔහු ජේසුස්වහන්සේගේ විශ්වාසය කඩ කළේය. බුදුපියාණන් වහන්සේට අනුව ප්‍රාතිහාර්ය එක් දෙයක් වන අතර, ධර්මය සම්පූර්ණයෙන්ම වෙනස් දෙයකි. උන්වහන්සේ මෙසේ පැවසූහ: ''ප්‍රාතිහාර්ය කළත් නොකළත්, ධර්මය කියාදීමේ මගේ ප්‍රයත්නය, ධර්මය පුරුදු කරන කවුරු වුවත්, දුකෙන් සම්පූර්ණයෙන්ම නිදහස් කරගැනීමට මග පෙන්වයි. එසේනම්, ප්‍රාතිහාර්ය පෑමේ ඇති ඵලය කුමක් ද?" [68]

ජේසුස්වහන්සේගේ පූජක ධුරයේ වැදගත් කොටසක් ප්‍රාතිහාර්යයෙන් ලෙඩ සුවකිරීම සඳහා වැයවුණේය. මිනිසුන් ඔහුගේ අවධානය සහ ඉගැන්වීම් පිළිගැනීමට ප්‍රධාන හේතුව ද එය විය. ඔහු අන්ධ, අංශභාග සහ ලාදුරු රෝගීන් සුවකර ඇත. එසේම මියගිය අයට නැවත ජීවය ලබාදී ඇත. අවධානයට ගත යුතුයි, බුදුපියාණන් වහන්සේ හෝ උන්වහන්සේගේ කිසිම ශ්‍රාවකයකු ප්‍රාතිහාර්යයෙන් ලෙඩ සුවකිරීම හෝ යක්ෂයන් පලවා හැරීම පිළිබඳව ත්‍රිපිටකයේ උදාහරණ නැත. මෙයට හේතු අතරින් කොටසක් ඉහත සඳහන් වේ. නමුත් මිනිසාගේ දුක්විඳීම යන ප්‍රශ්නය උන්වහන්සේ රෝග, ජරාවට පත්වීම සහ මරණය, පැවැත්මක අන්තර්ගත වීම, සහජයක් ලෙස දුටුවහ. සැබැවින්ම එය එසේමය. ඒ නිසා උන්වහන්සේට රෝගියකු සුවකිරීමෙන් අනාගතයේදී ඔවුන් රෝගී නොවන බවට සහතික විය නොහැකිය. මරණයට පත් පුද්ගලයකු නැගිටවීමෙන් හුදෙක් අදහස් කරන්නේ නැවත ඉපදුණු පුද්ගලයා පසුව මියයන බවය. ප්‍රාතිහාර්යයෙන් සුවකිරීම චමත්කාර ජනකද? සත්තකින්ම! ඒවා පිරිවර ආකර්ෂණීය කිරීම සහතික ද? සත්තකින්ම! නමුත් බෞද්ධ අදහසට අනුව, ඒවා සැබැවින්ම ප්‍රශ්නයේ හදවතට නොයයි. ඉතාම මූලික මට්ටමින් විසඳීම උන්වහන්සේගේ අරමුණ විය.

බුදුපියාණන් වහන්සේ රෝගීන් කෙරෙහි අනුකම්පාවක් නැතැයි මෙයින් අදහස් නොකෙරේ. එසේම, උන්වහන්සේ ඔවුන්ගේ තත්ත්වය මගහැරියා නොවේ. එයින් බොහෝ දුර සිට, උන්වහන්සේ සුව කළහ. සාමාන්‍ය ක්‍රමයට ඔවුන් සුව කළහ. උපකාර කළහ. උපකාර තුළින් ඔවුන් සැනසූ සේක. රෝගීන්ගේ සුවදුක් බැලීමට යෑම සහ රැකබලා ගැනීම සුචරිතවත් ක්‍රියා ලෙස සැලකූ සේක. අනුකම්පාවෙන් මේ දෙකම කළහ. උන්වහන්සේ

තමන් වහන්සේගේ ශ්‍රාවකයන් මෙසේ කිරීමට උනන්දු කළහ.[69] පාචනයෙන් පෙළෙන භික්ෂුවක සෝදා, උන්වහන්සේට නොසැලකූ භික්ෂූන්ට ආමන්ත්‍රණය කර, සමකාලීන භික්ෂුවකට දැක්වූ අසතුටුදායක සංග්‍රහය පිළිබඳ වරද පෙන්වා දී බුදුපියාණන් වහන්සේ මෙසේ කියා සිටියහ: ''මට සාත්තු කරන පුද්ගලයා රෝගියකුට ද සාත්තු කරයි" (යෝ භික්ඛවේ මං උපට්ඨහෙය්‍ය **සො ගිලානං උපට්ඨහෙය්‍ය**).[70] මෙම දේශනාව සහ ජේසුස්වහන්සේ රෝගීන්ට උපස්ථාන කිරීම අතර සමාන බවක් දැකගැනීමට කෙනකු අපොහොසත් නොවෙනු ඇත. ජේසුස්වහන්සේ කුසගින්නේ සිටින අයට ආහාර ලබාදීම, පිපාසයෙන් පෙළෙන අයට ජලය ලබාදීම, අමුත්තන් පිළිගැනීම, ඇඳුම් නොමැති අයට වස්ත්‍ර ලබාදීම සහ සිරකරුවන් දැකීමට යාම ද එයට එක්කර ඇත. ''මම ඔබට කියමි, ඕනෑ වෙලාවක, මා අනුගමනය කරන අඩුම වැදගත් පුද්ගලයකුටත් ඔබ මෙය කරන්නෙහි නම්, එය ඔබ මට කළා හා සමාන වෙයි." [71]

## මරණින් මතු ජීවිතය සහ ආත්මය

ජේසුස්වහන්සේගේ කාලයේ යුදෙව් දේවධර්මධරයන් කාණ්ඩ දෙකකට බෙදී තිබුණි, ඒ යුදෙව් සද්දුසි නිකායේ සාමාජිකයන් සහ ආදි යුදෙව් නිකායේ සාමාජිකයන් වශයෙනි. පෙර සඳහන් කළ අය කුමන ආකාරයක හෝ මරණින් මතු ජීවිතය සම්බන්ධ විශ්වාස ප්‍රතික්ෂේප කළ අතර, පසුව සඳහන් කළ අය මරණින් මතු ජීවිතයක් ඇති බව ඉගැන්වූහ. නමුත් කුමන ආකාරයෙන් ද යන්න නිශ්චිතව නොදනී.[72]

මරණින් මතු ජීවිතය පිළිබඳ ප්‍රශ්නයේදී ජේසුස්වහන්සේ ආදි යුදෙවු නිකායේ සාමාජිකයන්ගේ පැත්ත ගත්තේය. ඔහු ස්වර්ගය (ourano), සමහර විට පාරාදීසය (paradeiso), යනුවෙන් ද හැඳින්විය, එසේම නිරය පිළිබඳවද විශ්වාස කළේය. ස්වර්ගය ''සදාකාලික ජීවිතයක්" ඇති ස්ථානයක් සහ එහි පදිංචිකරුවන් ''ඉර මෙන් බැබලෙන" සහ ''දෙවියන් වහන්සේ දකින" අය බවද ඔහු විස්තර කළේය. පැහැදිලිව පෙනෙන ආකාරයට ස්වර්ගයේ ඉන්නා පුද්ගලයෝ විවාහ නොවෙති. ඔවුන් භෞතික ශරීර දරා

සිටිත් ද යන්න පැහැදිලි නැත, නමුත් ජේසුස්වහන්සේ මළවුන්ගෙන් නැගිටීමෙන් පසුව ද ශරීරයක් තිබුණු නිසා, ස්වර්ගයේ ජීවීන්ට ද එසේ තිබේ යැයි පෙනෙන්ට තිබේ. ජේසුස්වහන්සේ සිදුකළ එකම අවකාශමය විස්තර නම් ස්වර්ගයේ කාමර තිබූ බවය. සමහර විට විවිධ මට්ටම් හෝ තීව්‍රතාවෙන් යුක්ත සතුට අදහස් කරමින් විය හැකිය.[73] නිරය හැඳින්වීමට ජේසුස්වහන්සේ බොහෝ වචන සහ වාග් ශෛලීන් භාවිත කළේය; මළවුන්ගේ ලෝකය, ගිනිගත් උදුන (kaminos tou pyrus), පිටත අඳුර (exoteros skotos), සහ නරකාදිය (අලුත් තෙස්තමේන්තුව), ජෙරුසලමේ අපද්‍රව්‍ය පිළිස්සූ ස්ථානයේ පිටත පටු ගැඹුරු පැල්මක් ඇතිවීමෙන් පසු නම් කරන ලදී.[74] නිරය ප්‍රධාන වශයෙන් ගින්දරෙන් හිරිහැර විඳින සහ පණුවන් ඇගේ මස් කන, අතිශය වේදනාව ඇති ස්ථානයක් බව ඔහු විස්තර කළේය.

පුද්ගලයකු සෑදෙන්නේ කොටස් 'රාශියක' එකතුවකින්, පදගත අර්ථය (ඛන්ධ) බව බුදුපියාණන් වහන්සේ ඉගැන්වූහ. ඒ සියල්ල එකක් අනිකක් හා බැඳුණ සහ නිරන්තරයෙන් වෙනස්වනසුලු තත්ත්වයක පවතී. ශරීරය ''විඥානය සමඟ බැඳී ඒ මත ආවාස්ථිකව පවතී. (එත්ථ සිතං එත්ථ පටිබද්ධං)" බුදුපියාණන් වහන්සේ වදාළහ.[75]

පුද්ගලයකු මිය ගිය විට, ශරීරය ගිලිහී යයි, විඥානය නැවත වෙනත් භෞතික වස්තුවක ස්ථාපනය වෙයි, සප්‍රාණික වෙයි, ඊළඟ භවය ආරම්භ වෙයි. මෙම ක්‍රියාවලිය ''පැවැත්මෙන් පසු පැවැත්ම" "දරුගැබකින් දරුගැබකට පියවර ගැනීමක්" හෝ වඩාත් හරියටම ''නැවත වෙනවා" (පුනබ්භව)[76] යනුවෙන් බුදුපියාණන් වහන්සේ හැඳින්වූහ. උන්වහන්සේ පැහැදිලි කළ ආකාරයට, මරණය සිදුවන විට, විඥානය ''ඉහළ දිසාවට ක්‍රියාත්මක වෙයි." (උද්ධගාමි), ඊට පසු දරු ගැබකට - ඒ, මවකගේ අළුත් සාරවත් ඩිම්බයකට ''නවාතැන් ගැනීමට ස්ථානයක්" (පතිට්ඨිතා) සොයා එතැන ''පහළට බසී" (අවක්කන්ති). කෙසේ නමුත්, මෙම අවකාශමය විස්තර සමහර විට රූපාලංකාර පමණක් විය හැකිය.[77]

යම් කෙනකුගේ වර්තමාන ජීවිතයේ සිදුවීම් එම පුද්ගලයාගේ පෙර ජීවිතයේ කර්ම සහ වර්තමානයේ නිර්මාණය වන කර්ම කොටස්වලින් පාලනය වේ. එසේම එම ක්‍රියාවලියම ඊළඟ භවයේදී

ද නොකඩවා පැවැත්වෙයි; කර්මයේ පැවැත්ම යම් පුද්ගලයකුගේ සියලු හිතා මතා කළ සිතුවිලි, කථාව සහ ක්‍රියාවලට අනුව විඥානයේ නිර්මාණය සහ හැඩගැස්වීම මත සිදුවේ. මෙහිදී 'තීරණය වේ' යන වචනයට වඩා 'පාලනය වේ' යන්න යෝග්‍ය වේ. එයට හේතුව ලෙස යමකුගේ සිතීමේ රටාව සහ හැසිරීම වෙනස් කළ හැකි ආකාරයට ම, යමකුගේ කර්මය ද වෙනස් කිරීමට හැකි බව බුදුපියාණන් වහන්සේ පැවසූහ. [78]

කර්මය පිළිබඳව ඇති වඩාත් දිගටම පවතින වරදවා වටහා ගැනීම නම් යමකුගේ අනාගතය, වර්තමාන ජීවිතය හෝ ඊළඟ භවය තීරණය වන්නේ එම පුද්ගලයාගේ අතීතය විසින් යැයි සහ එම නිසා කර්මය වෙනස් නොකළ හැකිය යන්නය. හිතූ පරිදිම, ''ඔබට කිසිවිටක ඔබගේ අතීත කර්මවලින් ගැලවිය නොහැක", යමකු අත්විඳින සියලු දේ කර්මය නිසා සිදුවන බව, (පුබ්බේ හේතුකථා) බුදුපියාණන් වහන්සේ නම් කළා යන්න අසත්‍ය වූ සහ අනර්ථකාරී අදහස් තුනෙන් එකකි. අනෙක් ඒවා නම් සියලු දේ සියලු බල ඇති ඊශ්වර දෙවියන් (ඉස්සර - පාලි, ඊශ්වර - සංස්කෘත) විසින් කරන බව සහ සියලු දේ විශේෂ හේතුවක් නොමැතිව, අහඹු ලෙස සිදුවන බව ය.[79]

සෘණාත්මක ක්‍රියාවකට පසුව ප්‍රතිජානන ක්‍රියා මාලාවක් ඇත්තේ නම්, සෘණාත්මක ක්‍රියාවෙන් ඇතිවූ කර්මය හොඳින් 'බාල' කළ හැකි බව බුදුපියාණන් වහන්සේ ඉගැන්වූහ. උදාහරණ වශයෙන්, කෙනකුට රළු ලෙස හෝ අවිනීත ලෙස කථා කිරීමෙන් පසු, ඒ ගැන කණගාටු වී අවංකවම කණගාටුව ප්‍රකාශ කිරීමෙන් සිදුවූ වරද නිවැරදි කිරීම, සමහර විට කලින් කරන ලද සෘණාත්මක කර්මය වෙනස් කිරීමට හෝ මකා දැමීම වුවද කළ හැකිය.[80] සත්තකින්ම, එය අනෙක් ආකාරයට ද සිදුවිය හැකිය; කලින් සිදුකරන ලද ප්‍රතිජානන ක්‍රියාවක් හේතු කරගත් කර්මයක් දැන් සිදුකරන ලද යම් බලවත් හෝ සමාන බලවත් සෘණාත්මක ක්‍රියාවක් නිසා හීන වීමට හෝ අවලංගු වීමට ද ඉඩ ඇත.

යම් කෙනකු ඉපදීමට හේතුවන බොහෝ විෂය පථ ඇත, වඩා වැදගත් වන්නේ මිනිස් භවයක්, දිව්‍යමය ආකාශගත සහ නිරය (විඳවන ස්ථාන) වශයෙනි. බුදුපියාණන් වහන්සේගේ බොහෝ සඳහන් කිරීම්වල පෙන්වා දී ඇත්තේ මෙම පවත්නා ප්‍රදේශ

අවකාශමය පිහිටීම් බව ය, <u>නමුත් ඒවා ස්ථානවලට වඩා බොහෝ සෙයින් අත්විඳීම් බව බුදුපියාණන් වහන්සේ පැවසූ සමහර දෙයින් හැඟවෙයි. උදාහරණ වශයෙන් : ''නිරය (තාවකාලික විඳවන ස්ථාන) ඇත්තේ මුහුද යට බව මෝඩයෝ කියති. නමුත් නිරය (විඳවන ස්ථාන) යනු ඇත්ත වශයෙන්ම වේදනාකාරී අත්දැකීම් වලට නමකි."[81]</u>

දෙව්ලොව සහ තාවකාලික විඳවන ස්ථාන පිළිබඳව බුදුපියාණන් වහන්සේගේ විස්තර ජේසුස්වහන්සේගේ විස්තර සමඟ එතරම් වෙනස් නැත; දිව්‍යමය ජීවීන් ප්‍රීතිය සහ සතුට අත්විඳින අතර, තාවකාලික විඳවන ස්ථානවල ඉන්නා ජීවීහු වේදනාව සහ ශෝකය අත්විඳිති. කෙසේ නමුත් බොහෝ වැදගත් ආකාරයෙන් සමානකම් කෙළවර වේ. ජේසුස්වහන්සේට අනුව ස්වර්ගය සහ නිරය සදාකාලිකය; බුදුපියාණන් වහන්සේට අනුව යම් පුද්ගලයකුගේ කර්මය අවසානයට එළඹෙන තුරු පමණක් ඒ භවය පවතී. කර්මය අවසාන වූ පසු, ඒ පුද්ගලයා එතැනින් මිය ගොස් තවත් ස්ථානයක උපත ලබයි. ඒ අනුව, බෞද්ධ සන්දර්භය තුළ නිරයට වඩා විඳවන ස්ථාන පිළිබඳව කථා කිරීම වඩාත් යෝග්‍ය වේ. පුද්ගලයකුගේ මරණින් පසු ජීවිතය පිළිබඳ ඉරණම රඳා පවත්නේ ජේසුස්වහන්සේගේ හෝ දෙවියන් වහන්සේගේ විනිශ්චය (krino)[82] අනුව බව, ඔහුගේ අවබෝධය විය, එනම් යහපත් සහ විශ්වාසදායක ජීවීන් ස්වර්ගයට පත් කිරීම හා පව්කාරයන් සහ විශ්වාස කළ නොහැකි අය නිරයට දඬුවම් පිණිස නියම කිරීමයි. මෙම පරීක්ෂණය සහ ඇගයීම සිදුවන්නේ ජේසුස්වහන්සේ සඳහන් කරන පරිදි විනිශ්චය දිනයේදී ය. (Imera tis Krisis) පව්කාරයන් සම්බන්ධයෙන් දෙවියන් වහන්සේ ඔවුන්ට විරුද්ධව තමන්ගේ විනිශ්චය දෙන්නේ දැඩි කෝපයෙන් (orge) සහ වියරුවෙන් (thumo) සහ කරුණාවෙන් (aneleo) තොරව ය.[83] බුදුපියාණන් වහන්සේට අනුව, උන්වහන්සේ හෝ දෙවිකෙනකු පුද්ගලයකුගේ පශ්චාත්-මරණ ඉරණම තීරණය කරන්නේ නැත. ඊට වඩා ඔවුන් විසින්ම තමන්ගේ ජීවිත කාලය තුළ තෝරාගත් හැසිරීමට අනුව, තමන්ගේ කර්මය නිර්මාණය කරනු ලබයි. එය අපුද්ගල හේතු සහ ඵල ක්‍රියාවලියකි. ඒ නිසාවෙන්, බුදුපියාණන් වහන්සේ ස්වර්ගය, විඳවන ස්ථාන හෝ මනුෂ්‍ය පැවැත්ම ප්‍රදානයක් හෝ දඬුවමක්

විදියට දුටුවේ නැත. නමුත් නිශ්චිත හේතුවලට ඵලයක් ලෙස, දිව්‍ය ලෝක සම්බන්ධයෙන් ධනාත්මක හේතු ද, විඳවන ස්ථාන සම්බන්ධයෙන් ඍණාත්මක හේතු ද වශයෙනි. ජේසුස්වහන්සේට ස්වර්ගය දෙවියන් වහන්සේගේ ප්‍රදානයක් (mistho) වූ අතර, නිරය ඔහු විසින් ක්‍රියාවේ යොදවන ලද දඬුවමක් (kolasi) විය.[84]

දෙදෙනා වහන්සේලාගේ ස්වර්ගය පිළිබඳ දර්ශනයේ ප්‍රධාන වෙනස නම් ජේසුතුමා එය අවසාන අරමුණ ලෙස සැලකූ නමුත්, බුදුපියාණන් වහන්සේට එය අසතුටුදායක තත්ත්වාරෝපිත පැවැත්මක කොටසක් විය; තාවකාලික විඳවන ස්ථානයකට වඩා හොඳ නමුත් සම්පූර්ණ ලෝකෝත්තර සීමාව ඉක්මවා යන නිර්වාණයට වඩා පහත් ය.

තමන්ගේ ප්‍රධාන ඉගැන්වීම් අතරින් එකක් ලෙස මනුෂ්‍යයන්ට ආත්මයක් ඇති බවට සියලු ක්‍රිස්තියානි පල්ලි ස්ථිරව ප්‍රකාශ කර සිටිති; දෙවියන් වහන්සේ විසින් සප්‍රාණික කරන ලද අරූපී, සදාකාලික ස්වභාවයක් හෙවත් සැබෑ මිනිසකු දෙවියන් වහන්සේ විසින් මිනිසුන් මවන විට ඔවුන්ගේ භෞතික මරණයෙන් පසු ස්වර්ගයට හෝ නිරයට නියම කරනු ලබයි. එහි දේවධර්මමය වැදගත්කමක් තිබියදීත්, ජේසුස්වහන්සේ ආත්මය පිළිබඳව මුළුමනින්ම වාගේ කිසිවක් පැවසුවේ නැත. ඔහු බොහෝ වෙනස් සන්දර්භයක් තුළ ආත්මය (pneuma හෝ psyche) යන වචනය භාවිත කර ඇත. නමුත් ඉඳහිට පමණක් ආත්මයක් යන අර්ථයෙන්, ඔහු මෙසේ කියා ඇත. ''ශරීරයෙන් උපදින දේ ශාරීරික ය; ආත්මයාණන්ගෙන් උපදින දේ ආත්මික ය. ''ජේසුන් වහන්සේ මහ හඬින් මොරගසා, '' පියාණෙනි, ... ඔබ හස්තයට මාගේ ප්‍රාණය භාර දෙමි”යි වදාළ සේක. මෙවදන් කියා උන්වහන්සේ අපවත් වී වදාළ සේක.”[85] සියලු විස්තර අවබෝධ කර ගත්තේ මුල්කාලීන දේවස්ථාන පූජකයන් සහ පසුකාලීන දේවධර්මධරයන් ය.

බුදුපියාණන් වහන්සේගේ කාලයේ බ්‍රාහ්මණ ආගමේ සහ උපනිෂද් ඉසිවරයන් ප්‍රමුඛත්වයට පැමිණීමේ ආරම්භයත් සමඟම ඔවුන් හඳුන්වන ආත්මය (ආත්මන්), සත්වයෙක් (ජීව) හෝ සැබෑ මිනිසා (පුරුෂ), එහි ස්වභාවය සහ ඉරණම පිළිබඳව පුළුල් පරාසයක අදහස් තිබුණි. මේ සියලු මත එක් අතකින් හෝ වෙනත් අතකින් ස්ථිරව ප්‍රකාශ කර සිටියේ ආත්මය සදාකාලික බවත්, දෙවියන්ට

යම් ආකාරයක සබඳතාවක් තිබෙන බවත් ය. මෙයට ප්‍රතිවිරුද්ධව, සැබැවින්ම එකල සිටි සම්පූර්ණයෙන්ම වගේ වෙනත් සියලු සමණ ගුරුවරුන්ගෙන් වෙනස්ව, බුදුපියාණන් වහන්සේ ඉගැන්වූයේ සදාකාලික ආත්මයක් හෝ පුද්ගලයෙක් නොමැති බවය. මෙය උන්වහන්සේගේ දෙවන ධර්ම දේශනාවේ - ආත්මයක් නැති බවට සලකුණ (අනත්තලක්ඛණ සූත්‍රය) ප්‍රධාන මාතෘකාව විය. සියලු සංයුක්ත දේ අසතුටුදායක (දුක්ඛ), අනිත්‍ය (අනිච්ච) සහ ආත්මයක් නැති වීම (අනත්ත) රහත්ඵලයට පැමිණීමට ඇති තීරණාත්මක පියවරක් බව උන්වහන්සේ මෙම සූත්‍රයෙන් දේශනා කළ සේක. ''කය ආත්මය නොවේ, හැඟීම් ආත්මය නොවේ, හැඳින ගැනීම ආත්මය නොවේ, මානසික නිර්මාණ ආත්මය නොවේ සහ විඥානය ආත්මය නොවේ... යම් කෙනකු මෙය දකින විට, මේ දේවල් වලින් ඈත් වේ, ඈත්වීමෙන්, රාගය නැති වෙයි, රාගය නැති වූ විට, පුද්ගලයකු නිදහස් වෙයි, නිදහස් වීමෙන්, යම් කෙනකු තමන් නිදහස් බව දැන ගනියි.”[86] බුදුපියාණන් වහන්සේට ආත්මයක් නැත යන සත්‍යය බුද්ධිමය කල්පිතයේ ප්‍රතිඵලයයි, හුදෙක් සිද්ධාන්තයක් නොවේ, නමුත් ස්වභාව ධර්මය හෝ යථාර්ථය පිළිබඳ ගැඹුරු ගවේෂණාත්මක අවබෝධයක ප්‍රතිඵලයයි.

බුදුපියාණන් වහන්සේ ආත්මයක් නැතැයි කියා උගන්වන බව දැනගත් විට සහ මිනිසුන් නැවත ඉපදීම ද, එක් ජීවිතයකින් ඊළඟ ජීවිතයට යාමට දෙයක් නොමැති නම්, පුද්ගල සන්තතියක් ඇතිවන්නේ කෙසේද කියා ද සමහර මිනිස්සු අසති. මෙම ප්‍රශ්නය යථාර්ථයට වඩා පැහැදිලිව පෙනේ. පළමුව, පාදක කොට කටයුතු කරන ආත්මයක් නැතැයි බුදුපියාණන් වහන්සේ ඉගැන්වූයේ නැත. ඒ වෙනත් අයගෙන් වෙනස් සහ වෙන්වූ යැයි යන හැඟීම, යම් කෙනකුගේ අවකාශයේ හැඩගැසීම, අතීතය මතක තිබීම, අනාගතය සිතින් මවා ගැනීම, නමක් සම්බන්ධ කරගනිමින් එම නමින් හැඳින්වීම යනාදියෙන් ඇතිවන හැඟීම් පවත්වාගෙන යාම පැහැදිලිව එවැනි අත්දැකීම් පවතී. අද්භූත ආත්මයක් නොමැති බව බුදුපියාණන් වහන්සේ ඉගැන්වූහ, පෙනෙන දේට පිටුපස නොවෙනස්වන හරයක් නොමැත.

එකිනෙකට අසමාන ඉන්ද්‍රියන්ගේ ක්‍රියාකාරිත්වයේ සමානකම භාවිත කිරීමෙන් බුදුපියාණන් වහන්සේ අදහස් කළේ කුමක්ද

යන්න පැහැදිලි කරගැනීමට උපකාරී වේ. මවක් පවුලේ ඡායාරූප ඇල්බමය රැගෙන තමන් කුඩා කල ඡායාරූප තමන්ගේ දරුවන්ට පෙන්වයි. විද්‍යාවට අනුව ඇයගේ ශරීරයේ එකම සෛලයක්වත් ඇය තරුණ කල මෙන් සමාන නොවේ. ඇය කුඩා කල තිබූ සිතිවිලි, අදහස් සහ විශ්වාස යන මේ සියල්ල දැන් වෙනස්ය. ඇය තරුණ කාලයේ ඇයගේ මුහුණෙහි ස්වරූප පවා, අපැහැදිලි ලෙස සමාන වුවත්, ඇයගේ දරුවන්ට හඳුනාගත හැක්කේ අමාරුවෙන්ය. එසේ වුවත්, කුතුහලය ඇති දරුවෝ මෙසේ අසති: ''ඒ ඔබද අම්මේ?", ඇය පිළිතුරු දුන්නාය ''ඔව්", බොරු කීවා යැයි කිසිවෙක් ඇයට චෝදනා නොකරයි. කය සහ මනස යන දෙකම නිරන්තරයෙන් වෙනස්වීමක් සිදුවෙද්දී, නැවත උපන් පුද්ගලයා යම් ආකාරයකින් මිය ගිය පුද්ගලයාගේ පවත්වාගෙන යාමක් යැයි පැවසීම තවමත් වලංගු වේ - යම්කිසි වෙනස් නොවන ආත්මයක් එක් පුද්ගලයකුගෙන් තවත් පුද්ගලයකුට පසුකර යෑමක් නොව, නමුත් සිහිකල්පනාවේ, ස්වාභාවික ප්‍රවණතාවේ, ගතිලක්ෂණ, මානසික පුරුදු සහ මනසට අදාළ ප්‍රවණතාවල හැඳිනුම නොනවත්වා කරගෙන යාම නිසාය. එක් ජීවිතයකින් තවත් එකකට ඉදිරියට ගෙන යමින් මේ සියල්ල ඇතුළත් කරන්නේ විඥානයයි, පෙර භවය ඇතුළු පෙර ජීවිතවලදී කරන ලද කර්මවල විපාක පුද්ගලයකුට මේ ජීවිතයේදී අත්විඳිය හැකිය. පාදක කොට කටයුතු කරන ආත්මය වැරදි ලෙස වටහා ගැනීමෙන්, සදාකාලික හරයක් ලෙස ඇතිවෙන හැඟීම 'මා' යන මතයේ හට ගනී. එයින් ඉබේම 'මගේ' යන අදහස මතු වෙයි - මගේ රථය, මගේ මුදල්, මගේ රට, මගේ දේශපාලන පක්ෂය, මගේ ආගම වශයෙන්. එය සදාකාලික ජීවිතයකට ඇති දැඩි ආශාව, මරණයේදී ඇතිවෙන නිරුද්ධ වීමට ඇති බිය, ආත්මය වැඩි දියුණු කිරීම පිණිස ද්‍රව්‍ය හිමි කරගන්නට ඇති ආශාව සහ එයින් ඇතිකරන සියලු ප්‍රතිවිපාක වශයෙන් වූ දුක් විඳීම් පිටුපස ඇත.

### අභිනිෂ්ක්‍රමණය

බුදුපියාණන් වහන්සේ සත්‍ය සෙවීම ආරම්භ කරමින් උන්වහන්සේගේ සැහැල්ලු සහ වරප්‍රසාද හිමි ජීවිතය හා පවුල අතහැර හිටි අඩියේම පිටව ගියහ. පසුව, නිර්වාණය අවබෝධ

කරගත් පසු උන්වහන්සේගේ ආදර්ශය අනුගමනය කළ පුරුෂ සහ කාන්තා ශාසනයක් පිහිටවූහ. ගෘහස්ථ ජීවිතයේ සම්බාධකයන්, සමාජයෙන් ඇතිවන ඉල්ලීම් සහ බලාපොරොත්තු සහ ඔවුන්ට අවශ්‍යවන කාලය, ප්‍රයත්න සහ කරදර හේතුකොට ගෙන නිර්වාණයට පත්වීමට මහත් දුෂ්කරතා තිබෙන බව බුදුපියාණන් වහන්සේ දුටුවහ. විවාහක ගිහි පුද්ගලයන්ට නිර්වාණය අවබෝධකර ගන්නට හැකි වූ බවත්, සැබැවින්ම සමහර අය එසේ කළ බවත්, උන්වහන්සේ පිළිගත් අතර, එය ඔවුන්ට බොහෝ සෙයින් දුෂ්කර විය.

අභිනිෂ්ක්‍රමණය පිළිබඳව කරන ලද මෙම අවධාරණයේ ප්‍රතිඵලයක් ලෙස, සිතන පරිදි ''ලෝකය තහවුරු කරන" ආගමක් වූ ක්‍රිස්තියානි ධර්මයට, විරුද්ධ ''ලෝකය-තමන්ගේ නොවේ යැයි කියා සිටින", ආගමක් ලෙස බටහිර බුදුදහම විස්තර කර ඇත. පෙර කී ලෙස ගෙන හැර දක්වන ජේසුස්වහන්සේගේ වචන පිරික්සුම නව තෙස්තමේන්තුවේ පෙන්වන ''ලෝකය - තමන්ගේ නොවේ"ය යන ඔහුගේ දේව ධර්මය බුදුපියාණන් වහන්සේ සහ ඔහු අතර පොදුවේ තිබූ සුළුතරයක් කරුණු වේ. මෙම අදහස වඩාත් අවුල් සහගත ය.

ජේසුස්වහන්සේ ද පුද්ගලයකුට තමන්ගේ පවුල අතහැරීමට පක්ෂව කථා කළේය: ''උන්වහන්සේ කතා කරමින්, 'ඇත්තෙන්ම මම ඔබට කියමි, දෙවියන් වහන්සේගේ රාජ්‍යය නිසා ගේ දොර හෝ භාර්යාව හෝ, සොහොයුරන් හෝ දෙමව්පියන් හෝ දූ දරුවන් හෝ අත්හළ කවරෙක් වුව ද, මේ කාලයේදී ම ඊට බොහෝ වැඩියෙන් ද එන යුගයේදී සදාතන ජීවනය ද ලබන්නේ ම ය'යි වදාළ සේක."[87] ජේසුස්වහන්සේගේ මව සහ සහෝදරයන් උන්වහන්සේ සොයමින් පැමිණි විට ඔහු ඔවුන්ට පිටත සිටගෙන ඉන්නට සලස්වා තමන් වටා රැස්ව සිටි ශ්‍රාවකයන්ට කථා කරමින් ඍජුවම පැවසුවේ ඔවුන් තමන්ගේ එකම පවුල බවය: ''ස්වාමීනී, පළමු කොට ගොස් මාගේ පියා භූමදාන කරන්ට මට අවසර දුන මැනැවැ"යි කීය. ජේසුස්වහන්සේ පිළිතුරු දෙමින්, ''මා අනුව එන්න; මළවුන්ගේ භූමදානය මළවුන්ම කළාවේ" ය යි ඔහුට වදාළ සේක. එවිට උන්වහන්සේගේ මෑණියෝ ද සහෝදරයෝ ද අවුත් පිටත සිට, උන් වහන්සේ කැඳවා පණිවුඩයක් යැවූහ. සමූහයක් උන්වහන්සේ අවට වාඩි වී උන්හ. ඔවුහු, 'අන්න, ඔබේ මෑණියෝත්,

සහෝදරයෝත්, සහෝදරියෝත් පිටත සිට ඔබ සොයති'යි උන්වහන්සේට කීහ. උන්වහන්සේ උත්තර දෙමින්, 'මාගේ මෑණියෝත්, මාගේ සහෝදරයෝත් කවුරු ද' කියා පෙන්වමින්, තමන් පිරිවරා අවට වාඩි වී සිටියවුන් දෙස වටේට බලා, 'මෙන්න මාගේ මෑණියෝ, මෙන්න මාගේ සහෝදරයෝ! දෙවියන් වහන්සේගේ කැමැත්ත ඉටු කරන කවරෙක් හෝ වෙත්වා, ඔවුහු මාගේ සහෝදරයාත්, මාගේ සහෝදරීත්, මාගේ මෑණියෝත් ය'යි වදාළ සේක. මිහි පිට කිසිවකුට 'පියාණෙනි' යයි නොකියන්න. ඔබට ඇත්තේ ස්වර්ගයෙහි වැඩ වසන එක ම පියාණන් වහන්සේය." [88]

දෙවියන් වහන්සේ සමග සසඳන විට ලෝකයේ තිබෙන දේවල් හුදෙක් දූවිලි බව ජේසුස්වහන්සේ පවසන බව අපෝස්තල්වරු අවබෝධ කරගෙන සිටියහ. ''මේ ලෝකයටත්, එහි ඇති දේවලටත් ආලය නොකරන්න. යමෙක් ලෝකයට ආලය කරන්නේ ද, දෙවියන් වහන්සේ කෙරෙහි ප්‍රේමය ඔහු තුළ නැත. මන්ද, ලෝකයෙහි සියල්ල වන, කාමරාගයත්, මාංසික තෘෂ්ණාවත්, අහංකාරකමත් ඇතිවන්නේ පියාණන් වහන්සේගෙන් නොව ලෝකයෙන් ය."[89] ජේම්ස් එය මෙසේ කියයි: ''අවිශ්වාසී ජනයෙනි, ලෝකය සමග මිතුරුකම, දෙවිඳුන් සමඟ සතුරුකම බව ඔබ දන්නේ නැද්ද? එබැවින් කවරෙක් වුවත් ලෝකය හා මිත්‍රවන්නට කැමැත්තේ නම්, ඔහු දෙවිඳුනට සතුරෙක් වන්නේ ය. විජාතීන් සමඟ ඔබ අධික අවකල් ක්‍රියාවල නොයෙදෙන බැවින් ඔවුහු ඒ ගැන පුදුම වී ඔබට අපහාස කරති. එබැවින් කාමමිථ්‍යාචාරය, අපිරිසුදුකම, කාමරාගය, නපුරු තෘෂ්ණා, රූප වැඳීමක් වැනි තණ්හාව යන කාමුක දුසිරිත් නසා දමන්න. මේ දේ නිසා අකීකරු වන අය පිට දේව උදහස පැමිණෙනු ඇත"[90] පෝල් ඉල්ලා සිටියේය. ලෝකය පිළිබඳව ක්‍රිස්තියානුවන්ට දැනිය යුත්තේ කෙසේද යන්න අවධාරණය කිරීමට ජේසුස්වහන්සේ 'වෛර කිරීමට' හෝ 'පිළිකුල් කිරීමට' යන අර්ථය ඇති පසිඳ යන වචනයද භාවිත කළේය. ''තම ජීවිතයට ඇලුම් කරන්නා එය නැති කරගනියි; මෙලොව තම ජීවිතයට ද්වේෂ කරන්නා එය සදාතන ජීවනය සඳහා රැකගනියි."[91] නැවතත්: ''මා වෙත එන තැනැත්තේ මට වඩා තම පියාට ද මවට ද භාර්යාවට ද දරුවන්ට ද

සහෝදරයන්ට ද සහෝදරියන්ට ද තමාගේ ම ජීවිතයට ද වුව ප්‍රේම කරන්නේ නම් ඔහුට මාගේ ගෝලයකු විය නොහැකිය."[92]

මේවායෙන් සමහරක් බුදුපියාණන් වහන්සේ ද කථා කර තිබෙන්නට පුළුවනි. නමුත් උන්වහන්සේ එවැනි දැඩි භාෂාවෙන් වැළකී තිබෙන්නට ඇත, කිසිම කෙනකුට හෝ කිසිම දෙයකට ද්වේෂය අනුමත කර නැත. උන්වහන්සේ 'අභිනිෂ්ක්‍රමණයට' හෝ 'පිටවීමට ඉඩ හරින්න' හෝ 'නොඇලී සිටින්න' සමාන පද භාවිත කළහ. වඩා වැදගත් ආකාරයෙන්, එවැනි පණිවුඩයකින් උන්වහන්සේ ඇමතුවේ ප්‍රධාන වශයෙන් භික්ෂූන් සහ භික්ෂුණීන් වීමට බලාපොරොත්තු වන අයට මිස, සැම දෙනාටම නොවේ. පවුල් ජීවිතය සම්බන්ධයෙන් උන්වහන්සේට කියන්නට බොහෝ දේ තිබුණි, විවාහක සම්බන්ධතා, දෙමාපිය සහ දාරක සම්බන්ධතා යනාදී ආදරය, පවුල් තුළ ආදරය විස්තර කිරීමට උන්වහන්සේ පිය, ප්‍රේම සහ සෙනෙහෙ වැනි ජානමය වචන භාවිතා කළහ. නමුත් මව් සෙනෙහස සඳහා 'මත්තෙයිය' සහ පිය සෙනෙහස සඳහා 'පෙත්තෙයිය' වැනි වඩා විශේෂිත වචන ද භාවිතා කළහ. තරුණයෙක් සහ එකම දරුවා වශයෙන් තරුණ ගෞතම සමහර විට තමාගේ දෙමාපියන් විශේෂයෙන්ම ආදරයෙන් රැක බලාගන්නට ඇත. පසුව එතුමන් දශකයකට වඩා සැමියෙක් සහ ඉතා කෙටි කාලයකට පියෙක් ද විය. මෙයත් එක්ව මිනිස් ආශාවන්, අවශ්‍යතා සහ පෙළඹවීම් පිළිබඳව උන්වහන්සේට තිබූ විනිවිද යන අවබෝධය, සැඟවුණ ඇත්ත දැකීමේ හැකියාවෙන් සහ සංවේදනීයතාවෙන් පවුල් සම්බන්ධතා ගැන කථා කිරීමට උන්වහන්සේට ඉඩ ලබා දී ඇත. දරුවන්ට ආදරය කිරීම සහ රැකබලා ගැනීමට අමතරව, දෙමාපියන්ගේ කාර්යභාරය වශයෙන්, ''ඔවුන් වැරදි කිරීමෙන් වැළැක්වීම, යහපත් දේ කිරීමට උනන්දු කිරීම, අධ්‍යාපනයක් ලබාදීම, සුදුසු විවාහයක් කරදීම සහ දායාදයක් ලබා දීම" බුදුපියාණන් වහන්සේ අනුදැන වදාළහ."[93]

දරුවන්ටඃ ''මවගේ ආදරය සහ පියාගේ ආදරය මේ ලොව ඇති සැබෑ සතුට යි" උන්වහන්සේ පැවසූහ.[94] විශේෂයෙන්ම දරුවන්ගේ ආදරය, ගෞරවය සහ කෘතඥතාව ලැබීමට දෙමාපියන් සුදුසු වේ යැයි බුදුපියාණන් වහන්සේ විශ්වාස කළහ, ''එයට හේතුව ඔවුහු

තමන්ගේ දරුවන්ට බොහෝ දේ කරති; ඔවුහු දරුවන් හදා වඩා ගනිති, පෝෂණය කරති සහ දරුවන් ලෝකයට හඳුන්වා දෙති.”[95]

මෙම ආදරණීය කළගුණයේ සැඟවුණු ආශීර්වාදය අවධාරණය කිරීමට මෙන්, යමකුට දෙමාපියන් කර ඇති සියලු දෙයට කළගුණ සැලකීම් වස් යමක් කරන්නට අපහසු බව උන්වහන්සේ වැඩිදුරටත් පැවසූහ. ඊට පසු උන්වහන්සේ මෙම වැදගත් නියමය එකතු කළහ: ‘‘නමුත් ආගමික විශ්වාසය නොමැති තමන්ගේ දෙමාපියන් ආගමික විශ්වාසය ඇතිකර ගැනීමට යම් කෙනකු උනන්දු කරන්නේ නම්, තමන්ගේ අවකල් ක්‍රියා කරන දෙමාපියන් දැහැමි බවට පත්කරවීම, හෝ අඥාන දෙමාපියන් ප්‍රඥාවන්ත කරවීම, එසේ කරවීමෙන් කළගුණ සැලකිය හැකිය, දෙමාපියන්ට කළගුණ සැලකීමටත් වඩා කළ හැකිය.”[96] දරුවන් විසින් හොඳින් ගෞරවයට පත් කරන ලද සහ ආදරයෙන් රැකබලාගත් දෙමාපියන්ගේ සිත් ‘‘තමන්ගේ එම දරුවන් කෙරෙහි ලස්සන සිතුවිලිවලින්  සහ කරුණාවෙන් පිරී ඇති අතර, (කල්‍යාණේන මනසා අනුකම්පන්ති)  ‘ඔබට දීර්ඝායුෂ ලැබේවා!’ කියමින් දෙමාපියෝ ඔවුන්ට ආශීර්වාද කරති.”[97]

බුදුපියාණන් වහන්සේට අනුව ආදරය, මෘදුබව සහ අන්‍යෝන්‍ය ගෞරවය සාර්ථක විවාහයකට, ප්‍රීතිමත් සහ පවතින විවාහයකට පදනම වේ. ‘‘එකඟතාවෙන්  සහ අන්‍යෝන්‍ය ආදරයෙන් එකතු වෙනවා වෙනුවට,” බ්‍රාහ්මණයන් ඔවුන්ගේ බිරින්දෑවරුන් මිලදී ගැනීම පිළිබඳව බුදුපියාණන් වහන්සේ බ්‍රාහ්මණයන්ට දෝෂාරෝපණය කළහ.[98] උන්වහන්සේ ජාතක කථාවක සඳහන් කළ ආකාරයට: ‘‘මෙම ලෝකයේ, ආදරය නොමැති විවාහය දුකකි.”[99] උන්වහන්සේ මෙසේ පැවසූහ: ‘‘යම් කෙනෙක් බිරිඳ සහ දරුවා රැකබලා ගැනීම උතුම්ම ආශීර්වාදයයි,”[100] ආදරණීය බිරිඳක් ‘‘යම් කෙනකුට ලැබිය හැකි හොඳම මිතුරියයි,”[101] එසේම ධර්මය අනුගමනය කරන යුවලක් ‘‘එකිනෙකාට ආදරණීය වචන කථා කරති,”[102] සහ ‘‘එක් හදවතක් සහ එකඟතාවෙන් සහ ප්‍රීතිමත් මනසකින්”[103] එකට ජීවත් වෙති. දෙදෙනකු එකිනෙකාට දැඩි සේ ආදරය කරන විට තමන් එක්වී ඇත්තේ කෙසේ නමුත් ‘කලින් නියම කිරීමකට’ අනුව බවට බලවත් හැඟීමක් ඇතිවේ.  එවැනි හැඟීම් ශරීරයේ රසායනික වෙනස්වීම්  ඒ ආකාරයෙන් ඇති වීම නිසා සිදුවන බවට විද්‍යාඥයන් පැහැදිලි කිරීමට උත්සාහ කර ඇත.

ඔවුන් නිවැරැදි විය හැකිය, නමුත් තවත් පැහැදිලි කිරීම් තිබිය හැකිය. බුදුපියාණන් වහන්සේගේ අවබෝධයට අනුව, සෑම පුද්ගලයකුම රහත්ඵලයට පැමිණ නොමැති නම්, වර්තමාන ජීවිතයට පැමිණ ඇත්තේ කලින් ජීවිතයකින් ය, මෙසේ මිය ගිය පසු තවත් භවයකට යයි. පුද්ගලයකුගේ හිතා මතා කළ සිතුවිලි, වචන සහ ක්‍රියා (ඔවුන්ගේ කර්ම) සෑම භවයකදීම ඔවුන්ගේ අත්විඳීම් සකස් කරන/හේතුවන ප්‍රධාන සාධකයක් වේ. නමුත් ඉන් ඔබ්බට විශේෂ පිහිටීමක් හෝ මැවිල්ලක් ප්‍රබල හඳුනාගැනීමක් සමඟ, සම්බන්ධයක් හෝ ඈඳියක් ඔහුට නැවත ඉපදීම සඳහා හේතුවේ. මේ ආකාරයට, විශේෂ පුද්ගලයකු සමඟ සමීප බැඳීමක් හෝ නෑකමක් ඊළඟ භවයේදී එම පුද්ගලයා කෙරෙහි ආකර්ශණය ඇති වේ.[104]

බුදුපියාණන් වහන්සේට සමීප ශ්‍රාවකයන් වූ නකුලපිතා සහ නකුලමාතා පරමාදර්ශී ආදරණීය යුවල වෙති. වරක් දීර්ඝ කාලයක් රෝගාතුරව සිටි තම ස්වාමිපුරුෂයාට සෑමවිටම දිරි දෙමින් සහ බිය සැක දුරු කරමින් නකුලමාතා ඉතා ලැදිව සාත්තු සප්පායම් කළාය. බුදුපියාණන් වහන්සේ මේ බව දැනගත් විට, උන්වහන්සේ නකුලපිතාට මෙසේ පැවසුවේය: ''ඔබ යහපත උදාකරගෙන ඇත, ඔබේ උපදේශකයා සහ ගුරුවරයා වශයෙන් ඔබගේ සුභසිද්ධිය සඳහා ඇල්මෙන් ඔබට බොහෝ සේ අනුකම්පාව දක්වන බිරිඳක් සිටීමෙන් ඔබ බොහෝ සේ යහපත උදාකරගෙන ඇත.''[105]

බෞද්ධ දර්ශනයට අනුව, මෙම ගුණාංග කල් පවත්නා සහ හරවත් සම්බන්ධතාවකට-විශ්වාසදායක (අනුබත්ත), අනුකම්පාව (අනුකම්පිකා) එකිනෙකාගේ සුභසිද්ධිය පිළිබඳව ඇති සැලකිලිමත් වීම (අත්ථකාමා) සහ එකිනෙකාගේ උපදේශක සහ ගුරුවරයා (ඕවාදිකා අනුසාසිකා) උපක්‍රමයයි. තවත් අවස්ථාවක නකුලමාතා සහ නකුලපිතා බුදුපියාණන් වහන්සේ වෙතට පැමිණ තමන් තරුණ කාලයේ, විවාහ වුණ දා සිට එකිනෙකාට කිසිවිටක සිතුවිලි වලින්, ක්‍රියාවෙන් විශ්වාසය කඩ නොකළ බවත්, ඔවුන්ගේ සම්බන්ධතාව ඉතා සමීපවූ බව සහ මෙම භවයේ දී මෙන්ම ඊළඟ භවයේ දීත් එකට එක්වන්නට අවශ්‍ය වූ බවත් පැවසූහ. බුදුපියාණන් වහන්සේ මෙසේ පිළිතුරු දුන්හ: ''පුරුෂයෙක් සහ බිරිඳක් යන දෙදෙනාම මෙම භවයේදී සහ ඉදිරි ජීවිතවලදීත්

දකින්නට කැමැති නම්, ඔවුන්ට එකම විශ්වාසය, එකම ගුණධර්ම, එකම ත්‍යාගවන්ත බව සහ එකම ප්‍රඥාව ඇත්තේ නම්, ඔවුන්ට මෙම භවයේ සහ අනාගත ජීවිතවලදී ද එකිනෙකා දැකිය හැකිය."[106]

ජීවත්වීමට හෝ පවුල් ජීවිතයට ප්‍රායෝගික අවවාද සහ මාර්ගෝපදේශ සුවිශේෂී දේවවාක්‍ය හරහා කියවීම බෞද්ධයන්ට කනස්සල්ලක් ඇතිවීමට හේතුවිය හැකිය. ඉහත දකින්නට තිබෙන ආකාරයට, විෂයයන් දෙකම පිළිබඳව ජේසුස්වහන්සේ විසින් කරන ලද ප්‍රකාශයන් අසුභවාදී වේ. විවාහමය සම්බන්ධතා සැලකිල්ලට ගනිමින් ජේසුස්වහන්සේ එම විෂය ගැන ඉගැන්වූ එකම දේ නම් කෙනකුට තමන්ගේ බිරිඳ දික්කසාද කළ හැකි එකම හේතුව ඇය පරදාර සේවනයේ යෙදුණොත් පමණක් බවය.[107]

සමීපයේ තිබෙන විෂයයට නැවත පැමිණෙමින්, වඩා කැපවුණ ශ්‍රාවකයන් සඳහා බුදුපියාණන් වහන්සේ විප්ලවකාරී අභිනිෂ්ක්‍රමණයට පක්ෂපාතීව කථා කිරීමට හේතුව ජේසුස්වහන්සේගේ ඒවාට වඩා මුළුමණින්ම වෙනස් ය. ලෝකය සහ එයින් ලැබෙන සතුට ''අල්ප තෘප්තියක් සහ බොහෝ වේදනාවන් සහ පීඩාවන්"[108] යැයි බුදුපියාණන් වහන්සේ විශ්වාස කළහ. එසේම වඩා ඉහළ සහ බොහෝ සුශික්ෂිට සතුටකට, එනම් උන්වහන්සේ හඳුන්වන නිර්වාණයට එළඹිය හැකිය. ''සීමිත සතුටක් අත්හැරීමෙන් යම් කෙනකුට වඩා පෘථුල සතුටක් අත්විඳිය හැකිය, ප්‍රාඥාවන්තයා සීමිත සතුට අත්හැර, පෘථුල සතුට දැකිය යුතුය."[109]

පහතින් දකින ආකාරයට, ජේසුස්වහන්සේ ඉගැන්වූයේ විප්ලවකාරී අභිනිෂ්ක්‍රමණයයි. එයට හේතුව ලෝකය ඉතා ඉක්මණින් නැතිවී දේපළ, පවුල් සබඳතා, තත්ත්ව, සහ පෞද්ගලික ජයග්‍රහණ සලකා නොබලන ස්ථානය වූ දෙවියන් වහන්සේගේ රාජධානිය එම ස්ථානයට පත්වේ යැයි ඔහුට තහවුරු වූ නිසාය.

## ආදරය

වර්තමානයේ බොහෝ මිනිසුන්ට ජේසුස්වහන්සේගේ ඉගැන්වීම්වලින් අවධානය වඩාත් ආකර්ෂණය වන්නේ කරුණාවන්ත භාවය සහ ආදරය (අගපේ), නිතර, ඔහු ඉගැන්වූ

බොහෝ හෝ වෙනත් නොයෙක් අදහස් ඉස්මතුවී පෙනීම පිළිබඳවය. මෙය පුදුමයක් නොවේ; එය ඔහුගේ සුවිශේෂ දේවවාක්‍ය පිළිබඳ වඩාත් සිත්ගන්නා සුලු දෙයයි. ජේසුස්වහන්සේ ආදරය පිළිබඳව බොහෝවිට හෘදයාංගමව, සම්පූර්ණයෙන්ම අතිශය උද්‍යෝගීමත් අයුරෙන් කථා කළහ. මෙයින් පෙළඹීමට පත්වූ ඔහුගේ සමීප ශ්‍රාවකයෝ හැකිතාක් හරියටම සහ ඉඳහිට ඊටත් වඩා වාග් චාතුර්යයෙන් ආදරය ප්‍රබල ලෙස ඉස්මතු කළහ. තමන් ආදරය යනුවෙන් අදහස් කළේ කුමක්ද කියා ජේසුස්වහන්සේ කිසිවිටක පැහැදිලි කළේ නැත, නමුත් පෝල් සැලකිය යුතු තරම් සාර්ථකව එය සිදු කළේය. "ප්‍රේමය, ඉවසිලිවන්ත ය, කරුණාවන්ත ය; ප්‍රේමය, ඊර්ෂ්‍යා වන්නේ නැත, පාරට්ටු කර ගන්නේ නැත, උඩඟු වන්නේ නැත; ප්‍රේමය, අවිනීත නොවේ, ආත්මාර්ථකාමී නොවේ, හනික නොකිපේ, නපුර සිතේ ධාරණය කර නොගනියි; ප්‍රේමය, අනුන්ගේ වරද ගැන ප්‍රීති නො වී, හරි දේ ගැන ප්‍රීති වෙයි. ප්‍රේමය, සියල්ල උසුලයි. ප්‍රේමයෙහි, විශ්වාසයට ඉමක් නැත, බලාපොරොත්තුවට නිමක් නැත, ඉවසීමට අගක් නැත."[110] යම් අයකු ඊකගත හැක්කේ කෙසේද කියා ඇසූ විට ජේසුස්වහන්සේගේ පිළිතුර වූයේ දෙවියන් වහන්සේ සහ අසල්වැසියාට ආදරය කරන ලෙසය.[111] එවැනි අදහස් අලුත් නොවේ. ජේසුතුමා පරණ තෙස්තමේන්තුවෙන් උපුටා දක්වා ඇත; Deuteronomy 6.5 and Leviticus 19.9-18

මෙහි සඳහන් ජේසුස්වහන්සේගේ මෙම අනුශාසනය ආදරය සඳහා අවධානය දෙආකාරයකින් යොමු කර ඇති බව පෙන්වා දෙයි. ජේසුස්වහන්සේට අනුව, දෙවියන් වහන්සේ කෙරෙහි ඔබගේ ආදරය '' නුඹේ මුළු හෘදයෙන් ද නුඹේ මුළු සිතින් ද නුඹේ මුළු බුද්ධියෙන් ද නුඹේ මුළු වීර්යයෙන් ද නුඹේ දෙවි ස්වාමීන් වහන්සේට ප්‍රේම කරන්න."[112] කරුණාවෙන්, ඉවසීමෙන්, පරිත්‍යාගශීලි වීමෙන් සහ සමාවදීමෙන්, අවිහිංසාවෙන් සහ අවස්ථාවක් එළඹියහොත්, තවත් අයකු වෙනුවෙන් මිය යෑමට පවා යම් අයකු මිතුරන් වෙනුවෙන් ඇති ආදරය ප්‍රකාශ කළ යුතුය.[113]

ජේසුස්වහන්සේගේ අපේක්ෂාව ජෝන් ප්‍රතිනාද කළේ මෙසේ ලියමින් යඃ ''ලෞකික සම්පත් ඇති කෙනෙක්, තම සහෝදරයාගේ අගහිඟකම් දැක දැකත්, ඔහුට අනුකම්පා නොකරත් නම්, දෙවියන්

වහන්සේගේ ප්‍රේමය ඔහු තුළ පවතින්නේ කෙසේ ද? මාගේ ප්‍රිය දරුවෙනි, අපගේ ප්‍රේමය වචනයෙන් වත්, කතාවෙන් වත් නොව, ක්‍රියාවෙන් ප්‍රකාශ වන සත්‍ය ප්‍රේමයක් විය යුතුය. අප පොහොසත් නම් සහ අගහිඟකම් ඇති අනෙක් අය සිටීනම්, එහෙම වුණත් ඔවුන් වෙනුවෙන් අපේ හදවත් නොඇරේ නම්, අප දෙවියන් වහන්සේට ආදරේ යැයි කෙසේ කිව හැකිද? මගේ දරුවනි, ආදරය හුදෙක් වචන සහ කථාව විය යුතු නැත; එය ක්‍රියාවෙන් පෙන්වන සැබෑ ආදරය විය යුතුය."[114] නැවතඃ ''යමෙක් මම දෙවියන් වහන්සේට ප්‍රේම කරමි"යි කියමින්, තම සහෝදරයාට වෛර කරයි නම්, ඔහු බොරුකාරයෙකි. පෙනෙන සහෝදරයාට ප්‍රේම නොකරන්නාට, නොපෙනෙන දෙවියන් වහන්සේට ප්‍රේම කළ නොහැකි ය." [115]

සියලු ආගමික ග්‍රන්ථ අතර මේවා ඉතාම බලවත් සසල කරන වචන වේ. දෙවියන් වහන්සේ රැකීමට යම් කෙනකුගේ අසල්වැසියන්ට ආදරය කළයුතු යැයි ජේසුස්වහන්සේ පැවසූ විට, අසල්වැසියා කවුදැයි ඔහුගෙන් ප්‍රශ්න කරන ලදී. ඔහු එවිට යහපත් අසරණයන්ට පිහිටවන්නාගේ උපමා කථාව පැහැදිලි කළේය. උපමා කථාවේ අර්ථය පැහැදිලි ය; අවශ්‍යතාවක් ඇත්තකුට උපකාර කිරීම ආදරය කිරීමයි, ඒ අය අමුත්තකු හෝ සතුරෙකු හෝ විය හැකිය. [116]

සම්පූර්ණයෙන්ම ආධ්‍යාත්මික නැඹුරුතාවකින් යුක්ත ආදරයක් සඳහා ජේසුස්වහන්සේගේ ඇමතුම, ''දෙවියන් වහන්සේ වෙතින් පැමිණෙන" දිව්‍යමය ප්‍රභවයක් පමණක් ඇති ආදරය බව පළමු ක්‍රිස්තියානීන්ට විශ්වාස කිරීමට මෙහෙයවීය."[117] දෙවියන් වහන්සේ "එබඳු බලාපොරොත්තුවකින් කිසි ම කලකිරීමක් ඇති නොවෙයි. මන්ද, අපට දෙන ලද ශුද්ධොත්තමයාණෝ දේව ප්‍රේමයෙන් අපේ සිත් පුරවන සේක."[118] යැයි පෝල් කීවේය. ''කිසිවකු කිසි කලෙක දෙවියන් වහන්සේ දුටුවේ නැත. එහෙත්, අපි එකිනෙකාට ප්‍රේම කරමු නම්, දෙවියන් වහන්සේ අප තුළ වැඩ වසන සේක. උන් වහන්සේගේ ප්‍රේමය ද අප තුළ පරිපූර්ණ වන්නේ ය."[119] එනිසා මුල්කාලීන ක්‍රිස්තියානීහු එය අවබෝධ කරගත්හ, ආදරය සැබැවින්ම මිනිසාගේ මුල පිරීමක් නොවේ, නමුත් දෙවියන් වහන්සේ විසින් පිරිනමන ලද දෙයකි.

ආදරය පිළිබඳව ජේසුස්වහන්සේගේ අවබෝධයේ, එය මිනිස් හෝ දිව්‍යමය ද යන්න පිළිබඳව පිටස්තර නිරීක්ෂයකුට දෙගිඩියාවක් ඇතිවිය හැකිය. එක් අවස්ථාවකදී ඔහු මෙසේ කීවේයඃ ''මා, මාගේ පියාණන් වහන්සේගේ ආඥා පිළිපැද උන් වහන්සේගේ ප්‍රේමයෙහි පවතින සේ ම, ඔබත් මාගේ ආඥා පිළිපදින්නාහු නම්, මාගේ ප්‍රේමයෙහි පවතින්නාහු ය.”[120] මෙහි නිගමනය නම් ඔබ ජේසුස්වහන්සේගේ නියෝග නොපිළිපැද්දොත් ඔහු ඔහුගේ ආදරයෙන් ඔබ අස්කර ගන්නා බවය. මීට අමතරව, ජේසුස්වහන්සේට ඉහළම ආදරය වූ දෙවියන් වහන්සේගේ ආදරයට මිනිසුන් සදාකාලික නිරයට වරදකරු කරන අදහසට ඉඩ සැලැස්විය හැකිය. සෑම පුද්ගලයකුම විනිශ්චය දිනයේදී ජේසුස්වහන්සේ හෝ දෙවියන් වහන්සේ විසින් විනිශ්චය කරනු ලබන බවත්, ඔවුන්ගේ ඉරණම තීරණය කරන බවත් ජේසුස්වහන්සේ නැවත නැවතත් අවධාරණය කළහ. ඔවුන් පාපී, කළ වරදට පසුතැවිල්ලට පත් නොවන හෝ විශ්වාසයක් අඩු අය නම්, ඔහු හෝ දෙවියන් වහන්සේ ඔවුන් සදාකාලික දඬුවමට නියම කරනු ඇත. ඒ දිනයේදී දුකට පත් මිනිසුන්ට උපකාර කළ මිනිසුන්ට තමන් ප්‍රදානයක් කරන බව ජේසුස්වහන්සේ කලින් දැනුම් දුන්නේය. නමුත් එසේ කිරීමට අපොහොසත් වූ අය දෙවියන් වහන්සේගේ සාපයට යටත් වන අතර, ඔවුන්ට දෙවියන් වහන්සේ මෙසේ පවසනු ඇතඃ ”එවිට උන් වහන්සේ වම් පසෙහි සිටින්නන්ට කතා කොට, 'ශාප ලද්දෙනි, මා වෙතින් ඉවත් වී යක්ෂයාට ද ඔහුගේ දූතයන්ට ද සූදානම් කර තිබෙන සදාකාල ගින්නට යන්න.” [121]

''කිරිඳි එක් කොට ගින්නෙහි දවන්නේ යම් සේ ද, යුගාන්තයේ දී එසේ ම වන්නේ ය. මනුෂ්‍ය-පුත්‍රයාණෝ ස්වකීය දූතයන් එවන සේක. ඔවුහු උන් වහන්සේගේ රාජ්‍යයේ බාධා උපදවන සියල්ල ද අදමිටුකම් කරන්නන් ද එක් කොට, ගිනි උදුනෙහි හෙළන්නෝ ය. එහි දී වැළපීම ද දත්මිටි කෑම ද වන්නේ ය.”[122] තමන් විසින් කරන ලද පව්වලට පසු නොතැවෙන හෝ දෙවියන් වහන්සේ හෝ ජේසුස්වහන්සේ කෙරෙහි විශ්වාස නොකළ අය වෙනුවෙන් සමාවක් දීම සහ දඬුවමින් මිදීමක් නැත.” පුත්‍රයාණන් අදහන්නාට සදාතන ජීවනය ඇත. එහෙත්, පුත්‍රයාණන්ට කීකරු නො වන්නා ජීවනය නො දක්නේ ය; දේව උදහස ඔහු පිට රඳා පවතියි.”[123]

''දයාව නොපෙන්වූ තැනැත්තාට දයා විරහිත විනිශ්චයක් පැමිණෙන්නේ ය. දයාව, විනිශ්චය පසුබා ජය ගනී."[124] ඕනෑම පවකට සමාව දිය හැකිය, ජේසුස්වහන්සේ පැවසීය, නමුත් ශුද්ධවූ ආත්මයට විරුද්ධව කථා කිරීම හෝ මනුෂ්‍ය පුත්‍රයාට විරුද්ධව ''දැන් හෝ සදහටම" යමක් පැවසීමට සමාව දිය නොහැකිය.[125] එම නිසා ජේසුස්වහන්සේගේ අවබෝධයට අනුව, දෙවියන් වහන්සේගේ ආදරය ඇතුළුව, ඉතාම නිශ්චිතව, සීමාවන් සහ කොන්දේසි තිබුණි.

අපහාස කිරීම, විවේචනය කිරීම හෝ හුදෙක් අවංකවම සැක කිරීම, බුදුපියාණන් වහන්සේ වැනි පුබුදු වූ පුද්ගලයකු සමඟ සැසඳීම සම්බන්ධයෙන් දිව්‍යමය ප්‍රතිචාරය ඉතා වැදගත් වේ. ''යම් කෙනකු මා, ධර්මය හෝ සංඝයා පිළිබඳව හෙළා දකිමින් කථා කරයිද, ඔබ එයට කෝපයට පත්වීම, නුරුස්නා බවට පත් වීම හෝ සසල වීම සුදුසු නැත. ඔබ එසේ කළහොත්, ඔබට ඔවුන් කිවූ දෙය සත්‍ය ද නැද්ද කියා හඳුනා ගැනීමට නොහැකි වනු ඇත. එමනිසා, වෙනත් අය මා ගැන, ධර්මය හෝ සංඝයා හෙළා දකිමින් කථා කළහොත් : 'මෙය නිවැරදි නොවේ, මෙය සත්‍ය නොවේ, අප මේවා කරන්නේ නැත, ඒ අපේ ක්‍රමය නොවේ' යනුවෙන් පවසා ඔබ ඒ වැරදි කියමන පහදා දිය යුතුයි."[126]

මෙයට හේතුව මූලිකවම ධර්මය කායික සහ මානසික දුක (දුක්ඛ) මැඩ පැවැත්වීමට මාර්ගය වශයෙන් බුදුපියාණන් වහන්සේ දුටුවහ. එසේම දුක්විඳීමට සුදුසු ප්‍රතිචාරය කරුණාව නිසා, බුදුපියාණන් වහන්සේ ආදරයට වඩා කරුණාව (කරුණා, අනුකම්පති හෝ දයා) පිළිබඳව පමණක් කථා කිරීම ස්වභාවිකය." එදිරිවාදීකම සහ ද්වේෂය අත් හැරීමෙන් සියලු ජීවීන්ට කරුණාව අනුකම්පාව දක්වන මනසකින් යුක්තව පුද්ගලයෙක් වාසය කරයි, එම එදිරිවාදීකම සහ ද්වේෂය සහිත මනස පිරිසුදු කරයි... සතුන් මැරීමෙන් වැළකීමෙන් සහ දණ්ඩ සහ කඩුව පසෙකට දැමීමෙන් පුද්ගලයෙක් සියලු සත්ත්වයන්ට සැලකිල්ලෙන්, සංවේදනාත්මකව සැලකීමෙන් සහ කරුණාවන්තව සහ අනුකම්පාවෙන් යුක්තව ජීවත් වෙයි."[127]

බුදුපියාණන් වහන්සේගේ චරිතයේ ඉතාම සැලකිය යුතු අංගය නම් උන්වහන්සේගේ කරුණාව ය. එය හුදෙක් අනුන් වෙනුවෙන් උන්වහන්සේට දැනුණු දෙයක් පමණක් නොවේ, හෝ උන්වහන්සේ ඉදිරියේදී ඔවුන්ට දැනුණු දෙයක් ද නොවේ; එය උන්වහන්සේ ප්‍රකාශ කළ සහ කළ බොහෝ දේවල අරමුණයි. " ශ්‍රාවකයන්ගේ සුභසිද්ධිය වෙනුවෙන් සහ ඔවුන් කෙරෙහි අනුකම්පාවෙන් ගුරුවරයකු විසින් තමන්ගේ ශ්‍රාවකයන් කෙරෙහි කරුණාවෙන් කළ යුතු දේ මම කර ඇත්තෙමි."128 උන්වහන්සේ ''කරුණාවෙන්" රෝගීන් දැකබලා ගැනීමට ගොස් ඔවුන් අස්වැසූහ,129 එසේම කරුණාවෙන් ධර්මය ඉගැන්වූහ. 130

වරක් උන්වහන්සේ අනුක්‍රමික ඝාතකයකු සොයා වනයට වැඩියහ, උන්වහන්සේ එසේ කළේ ඝාතකයාගේ විභව්‍ය ගොදුරු බවට පත්වන්නට තිබූ පුද්ගලයන් සහ ඝාතකයා කෙරෙහි ද තිබූ කරුණාවෙනි.131 බුදුපියාණන් වහන්සේගේ කරුණාව කාල සීමා ද ඉක්මවූ බව පෙනෙන්නට තිබේ. උන්වහන්සේ සමහර විට සමහර දේ ''ඉදිරි පරම්පරා කෙරෙහි කරුණාවෙන්ම" කිරීමෙන් වැළකුණු බවට ද සඳහන් වේ."132 වරක්, උන්වහන්සේ තමන් වහන්සේගේ පැවැත්මට මූලික හේතුව ''බොහෝ දෙනකුගේ යහපතට, බොහෝ දෙනකුගේ සතුටට, ලෝකය කෙරෙහි කරුණාවෙන්, සුභසිද්ධියට, දෙවියන් සහ මිනිසුන්ගේ යහපතට සහ සතුටට" බව පැවසූහ.133

කෙසේ නමුත්, කරුණාව කෙරෙහි විශාල අවධාරණයක් හොවමින්, ආදරය පිළිබඳව ද බොහෝ දේ කියන්නට තිබුණි. ආදරය (මෙත්තා) මිනිය නොහැකි හෝ සීමාවක් නැති (අප්පමාණ) පවත්නා තත්ත්වයක්, හතර ආකාරයෙන් සම්බන්ධ පවත්නා තත්ත්ව සමස්තයක කොටසක් ලෙස උන්වහන්සේ දුටුවහ; අනෙක් ඒවා කරුණාව, මුදිතාව (මුදිතා) සහ උපේක්ෂාව (උපෙක්ඛා) වන අතර, සහ '' බ්‍රහ්ම-සමානව පවතින" (බ්‍රහ්මවිහාර) යනුවෙන් හැඳින්වේ.

තමන් වහන්සේගේ ශ්‍රාවකයන් හට ආදරය පිළිබඳව උන්වහන්සේගේ අවවාදය වූයේ මෙයයි. ''ඔබලා පුහුණු විය යුත්තේ මේ ආකාරයට යඃ 'අපගේ සිත් වැරදි ලෙස භාවිත නොකෙරේවා, වැරදි කථා සිදු නොවේවා, කරුණාව සහ අනුකම්පාවෙන්, වෛරයෙන් නිදහස් වූ - ආදරයෙන් පිරුණු

මනසකින් අපි ජීවත් වෙමු. පළමුව එක් පුද්ගලයකු වෙත ආදරය සහ විස්මය පතුරුවමින් අපි ජීවත් වෙමු, පෘථුල, පැතිරෙන, මිනිය නොහැකි සහ වෛරය හෝ අමනාපයෙන් සම්පූර්ණයෙන් තොර ආදරයක් මුළු ලොවට ම පතුරවමු. 'ඔබලා පුහුණු කළ යුත්තේ මේ ආකාරයට ය."134

බුදුපියාණන් වහන්සේ අවබෝධ කරගත් ආදරයට ශක්තිමත් රැකබලා ගැනීමේ විශාල කොටසක් ඇත. ''තමන්ගේ එකම දරුවා මවක් ආරක්ෂා කරන්නේ කෙසේද, ඒ ආකාරයටම ඔබ සියලු සත්ත්වයන්ට සහ මුළු ලෝකයටම ආදරය කිරීමට නොබැඳුණ මනසක් වැඩි දියුණු කරගත යුතුය." 135

බුදුපියාණන් වහන්සේගේ ආදරයේ ප්‍රතිප්‍රහාර දීමට හෝ පළිගැනීමට කිසිම ඉඩකඩක් නැත. "නීච අපරාධකරුවන් යුගල අත් කියතකින් ඔබගේ අවයවයෙන් අවයවයට කපා දැම්මත්, ඔබ ඔබගේ මනස වෛරයෙන් පුරවා ගත්තොත් ඔබ මගේ ඉගැන්වීම් පුහුණු කරන්නේ නැත."136 ''අනෙක් කම්මුලත් හරවන්න" යනුවෙන් ජේසුස්වහන්සේගේ ඇරයුමට සමාන ලෙස මෙය දකින්නට පුළුවනි.

පෞද්ගලික ලාභයක් ලැබීමේ අදහසින් යහපත් දෙයක් කිරීමට වඩා බුදුපියාණන් වහන්සේට අනුව බොහෝ වාරයක් ආදරනීය හදවතක් තිබීම වඩා හොඳය.

"සියලු තාරකාවල දීප්තිය සඳුගේ දීප්තියෙන් දාසයෙන් පංගුවක් තරම් නොවටිනවා මෙන්ම; වසන්ත ඍතුවේ අවසාන මාසයේ වර්ෂා සමයේ, අහස පැහැදිලිව සහ වළාකුළුවලින් නිදහස්ව තිබෙන ආකාරයෙන්ම, සූර්යයා අහසේ පායා ආලෝකය විහිදයිද, කිරණ විහිදයිද, සියලු අඳුර දුරුකරයිද; අරුණෝදයට පෙර එළිය සමථයකට පත් කරන තරුව බැබලෙන, දිලිසෙන සහ ආලෝකය පතුරුවන ආකාරයට; යහපත් පුනරුත්පත්තියක් සඳහා යම් අයකු කුමන ආකාරයේ යහපත් ක්‍රියා කරන්නේද, මේ එකක්වත් මනස නිදහස් කරන ආදරයේ දාසයෙන් පංගුවකට වටින්නේ නැත. මෙම සියලු යහපත් ක්‍රියා අභිබවා යමින් මනස නිදහස් කරන්නේ සහ අලෝක කරන්නේ, උණුසුම් කරන්නේ සහ බබළවන්නේත් මෙම ආදරයයි.137 ''ඒ හා සමානවම, බුදුපියාණන් වහන්සේට අනුව, ආදරය තිබීම හා සසඳන විට, විවිධාකාර ආගමික චාරිත්‍ර සිදු

කිරීම්වල ඇත්තේ සුළු වටිනාකමකි.[138] ''කිරි සහ ජලය මිශ්‍රණය මෙන් සුසංගමව, එගතාවෙන් සහ ප්‍රියමනාපව එකිනෙකා දෙස ආදරය පිරුණු ඇස්වලින් බලමින් ජීවත්වන"[139] ලෙස උන්වහන්සේ තමන් වහන්සේගේ ශ්‍රාවකයන්ගෙන් ඉල්ලා සිටියහ. යම් අයකු ආදරයෙන් කථා කළ යුතුය, ධර්මය ආදරයෙන් බෙදා දිය යුතුය, සහ රෝගීන්ට ආදරයෙන් සාත්තු කළ යුතු බව උන්වහන්සේ වදාළහ.[140]

සමහර විට සියලුම දේවල්වලින් වඩාත්ම සිත් ඇදගන්නාසුළු දෙය බුදුපියාණන් වහන්සේ සඳහන් කළේ යම් කෙනකුට ආදරනීය හදවතක් ඇත්තේ නම්, එම අයගේ අනාගතය මෙතැන් සිට තැවුලක් ඇතිකර ගැනීමට හේතුවක් නොවන බවය. "ව්‍යාකූල නොවූ සහ පැහැදිලි දැනුමක් ඇති දැඩි ආශාවක් හෝ වෛරයක් නොමැති සත්පුරුෂ ශ්‍රාවකයෙක්, ආදරය සහ කරුණාව, මුදිතාව සහ උපේක්ෂාව පිරුණු මනසකින් සතර දිශාවට පතුරුවමින් ජීවත් වෙයි. තමන්ට මෙන්ම උඩ, යට, හරහ සහ සැමතැනම ඔහු පෘථුල සහ පැතිරෙන සුලු, මිනිය නොහැකි සහ සම්පූර්ණයෙන්ම වෛරය සහ එදිරිවාදිකම් වලින් තොර ආදරය සහ කරුණාව, මුදිතාව සහ උපේක්ෂාව පිරුණු මනසකින් මුළු ලෝකයටම පතුරුවමින් ජීවත් වෙයි. එවැනි ශ්‍රාවකයකුට මෙම විශ්වාස හතර තිබිය හැකිය. ඔහුට මෙසේ සිතන්නට පුළුවනි, 'මරණින් මතු ජීවිතයක් ඇත්නම්, හොඳ සහ නරක ක්‍රියා සඳහා ප්‍රතිඵලයක් ඇත්නම්, එවිට මරණින් මතු මගේ ශරීරය බිඳී ගියහොත්, මා හොඳ භවයක හෝ දිව්‍ය පථයක නැවත උපදිනු ඇත.' මෙය ඔහුට ඇතිවිය හැකි පළමු විශ්වාසයයි. හෝ ඔහුට හිතෙන්නට පුළුවනි, 'මරණින් මතු ජීවිතයක් නැති වුණත්, සහ හොඳ සහ නරක ක්‍රියාවලට ප්‍රතිඵල නොමැති වූවත්, කෙසේ නමුත් මේ ජීවිතයේදී මම වෛරය සහ එදිරිවාදිකම් නොමැති සහ කරදර වලින් නිදහස් ජීවිතයක් ගත කරමි.' මේ ඔහුට තිබිය හැකි දෙවන විශ්වාසයයි. නොඑසේ නම් ඔහුට මෙසේ සිතිය හැකිය, 'යම් අයහපත් පුද්ගලයකුට පෙරළා අයහපතක් නොවේ නම් මා අයහපතක් නොකරන නිසා මට දුක්විඳීම් එන්නේ කෙසේ ද?' මේ ඔහුට ඇතිවිය හැකි තුන්වන විශ්වාසයයි. ඔහුට මෙසේ ද සිතිය හැකිය, 'අයහපත් පුද්ගලයකුට අයහපතෙන්ම දඬුවම් නොලැබේ නම්, කෙසේ නමුත් මම පිරිසුදුයි."[141]

ඒ නිසා, බුදුපියාණන් වහන්සේ අවබෝධ කරගත් ආකාරයට, උසස් බවට පත් වූවකුගේ මරණින් මතු ජීවය විශේෂ දෙවියකු කෙරෙහි විශ්වාසය තැබීම අවශ්‍ය නැත. නමුත්, අවශ්‍ය වන්නේ ගුණවත්වීම සහ ආදරනීය වීම ය. ජේසුස්වහන්සේගේ අවබෝධයට අනුව මෙය පැහැදිලිවම අසමානය, විමුක්තිය සඳහා ආදරය කිරීම පමණක් ප්‍රමාණවත් නොවේ. යම් කෙනකු දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාසය ද නොමැත්තේ නම් ඔහු මුදවා ගත නොහැකිය.

නමුත්, ආදරය පිළිබඳව දෙදෙනා වහන්සේ අතර බොහෝ සමානකම් තිබියදීත්, වෙනත් බොහෝ වෙනස්කම් ඇත. බුදුපියාණන් වහන්සේට සංවේදනය, උත්සුකභාවය, කරුණාව සහ ආදරය (මෙත්තා) විශ්වයටම උපයෝගීවන අයුරින් අවධාරණය කරගතයුතු විය යුතුවූ අතර, හුදෙක් මිනිසුන්ට පමණක් නොව, සියලු සචේතනික සත්ත්වයන්ට ද පැතිරවිය යුතු විය. සතුන්ට හිංසා කිරීමෙන් සහ ප්‍රමාණය ඉක්මවා වැඩ ගැනීමෙන් ආරක්ෂා කිරීමට බොහෝ නීති පැරණි තෙස්තමේන්තුවේ ඇතුළත් කර ඇති නමුත්, ජේසුස්වහන්සේ සතුන් පිළිබඳව කිසිවක් පවසා නැත. පීටර්ට අනුව, පැරණි තෙස්තමේන්තුවේ නීති සකස් වී ඇත්තේ මිනිසුන්ගේ යහපත සඳහා පමණක් ය. දෙවියන් වහන්සේ සතුන්ගේ ඉරණම පිළිබඳව සැලකිල්ලක් දැක්වූයේ නැත. මෙම තත්ත්වය මෑතක් වනතුරුම බොහෝ ක්‍රිස්තියානීහු පවත්වාගෙන ගියහ. සතුන්ගේ ශුභසිද්ධිය උදෙසා මුල්කාලීනව දැනසිටි නීති සකස් කළේ ක්‍රි.පූ. 243දී අශෝක අධිරාජයා විසිනි. මෙය සියලු සචේතනික ජීවීන් කෙරෙහි කරුණාව සහ ආදරය ඇති කිරීමට බුදුපියාණන් වහන්සේගේ ඉගැන්වීම්වලින් ඍජුව ආකර්ශණය වීමේ ප්‍රතිඵලයකි. එසේම සමහර විට, වැදගත් මෙන්ම කරුණාවන්ත ක්‍රියාවලට සම්බන්ධ වීම ආදරය බව කියමින් බුදුපියාණන් වහන්සේ ආදරය පිළිබඳව එවැනි සක්‍රිය ප්‍රකාශ අවධාරණය කළත් ජේසුස්වහන්සේ තරම් නිතර කථා කළේ නැත. බුදුපියාණන් වහන්සේ ආදරය පිළිබඳව ප්‍රධාන වශයෙන් කථා කළේ මනසක තත්ත්වය වශයෙන්, මානසික භාෂිතයෙන් ය; ජේසුස්වහන්සේ එය දුටුවේ වඩාත් හැසිරීමට අදාළ අයුරින්ය, අනෙක් අය වෙනුවෙන් කරන ලද දෙයක් සහ ක්‍රියාවෙන් ප්‍රකාශ කළ දෙයක් ලෙසය. බෞද්ධ සංස්කෘතිය පාරම්පරිකව දිගුකාලීන සංවිධානාත්මක පුණ්‍ය කටයුතුවලදී සහ සමාජීය නිරතවීම්වලදී ක්‍රිස්තියානීන්ට වඩා

අඩුවෙන් ක්‍රියාකාරී වීමට හේතුව බුදුපියාණන් වහන්සේ ආදරය පිළිබඳව කථා කළ ආකාරය විය හැකිය.

තමන්ගේ දෙමාපියන්ගේ විරුද්ධතා තිබියදීත් භික්ෂුවක් වූ තරුණයකු පිළිබඳව ත්‍රිපිටකයේ සඳහන් වේ. මාස කිහිපයකට පසුව ඔහු තම දෙමාපියන්ගේ නිවසට දානය ඉල්ලා නැවත වැඩියහ. තවමත් ඔහුගේ මනස වෙනස් කරවීම සඳහා ඔහුගේ දෙමාපියෝ පසු දින දානයට වඩින ලෙස ආරාධනය කළහ. සිවුරු ඇරවීම සඳහා ඔහු පෙළඹවීමට ඔවුහු දානයට වඩින්නට පෙර, මුදල් සහ වෙනත් වටිනා දේ ආහාර කාමරයේ ගොඩ ගැසූහ. ඔහු පැමිණි විට ඔවුන් ඔහුට මුදල් පෙන්වා නැවත ගිහියකු ලෙස පැමිණියහොත්, ඒවා ඔහු සතුවන බව කියා සිටියහ. ඔහු පිළිතුරු දුන්නේය: "ඔබලා මගේ අවවාදය ලබා ගන්නේ නම්, මෙම සල්ලි ගොඩ සහ වටිනා දේ කරත්තයක පටවා ගඟට අතහරින්න."142

## ආගමික විශ්වාසය

ක්‍රිස්තියානි නිකායන් අතර ආගම කෙරෙහි ඔවුන්ගේ ඇති විශ්වාසයට අදාළ භූමිකාව සම්බන්ධයෙන් විවිධ ආකල්ප දරා සිටිති. විමුක්තිය රඳා පවත්නේ විශ්වාසය සහ යහපත් ක්‍රියා මත බව කතෝලික ධර්මය උගන්වයි; විශ්වාසය පමණක් ප්‍රමාණවත් බව ප්‍රොතෙස්තන්ත ආගම පවසයි. කවුරු නිවැරදි වුවත්, විශ්වාසය වැදගත් බව ජේසුස්වහන්සේ උගැන්වූයේය, එසේ නොවේ නම් මානව වර්ගය සහ දෙවියන් වහන්සේ අතර ඇති දැඩි පරතරය යා කෙරෙන ගුණය ඉතා වැදගත් වේ. "අදහා බව්තීස්ම-ස්නානය ලබන තැනැත්තේ ගැළවීම ලබන්නේ ය; එහෙත්, නොඅදහන තැනැත්තේ වරදකරු යයි තීන්දුව ලබන්නේ ය." නැවතත්: " දෙවියන් වහන්සේ ලෝකයාට කොතරම් ප්‍රේම කළ සේක් ද කීවොත්, ස්වකීය එක ම සහජාතක පුත්‍රයාණන් පවා ලොවට දෙවා වදාළ සේක. එසේ කෙළේ, උන් වහන්සේ කෙරෙහි අදහන සියලු දෙනා ම නොමැරී සදාතන ජීවනය ලබන පිණිස ය." නැවතත්: " ඔබ 'මම කවුද' කියා ඔබ විශ්වාස නොකරන්නේ නම්, ඔබ ඔබේ පව්වලට මිය යනවා ඇත." තවත් වරක්: "ඔබ මෙලොවින් වන්නාහු ය; මම එලොවින් වන්නෙමි. ඔබ මේ ලෝකයෙන් ය; මම මේ ලෝකයෙන් නොවෙමි. ඔබේ පාපයෙහි ම ඔබ මැරෙන්නාහු ය යි

මා කීවේ එබැවිනි. මම උන් වහන්සේ ම ය යි නො පිළිගත්තොත්, ඔබේ පාපයෙහි ම ඔබ මැරෙන්නාහු ය"යි වදාළ සේක."[143] දෙවියන් වහන්සේ සතුටු කිරීමට කුමක් කළයුතු ද කියා ජේසුස්වහන්සේගෙන් යම් කෙනකු ප්‍රශ්න කළ විට ඔහුගේ පිළිතුර වූයේ : ''දෙවියන් වහන්සේගේ අභිප්‍රාය වනුයේ, උන් වහන්සේ එවා වදාළ තැනැත්තාණන් ඔබ විසින් අදහා ගනු ලැබීම ය" යි වදාළ සේක. ඒ, ජේසුස්වහන්සේය. මෙම කරුණම අපෝස්තල්වරු ද නැවත නැවත කිව්වෝය. "ඇදහිල්ල නැති ව උන් වහන්සේගේ ප්‍රසාදය දිනා ගැනීමට පුළුවන්කමක් නැත. මන්ද, දෙවියන් වහන්සේ වෙත ළඟා වන්නා උන් වහන්සේ ජීවත් වන බවත්, උන් වහන්සේ සොයා එන්නවුනට ඉෂ්ට විපාක දෙන කෙනකු බවත් විශ්වාස කළ යුතුය." නැවතත් : "ඒ වනාහි ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ කෙරෙහි ඇදහිල්ල කරණ කොටගෙන අදහන සියල්ලන් දෙවියන් වහන්සේ විසින් තමන් වහන්සේ සමඟ සබඳතාවට පමුණුවනු ලැබීමේ මාර්ගය වේ. එය කිසි වෙනසක් නැතිව, අදහන්නා වූ හැම දෙනාට ම ලබාගත හැකි ය." නැවතත්: "ඔබ ගැලවී සිටින්නේ දේව වරප්‍රසාදය මඟින් වූ ඇදහීම කරණ කොට ගෙන ය. එය ඔබගේ ම ක්‍රියාවක් නොව, දෙවියන් වහන්සේගේ දීමනාවකි."[144]

මෙම කියමන් සහ සමාන ප්‍රකාශවලින් පෙනී යන්නේ විශ්වාසයේ දෙආකාර අරමුණු තිබූ බවය ; දෙවියන් වහන්සේ සහ ජේසුස්වහන්සේ කෙරෙහි විශ්වාසය තැබීමෙන් අදහස් කරන්නේ ඔහු පිළිබඳව කරන ලද නිශ්චිත කියා සිටීම් විශ්වාස කිරීමය; ඒ දෙවියන් වහන්සේ සියල්ල මැවූ බව, ඔහුට තුන් ආකාර ස්වභාවයන් තිබෙන බව, ඔහුට පුතෙක් සිටින බව, ඔහු මානව වර්ගයා වෙනුවෙන් තමන්ගේ පුත්‍රයා මිය යැමට යැවූ බව, යනාදිය. ඒ ආකාරයටම, ජේසුස්වහන්සේ කෙරෙහි විශ්වාසය තැබීම යනු, ඔහු කන්‍යාවකගෙන් බිහිවූ බව, ඔහු දෙවියන් වහන්සේගේ පුත්‍රයා බව, ඔහු මළවුන්ගෙන් නැගිට්ට බව, ඔහු නැවතත් ලෝකය විනිශ්චය කිරීමට පැමිණෙන බව යනාදිය විශ්වාස කිරීමය. ඒ අනුව ගැලවීම රඳා පවත්නේ සමහර අදහස් පිළිබඳව සැකයක්, අඩමානයක් හෝ අවිනිශ්චිත බවක් නැති වීම මතය. "එහෙත් සැක නොකර ඇදහිල්ලෙන් ඔහු එය අයදීවා. මන්ද, සැක කරන තැනැත්තේ සුළඟින් කැළඹී නගින බසින මුහුදු රැල්ලට සමාන ය.

එබඳු මනුෂ්‍යයා තමාට ස්වාමීන් වහන්සේගෙන් කිසිවක් ලැබේ යයි නොසිතාවා. ඔහු සිත් දෙගිඩියාවෙන් පසු වෙන මනුෂ්‍යයකුව තමාගේ සියලු ක්‍රියා මාර්ගවලදී අස්ථිර ව සිටින්නේය." ඔබ යාඥා කරන විට ඒ පිළිබඳව කිසිසේත් සැක නොකළ යුතුය. සැක කරන ඕනෑම පුද්ගලයකු සුළඟෙන් මෙහෙයැවන සහ සුළඟට ගසා ගෙන යන මුහුදේ රැළි මෙන්ය. ඔබ එවැනි නම්, ඔබගේ මනස හදා ගත නොහැකි නම්, සහ ඔබ කරන සියලු දේ පිළිබඳව තීරණයක් නොමැති නම්, දෙවියන් වහන්සේගෙන් ඔබට කිසිම දෙයක් ලැබේ යැයි නොසිතන්න."[145] විශ්වාස කරන්නා රැක ගනිමින් දෙවියන් වහන්සේ මෙම විශ්වාසයට ප්‍රතිචාර දක්වයි.

ක්‍රිස්තු ධර්මයේ සියලු ඇදහිලි; * අපෝස්තල්වරුන්ගේ ඇදහිලි;*, නයිසීන් (Nicaean) ඇදහිලි;*, ඇතනේසියන් (Athanasian) ඇදහිලි;*, ශික්ෂාපද තිස්නවය* (Thirty Nine Articles), ඔග්ස්බර්ග් පාපොච්චාරණය* (Augsburg Confession), ජේසුතුමාගේ දෙවන පහළවීමක් ඇතැයි අදහන ධර්මය පිළිබඳ ආධාරක,* (the Pillars of Adventism), මෙතෝදිස්ත ආගමේ ශික්ෂාපද* (Methodist Articles of Religion), යනාදිය - මේ සියලු දෙයින් පැහැදිලි කරන්නේ කිතුනුවකු වී ආත්ම විමුක්තිය ලබා ගැනීම සඳහා විශ්වාස කළ යුතු දෙවියන් වහන්සේ හා ජේසුතුමා පිළිබඳ සුවිශේෂී අදහස් කිහිපයකි. මේ සියලු අවශ්‍යතා ප්‍රඥාවන්තව අවබෝධ කර ගැනීම අවශ්‍ය වන්නේ යැයි අදහස් නොකෙරේ; ඒවා අවබෝධ කර ගැනීම හෝ නිසැක ලෙස විශ්වාස කිරීම හෝ ඒවා ප්‍රමාණවත් තරමට සත්‍ය යැයි ආරක්ෂා කිරීම හෝ ඒ සඳහා ප්‍රමාණවත් වෙයි. සැලකිල්ලට ගතයුතු දෙයක් නම්, මෙම ඇදහිලි කිසිවක් පුද්ගලයකු හැසිරිය යුත්තේ කෙසේද කියා නොපවසයි; ආදරනීය වන්නේ කෙසේද හෝ ආදරය යන වචනයවත් සඳහන් කර නැත. එසේම බොහෝ විද්වතුන් විසින් විශ්වාසයට ගත යුතු ක්‍රිස්තියානියේ හරය පිළිබඳ පැරණිතම එකම වාර්තාව ලෙස සලකනු ලැබූ බයිබලයේ (1) හි කොරින්තියන්ස් 15වන පරිච්ඡේදය ද, ප්‍රකාශ කරන්නේ සහ පැහැදිලි කරන්නේ විශ්වාස කළයුතු යැයි නියම කරන අදහස් සමූහයක් පමණි. ජේසුතුමාට අනුව, කුඩා දරුවකු මෙන් පරමාදර්ශී විශ්වාසය නම් සරල, විශ්වාසය ඇති බව සහ ප්‍රශ්න නොඇසීමය. ඔහු කියන ආකාරයට: ''සැබැවින්ම මම ඔබට කියමි, ඔබ වෙනස්

වී කුඩා දරුවන් මෙන් නොවූවොත්, කිසි සේත් ස්වර්ග රාජ්‍යයට ඇතුල් නො වන්නහු ය."[146]

නිර්වාණ අවබෝධ මාර්ගයට පිවිසෙන මූලික ක්‍රියාවලියේදී බෞද්ධයකුට ශ්‍රද්ධාව (සද්ධා) සහ දැඩි විශ්වාසය (පසාද) වැදගත් බවක් තිබේ. ඒ අනුව බුදුපියාණන් වහන්සේ දැඩි විශ්වාසය (සද්ධා බීජං) [147], බීජය යන අර්ථයෙන් හඳුන්වමින් අඩුම තරමින් යම් මූලික ශ්‍රද්ධාවක් හෝ විශ්වාසයක් නොමැතිව කෙනකු ධර්මය විමසීම ආරම්භ නොකර හෝ පුහුණු නොකර, ප්‍රතිඵල ඇති නොවන බව වදාළහ. චතු සම්පත් (චතු සම්පදා), පංච සම්පත් (පංච ධන), පංච බල (පංච බල), පංච ආධ්‍යාත්මික ඉන්ද්‍රියයන් (පංච ඉන්ද්‍රිය), සහ සත් ආකාර යහපත් තත්ත්වයන් (සත්ත සද්දගම්මෙහි)[148] ආදිය වැනි ධර්මය පිළිබඳ මූලධර්මයන් ශ්‍රද්ධාවෙන් ඇරඹෙන නමුත්, ඒවායේ කූටප්‍රාප්තිය ප්‍රඥාව පදනම් වී කෙනකු තුළ පවතී. එලෙසින්ම, තත්ත්වාරෝපිත සංසාර පැවැත්මේ (දුක්ඛා) ප්‍රමාණවත් නොවන්නා වූ ද, අතෘප්තිදායක වූ ද, ස්වභාවය පිළිබඳව ලබා ගන්නා දැනුවත් බව ශ්‍රද්ධාව වෙත යොමු කරවන බව ය; එහි ප්‍රතිඵලයක් වශයෙන් වඩාත් උසස්, වඩාත් වැදගත් ආධ්‍යාත්මික ගුණාංගවල හට ගැනීමක් ඇති කරවයි.[149] ආගමික විශ්වාසය (සද්ධා) ආර්ය අෂ්ටාංගික මාර්ගයේ එක් පියවරක් නොවීම යන කරුණ, එය ආධ්‍යාත්මික වැඩිදියුණුවට හේතුවන නමුත්, ඒ සඳහා එය අත්‍යවශ්‍ය නොවන බව අඟවයි. ඊට ප්‍රතිවිරුද්ධව, ආගමික විශ්වාසය ක්‍රිස්තියානි දහමට අවශ්‍ය වේ. ඉංග්‍රීසි සහ වෙනත් යුරෝපීය භාෂාවන්ට අනුව 'විශ්වාසය' 'ආගම' සඳහා සමාන අරුත් ඇති පදයකි.

විචක්ෂණයෙන් නිගමනය කරන ශ්‍රද්ධාව (ආකාරවතී සද්ධා) සහ පදනම් රහිත ශ්‍රද්ධාව (අමූලිකා සද්ධා) යන දෙක බුදුපියාණන් වහන්සේ වෙන්කොට හඳුන්වා ඇත. විචක්ෂණයෙන් නිගමනය කරන ශ්‍රද්ධාව වැඩෙන්නේ සම්භාවිතාවන්, අනුමාන කිරීම් සහ කරුණු අවධානයෙන් යුතුව තක්සේරු කරමින්ය, දැඩි හැඟීම්වලට බලාපොරොත්තු සමඟින් ක්‍රියාත්මක වෙමින් ප්‍රාතිහාර්යයන් වලින් ප්‍රබෝධ වීමෙන්, විකල්පයන් පරීක්ෂා නොකර තමන්ට අහම්බෙන් අවධානය වන පළමු දේ පිළිගැනීම පදනම් රහිත ශ්‍රද්ධාවයි. වැදගත් ප්‍රජා නායකයකු සහ ජෛන ආගම අදහන්නකු වූ උපාලි

සමඟ බුදුපියාණන් වහන්සේ අතර වූ මුණ ගැසීමේදී බුදුපියාණන් වහන්සේගේ විචක්ෂණයෙන් නිගමනය කරන ශ්‍රද්ධාව පිළිබඳව තිබූ මනාපය හොඳින් පැහැදිලි වේ. බුදුපියාණන් වහන්සේ සමඟ සාකච්ඡාවත් පසුව උපාලි උන්වහන්සේගේ අනුගාමිකයකු වීමට ''මේ දින සිට ජීවිතය පවතින තුරු" තීරණය කළේය. උපාලිගේ ශ්‍රද්ධාව පිළිගැනීමට වඩා, තීරණය කිරීමට පෙර, ඒ පිළිබඳව සැලකිල්ලට ගැනීමට කාලයක් ගන්නා ලෙස බුදුපියාණන් වහන්සේ අවවාද කළහ. : "උපාලි, සැලකිල්ලෙන් සෝදිසියක් කරන්න. ඔබ වැනි හොඳින් දන්නා පුද්ගලයකු පළමුව සැලකිල්ලෙන් සෝදිසියක් කළ යුතුය."[150]

බුදුපියාණන් වහන්සේගේ මෙම අවවාදය තෝමස්ට ජේසුස්වහන්සේ කළ ප්‍රකාශය වෙතින් වෙනස් වීම සැලකිල්ලට ගත යුතුයි, තෝමස් පැවසුවේ ජේසුස්වහන්සේ මළවුන්ගෙන් නැගිටි බව තමන් විශ්වාස කරන්නේ තමන්ට ඒ පිළිබඳව නිරීක්ෂණය කිරීමෙන් ලැබූ සාක්ෂි ඇත්නම් (බලන්නට සහ ස්පර්ශ කරන්නට) පමණක් බවය. "ජේසුස්වහන්සේ ඔහුට මෙසේ පැවසුවේය, 'ඔබට මා පෙනෙන නිසා ඔබ මා විශ්වාස කරන්නේද? දකින්නේ නැතිව විශ්වාස කරන අය කෙතරම් සතුටින්ද! "[151]

බුදුපියාණන් වහන්සේගේ අවබෝධයට අනුව, විශ්වාසය සෙලවිය නොහැක්කේ (අවේච්චප්පසාද) යම් කෙනකු පරිනාමන ප්‍රතිඵල (මාර්ගඵල) දැකීමෙන් පසුය.[152] බුදුපියාණන් වහන්සේ කෙරෙහි විශ්වාසය ඇතිකරවීමට ප්‍රබෝධයක් ඇති වන්නේ පුද්ගලයන් තමන්ගේ පුහුණුවීම්වල ඵල අත්දකින්නට පටන් ගන්නාවිටය. එවිට උන්වහන්සේ කෙරෙහි ඔවුන්ගේ ගෞරවය සැබැවින්ම ශක්තිමත් වේ.[153] උදාහරණ වශයෙන්, තමන් වහන්සේ පිළිබඳව උන්වහන්සේ කියූ දේවල් සත්‍ය ද කියා තමන් වහන්සේගේ හැසිරීම පරීක්ෂා කරන ලෙසත්, උන්වහන්සේගේ ප්‍රසිද්ධ පුද්ගලයා සහ පෞද්ගලික හැසිරීම අතර වෙනසක් තිබුණේ නම්, දේශනා කරන දේ ප්‍රායෝගිව පුහුණු කළේ ද, උන්වහන්සේ ජනප්‍රිය සහ ගෞරවයට පත් වීමෙන් පසු චරිතයේ වෙනස්කම් ඇත්තේ ද යන්න නිරීක්ෂණය කරන මෙන් ශ්‍රාවකයන්ගෙන් ඉල්ලූ සේක. යම් කාලයක් ශ්‍රාවකයන් මෙසේ කළානම් ඔවුන් තුළ බුදුන්වහන්සේ

කෙරෙහි ''හේතූන්වලින් පෝෂණය වූ"[154] ශ්‍රද්ධාවක් ඇති වෙන බව බුදුපියාණන් වහන්සේ කියා සිටියහ.

ඒ නිසා බුදුපියාණන් වහන්සේට, ශ්‍රද්ධාව ප්‍රයෝජනවත් මනෝ විද්‍යාත්මක තත්ත්වයකි, එය අවසානයේ පෞද්ගලික අත්දැකීමෙන් ආදේශ කළ යුතුය. ජේසුස්වහන්සේට අනුව එය එසේ තිබූ පුද්ගලයා ගලවා ගනිමින් දෙවියන් වහන්සේ විසින් ප්‍රතිචාර දක්වන ලද ආධ්‍යාත්මික බලයකි.[155] පරස්පර විරෝධී ලෙස, මෙම ශ්‍රද්ධාව හෝ ප්‍රඥාව හෝ වෙනත් කිසියම් ආධ්‍යාත්මික ගුණයක් තිබෙන්නේ එය දෙවියන් වහන්සේගේ දේවවරමින් ප්‍රදානය කළොත් පමණි.

## ලෝකයේ අවසානය

පළමුවෙනි සහස්‍ර වර්ෂය පසු කරන්නට පෙර ශතවර්ෂ ගණනාවක් සහ අඩු ගණනේ එයින් පසු ශතවර්ෂ එකහමාරක්, බොහෝ යුදෙව් ජාතිකයන් විශ්වාස කළේ ලෝකය මෙතරම් කුරිරු වී ඇත්තේ දෙවියන් වහන්සේ ලෝකය විනාශ කිරීමට යන නිසා බවය. මෙයට පෙර සිදුවීමක් විය, ඒ දෙවියන් වහන්සේ සම්පූර්ණයෙන්ම සියලු ජීවීන් විශාල ජලගැල්මකින් අතුගා දැමීමය. ජේසුස්වහන්සේට අවුරුදු සියයකට ප්‍රථමව, එසීන්ස් නමැති එක් යුදෙව් පූජක නිකායට අයත් පුද්ගලයෙක් අවසානය ලඟ බව ඉගැන්විය. ක්‍රි. පූ. 90දී පමණ ලියන ලද සොලමන්ගේ ගීතිකා නමැති යුදෙව් ග්‍රන්ථයේ මෙම අදහස තිබේ. බැප්ටිස්ට් ජෝන් එයම උගැන්විය, ජේසුස්වහන්සේ එය කළේය, ඔහුගේ මරණයෙන් පසු අපෝස්තල්වරු ද එය කළහ, එය පළමු ක්‍රිස්තියානි බොහෝ පරම්පරාවන් විසින් සිදුකළ දේශනා කිරීමේ දැවැන්ත මාතෘකාවක් විය. කලබලයට පත් වූ බැප්ටිස්ට් ජෝන් දිගු දේශනාවක් කළේය. ඔහුට සවන් දීමට පැමිණි සෙනඟට ''දෙවියන් වහන්සේ දඬුවම් එවීමට ආසන්නව සිටියි".[156] "තවද, දැනට ම පොරොව ගස් මුල්වලට තබා තිබේ. එබැවින් හොඳ පල නොදෙන සියලු ගස් කපා ගින්නෙහි දමනු ලැබේ."[157]

එය ජේසුස්වහන්සේ හදවතට ගත් පණිවුඩයකි. ලෝකය විනිශ්චය කිරීමට දෙවියන් වහන්සේ විසින් එවූ මිනිසාගේ පුත්‍රයා තමා යයි ඔහු විශ්වාස කළේය; දුෂ්ටයන් විනාශ කරමින් සහ ධාර්මිකයන්ට ප්‍රදානයන් කරයි. දුප්පතුන් සහ නිහතමානි පුද්ගලයන් උසස් බවට

පත් කරන අතර, ධනවත් සහ බලවත් අය පහත් තත්ත්වයට ගෙන එයි. "නිහතමානී ගුණ ඇත්තෝ භාග්‍යවන්තයෝ ය; ඔවුහු දේශය උරුම කර ගන්නෝ ය." ජේසුතුමා පොරොන්දු විය. 158

එකිනෙකාට ආදරය කිරීමට කාලය පැමිණ ඇත, ආදරය ඉල්ලා සිටි ඕනෑම පුද්ගලයකුට දීම සඳහා, යම් කෙනකුගේ සතුරන්ට සමාව දෙන්න, අනිත් කම්මුල හරවන්න, හෙට පිළිබඳව නොසිතන්න. පැරණි ලෝකය බලයෙන් පහකර, නව සහ අංගසම්පූර්ණ එකකින් එය ආදේශ කිරීමට ඉතා ආසන්නය. ඉර සහ සඳ අඳුරු වීම ආරම්භක සිද්ධියයි, තරු ස්වර්ග ලෝකවලින් කඩා වැටෙයි, මිනිසාගේ පුත්‍රයා වළාකුළු අතරින් තේජසින් පැමිණේ." මන්ද, ස්වාමීන් වහන්සේ ම අණ දීමේ ශබ්දය ද, අග්‍ර දේව දූතයකුගේ හඬ ද, දෙවියන් වහන්සේගේ හොරණෑ නාදය ද ඇතිව ස්වර්ගයෙන් බැස වදාරන සේක. ක්‍රිස්තුන් වහන්සේ අදහමින් පරලෝ සැපත් වූ අය පළමුකොට නැඟිටින්නෝ ය. එවිට ජීවතුන් අතර සිටින අපි, ඔවුන් සමඟ ස්වාමීන් වහන්සේ හමු වනු පිණිස, වළාකුළුවලින් අහසට ඔසවාගනු ලබන්නෙමු. මෙසේ අපි නිතර ම ස්වාමීන් වහන්සේ සමඟ සිටින්නෙමු. එහෙයින් මේ වචන වලින් එකිනෙකා සනසන්න."159

මෙය සිදුවන්නේ සම්පූර්ණයෙන්ම අනපේක්ෂිත අයුරෙන්ය, ''රාත්‍රියේ සොරෙකු මෙන්ය", එසේම ඉතා ඉක්මනින්ය. "සෑම දෙයක්ම නිහඬයි සහ ආරක්ෂා සහිතයි'' මිනිසුන් පවසන විට, හදිසියේම විනාශය ඔවුන්ට පහර දෙයි! දරුප්‍රසූතියේදී කාන්තාවකට ඇතිවන වේදනාව මෙන් එය හදිසියේම පැමිණෙයි, මිනිසුන් නොමිදෙයි." (1 Thess.5.3) ''සාමය ඇත; අනතුරක් නැත'' යි ඔවුන් කියන විට, ගැබිණියකට විළි රුජා පැමිණෙන්නාක් මෙන්, ක්ෂණික විනාශය ඔවුන් පිට පැමිණේ; ඔවුනට කිසි ගැලවීමක් නැත.(1 තෙසලෝනික) ජේසුස් වහන්සේ ද, ''එසේ ය, තවද මනුෂ්‍ය-පුත්‍රයාණන් බලපරාක්‍රමයාණන්ගේ දකුණු පස වැඩහිඳිනවාත්, අහසේ වළාකුළු පිරිවරා වඩිනවාත් ඔබ හැම දකිනු ඇතැ"යි වදාළ සේක."160 මෙම ප්‍රබෝධමත් කරන අවසානය තමන්ට තහවුරු කරගත හැකි බව ජේසුස්වහන්සේ ප්‍රේක්ෂකයන්ට අනතුරු ඇඟවීමක් කළේය. "සැබැවින් ම මම ඔබට කියමි, මේ සියල්ල සිදුවන තුරු මේ පරම්පරාව පහ වී නොයන්නේ ය."161

නැවතත්: "තවද, උන් වහන්සේ ඔවුන්ට කතා කොට, ''සැබැවින් ම මම ඔබට කියමි, දෙවියන් වහන්සේගේ රාජ්‍යය බලපරාක්‍රම සහිත ව පහළ වූ බව දකින්නට පෙර, මෙහි සිටින්නන්ගෙන් ඇතැමෙක් කිසි සේත් මරණයට පත් නොවන්නාහ"යි වදාළ සේක.[162] වර්තමානයේ එවැනි අනාවැකි විශ්වාස කරන අය ප්‍රකෝප කිරීමට, උසුළු විසුළු කිරීමට යොමු වෙයි, හෝ අඩු ගණනේ තමන් යමක් දන්නා බව අඟවයි. නමුත් ජේසුස්වහන්සේ අදහස් කළේ කුමක් ද කියා පැහැදිලිය, පළමු ක්‍රිස්තියානි බොහෝ පරම්පරාවන් ජේසුස්වහන්සේ පැවසූ දේ ඉතා ගැඹුරු ලෙස පිළිගෙන ඇත. ජෝන් ඔහුගේ පාඨකයන්ට පොරොන්දු වියː ''ප්‍රිය දරුවෙනි, අවසාන මොහොත පැමිණ ඇත. මේ කාලයේදී ක්‍රිස්තු විරෝධියා එන බව ඔබ අසා ඇත. දැනට ම බොහෝ ක්‍රිස්තු විරෝධීහු පහළ වී සිටිති. මේ කරුණින් මෙය අන්තිම මොහොත බව අපට පෙනේ."[163] ජේම්ස් ඉල්ලා සිටියේයː "එසේ ම ඔබ ද ඉවසිල්ලෙන් සිටින්න; ස්වාමීන් වහන්සේගේ ආගමනය දැන් ළං ව ඇති බැවින් ඔබේ සිත් තිරසර ව තබාගන්න.".[164] ''දෙවියන් වහන්සේ ඉක්මනින්ම පැමිණෙන" බව පෝල් මිනිසුන්ට මතක් කළේය."[165] ''මේ සියල්ල සිදුවූයේ ඔවුන්ට පාඩමක් වන පිණිස ය. ඒවා ලියන ලද්දේ යුගාන්තයට පැමිණ සිටින අපට අනතුරු ඇඟවීමක් වශයෙනි".[166] යම් පුද්ගලයකු ඔහුගෙන් විවාහය පිළිබඳව උපදෙස් පැතූ විට, ඔබ ස්ත්‍රියක සමඟ විවාහ වී සිටින්නෙහි නම් ඇයගෙන් නිදහස් වන්නට නොසොයන්න. ඔබ ස්ත්‍රියක සමඟ විවාහ වී නැත්නම් භාර්යාවක නොසොයන්න. එහෙත් ඔබ විවාහ වූවත් එයින් ඔබට පාපයක් නැත. කන්‍යාවක විවාහ වූවත් එයින් ඇයට පාපයක් නැත. එසේ වුව ද එවැනි අයට මේ ලෝකයෙහි දුක් විපත් ඇති වන්නේ ය. මම ඔබ ඒවායින් වළක්වා ලීමට කැමැත්තෙමි. සහෝදරවරුනි, මේ දේ කියනු කැමැත්තෙමි. එනම් වැඩි කාලයක් ඉතිරි වී නැත..."[167]

ලෝකය පිළිබඳව, සැබැවින්ම මුළු විශ්වයම සහ එහි ඉරණම පිළිබඳව බුදුපියාණන් වහන්සේගේ සංකල්පනය ජේසුතුමාගේ මතයට සම්පූර්ණයෙන්ම සැම ආකාරයෙන්ම වෙනස් විය. ලෝකය හෝ විශ්වය දෙවියන්ගේ මැවීමක් යන මතය බුදුපියාණන් වහන්සේ පිළිගත්තේ නැත, නමුත් ඊට වඩා ස්වභාවික ශක්තීන්, හේතු සහ ඵල යන ක්‍රියාවලියක් හරහා ඇතිවූ පැවැත්මක

සංසිද්ධියකි. විශ්වයට නිශ්චිත ආරම්භයක් හෝ අවසානයක් නැත. බුදුපියාණන් වහන්සේ කල්ප ගණන් විනාශ සහ ප්‍රතිසංස්කරණ හටගනිමින් පැවතී නිමාවක් නොමැති චක්‍රය ''ලෝක පද්ධති" (චක්කවාළ) යනුවෙන් හැඳින්වූ අතර උන්වහන්සේ එය දුටුවහ.'' ඉක්මණින් හෝ පසුවී අතිවිශාල කාලසීමාවකට පසු මෙම විශ්වය සංකෝචනය වන අවස්ථාවක් එළඹේ (සංවත්තති)... ඊට පසු ඉක්මනින් හෝ පසුවී, අතිවිශාල කාලසීමාවකට පසු මෙම විශ්වය ප්‍රසාරණය වන අවස්ථාවක් ඇත (විවත්තති)."[168]

මෙම කැඩී බිඳී යාම හෝ ප්‍රතිසංස්කරණය සිදුවන කාලසීමා ඇතිවන්නේ කොපමණ කාලයකට වරක් ද කියා විමසූ විට, උන්වහන්සේ පැවසුවේ කල්පයකින් බවය. කල්පයක් කෙතරම් කාලයක් ද කියා විමසූ විට උන්වහන්සේ පිළිතුරු දුන්හ: ''අවුරුදු ගණන් කරමින්, ශතවර්ෂ ගණන් කරමින් හෝ සහස්‍ර වර්ෂ ගණන් කරමින් ගණනය කිරීම පහසු නොවේ." ඊට පසු උන්වහන්සේ මෙම උපමාව දුන්හ. ''අවුරුදු සියයකට වරක් මිනිසකු විශාල ගල් සහිත කඳු මුදුනකට එක් වරක් පට රෙද්දකින් පහර දුන්නේ නම්, කල්පයක් ගෙවීමට පෙර එම කන්ද ගෙවී යයි."[169] ලෝකය හෝ විශ්වය දෙවියන්ගේ අභිමතයක ප්‍රතිඵලයක්, දෙවියන්ගේ බලය ඔවුන් සැලකිල්ලට නොගැනීම හෝ ඔවුන්ට මැදිහත් වූ බවක් හෝ දෙවියන් ඔවුන් විනාශ කරන්නට තැත් කළ බවක් බුදුපියාණන් වහන්සේ පැවසූ බවට මෙහි වෙනත් තැනක යෝජනාවක් නැත.

## විමුක්තිය සහ පුබුදුවීම

ජේසුස්වහන්සේ විශ්වාස කළ දෙවියන් වහන්සේගේ රාජ්‍යය වූ පැරණි ලෝකය දෙවියන් වහන්සේ විසින් විනාශ කිරීමෙන් පසු යුතෝපියානු රාජ්‍යයකින් ආදේශ වන්නට ඇත, මෙය දෙවියන් වහන්සේ ඉදිරියේ සදාකාලිත්වය සඳහා අධික ප්‍රීතිමත් පැවැත්මක් ඇති ස්ථානයකි. කෙසේ නමුත්, මුළු ලෝකයම එහි ස්වභාවික චමත්කාරය සහ මිනිසුන් ඉෂ්ට කරගෙන ඇති, ආදරය කර ඇති සියලු දේ සමඟ ප්‍රචණ්ඩ විනාශයක් ඇතිවෙන බවට ඇති දෘෂ්ටිය ඉතා ප්‍රබල අසුබවාදී ප්‍රතිෂේධාත්මක එකකි. මෙම දරුණු දෘෂ්ටියට එකතු කරමින්, දෙවියන් වහන්සේගේ රාජ්‍යයේ ප්‍රචණ්ඩ සිද්ධියෙන් නොමැරී ජීවත්වී සතුටු වීමට අවස්ථාව ලැබෙන්නේ ඉතාම සුළු

පිරිසකට පමණක්ය යන ජේසුස්වහන්සේගේ මතභේදයට භාජනවූ කාරණයකුත් තිබුණි. "පටු දොරටුවෙන් ඇතුල් වන්න. විනාශයට යන දොරටුව විශාල ය, පාරත් පළල් ය. එයින් ඇතුල් වන්නෝ ද බොහෝ ය. එහෙත්, ජීවනයට යන දොරටුව පටු ය; පාර ද අවහිර ය; එය සොයාගන්නෝ ස්වල්ප දෙනෙක් පමණකි.",[170] සහ වැඩිදුරටත් "... පටු දොරෙන් ඇතුල් වන්නට වීර්ය කරන්න. මන්ද, බොහෝ දෙනෙක් ඇතුල් වන්නට සොයන නමුත් ඔවුන්ට නොහැකි වේය යි මම ඔබට කියමි."[171]

පැහැදිලිව පෙනෙන ආකාරයට, ජේසුස්වහන්සේ සහ ඔහුගේ සුවිශේෂී දේවවාක්‍ය විමුක්තිය සඳහා පොරොන්දුවක් නොවේ. " ස්වර්ගයෙහි වැඩ වසන මාගේ පියාණන් වහන්සේගේ කැමැත්ත ඉටු කරන අය මිස මට, 'ස්වාමිනී'යි කියන සියල්ලෝ ම ස්වර්ග රාජ්‍යයට ඇතුල් නොවන්නෝ ය. ඒ දවසේ දී බොහෝ දෙනකු, 'ස්වාමිනී, ස්වාමිනී අපි ඔබේ නාමයෙන් දිවැස් වැකි නොකීවෙමු ද? ඔබේ නාමයෙන් යක්ෂයන් දුරු නොකෙළෙමුද? ඔබේ නාමයෙන් නොයෙක් ප්‍රබල ක්‍රියා නොකෙළෙමු දැ' යි මට කියනු ඇත. එවිට මම, 'කිසි කලක ඔබ නොහැඳින්නෙමි; දුදනෙනි, මා වෙතින් අහක් ව යන්නැ' යි ඔවුන්ට කියන්නෙමි."[172] ජේසුස්වහන්සේගේ ජ්‍යෙෂ්ඨ අපෝස්තල් සහ මුල්කාලීන දේවස්ථානයේ නායකයා වූ පීටර්, මෙය ලිවීම සඳහා එතරම් දුරට ගියේයඃ "ශුද්ධලියවිල්ලේ කියා ඇති පරිදිඃ ''ධර්මිෂ්ඨයකුට ගැලවීම දුෂ්කර වේ නම්, අභක්තිකයාට ද පාපිෂ්ඨයාට ද කිමෙකින් කිමක් වෙයි ද?"[173] අපෝස්තල් ජෝන්ට දෙවියන් වහන්සේ සැබැවින්ම බේරාගත හැකි මිනිසුන් ප්‍රමාණය හෙළි කළේය; 144,000 ප්‍රමාණයක්.[174] අනෙක් අය සම්බන්ධයෙන්, භයානක ඉරණමක් බලාපොරොත්තුව සිටී.

කොපමණ පුද්ගලයන් ප්‍රමාණයක් නිර්වාණය අවබෝධ කර ගනීද කියා බුදුපියාණන් වහන්සේගෙන් විමසූ විට, උන්වහන්සේ පිළිතුරු දීම ප්‍රතික්ෂේප කළහ. ප්‍රශ්නය අදාළ නොමැති බවට සලකමින් උන්වහන්සේ දෙවතාවක් එක දිගට එසේ කළහ. ප්‍රශ්න කරන්නා කළකිරීමට පත්වී යන්නට යයි සිතමින් බුදුපියාණන් වහන්සේ වෙනුවට ආනන්ද ස්වාමින් වහන්සේ ප්‍රශ්නයට පිළිතුරු දුන්හ. නගරයක් එක් ගේට්ටුවකින් සහ ශක්තිමත් තාප්පයකින් වටවී තිබේ

නම්, නගරයට ඇතුළුවන ඕනෑම පුද්ගලයකු එම ගේට්ටුවෙන් ඇතුළු වීමට සිදුවෙන බව ආනන්ද හිමියෝ පැවසූහ. උන්වහන්සේ ඊළඟට පැවසුවේ නිර්වාණය අවබෝධ කරගත් ඕනෑම පුද්ගලයකුද ආර්ය අෂ්ටාංගික මාර්ගය අනුගමනය කරමින් එසේ කරන බවය.[175] තමන්වහන්සේගේ ඉගැන්වීම් ''අනිත් අයගේ ඉගැන්වීම්වලට වෙනස්" සහ ''නොමඟ ගිය බොහෝ පුද්ගලයන්" සිටින බවද පවසමින්, තමන් වහන්සේගේ දහස් ගණන් ශ්‍රාවකයන් සම්පූර්ණයෙන් නිර්වාණය අවබෝධය අනිවාර්ය කරන එක් හෝ තවත් පියවරයන්ට (මර්ගඵල වලට) පත්වී ඇති බව බුදුපියාණන් වහන්සේ පවසා සිටියහ.[176] නිර්වාණය අවබෝධ කරගැනීමට තිබෙන දුෂ්කරතාව පිළිබඳව උන්වහන්සේගේ හැඟීම් ගැන කිසිම සැකයක් නැති බවට සුමේධා තෙරණිය විසින් ඉතා හොඳින් කැටිකොට දැක්වූ මෙම අදහසින් පැහැදිලි වේඃ "බොහෝ දෙනා අමරණීයත්වයට පත්වී ඇත, එසේම උත්සාහ කරන්නන්ට අදත් පත්විය හැකිය. නමුත් උත්සාහ නොකරන්නන්ට එසේ කළ නොහැකිය."[177]

## ධනසම්පත්

ප්‍රධාන වශයෙන්ම නිහතමානී, නොසලකා හරින ලද සහ යටහත්පහත්, යන සුළු පිරිසක් පමණක් ගලවා ගත හැකි බව ජේසුස්වහන්සේට නිසැක වූ අතර, සැබැවින්ම ධනවත් පුද්ගලයන්ට එය නොහැකි බව ඔහු ඉගැන්වූයේය. "දරුවෙනි, දෙවියන් වහන්සේගේ රාජ්‍යයට ඇතුල් වීම කොතරම් දුෂ්කර ද? ධනවතකුට දෙවියන් වහන්සේගේ රාජ්‍යයට ඇතුල් වීමට වඩා ඔටුවකුට ඉදිකටු මලින් රිංගා යාම පහසු ය."[178] දෙවියන් වහන්සේගෙන් ඔහුට ලැබී ඇති දූත මෙහෙවර විශේෂයෙන් දුප්පතුන් වෙනුවෙන්ය (echrisen me euangelisasthai ptochois)[179] ධනය මිනිසුන් කෑදර සහ අහංකාර බවට පත් කරන අතර තමන්ගේ මිතුරන් සහ ඔවුන්ගේ ආධ්‍යාත්මික ලුහුබැඳ යාම් සාවද්‍ය ලෙස සලකන බව ඔහු දැන සිටි අතර, ඒ පිළිබඳව බොහෝ අවස්ථාවල පෙන්වා දුන්නේය. කෙසේ නමුත්, ජේසුස්වහන්සේගේ ආකල්පය මින් ඔබ්බට ගොස්, පොහොසතුන් හුදෙක්ම පොහොසතුන් වීම, දෝෂාරෝපණයට හේතුවිය. ජේසුස්වහන්සේ

ඔහුගේ කුරිරුතම වචන පළමුව ආත්ම වංචනිකයන්ට සහ ඊළඟට ධනවතුන්ට වෙන්කළ බව එක් වරකට වඩා මත ප්‍රකාශ වී තිබේ.

ධනවත් මිනිසකු මිය ගොස් නිරයට යෑමත්, කෑමට යමක් ලැබෙන තුරු තමන්ගේ දොර ළඟ සිටි දුප්පත් මිනිසකු මිය ගිය විට දේවදූතයන් ස්වර්ගයට ගෙන යාමේ කථාවක් ජේසුස්වහන්සේ කිව්වේය. නිරයේ දරුණු බලවත් වේදනා අත්විඳිමින්, ධනවත් මිනිසා ඒබ්‍රහම්ගෙන් අනුකම්පාව අයැදි අතර, ඒබ්‍රහම් සමග ස්වර්ගයේ සිටින දුප්පත් මිනිසාගෙන් ධනවත් මිනිසා පිපාසය සංසිඳුවීමට ජලය බිඳක්වත් ඉල්ලා සිටියේය. ඔවුහු (ඒබ්‍රහම් සහ දුප්පත් මිනිසා) (නිරයේ සිටින පොහොසත් මිනිසා) තමන්ගේ සොහොයුරන්ට තමන් මෙන් දුප්පතුන්ට නොසලකා නොහරින ලෙසට අවවාද කරමින් පණිවුඩයක් යවන ලෙස කරන ලද ඉල්ලීමද ප්‍රතික්ෂේප කළහ. ඉල්ලීමටත් අකැමැත්ත ප්‍රකාශ කළහ.[180] මෙය කරදරකාරී උපමා කථාවකි. දුප්පත් මිනිසා විශේෂයෙන්ම ගුණවත් පුද්ගලයකු බවට ඉඟියක් නැත; ඔහු මුදවා ගැනීමට තිබූ එකම දේවප්‍රසාදය වූයේ ඔහුගේ දුප්පත්කමයි. ධනවත් මිනිසා ඔහුගේ කොටස සම්බන්ධයෙන්, සමහර විට ඔහුගේ අනුකම්පා විරහිත බව සහ නොසලකා හැරීම් පිළිබඳව දෝෂාරෝපණයට දඬුවම් ලැබීමට සහ තදින් දොස් පැවරීමට පවා සුදුසු වේ. නමුත් ඔහු සදාකාලික දඬුවමකට සුදුසුද? මේ සියල්ල අතරින් වඩාත් අප්‍රසන්න දෙය නම් මෙම කථාව තුළ අනුකම්පාවක් නැතිවීමයි; ධනවත් මිනිසා දයාව ඉල්ලූවිට ඒබ්‍රහම් සහ දුප්පත් මිනිසා දැක්වූ ප්‍රතිචාරය තරහ දනවනසුලු සහ පළිගන්නාසුලු බව හඟවයි.

ධනවතුන් පිළිබඳව ජේසුස්වහන්සේ කළ වෙනත් බොහෝ ප්‍රකාශ එයම යෝජනා කරයි. "අහෝ, ධනවත් ඔබට වන විපතක මහත! ඔබේ සැපවත් ජීවිතය ඔබ විඳ හමාරය. අහෝ, දැන් පුෂ්ටිමත් ව සිටින ඔබට වන විපතක මහත! ඔබට සාගිනි දැනෙනු ඇත. අහෝ දැන් සිනාසෙන ඔබට වන විපතක මහත! ඔබ හඬා වැළපෙනු ඇත."[181] ජේසුස්වහන්සේ අනුගමනය කරමින් ඔහුගේ අපෝස්තල්වරු ද සමාන ආකල්පයක් දැරූහ. "දැන් ඉතින් ධනවතුනි, ඔබ පිට පැමිණෙන්නට තිබෙන අවාසනාවන්ත ඉරණම ගැන හඬා වැළපෙන්න. ඔබගේ ධන ධාන්‍ය දිරාගොස් ඇත,

ඔබගේ වස්ත්‍ර කාවුන් කා දමා ඇත; ඔබේ රන් රිදී මලකඩ කා ඇත; ඒ මලකඩ ඔබට විරුද්ධව සාක්ෂියක් වී, ගින්නක් මෙන් ඔබගේ මාංශ කා දමනු ඇත. ඔබ වස්තු ගොඩගසා ඇත්තේ නිමවේගන යන යුගයක ය."[182] නැවතත් : "පීඩිත තත්ත්වයක සිටින සහෝදරයා තමා උසස් කරනු ලැබීම ගැන ද, ධනපතියා තමා පහත් කරනු ලැබීම ගැන ද උදන් අනාවි. මන්ද, ධනවතා තණ මලක් මෙන් පහ ව යන්නේ ය. දැවෙන හිරු කිරණින් තණ කොළ වියළී යයි; ඒවායේ මල් පෙති වැටී යයි. එහි සෞන්දර්යය පහවී යයි. එලෙස ම ධනවතා සිය කටයුතුවලදී නැත්තට ම නැති වී යයි."[183] දෙවියන් වහන්සේ සැම දෙනාටම ආදරය කරනු ලබන බව කියයි. නමුත් ඔහුට දුප්පතුන් වෙනුවෙන් ධනවතුන්ට වඩා ආදරයක් තිබුණි. ජේසුස්වහන්සේ සහ ඔහුගේ අපෝස්තල්වරු ද එසේම සිතුහ." මාගේ ප්‍රේමවන්ත සහෝදරයෙනි, සවන් දෙන්න, ඇදහිල්ලෙහි ධනවතුන් වනු පිණිසත්, දෙවියන් වහන්සේට ප්‍රේම කරන්නන් හට පොරොන්දු වූ රාජ්‍යයේ උරුමක්කාරයන් වන පිණිසත්, උන්වහන්සේ ලෝකයේ දිළිඳුන් තෝරා ගත්තේ මක්නිසාද?"[184] ජේසුස්වහන්සේගේ මව වූ මේරි දෙවියන් වහන්සේ පිළිබඳව මෙසේ පැවසුවාය : "සාගිනි වූවන් යහපත් දෙයින් සතප්වා, ධනවතුන් හිස් අතින් හරවා යැවූ සේක."[185] සියල්ල හෝ කිසිවක් නැති ප්‍රවේශයකින් යුක්ත ගතිලක්ෂණයකින්, ඇත්තේ තෝරා ගැනීම් දෙකක් පමණක් බව - දෙවියන් වහන්සේ හෝ ධනසම්පත් බව ජේසුස්වහන්සේ ප්‍රකාශ කළේය.[186] ඔහුට අනුව, උත්සාහ කිරීමට සුදුසු එකම ධනසම්පත ස්වර්ගය පමණි. "කුඩා රැළ, භය නොවන්න, ඔබට රාජ්‍යය දෙන්නට ඔබගේ පියාණන් වහන්සේ සැදී පැහැදී සිටින සේක. ඔබ සතු දේ විකුණා දන් දෙන්න; නොදිරන පසුම්බි ද නොපිරිහෙන වස්තු ද ස්වර්ගයෙහි ඔබට සපයාගන්න. එහිදී ඒවාට සොරු ළං නොවෙති, කාවෝ ද නාස්ති නොකරති. මන්ද, ඔබගේ වස්තුව කොතැන ද, ඔබගේ සිතත් එතැනම ය."[187]

එක් අතකින් දුප්පතුන් පිළිබඳව කරන ලද එම ඉගැන්වීම් වරප්‍රසාද නොලත් අයට සැලකීම සහ අනුකම්පාව දැක්වීමට දිගුකාලීනව පැවත ආ ක්‍රිස්තියානි විශ්වාස රටාව වූ අතර, සමහර විට, ක්‍රිස්තියානි ධර්මය විහිදී පැතිර ගිය සමාජවල විශිෂ්ටතම දායකත්වයයි, මෙය අනෙක් අයත් අනුගමනය කළ යුතු

උදාහරණයකි. අනෙක් අතට දරිද්‍රතාවය දුප්පතුන් උද්දීපනය කරන්නකි. ලූක්ගේ සුවිශේෂ දේවවාක්‍යයේ ජේසුස්වහන්සේ පැවසූ බවට සඳහන් ව ඇත්තේ රෝගීන්ට ඔබගේ උත්සව සහ වෙනත් වැදගත් සමාජ සිදුවීම්වලට ආරාධනය කරමින් උඩුයටිකුරු කිරීම ඔබගේ පවුලේ සාමාජිකයන්ට හෝ ඔබගේ මිතුරන්ට සහ අසල්වැසියන්ට ආරාධනය කිරීමට වඩා ආශීර්වාදයක් බවය.[188] (14,7-14)

ඉතා සුළු පිරිසක් කවරදා නමුත් එසේ කරන්නේ හෝ කර ඇත්තේ යන කාරණය හැරුණු විට, දුප්පතුන් ගැන නිතරම සිතීම, දුප්පතුන් සෑම දෙයකටම ඇතුළත් කිරීම, අන් සියල්ලන්ට වඩා දුප්පතුන් අගය කිරීම අවශ්‍යද? අනෙක් අයට මෙන්ම දුප්පතුන්ට ලෝභය, සාමාන්‍ය ලෙස ධෛර්යය, වංකබව සහ ද්වේශය ඇතිවන්නට හැකියාවක් නැද්ද?

ධනසම්පත් පිළිබඳව මෙම ඉගැන්වීම්වලට අනුව, සහ සිදුවීමට ඉතා ආසන්න ලෝක අවසානය බලාපොරොත්තුවෙන්, පළමු ක්‍රිස්තියානීහු තමන්සේ සියලු දේපල අලෙවි කර, මුදල් එක්රැස් කර ඔවුන් අතර සමානව බෙදා ගත්හ. "එකල සැදැහැවත් සමූහයා එක්සත් ව, එක්සිත් ව සිටියාහ; තමන් සතු දෙයින් කිසිවක් තමාගේ ම යයි කිසිවෙක් නොකීහ; සියල්ල පොදුවේ තබාගත්හ. ස්වාමීන් වන ජේසුන් ක්‍රිස්තුන් වහන්සේගේ පුනරුත්ථානය ගැන ප්‍රේරිතයෝ ප්‍රබල ලෙස සාක්ෂි දුන්හ. ඔවුන් සියල්ලන් කෙරෙහි දේව වරප්‍රසාදය බහුලව පැවතිණි. අග හිඟ ඇති කිසිවෙක් ඔවුන් අතරේ නොවූහ. මන්ද, වතුපිටි හෝ ගෙවල් හෝ අයිතිකරුවෝ ඒවා විකුණා එයින් ලත් මුදල් ගෙනැවිත්, ප්‍රේරිතයන්ගේ පා මුල තැබූහ. ඒ මුදල් එකෙකාගේ වුවමනාවේ හැටියට බෙදා දෙන ලදී."[189] "තමන් සතු දෙයින් කිසිවක් තමාගේ ම යයි කිසිවෙක් නොකීහ, නමුත් ඔවුහු තමන් සතු සියලු දේ එකිනෙකා අතර බෙදා ගත්හ... අවශ්‍යතා තිබූ කිසිවකු කණ්ඩායම අතර නොවීය. ඉඩම් හෝ ගෙවල් හිමි අය ඒවා අලෙවි කර ඒවායෙන් ලැබූ මුදල් අපෝස්තල්වරුන්ට භාර දුන්හ; ඒවා මිනිසුන්ගේ අවශ්‍යතාවන්ට අනුව බෙදා දෙන ලදී."[190] (Acts 4,32)

තත්ත්වාරෝපිත සාමාන්‍ය පැවැත්ම අසතුටුදායක (දුක්ඛ) බව සහ සියලු උත්සාහයන්ගෙන් වඩාත් වැදගත් වන්නේ ලෝකෝත්තර වීම

බව බුදුපියාණන් වහන්සේ සැලකිල්ලට ගත්හ. ජේසුස්වහන්සේගේ සුවිශේෂී දේවවාක්‍යවල තිබූ දැඩි සංවේදිතාවෙන් යුක්ත ඉතා හදිසි ගතිලක්ෂණ බුදුපියාණන් වහන්සේගේ ඉගැන්වීම්වල ප්‍රදර්ශනය වූයේ නැත. බුදුපියාණන් වහන්සේට අනුව ලෝකය විනාශයක මායිමේ නැත. එසේම උන්වහන්සේගේ නැවත ඉපදීම පිළිබඳ ධර්මයෙන් අදහස් වන්නේ මෙම ජීවිතයේදී නිර්වාණය අවබෝධ කරනොගත් අයට ඊළඟ භවයේදී, හෝ නොඑසේ නම් ඊට පසු ආත්මයේදී හෝ එසේ කරගැනීමට අවස්ථාව තිබෙන බවය. බොහෝ දෙනා ''ලෝකයේ" ජීවත් වන්නට යන බව පිළිගෙන, බුදුපියාණන් වහන්සේ එයම හේතුවක් ලෙස දක්වමින් උන්වහන්සේගේ ධර්මයට ධාර්මිකව එසේ කරන්නේ කෙසේද කියා නිවැරදි, ප්‍රායෝගික සහ යථාර්ථවාදී අවවාද ඉදිරිපත් කළහ. බුදුපියාණන් වහන්සේ වැදගත් සහ පිළිගත හැකි සතුටු වර්ග ලෙස සැලකූ ඒවා නම් අයිතිය පිළිබඳ සතුට (අත්ථිසුඛ), ධනය පිළිබඳ සතුට (භෝගසුඛ), ණය බරින් නිදහස් වීම පිළිබඳ සතුට (අණනසුඛ) සහ නිවැරැදි බව පිළිබඳ සතුට (අනවජ්ජසුඛ) ය.[191] බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහඃ "නීත්‍යානුකූල ලෙස සහ අනෙක් අයට හිංසා නොකරමින් ධනය උපයමින්, තමන් සතුටට සහ තෘප්තියට පත් කරමින්, ඒවා අනෙක් අය සමඟ බෙදා හදා ගනිමින්, යහපත්ව ක්‍රියා කරයි ද, ලෝභයක් නොමැතිව, මෝහයෙන් මුළා නොවී, එහි සීමාවන් දනිමින් සහ තමන්ගේම ආධ්‍යාත්මික වර්ධනය සිතෙහි තබා ගනිමින් පුද්ගලයකු ධනය භාවිත කරයි ද; (පුඤ්ඤානි කරෝති) එම පුද්ගලයා මෙම සියලු සලකා බැලීම්වලදී ප්‍රශංසා කටයුතු වේ."[192] මෙහිදී බුදුපියාණන් වහන්සේ පැවසුවේ ධනවත් පුද්ගලයන් ඔවුන් ධනය ලබා ගත් ආකාරය, ඔවුන් ඒවා භාවිත කළ ආකාරය, සහ ඒ පිළිබඳව ඔවුන්ට ඇති ආකල්පයට අනුව, ඔවුන් ප්‍රශංසා (පාසංසො) කටයුතු විය හැකි බවය. ඉතා අවංක පුද්ගලයකු තමන්ගේ ධනය නීත්‍යානුකූල (ධම්මේන), අයුරින් වෙනත් අයට හිංසා නොකරමින් (සංවිභජති) සහ සමාජයේ සම්මතයන් සහ ප්‍රමිති උල්ලංඝනය නොකරමින් ඉපයිය යුතුය. ධනය ඉපයීමෙන් පසු, ඔවුන් එය නිරර්ථක ලුහුබැඳ යාම්වලට, නිකරුණේ නාස්ති කිරීමට හෝ සුලබ සුඛෝපභෝගය සඳහා හෝ එය කොහෙත්ම වියදම් නොකිරීමට වඩා තේරුමක් ඇතිව සහ තමන්ට සතුට සහ තෘප්තියක් ඇතිවන අයුරෙන්

(අත්තානං සුඛේති පීණෙති), භාවිත කළ යුතුය. තමන් සතුටුවන අතරදීත්, තමන්ට ලැබී ඇති සැපත අහිමි බොහෝ දෙනා කිසි දිනක ඔවුන් අමතක නොකළ යුතු අතර, තමන්ගේ ධනය අනෙක් අය සමඟ බෙදා ගනිමින් පුණ්‍යායතන සහ ආගමික ආයතන වලට ද උපකාර කළ යුතුය. පුද්ගලයකු තමන්ගේ ආර්ථික සම්පත් කොටස් හතරකට බෙදා එක් කොටසක් දිවි පැවැත්මේ වියදම්වලට භාවිතයටත්, කොටස් දෙකක් තමන්ගේ වැඩ රාජකාරිවලට හෝ ආයෝජනවලට සහ එක් කොටසක් අනාගත අවශ්‍යතාවනටත් වෙන් කළ යුතු බව තවත් අවස්ථාවකදී බුදුපියාණන් වහන්සේ උපදෙස් දුන්හ.[193] මේ සමඟ සසඳන විට ජේසුස්වහන්සේගේ ධනවත් මෝඩයා පිළිබඳ උපමා කථාව සම්පූර්ණ වෙනස් වෙයි. එය මූලික ආරක්ෂාව සහ හුදෙක් සැපපහසුව පමණක් සැලකිල්ලට ගෙන වුවත්, ධනසම්පත් අත්පත් කරගැනීම පිළිබඳ පැහැදිලි අධෛර්යමත් කිරීමකි..[194] තිමති එම කාරණයම තමන්ගේ පළමු සන්දේශයේ සඳහන් කර ඇත. "ධනවත් වීමට ආශා වන්නෝ පරීක්ෂාවලටත්, උගුල්වලටත්, අසු වන්නෝ ය. නාස්තියටත්, විනාශයටත් පමුණුවන, නොයකුත් මෝඩ නිෂ්ඵල තෘෂ්ණාවන්ට, ඔවුහු වසඟ වන්නෝ ය." [195]

ණයබරින් යුක්ත වීම හෝ ප්‍රමාණවත් මූල්‍යමය සම්පත් නොමැති වීම අපහසුවක් පිළිබඳ සිතුවිලි ඇතිවීමට ප්‍රභවයක් බව බුදුපියාණන් වහන්සේ දැන සිටියහ. එම නිසා තර්කානුකූල හෝ සාක්ෂ්‍යමය ආධාරකයක් සමඟින් විශ්වාස කිරීමෙන්, සම්භාවිතාවන්, අනුමානයන් සහ කරුණු සැලකිල්ලෙන් තක්සේරු කිරීමෙන් විශ්වාසය වැඩෙන බව උන්වහන්සේ තමන්වහන්සේගේ ශ්‍රාවකයන් හට අවවාද කළහ. මෙසේ පවත්වා ගෙන යාම සමතුලිත ජීවනරටාවක් ලෙස (සම ජීවිකං) ලෙස උන්වහන්සේ හැඳින්වූ සේක. "සමතුලිත ජීවනරටාවක් යනු කුමක්ද? යම් කෙනකු තමන්ගේ ආදායම සහ වියදම යන දෙකම දකිමින් පමණ ඉක්මවා වැය නොකරමින් සහ මසුරු කමින් තොරව ජීවත් වෙමින්, වියදම්වලට පසු ආදායම එක් විශේෂ ප්‍රමාණයකදී නතර වන නිසා ආදායම ඉක්මවා වියදම් නොකළ යුතු බව හොඳින් දනිමින් කටයුතු කිරීමය."[196]

ජේසුස්වහන්සේගේ සුවිශේෂ දේවවාක්‍ය පැතිර ගියේ එහි මුල්කාලීන දශකවලදී ය. ඒ ධෛර්ය සම්පන්න සහ තීරණාත්මක අනුබල දෙන්නන් පිරිසක් නිසාය. ඔවුන්ගෙන් ඉතා වැදගත් පුද්ගලයා පෝල්ය. බුදුපියාණන් වහන්සේගේ පරිනිර්වාණයෙන් පසුව, උන්වහන්සේගේ භික්ෂු - භික්ෂුණීන් මධ්‍යම දේශයෙන් ඔබ්බට ධර්මය බෙදා හැරිය අතර, ධනවත් ව්‍යාපාරිකයන්ගෙන් ලැබුණු සහයෝගය අතරින්, දන්නා හොඳම උදාහරණය අනාථපිණ්ඩික සිටුවරයායි. එය ඔවුන්ගේ සාර්ථකත්වයේ ඉතාම වැදගත් කරුණයි. බුදුපියාණන් වහන්සේගේ ධර්මය, ධනවතුන් ඇතුළුව සැමදෙනාටම සබඳතාවක් සහ ආකර්ෂණයක් ඇති කරවන්නක් විය.

ධනයට, (විශේෂයෙන්ම ධනය ලැබුණේ හදිසියේ හෝ ස්වල්ප උත්සාහයකින් නම්), මිනිසුන් අහංකාර සහ තැකීමෙන් තොර අය බවට පත් කිරීමට නැඹුරුවක් තිබේ. බුදුපියාණන් වහන්සේ මෙසේ ප්‍රකාශ කළහ: "විශාල ධනයක් උපයා ගත් විටත් එයින් ගිලිහී නොයන්නේ, සැලකිලිමත් වන්නේ, ඉඳුරන් පිනවීම මතම හඹා නොයන්නේ සහ අනෙක් අයට අයහපත් ආකාරයට නොසලකන්නේ, ලෝකයේ මිනිසුන් අතර සුළු පිරිසකි."[198] මෙම අනතුරු හැඟවීම මතක තබා ගනිමින්, කල්පනාකාරී ශ්‍රාවකයන් තමන්ගේ ධනය පිළිබඳ සීමාව (ආදීනවදස්සාවී) සිහියේ රඳවා ගතයුතු බව බුදුපියාණන් වහන්සේ වදාළහ. සමහර අංශවලින් ධනයට ඔවුන්ට බොහෝ දේ දිය හැකි නමුත්, ජීවිතයේ බොහෝ වැදගත් දේ ලබා දිය නොහැකි බව ඔවුන් දැනගත යුතුය, මෙම දැනගැනීම ලෝභයෙන්, ඇල්මෙන් හෝ දැඩි ආශාවෙන් (අමුච්ඡිත) තොරව, තමන්ගේ ධනය භාවිතයට ධෛර්යමත් කරයි. ඔවුන් තමන්ගේ කාලය, නිදහස සහ අවස්ථා, ඔවුන්ගේ ආධ්‍යාත්මික ගුණවගාව (නිස්සරණපඤ්ඤා) සඳහා යොමුකරන්නේ නම්, ඔවුන් සතු ධනයට ඊටත් වඩා වැඩි වටිනාකමක් ඇතිවන බව ද අවබෝධ කරගත යුතුය.

ධාර්මිකව උපයාගත් සහ කල්පනාකාරීව භාවිතා කළ ධනය වර්ණනා කරමින්, අගයෙන් වැඩි, සියලු දෙනාට ප්‍රවේශ විය හැකි, කිසිදිනක සොරකම් කිරීමට නොහැකි හෝ අහිමි නොවන සහ ඊළඟ භවයට ගෙන ගිය හැකි තවත් වර්ගයක ධනයක් අවධානයට

ලක් කරමින් බුදුපියාණන් වහන්සේ සැමවිටම එය තුලනය කළහ. " මෙවැනි පස් ආකාර ධනයක් ඇත, ඒ පහ මොනවාද? සම්පූර්ණ විශ්වාසය නමැති, ධනය ගුණ යහපත්කම නමැති ධනය, ඉගෙනීම නමැති ධනය, ත්‍යාගශීලිබව නමැති ධනය සහ ප්‍රඥාව නමැති ධනයයි." (සද්ධා, සීල, සුත, චාග, පඤ්ඤා)[199] මෙම සහ වෙනත් වර්ගයේ ආධ්‍යාත්මික වස්තූන්ගෙන් 'ධනවත්' ඕනෑම කෙනකු "පුරුෂයකු හෝ කාන්තාවක හෝ වේවා, ඔවුහු දුප්පත් හෝ ඔවුන්ගේ ජීවිත හිස් නොවේ."

## සමස්තයක ලා සැලකීම සහ සුවිශේෂ වීම

සමස්තයක ලා සැලකීම "එක් විශේෂ ආගමික සිතුවිලි ප්‍රකාරයක් පමණක් (නම් වශයෙන් තමන්ගේම) වලංගු, අනෙක් සියල්ල අසත්‍ය යන අදහස; සුවිශේෂ වීම "තමන්ගේ විශ්වාසය පූර්ණ සත්‍ය ලෙසත්, නමුත් මෙම සත්‍ය කෙසේ නමුත් අර්ධ වශයෙන් වෙනත් විශ්වාසවල පිළිබිඹු වී තිබෙන බවට ඇති අදහස", සහ බහුත්වවාදය ''ලෝකයේ උසස් විශ්වාස සහ සංකල්පවල විවිධ මත සහ සත්‍යයට හෝ පරම සිද්ධාන්තයට අනුරූපී නොවන වෙනස් ප්‍රතිචාර අන්තර්ගත වී ඇතැයි යන අදහස" ලෙස ප්‍රසිද්ධ දේවධර්මධර, ජෝන් හික් නිර්වචනය කර ඇත. හික්ගේ නිර්වචන හොඳ ඒවා යැයි මම සිතමි. බුදුපියාණන් වහන්සේ ඉගැන්වූයේ සමස්තයක ලා සැලකීමය.

පැහැදිලිවම, බුදුපියාණන් වහන්සේ මුළු විශ්වයටම පළමු ආගමික සර්වවිශ්වීය පුද්ගලයා වූ අතර, එක් විශේෂ කුලයකට, ලිංගයකට හෝ ජනවාර්ගික කණ්ඩායමකට නොව, සියලු මානව වර්ගයටම යථාර්ථයක් සහ ජීවන දර්ශනයක් උගැන්වූහ. තමන්වහන්සේ ''දෙවිවරුන්ගේ සහ මිනිසුන්ගේ ගුරුවරයා" (සත්ථා දේවමනුස්සානං) ලෙස උන්වහන්සේ හැඳින්වූ සේක, එනම් තර්කනය සහ අවබෝධ කර ගැනීමේ හැකියාව ඇති සියලු සත්ත්වයන්, ධර්මය වැළඳ ගන්නා බව බුදුපියාණන් වහන්සේ අතිශෝක්තියෙන් පැවසූහ, ''එසේ නම් මිනිසුන් ඊට වඩා කෙතරම් ද! "[200]

බුදුපියාණන් වහන්සේ තමන් වහන්සේගේ පළමු ශ්‍රාවකයන් බිහි කිරීමෙන් පසු, "බොහෝ දෙනාගේ යහපත පිණිස, බොහෝ දෙනාගේ සතුට පිණිස, ලෝකය කෙරෙහි කරුණාවෙන්"[201] ඔවුන්ට

ධර්මය ප්‍රසිද්ධ කරන ලෙස උපදෙස් දුන්හ. මෙම විශ්වීයත්වය එකල ඕනෑම ස්ථානයක සමාජයෙන් පිටමං කළ තැනැත්තන් සහ විදේශිකයන් (මිලක්ඛ) බැහැර කළ බ්‍රාහ්මණ ආගමේ විශේෂත්වය සැලකිල්ලට ගැනීම විශේෂයෙන්ම වැදගත් විය. බුදුපියාණන් වහන්සේගේ ධර්මයේ ස්වභාවය ආගමික ඇතුළත්වීමට අගහිඟ නැතිව සහාය දෙයි. බුදුපියාණන් වහන්සේ තමන්වහන්සේ ධර්මය අවබෝධ කරගත්, පැහැදිලි කළ සහ ඉදිරිපත් කළ ආකාරය, නිර්වාණය අවබෝධ කර ගැනීමට එකම මාර්ගය ලෙස කිසි දිනක කියා නොසිටියහ. "පිටත ශ්‍රමණයෙක් නැත" (සමණො නත්ථි බාහිරේ)202 යන උන්වහන්සේගේ ප්‍රකාශය සුවිශේෂතාව හඟවන බව සමහර පුද්ගලයෝ තර්ක කළහ. එයට හේතුව බුදුදහමින් පිටත (බාහිර) කිසිවකුට සැබෑව සොයන්නකු විය නොහැකි බැවින්, නිර්වාණයට පැමිණිය නොහැකි බව ය. කෙසේ නමුත්, එම ප්‍රකාශයේ සම්පූර්ණයෙන්ම හා සැබැවින්ම කියන්නේ බුදුපියාණන් වහන්සේගේ භික්ෂු ශ්‍රාවකයන් හැර වෙනත් කිසිම භික්ෂුවක් හෝ භික්ෂුණියක් අව්‍යාජ ශ්‍රමණයන් වීමට නුසුදුසු බවය, එසේ පැවසීමට එකල තිබූ තත්ත්වය හොඳින්ම හේතු වන්නට ඉඩ ඇත.

වෙනත් නිකායන් සහ ආගම්වල අය නිර්වාණය අවබෝධ කරගෙන ඇත්ද කියා වරක් එක් විමසන්නකු බුදුපියාණන් වහන්සේගෙන් විමසූ විට උන්වහන්සේ මෙසේ පිළිතුරු දුන්හ: " සියලු ශ්‍රමණයන් සහ බ්‍රාහ්මණයන් උත්පත්තිය සහ මරණය යන ඇඳුමෙන් ආවරණය වී ඇතැයි මම නොකියමි. ඉඳුරන් පිනවීම, අත්විඳීම හෝ සදාචාරය සහ නීතිවලට නොඇලෙන, සැකය අත්හැරි, දැඩි ආශාව සහ කෙලෙසීම්වලින් නිදහස් ඕනෑම පුද්ගලයකු, එම පුද්ගලයා නිර්වාණය අවබෝධ කරගෙන ඇතැයි මම කියමි."203

ඒ අනුව බුදුපියාණන් වහන්සේගේ පිළිතුර යමකුට අවසාන විමුක්තියට පත්විය හැක්කේ උන්වහන්සේගේ ධර්මය තුළ සිටින කෙනකුට පමණක් බවත්ය. එය ස්ථිරව කරන ප්‍රකාශයක් නොවේ. ''එය අසම්භාව්‍යයකි.'' තවත් අවස්ථාවක එම ප්‍රශ්නයම ඇසූ විට, උන්වහන්සේ මෙසේ පැවසූහ: "වෙනත් අයටත් රහත්ඵලලාභීන් විය නොහැකි යයි මම නොකියමි." (න බො ... අරහත්තස්ස මච්ඡරියාමි).204 ඒ අතරම තවත් දේශනාවකදී, සමහර පුද්ගලයන්

ඔවුන් බුදුපියාණන් වහන්සේ කිසිදිනක නොදැක සහ උන්වහන්සේගේ ධර්මය නොඅසා නිර්වාණයට මඟ පෙන්වන ''වෙනස් කළ නොහැකි මාර්ගයට එළඹුණ බව" (ඔක්කමති නියාමං) කියමින් මෙම මතය ඊටත් වඩා පැහැදිලිව උන්වහන්සේ තහවුරු කළහ.205 වෙනත් මාර්ග පිළිබඳව බුදුපියාණන් වහන්සේ විවෘත ආකල්පයක් දැක්වීමට හේතුව වූයේ හුදෙක් උන්වහන්සේ ඒවා සම්බන්ධයෙන් ඉවසා දරා සිටි නිසා හෝ හොඳින් දැනුවත් වීම පමණක් නොව, සත්‍යයේ ස්වභාවය සහ එයට ලබාදිය හැකි විමුක්තිය පිළිබඳව උන්වහන්සේට තිබූ අවබෝධය නිසාය. බුදුපියාණන් වහන්සේ අවබෝධ කළ ආකාරයට, විමුක්තියට පත්වීම විශ්වාස කිරීම, දෙවිකෙනකුගේ අනුමැතියක් දිනා ගැනීමක් හෝ අනුග්‍රහයක් ලැබීම මත රඳා නොපවතියි. නමුත් සියලු දෙනාටම හැකියාව ඇති යයි උන්වහන්සේ විශ්වාස කළ නිශ්චිත ස්වභාවික සත්‍යයන් අවබෝධ කර ගැනීමයි. ඒ නිසාවෙන්, ධර්මය සමඟ කිසි දිනක සම්බන්ධයක් නොතිබූ අයට ද නිර්වාණය අවබෝධ කරගත හැකි බව සිතාගත හැකිය. එසේ පැවසීමෙන් පසු, බුදුපියාණන් වහන්සේගේ ඉගැන්වීමට ඇති විවෘතබව එය අගය කිරීමට වැඩි ඉඩක් ඇත. ඉගැන්වීම අගය කිරීමෙන් එය වඩාත් ශක්තිමත් ලෙස පුහුණු කිරීමට කැමැත්තක් ඇති කරයි. බුදුපියාණන් වහන්සේගේ ඉගැන්වීම් පුහුණු කිරීම නිර්වාණයට පත් වීමට බොහෝ වාරයක් වඩාත් අපේක්ෂා කළ හැකි දෙයකි.

ජේසුස්වහන්සේට අනුව, අපට ඇත්තේ එකම ලෞකික ජීවිතයක් පමණි. මරණයට පෙර අප බේරා නොගත්තොත්, අප සදහටම තුට්ටුවක් වටින්නේ නැති වෙයි. තිබෙන්නේ පිළිගත හැකි ඉරණම් දෙකක් පමණි. බුදුපියාණන් වහන්සේගේ නැවත ඉපදීම පිළිබඳ ධර්මයෙන් අදහස් කරන්නේ මෙම ජීවිතයේදී පුද්ගලයකු නිර්වාණයට පත්වී නොමැති නම්, එම පුද්ගලයාට සැමවිටම ඊළඟ භවයේදී එසේ කිරීමේ හැකියාව ඇති බවයි. මීට අමතරව, නැවත ඉපදීම පිළිබඳ ධර්මයට සම්බන්ධව තිබෙන්නේ කර්මය පිළිබඳ ධර්මයයි. හිතාමතා කළ සිතුවිලි, කථා සහ ක්‍රියා පුද්ගලයකුගේ චරිතය ගොඩනඟන බව සහ ඒ අනුව එහි ප්‍රතිඵලයක් වශයෙන් එම පුද්ගලයාගේ වර්තමානය සහ අනාගතය; ඊළඟ සතිය, ඊළඟ මාසය, ඊළඟ අවුරුද්ද, සහ සමහර විට ඊළඟ ජීවිතය පාලනය කරන බවට අදහස. නිවැරදි සංකල්පිත හෝ බුද්ධිමය අවබෝධය

(සම්මා දිට්ඨි) තිබීම වැදගත් වේ, නමුත් යම් කෙනකුගේ විශ්වාස වැදගත් වන්නේ එම පුද්ගලයා තමාගේ හැසිරීමට සහ ඒ අනුව එහි ප්‍රතිඵලයක් වශයෙන් කර්මයට ද බලපාන ප්‍රමාණයටය. අවංක සහ ගුණවත් පුද්ගලයකුට ධනාත්මක නැවත ඉපදීමක් ලැබීමට ඔහුගේ ආගමික විශ්වාස, හෝ කිසිම ආගමක් ඔහුට නැති වුණත්, ඒවා වැදගත් නොවේ. නිසැකවම යම් කෙනකු ධර්මය වැළඳගත් විට ප්‍රීති ප්‍රමෝදයට පත් වෙයි, නමුත් යම් කෙනකු අව්‍යාජ හින්දු, පුහුණු වන යුදෙව් හෝ අවංක ක්‍රිස්තියානි අයෙක් වුවද, ඔවුන්ට සතුටු විය හැකිවිය යුතුය. ඒ අනුව අනෙක් විශ්වාසවලට ඉහළින් උසස්බව කියාපාන මත අවධාරණයට ඇති අවශ්‍යතාව සහ සැමවිටම ආගම වෙනස් කරන්නන් සෙවීම සාමාන්‍යයෙන් බුදුදහමේ ගතිලක්ෂණ නොවේ.

ක්‍රිස්තියානි ධර්මය සුවිශේෂ නීත්‍යනුකූල හිමිකමක් ඉල්ලා සිටින්නේ නම් එය මතභේදයකට හේතුවක් නොවේ. මෙම කාරණයේදී ජේසුස්වහන්සේ නිශ්චිත විය. "ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින්, "මාර්ගයද, සත්‍යයද, ජීවනයද මම වෙමි; මා මඟින් මිස කිසිවෙක් පියාණන් වහන්සේ වෙත නො පැමිණෙන්නෝය. පුත්‍රයාණන් අදහන්නාට සදාතන ජීවනය ඇත. එහෙත්, පුත්‍රයාණන්ට කීකරු නො වන්නා ජීවනය නොදක්නේය; දේව උදහස ඔහු පිට රඳා පවතියි. එහෙත්, යමෙක් මනුෂ්‍යයන් අබිමුවෙහි ප්‍රතික්ෂේප කරන්නේද, මමත් ස්වර්ගයේ වැඩ සිටින මාගේ පියාණන් වහන්සේ අබිමුවෙහි ඔහු ප්‍රතික්ෂේප කරන්නෙමි. "[206] ඔහු ලබාගත හැකි ඉතා හොඳ තෝරා ගැනීම් සැකයක් නැතිව හුදෙක්ම සහ පැහැදිලිව ඉදිරිපත් කළේය. : "මට පක්ෂ නොවන්නා, මට විපක්ෂය; මා සමඟ රැස් කිරීමට මට උදව් නොකරන්නා, එය විසුරුවා හරියි."[207] අපෝස්තල්වරු ද මේවා සහ සමාන ප්‍රකාශන පෙනෙන්ට තියෙන ව්‍යංගයට අනුව භාවිතා කළහ. "අන් කිසිවකු මඟින් ගැලවීමක් නැත; මන්ද, අපේ ගැලවීම සලසා දෙන ලද අන් කිසි නාමයක් මුළු ලොවෙහිම මිනිසුන් අතරේ නැත. නැවතත්, ඇත්තේ එකම දෙවියන් වහන්සේය. දෙවියන් වහන්සේ හා මනුෂ්‍යයන් අතර වනුයේ එකම මැදහත්කාරයෙකි. එනම්, මනුෂ්‍යයකු වූ ක්‍රිස්තුස් ජේසුන් වහන්සේ ය."[208]

## දෙවියන් වහන්සේ

බුදුපියාණන් වහන්සේ සහ ජේසුස්වහන්සේ අතර තිබෙන විශාලතම, වඩාත් වෙනස්වනසුළු සහ ප්‍රධාන වෙනස, සහ ඒවායෙන් වෙනත් බොහෝ නොගැලපීම් රඳවා තබන්නේ උන්වහන්සේලාගේ දෙවියන් වහන්සේ පිළිබඳව තිබූ අදහස් බවට කිසිම සැකයක් නැත. ජේසුස්වහන්සේ පෞද්ගලික දෙවියන් වහන්සේ කෙනකු පිළිබඳව නිසැක විශ්වාසයක් තිබූ අතර, බුදුපියාණන් වහන්සේ එසේ නොවූහ.

ජේසුස්වහන්සේගේ දෙවියන්ට ශතවර්ෂ ගණනාවක් පුරා වැඳුම් පිදුම් සිදුකරමින් පවතී. යුදෙව් ජාතිකයන්ගේ ජාතික (national) දෙවියන් වහන්සේ 'යාවේ' යනුවෙන් හැඳින්වුණු අතර, ඔහු මුහුණු දෙකක් තිබූ රෝමානු දෙවිකෙනකු වන ජානස්ට සමාන දෙආකාර ස්වභාවයකින් යුක්ත විය. අඩුම තරමින් දේව මෙහෙයට කැපවීමෙන් ඔහු එක් පැත්තකින් කාරුණික සහ රැකබලා ගැනීමේ ස්වභාවයන් යුක්ත විය. මීට හාත්පසින්ම වෙනස්ව, දෙවියන් වහන්සේ ද ඉල්ලීම් කරන, අණ නොපිළිපැද්දොත්, ඉක්මන් කෝපයෙන් යුක්ත, පළිගන්නාසුලු සහ බියවද්දන පුද්ගලයෙකි. සාමාන්‍ය ඉංග්‍රීසි භාවිතයද මෙම අනෙක් පැත්තට යොමු කරයි. දැහැමි, අවංක පුද්ගලයකු "දෙවියන්ට බිය ඇත්තකු" ලෙස අපි සඳහන් කරමු. එයට හේතුව දෙවියන් වහන්සේගේ දේව නියෝග නොසලකා හැරීමෙන් බියකරු විපාක ඇතිවිය හැකිවීමයි. ''දෙවියන් වහන්සේ පිළිබඳව බිය ඇති කිරීම" යම් කෙනකු තුළ මහත් බියක් ඇති කිරීමය. මිනිසුන්ට දඬුවම් කිරීමට දෙවියන් වහන්සේ භාවිත කළ සියලු බිහිසුණු ව්‍යසන ''බයිබලයේ සඳහන් වේ." එයට හේතුව, දෙවියන් වහන්සේ ඊජිප්තුවට යැමෙන් ඇතිවූ වසංගතයේ ඉතිරිවූ ශේෂ ලෙස එය සිතීමය. කොතැනක හෝ ප්‍රබෝධය ඇති කරන සතුට සහ සොම්නස "ස්වර්ගය වගේ යැයි " කියනු ලැබේ. නමුත් යම් තැනක ඉතා දරුණු දෙයක් ඇත්නම් හෝ සිදුවෙමින් පවතී නම් එය "මහ පොළොවේ අපාය" යනුවෙන් හැඳින් වේ. එයට හේතුව, එවැනි තැන දෙවියන් වහන්සේ විසින් පව්කාරයන් සහ විශ්වාස නොකරන්නන් දඬුවම්වලට නියම කරන ස්ථානය ලෙස සලකනු ලැබීමය.

පළමු සහස්‍ර වර්ෂය එළැඹෙන විට, හිලල්, රබී අවිකා සහ සයිමන් ද ජස්ට් වැනි ශ්‍රේෂ්ඨ යුදෙව් චින්තකයන් සහ දේවධර්මධරයන් දෙවියන් වහන්සේගේ ආදරණීය ස්වභාවය පිළිබඳව වඩා විශේෂ වැදගත්කමක් මතු කළ අතර, ජේසුතුමා ද මේ අය අතරට ඇතුළත් විය. කෙසේ නමුත්, ජේසුතුමා දෙවියන් වහන්සේගේ අනෙක් පැත්ත පිළිබඳව හොඳින් දැන සිටිය නමුත්, ඒ පිළිබඳව මිනිසුන්ට මතක් කිරීමට නොකැමැත්තක් නොතිබුණි. ''ශරීරය නැසූවත්, ආත්මය නසන්ට නුපුළුවන් අයට බිය නොවන්න. එහෙත්, ආත්මය ද ශරීරය ද නිරයෙහි විනාශ කරන්ට පුළුවන් උන්වහන්සේටම බිය වන්න."[209] නිරය පිළිබඳව ජේසුස්වහන්සේ අනතුරු හැඟවීමක් කළේය. "ගිනි උදුනෙහි හෙළන්නෝ ය. එහි දී වැළපීම ද දත්මිටි කෑම ද වන්නේය. අපායේ දී ඔවුන් කා දමන පණුවා නොනසියි. ඔවුන් දවා ලන ගින්න නොනිවෙයි. ඔබේ වැටීමට හේතුව ඔබේ අත නම් එය කපා දමන්න. දෑත ඇති ව අපායෙහි නොනිවෙන ගින්නට යාමට වඩා අබ්බගාත ව ජීවනයට ඇතුල් වීම ඔබට යහපතකි. අපායේදී ඔවුන් කා දමන පණුවා නොනසියි. එපමණකුත් නොවේ. මොබින් ඔබ වෙත යාමටවත් ඔබින් අප වෙත ඒමටවත් කැමති වූවන්ට එය කළ නොහැකි වන සේ ඔබ හා අප හා අතර පරතරයක් පිහිටුවා ඇතැ'යි කීය. අපායේදී ඔවුන් කා දමන පණුවා නොනසියි, ඔවුන් දවාලන ගින්න ද නොනිවෙයි.".[210]

බුදුපියාණන් වහන්සේගේ කාලයේ සහ ශතවර්ෂ ගණනාවක් උන්වහන්සේට පෙරත් බ්‍රාහ්මණ ආගම අප්‍රමාණ දෙවිවරුන්; යාම, සූරිය, සෝම, අග්නි, චන්ද, ඉන්ද්‍ර, වරුණ සහ ප්‍රජාපති යන ඉතා ජනප්‍රිය දෙවිවරුන් කෙරෙහි විශ්වාසය තබා ඇත. කෙසේ නමුත්, ක්‍රි. පූ. 7වන/6වන ශතවර්ෂ වලදී, එනම් පසුකාලීනව, අඩුම ගණනේ ඉතා උගත් ගුප්ත දේ විශ්වාස කරන්නන් සහ දේවධර්මධරයන් අතර, එක් විශේෂිත දෙවි කෙනකුට පමණක් වන්දනා කිරීමේ ස්වරූපයක් විකසනය වීමේ ආරම්භයක් වැඩි දියුණු විය. බ්‍රහ්ම ඉතාම උසස් ලෙස පිළිගැනුණි. ඔහු ''සියලු දේ දකින, සියලු දෙයට බලවත්, දෙවියන්, හදන්නා, නිර්මාණය කරන්නා සහ පාලකයා, පත් කරන්නා සහ පාලනය කරන්නා, ඔහු දැනට ජීවත්වන සහ අනාගතයේ ජීවත්වන සියල්ලන්ගේ පියා සහ මැවුම්කරුවාවේ.".[211]

''අනෙක් සියලු දෙවිවරුන්ට වඩා වැඩියෙන් බැබළෙන" දෙවියන් ලෙස ඔහු හඳුන්වනු ලැබුණි. එසේම, ''ඔහු පෙනී සිටින විට, විශාල හැඩයක් ආරූඪ කරගනී. එයට හේතුව ඔහුගේ ස්වභාවික පෙනුම ඇසට දැකිය නොහැකි වීමය."[212] බ්‍රහ්ම සියලු දේ නිර්මාණය කළ බවට සහ කාරුණික, ආදරනීය සහ කෝප හෝ දුෂ්ට නොවූ දෙවි කෙනකු වශයෙන් ද සඳහන් කරනු ලැබේ.[213] බැතිමත්හු ඔහු අගය කළහ, උපකාර ඉල්ලා පැමිණියහ. පූජා සහ පරිත්‍යාග සමඟ පැමිණ වැඳ නමස්කාර කළහ. ඔවුන්ගේ බලාපොරොත්තුව වූයේ මෙම ජීවිතයේදී ඔහුගෙන් මඟ පෙන්වීම ලැබීමට සහ ආරක්ෂා වීමටත්, මරණයෙන් පසු ඔහුගේ සහෝදරත්වය (බ්‍රහ්මසහව්‍යතා)[214] ලැබීමටත් ය. ක්‍රිස්තියානි දෙවියන් වහන්සේ සතු සියලු ගතිලක්ෂණ හින්දූන් තමන්ගේ දෙවියන් ලෙස ඇදහූ බ්‍රහ්මට තිබුණි. උදාහරණ වශයෙන් ඔහු සියලු දේ මැව්වේය, ඔහු සියලු අතින් බලසම්පන්නය, ඔහු ආදරනීයයි, ඔහු අදෘශ්‍යමානය, ඔහු යාඥාවන්ට සවන් දෙයි, ආදි වශයෙනි. නමුත්, ඔහු ක්‍රිස්තියානි දෙවියන් වහන්සේගෙන් එක් අතකින් වෙනස්ය, ඔහු බිය නොගන්වයි, පළි නොගනියි, ඔහු මිනිසුන් නිරයට යැවීමට දඬුවම් නියම නොකරයි, ඔහු වැරදි කරන්නන්ට දඬුවම් කිරීමට තර්ජනය නොකරයි, ඔහු ඔහුට වැඳපුදන්නට ඉල්ලා නොසිටියි, වෙනත් වචනවලින් කියනවා නම් ඔහුට 'අඳුරු පැත්තක් නැති' බව බුදුපියාණන් වහන්සේ හොඳින් දැන සිටියහ.

නුවණක්කාර ලෙස බුදුපියාණන් වහන්සේ බ්‍රහ්ම පිළිබඳ සැබෑ තත්ත්වය පිළිගත් අතර, ඔහු සම්බන්ධයෙන් පවසන සෑම සඳහනක් පිළිබඳව සම්පූර්ණයෙන්ම වාගේ උන්වහන්සේ සැක පහළ කළහ. ඒ අනුව එහි ප්‍රතිඵලයක් වශයෙන්, ඔහුට වැඳීම් සහ කැපවීම් අර්ථයක් නොමැති බව ඉදිරිපත් කළහ. වෙනස් නොවන බවින් බොහෝ වෙනස් අත්දැකීමකින් යුක්තව, බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ; අනෙක් සියලු දෙනාම සහ සියලු දේවල් මෙන්ම, බ්‍රහ්ම ද වෙනස්වීම් සහ ප්‍රතිවර්තන වලට (අඤ්ඤථත්තං අත්ථි විපරිණාමෝ) යටත් වේ.[215] තමන් සියලු දේ නිර්මාණය කළා යැයි බ්‍රහ්ම සිතුවත්, ඔහු කරුණු වරදවා තේරුම් ගෙන ඇත; ඒ සියලු දේ සිදුවූයේ ස්වභාවික බලපෑම් නිසා යයි බුදුපියාණන් වහන්සේ

වදාළහ.[216] බ්‍රහ්මගේ නිර්මාණ පිළිබඳව විශ්වාස කරන්නන්ගෙන් ඒවා නිශ්චිතවම පැමිණියේ කෙසේද කියා පැහැදිලි කරන ලෙස බුදුපියාණන් වහන්සේ වදාළ විට, ''ඔවුන්ට පිළිතුරක් දිය නොහැකි විය." (තේ මයා පුට්ඨා න සම්පායන්ති)[217] සැබැවින්ම, සියලු සිද්ධීන් සිදු වන්නේ දෙවියන්ට (ඉස්සර නිම්මාණහේතු) අනුව යයි යන විශ්වාසය මෙන්ම, සියලු දේ සිදුවන්නේ පෙර කර්මය හෝ හේතු හෝ හේතූන් නිසා යයි යන විශ්වාසය ද වැරදි බව බුදුපියාණන් වහන්සේ වදාළහ. [218]

බ්‍රහ්ම සර්වඥ යැයි පවසා තිබෙන්නට ඉඩ තිබේ, නමුත් ඔහුගේ හොඳ අවස්ථාවන්හිදී, බොහෝ දේවල් සම්බන්ධයෙන් තමන් නොදන්නා බව ඔහු පිළිගෙන ඇත.[219] සමහර විට බුදුපියාණන් වහන්සේ බැහැ දැක උන්වහන්සේ අගයමින් පැමිණ විශේෂයෙන් ආධ්‍යාත්මික කරුණු සම්බන්ධයෙන් තමන් නොදන්නා දේවල් පිළිබඳව ප්‍රශ්න ඇසූ බවට බුදුපියාණන් වහන්සේ සඳහන් කිරීමෙන් බ්‍රහ්මගේ කියනු ලබන සර්වඥබව තවදුරටත් හීනවිය.[220] ඊට පසු යහපත් දෙවිකෙනකු අයහපත ඇති කිරීමට ඉඩ දෙන්නේ ඇයි යන ප්‍රශ්නය මතු වේ. දෙවියන් වහන්සේ සියලු දේ සඳහා බලවත් නම්, එක වේලාවේම තත්ත්වය නොතකා සැමට ආදරය කරන ඔහු ලෝකයේ සිදුවෙන බරපතල දුෂ්ටකම් සහ දුක් විඳීම් පිළිබඳව කිසිම දෙයක් නොකරන්නේ ඇයි ද කියා ඒ කාලයේ සිටම බොහෝ පැරණි බෞද්ධයෝ ඇසූහ. "බ්‍රහ්මයා ලෝකයේ ඇදහැරියේ නැත්තේ ඇයි? ඔහු සැබැවින්ම පාලකයා නම්, සියලු සත්ත්වයන්ගේ ඉහළම දෙවියන් නම්, මුළු ලෝකයම මෙතරම් අවුල් ස්වභාවයක තිබෙන්නේ ඇයි? ඔහු ලෝකය සතුටු කළේ නැත්තේ ඇයි? ඔහු සැබැවින්ම පාලකයා නම්, සියලු සත්ත්වයන්ගේ දෙවියන් නම්, මෙතරම් රැවටිල්ල සහ බොරුව, අහංකාරය සහ අධර්මිෂ්ටත්වය ඇත්තේ ඇයි? ඔහු සැබැවින්ම පාලකයා නම්, සියලු සත්ත්වයන්ගේ දෙවියන් නම්, මේ සියල්ල නිර්මාණය කළේ ඔහුම නිසා අධර්මිෂ්ට සහ අනුකම්පා රහිත පුද්ගලයකු විය යුතුමය."[221]

ජේසුස්වහන්සේ මෙන්ම බුදුපියාණන් වහන්සේ ද මානව දුක්විඳීම් පිළිබඳව දැඩි සේ සසල වූහ, සැලකිලිමත් වූහ. ජේසුස්වහන්සේට අනුව ඒ සියල්ල එක් ආකාරයකින් හෝ වෙනත් ආකාරයකින්

දෙවියන් වහන්සේට නැවත යොමු වේ, පව් සහ එයින් ප්‍රතිවිපාක වශයෙන් වූ දුක්විඳීම් මානව වර්ගයා විසින් දෙවියන් වහන්සේට අකීකරු වීමෙන් ඇතිවූ ප්‍රතිඵල ය. බුදුපියාණන් වහන්සේට අනුව, ඒවාට මානසික හේතු ඇත; ඇලීම සහ අවිද්‍යාවයි. ජේසුස් වහන්සේට අනුව, ආගමික ජීවිතයක අරමුණ නම් සදාකාලිත්වය සඳහා දෙවියන් වහන්සේ වෙතට පැමිණීම ය. බුදුපියාණන් වහන්සේට අනුව, නිර්වාණයට පත්වීමයි. හුදෙක් දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාසය ඇති කර ගැනීමෙන් විමුක්තිය ලබා ගත හැකි බව ජේසුස්වහන්සේ විශ්වාස කළේය. මායාවෙන් තොරව විචක්ෂණශීලි අවබෝධයක් ගොඩ නඟමින් ''ඇති සැටියෙන් දේවල් පිළිබඳව අවබෝධය සහ විචාර බුද්ධියක" (යථා භූත ඤාණ දස්සන)[222] ප්‍රතිඵලයක් වශයෙන් ස්වභාවිකව නිවන් අවබෝධ කරගත හැකි බව බුදුපියාණන් වහන්සේ ඉගැන්වූ සේක.

ජේසුස්වහන්සේ දෙවියන් වහන්සේගේ අරමුණ විශ්වාස කළ අතර, සිදුවන සියලු දේ ඒ පිටුපස තැබුවේය. බුදුපියාණන් වහන්සේ සියලු දේ මනසට සම්බන්ධ කළහ. බුදුපියාණන් වහන්සේගේ (බොහෝ පුළුල් ලෙස ප්‍රචලිත උන්වහන්සේගේ) සියලු ප්‍රකාශයන්ගේ එකතුව වූ ධම්මපදයේ සඳහන් පළමු වචන, "මනස සියලු දෙයට මුල් වෙයි, ඒවා මනස මත රඳා පවතියි, ඒවා මනස විසින් ගොඩ නඟයි" යන්න ය.[223]

බුදුපියාණන් වහන්සේ දෙවියන් පිළිබඳව කථා කළේ කලාතුරකින් බව සමහරු පවසති," එයට හේතුව දෙවියන් ඇත්තේ වචනවලින් ඇත ය. සැබෑ හේතුව නම් උන්වහන්සේ මෙම විෂයය ආමන්ත්‍රණය කළේ ඉඳහිට ය. උන්වහන්සේ ඇතුළු වෛතුල්‍ය චින්තකයන් සහ බුද්ධිමතුන් අතර මෙම විෂය සාකච්ඡාවට භාජනය වීමට තරම් වැදගත් නොවීමයි.

**යාඥා කිරීම සහ භාවනාව**

මානව ක්‍රියාවන්හිදී සම්බන්ධ වීමට සිටින එකම උත්තරීතර පුද්ගලයා තමන් බවත් යාඥා කිරීමෙන් තමන් සමඟ අදහස් හුවමාරු කරගත හැකි බවත් ජේසුස්වහන්සේ පිළිගත්තේය. ක්‍රිස්තියානි දිවි පැවැත්මකට සහ ඇදහිල්ලකට යාඥා කිරීම අවශ්‍ය විය, සහ නිරන්තරව අවශ්‍ය වේ. තමන්ට සහ අනෙක් අයට උපකාරයක් අවශ්‍ය වූ විට සහ මඟපෙන්වීමක් ලැබීමට සහ

සුවිශේෂි දේවවාක්‍ය අනුගමනය කිරීමට ශක්තිය ලබා ගැනීමටත් කෙනකුට යාඥා කළ හැකිය. සෑම අවංක යාඥාවකටම දෙවියන් වහන්සේ පිළිතුරු දෙන බවට ජේසුස්වහන්සේ පොරොන්දු විය. ''එබැවින් මම ඔබට කියමි, ඔබ යාඥාවෙන් අයදින කවර දෙයක් වුවද, එය ඔබට ලැබුණේ යයි අදහන්න. එවිට එය ඔබට ලැබෙන්නේ ම ය." ''ඉල්ලන්න, ඔබට දෙනු ලැබේ; සොයන්න, ඔබට දොර අරිනු ලැබේ. මන්ද, ඉල්ලන්නාට ලැබේ. ඔබ අතරෙන් කවර මනුෂ්‍යයෙක් හෝ තමාගේ පුත්‍රයා පාන් ගෙඩියක් ඉල්ලුවොත් ඔහුට ගල් ගෙඩියක් දෙයි ද? මාළුවකු ඉල්ලුවොත් සර්පයකු දෙයි ද? මෙසේ අයහපත් ඔබ, ඔබේ දරුවන්ට යහපත් දේ දෙන්ට දන්නහු නම්, ස්වර්ගයෙහි සිටින ඔබේ පියාණන් වහන්සේ තමන්ගෙන් ඉල්ලන්නන්ට යහපත් දේ ඊටත් වැඩියෙන් නොදෙන සේක් ද?"224 (Mk.11.24;Matt.7.7-11) එම පොරොන්දුවම අපෝස්තල්වරු ද දුන්හ: ''මේ නිසා, උන් වහන්සේගේ කැමැත්තට එකඟ ව, අප යමක් ඉල්ලුවොත්, ඒ ඉල්ලීමට, උන් වහන්සේ සවන් දෙන බව අපි දනිමු නම්, අප උන් වහන්සේගෙන් ඉල්ලන දේ අපට ලැබෙන බව අපි දනිමු."225 (1 Jh.5.14-15) සැබැවින්ම, මිනිසුන්ට අවශ්‍ය සියලු දේ ඔවුන්ට නොලැබීමට හේතුව ඒ සඳහා ඔවුන් දෙවියන් වහන්සේට යාඥා නොකිරීමයි.226 (Jam.4.2) යාඥාව දෙවියන් වහන්සේ වර්ණනා කිරීමෙන් සහ ස්තුති කිරීමෙන් යන ආකාරයෙන් ද සිදු කළ හැකිය. දෙවියන් වහන්සේට යාඥා කිරීමේදී විශේෂිත වචන භාවිත කරන ලෙසද එක් අවස්ථාවකදී ජේසුස්වහන්සේ තමන්ගේ ශ්‍රාවකයන්ට උපදෙස් දුන්නේය, ඒ දෙවියන් වහන්සේගේ යාඥා වශයෙනි. පසුකාලීන ශතවර්ෂවලදී ක්‍රිස්තියානි සම්ප්‍රදාය යාඥා කිරීමේ සහ මෙනෙහි කිරීමේ හාස්‍යජනක සහ සංකීර්ණ ක්‍රම සකස් කළ නමුත්, ජේසුස්වහන්සේ ඉගැන්වූ ආකාරයට, යාඥාව සරල සහ අදහන්නා සහ දෙවියන් වහන්සේ අතර සන්නිවේදනය ඍජු සහ ක්ෂණික විය යුතුය. බ්‍රාහ්මණ ආගමේ යාඥාව වැදගත් පුරුද්දක් වූ අතර, බුදුපියාණන් වහන්සේට අනුව එය බ්‍රහ්ම සහ වෙනත් වෛදික දෙවිවරුන්ට ''අත්දෙක එක්කොට වර්ණනා කරමින් සහ වදිමින් අයැදීමකි." (ආයාචන්ති ථෝමයන්ති පඤ්ජලිකා නමස්සමානා)227 (D.I. 240). නමුත් බුදුපියාණන් වහන්සේගේ අවබෝධයේ යථාර්ථයට අනුව හුදු උත්තරීතර දෙවිකෙනකුට ඉඩක් නොමැති නිසා, බුදුදහමේ

යාඥාවේ වැදගත් කමක් නැත. යාඥාවකින් මිනිසුන්ට වඩා හොඳ බවක් හෝ සහනයක් දැනෙන්ට පුළුවනි, එයින් කෘතඥතාවක්, නිහතමානී බවක් සහ ඉවසීමක් වැනි ගුණධර්ම වැඩෙන්නට පුළුවනි. නමුත් බුදුදහමට අනුව, සහේතුකව, බාහිර දෙවිවරුන්ගේ බලපෑම් හේතුකොටගෙන පුද්ගලයකු තුළ එවැනි ගුණාංග ඇතිවීමට පෙළඹවීමක් ඇති කරන්නේ යැයි යන්න අදහස් නොකෙරේ. මිනිසුන් වඩාත් කැමැති දේ බුදුපියාණන් වහන්සේ පැවසූ සේක; ''සතුට, දීර්ඝායුෂ, යසස සහ දිව්‍යලෝකවල නැවත උත්පත්තිය,'' යනාදිය ''යාඥා සහ බාරවලින්'' ලැබිය නොහැකිය. (න ආයාචනහේතු වා න පත්ථනාහේතු) [228] (A.III.47)

අහඹුවේ සහ හේතුවක් රහිතව වෙන් වෙන්ව එක වෙලාවට සිදුවන දෙයක සංයෝජනයකින් යාඥාවකට පිළිතුරු ලැබුණේය යන හැඟීම ඇති වන්නේ කෙසේද කියා බුදුපියාණන් වහන්සේගෙන් ශතවර්ෂ ගණනාවකට පසුව මහාවස්තුවේ අවධානය කැඳවන නූතන සහ බුද්ධිමත් පැහැදිලි කිරීමක් කර ඇත. ''වරක් එක් මිනිසකු සෞභාග්‍යය ලැබීම පිණිස දිව්‍යාංගනාවකට යාඥා කළ අතර, පසුව ඔහු ධනවත් පුද්ගලයකු බවට පත්විය. මෙය හරියටම මිථ්‍යා ඇදහිලි ඇතිවන්නේ කෙසේද යන්න තහවුරු කරයි.'' [229] (Mhv.III.402)

මිනිසුන් තමන් සහ ලෝකයේ සිටින අනෙක් අය දකින, අර්ථ දක්වන සහ විනිශ්චය කරන ආකල්පය වන්නේ මනස (මනෝ, චිත්ත, විඤ්ඤාණ) බව බුදුපියාණන් වහන්සේගේ මතය විය. මෙම සංකල්පය බොහෝ දේවලදී බුදුපියාණන් වහන්සේ පිළිබිඹු කර ඇතඃ ''ලෝකය අතන මෙතනට මෙහෙයවන්නේත් අතන මෙතනට ඇදගෙන යන්නේත් මනසයි. සියලු දේ තමන් යටතේ පාලනය කරන එකම දේ මනසයි.''[230] (S.I.39) යම් පුද්ගලයකුගේ මනස යම් ආකාරයකින් විකෘති වූයේ නම් එවිට, එම පුද්ගලයාගේ හැඳින ගැනීම්, ඊළඟ, තීරණ සහ එතැනින් එහා හැසිරීම් ගැටලු සහිත වේ. එසේම මනස විකෘති කරන්නේ ලෝභය, ද්වේෂය, සැකය, ආශාවන්, අගතිය, රාගය, කණස්සල්ල යනාදියයි. වරක් බුදුපියාණන් වහන්සේ එක් දේශනාවකදී පුද්ගලයකුගේ මනස පිරිසුදු නිශ්චල ජලය සහිත භාජනයකට තමන්ගේ මුහුණේ පරාවර්තනය පැහැදිලිව දැකිය හැකි බව සංසන්දනය කළසේක.

